213 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 213 - இல. 11
Volume 213 - No. 11

2012 දෙසැම්බර් 03 වන සඳුදා
2012 டிசம்பர் 03, திங்கட்கிழமை
Monday, 03rd December, 2012

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විසර්ජන පනත් කෙටුම්පත, 2013 – [දහඅටවන වෙන් කළ දිනය]**
[ශීර්ෂය 166 (ජල සම්පාදන හා ජලාපවහන); ශීර්ෂ152, 282 (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ); ශීර්ෂ 160, 283 (පරිසර)] - කාරක සභාවේදී සලකා බලන ලදී.

**කල් තැබීමේ යෝජනාව:**
විනාශ වූ ගොවිජන සේවා මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2013 : [ஒதுக்கப்பட்ட பதினெட்டாம் நாள்]**
[தலைப்பு 166 (நீர் வழங்கல், வடிகாலமைப்பு); தலைப்புகள் 152, 282 (நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவம்); தலைப்புகள் 160, 283 (சுற்றாடல்)] – குழுவில் ஆராயப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**
அழிவடைந்த கமநல சேவை நிலையங்களின் அபிவிருத்தி

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 2013 - [Eighteenth Allotted Day]
Considered in Committee - [Head 166 (Water Supply and Drainage); Heads 152, 282 (Irrigation and Water Resources Management); Heads 160, 283 (Environment)]

ADJOURNMENT MOTION:
Development of Destroyed Agrarian Services Centres

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2012 දෙසැම්බර් 03 වන සඳුදා***
*2012 டிசம்பர் 03, திங்கட்கிழமை*
*Monday, 03rd December, 2012*

***පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 9.30 a.m.,* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, 2010 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ටී.බී. ඒකනායක මහතා -පැමිණ නැත.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

1. අවිස්සාවේල්ල, යාහල්ලවත්ත, 10 වෙනි පටුමඟ, අංක 03 දරන ස්ථානයෙහි පදිංචි ජී.ඩී. දයාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; හා

2. මතුගම, වැත්තෑව, අගලවත්ත පාර, අංක 384 දරන ස්ථානයෙහි පදිංචි එල්.ඩී. කුමාරගේ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - පැමිණ නැත.
ගරු අජිත් කුමාර මහතා - පැමිණ නැත.

**ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා**
(மாண்புமிகு ஏ.எம். சாமிக புத்ததாஸ )
(The Hon. A.M. Chamika Buddhadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හන්ගොන්නාව, කරගහඋල්පත, "වෙනුර" නිවසෙහි පදිංචි ටී.බී. තෙන්නකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු රුවන් රණතුංග මහතා -පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### රජයේ රෝහල්වල ඇඟිලි සලකුණු යන්ත්‍ර : විස්තර
### அரச வைத்தியசாலைகளில் கைவிரல் அடையாள இயந்திரங்கள் : விபரம்
### FINGERPRINT MACHINES AT GOVERNMENT HOSPITALS : DETAILS

2355/'12

**3. ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වල කාර්ය මණ්ඩල සේවයට වාර්තා කිරීම සටහන් කිරීම සඳහා 2006 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී ස්ථාපනය කරන ලද ඇඟිලි සලකුණු යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම යන්ත්‍ර මිලදී ගැනීමට සහ ස්ථාපනය කිරීමට වැය වූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීමේදී ටෙන්ඩර් පරිපාටියක් අනුගමනය කර තිබේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන හා එක් එක් ආයතනය ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

(iii) ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගත් ආයතනයේ නම කුමක්ද;

(iv) එක් යන්ත්‍රයක මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ස්ථාපනය කරන ලද ඇඟිලි සලකුණු යන්ත්‍රවලින් දැනට ක්‍රියාත්මකව පවතින යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම යන්ත්‍ර වෙනුවෙන් වැය කළ විශාල මුදලට සාපේක්ෂව ප්‍රමාණවත් ප්‍රතිලාභ ලැබී තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் அரசாங்க வைத்தியசாலைகளில் பணியாட்டொகுதியினர் கடமைக்கு சமூகமளிப்பதைப் பதிவதற்காக 2006ஆம் ஆண்டு செப்ரெம்பர் மாதத்தில் தாபிக்கப்பட்ட கைவிரல் அடையாள இயந்திரங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி இயந்திரங்களை கொள்வனவு செய்வதற்கும் தாபிப்பதற்கும் ஏற்பட்ட செலவு யாது

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) கைவிரல் அடையாள இயந்திரங்களைக் கொள்வனவு செய்கையில் கேள்விப் பத்திர நடைமுறை பின்பற்றப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், கேள்விப் பத்திரங்களை சமர்ப்பித்த நிறுவனங்கள் மற்றும் குறித்த ஒவ்வொரு நிறுவனமும் முன்வைத்த விலைகள் யாவை;

(iii) கைவிரல் அடையாள இயந்திரங்கள் கொள்வனவு செய்யப்பட்ட நிறுவனத்தின் பெயர் யாது;

(iv) ஒரு இயந்திரத்தின் விலை யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) தாபிக்கப்பட்ட கைவிரல் அடையாள இயந்திரங்களில் தற்போது இயங்குகின்ற இயந்திரங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி இயந்திரங்களுக்காக செலவிடப்பட்ட பாரிய நிதிக்கு ஒப்பீட்டளவில் போதியளவு நன்மைகள் கிடைத்துள்ளதா

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health :

(a) Will he state -

(i) the number of fingerprint machines installed in September 2006 for the purpose of marking attendance of staffs of Government hospitals in Sri Lanka; and

(ii) the amount of money that was spent for purchasing and installing the aforesaid machines ?

(b) Will he inform this House -

(i) whether a tender procedure has been followed in purchasing the fingerprint machines;

(ii) if so, of the names of the institutions that submitted tenders and the bids submitted by each of them;

(iii) of the name of the institution from which the fingerprint machines were purchased; and

(iv) of the price of one machine?

(c) Will he also state -

(i) the number of machines that are operative at present, out of the finger print machines installed as mentioned above; and

(ii) whether sufficient benefits have been received against the huge amount of money spent on the aforesaid machines ?

(d) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 236

(ii) රුපියල් 28,521,200.60

(ආ) (i) ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීමේදී ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේ.

(ii) ඔටෝමේටඩ් බාර්කෝඩ් පුද්ගලික සමාගම - රුපියල් 33,912,500.00

ඩී.පී.ජේ. හෝල්ඩිංස් සමාගම - රුපියල් 33,174,700.00

(iii) ඩී.පී.ජේ. හෝල්ඩිංස් සමාගම

(iv) රුපියල් 120,852.64 ( සපයා සවි කිරීමේ මිල)

(ඇ) (i) 8

(ii) ප්‍රතිලාභ ලැබී තිබේ. නමුත් වෘත්තීය සමිති බලපෑම් මත රෝහල් පරිපාලනයට ඇඟිලි සලකුණු යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම අපහසු වී ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා එතුමාගේ පිළිතුරෙන් ප්‍රකාශ කළා, ඇඟිලි සලකුණු යන්ත්‍ර 236ක් ස්ථාපනය කර තිබෙන බව. නමුත් දැනට ක්‍රියාත්මකව පවතින්නේ ඇඟිලි සලකුණු යන්ත්‍ර 8යි. එතුමා කියනවා, වෘත්තීය සමිති ප්‍රශ්න නිසා මේ වැඩසටහනට බාධාවක් සිද්ධ වුණාය කියා. මම එතුමාගෙන් අහන්න කැමැතියි, මේ ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපනය කරන්නට තීන්දු තීරණ

ගන්නා වූ මොහොතේ ඒ විවිධ පාර්ශ්වයන්, ඒ විවිධ කොටස්කරුවන් සමඟ සාකච්ඡා කර එකඟතාවකට අවබෝධයකට සම්මුතියකට පැමිනුණේ නැතිද කියා; එහෙම එකඟතාවකට සම්මුතියකට පැමිණිලා නොවෙයිද මේ වැඩසටහන ක්‍රියාත්මක කළේ කියා. ඇඟිලි සලකුණු යන්ත්‍ර 236ක් ඇනවුම් කර අද 8ක් පමණක් ක්‍රියාත්මකව පවතින නිසා රටට ලොකු පාඩුවක් සිදු වෙලා තිබෙනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව රජයේ සේවකයන්, නිලධාරින් සේවයට වාර්තා කිරීමේදී අත්සන් කළ යුතුයි. ඒ කාලයේ රජයේ රෝහල්වල කාර්ය මණ්ඩල සේවයට වාර්තා කිරීම වඩා හොඳ හා වඩා කාර්යක්ෂම කිරීමේ චේතනාවෙන් වෙන්න ඇති මෙම තීන්දුවට එන්න ඇත්තේ. පරිපාලන තීන්දුවක් ගැනීමේදී වෘත්තීය සමිතිවලින් විමසීමට අවශ්‍ය නැහැ. මොකද, එය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් අනුව සිදු වන දෙයක් නිසා.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෘත්තීය සමිති 104ක් විතර තිබෙනවා. පළමුව වෛද්‍යවරු අත්සන් කරන්න බැහැ කියනවා. ඊළඟට හෙදියන් අත්සන් කරන්න බැහැ කියනවා. ඒ වාගේ විවිධ බලපෑම් එනවා. එහෙම බලපෑම් ආවාම තමයි මේ ප්‍රශ්නය ව්‍යාකූල තත්ත්වයට පත් වී තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. මම හිතන විධියට අපේ උගත් ගරු නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා, ඇඟිලි සලකුණු යන්ත්‍රය සහ අත්සන් කිරීම අතර වෙනස. ඒ නිසා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, මේ වාගේ විශාල මුදලක් - විශාල පිරිවැයක්- දරන්නට පෙර; රටේ ජනතාවගේ බදු සල්ලි උපයෝගී කර ගෙන ඇඟිලි සලකුණු යන්ත්‍ර ගෙන්වන්නට පෙර ඔබතුමන්ලා ආයතනික වශයෙන් යම්කිසි අවබෝධතාවකට, එකඟතාවකට, සම්මුතියකට ඇවිල්ලා ඒ එකඟතාවෙන් පස්සේ මේ වාගේ ඇණවුමක් කර රටට පාඩුවක් නොවන ආකාරයට මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න කටයුතු කළේ නැත්තේ ඇයි කියා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

උගත් මන්ත්‍රීතුමනි, රජයේ පරිපාලන ප්‍රතිපත්තියක් යටතේ අපි මේ යන්ත්‍ර ගන්නවා. ඒ වාගේම මේ සේවාවේ නිරත වෙලා සිටින අනෙකුත් උගත් අයත් මහජන මුදල් වැය කර ගත් මේ යන්ත්‍ර සූත්‍ර, උපකරණ පාවිච්චිය සඳහා තමන්ගේ පටිපාටියෙන් කටයුතු කරනවා නම් හොඳයි. මොකද, රජයේ සේවයට පැමිණීමේ දී මේ දේවල් කරන්න වෙනවා. වෛද්‍යවරයාගේ දැනුම හෙදියකට ගන්න බැහැ. හෙදියගේ දැනුම වෛද්‍යවරයාට ගන්න බැහැ. අත්සන් කිරීමෙන් කාටවත් අඩුවක් වන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවට පැමිණීමේදී අත්සන් කිරීම සඳහා ලේඛනයක් දැම්මොත් අපිත් අත්සන් කරනවා. ඒ අත්සන් කිරීමෙන් මගේ උගත්කමේ හෝ ඔබතුමාගේ උගත්කමේ හෝ කිසි දෙයක් අඩු වන්නේ නැහැ නේ. මේ අදහස මේ රටේ අපි සියලු දෙනාගේම ඔළුවලින් අයින් කළ යුතු දෙයක් හැටියට මම දකිනවා. තනතුරු තානාන්තර තිබෙන සමහර අය හිතනවා, පැමිණීමේ - පිටවීමේ ලේඛනයක් අත්සන් කළොත් එයින් අඩුවක් වෙනවා කියලා. එහෙම අඩුවක් වන්නේ නැහැ.

වෘත්තීය සමිති 104ක් රජයට විවිධ බලපෑම් කරනවා. නමුත් රජයක් හැටියට අපි රෝගීන් ගැන හිතන්න ඕනෑ. මොකද, මිලියන 28ට වඩා රජයේ නිදහස් සෞඛ්‍ය සේවාව යටතේ ප්‍රතිකාර ලබන රෝගීන් අපට වටිනවා. අනෙක් පැත්තෙන් රෝගියකු මිය ගියොත් තමුන්නාන්සේලාම කියයි රජය මේ යන්ත්‍ර ආරක්ෂා කරන්න ගිහිල්ලා රෝගීන් ගැන බැලුවේ නැහැයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා ඒ වෙලාවේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමා සාකච්ඡා කර තීන්දුවක් ගන්න ඇති, කොහොම හරි හොඳට මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා. එහෙම තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. මේකේ දෙපැත්තක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් වෘත්තීය ක්‍රියා මාර්ග ගන්න අයත් මේ ගැන යම් අවබෝධයක් ඇති කර ගන්න ඕනෑ. අත්සන් කළත්, ඇඟිලි සලකුණ තැබුවත් රජය පඩි ගෙවනවා. එන යන වෙලාව අත්සන් කළාය කියලා ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ නේ.

යම් හොර වැඩක් කරන කෙනකුට තමයි මේකේ ප්‍රශ්නයක් ඇති වෙන්නේ. මම වුණත් කැමැතියි, අමාත්‍යාංශයට යනකොට අත්සන් කිරීමේ ලේඛනයක් තිබෙනවා නම්. ඒකේ අත්සන් කළාය කියලා ඇමතිවරයෙක් හැටියට මට අඩුවක් වෙන්නේ නැහැ; ප්‍රශ්නයක් වෙන්නේත් නැහැ. ඒක හොඳයි. ඒක මදිකමක් විධියට හිතන එක මේ සමාජය තුළ ඇති කරගෙන තිබෙන මතයක්. මේ රටේ අය සමහර විට පිට රටවලට ගිහිල්ලා shedsවල තෙල් ගහනවා. නමුත් ලංකාවේදී ඒ වැඩේ කරන්න හුඟාක් දෙනෙක් කැමැති නැහැ. ඒ වාගේ තමයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාම පිළිගන්නවා ඇඟිලි සලකුණු යන්ත්‍ර 236ක් ඇණවුම් කර අද වන විටත් ස්ථාපනය කර තිබෙන්නේ අටක් පමණක් බව. එතකොට ජනතාවගේ බදු සල්ලි, රටේ සල්ලි වියදම් කර, රාජ්‍ය සම්පත උපයෝගී කරගෙන ඇඟිලි සලකුණු යන්ත්‍ර 236කට වියදම් කර අටක් පමණක් ස්ථාපනය කිරීම තුළින් රටට පාඩුවක් සිදු වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] මගේ ප්‍රශ්නය ඉවර නැහැ. භය වෙන්න එපා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ බදු මුදල් අනවශ්‍ය විධියට ඇඟිලි සලකුණු යන්ත්‍රවලට යොදවනවා වෙනුවට අද අපේ රටේ තිබෙන බරපතළ ඖෂධ හිඟය වෙනුවෙන් -[බාධා කිරීමක්] මොකද, අද රජයේ රෝහල්වලින් හම්බ වෙන්නේ chit එක පමණයි. පෞද්ගලික pharmacyවලට ගිහිල්ලා සල්ලිවලට බෙහෙත් ගන්න ඕනෑ අපේ රටේ ගිලන් වූ ජනතාව.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඔබතුමා කථාවක් පවත් වන්නේ නැතිව ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මේ මුදල් ටික ඇඟිලි සලකුණු යන්ත්‍රවලට වැය කරනවා වෙනුවට මේ රටේ ඖෂධ හිඟය පියවන්නට වැය කළා නම් වැදගත් වෙනවා නේද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා මෙවර අය වැයෙනුත් රුපියල් බිලියන 1,000කට වැඩි ප්‍රමාණයක් නිදහස් සෞඛ්‍ය සේවාව වෙනුවෙන් වැය කර තිබෙනවා. ඒ වාගේම අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා සෞඛ්‍ය මධ්‍යස්ථාන හදන්න මිලියන 800කට වැඩි මුදලක් ගිය අවුරුද්දේ අපට දීලා මේ රටේ මාතෘ වැඩසටහන් පවත්වන මධ්‍යස්ථානවල පහසුකම් ඇති කරන්න කටයුතු කර තිබෙනවා. නිදහස් සෞඛ්‍ය සේවාව වෙනුවෙන් එවැනි විශාල මුදලක් අප වැය කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ ගරු මන්ත්‍රීතුමන්ලා සම්බන්ධ වෙන මේ ගරු සභාවේ තිබෙන විද්‍යුත් ක්‍රමයට ඡන්ද විමසන යන්ත්‍රය - "Yes", "No" හෝ "Absent" කියන නවීන තාක්ෂණය භාවිත කරන මේ ක්‍රමය- අප ප්‍රයෝජනයට ගන්නේ නැහැ නේ. ඇයි ඒ? මේ ගරු සභාවේ කොතැන හරි විරෝධතාවක් තිබෙනවා. අප දැන් 21වන ශත වර්ෂයේයි ඉන්නේ. එහෙනම් විශාල මුදලක් වැය කර ගෙන්වා සවි කර තිබෙන මේ යන්ත්‍රය අප ප්‍රයෝජනයට ගන්න එපා යැ. නමුත් එය ප්‍රයෝජනයට ගන්නේ නැහැ.

ඒකට හේතුව යම් මතයකට ගරු කිරීමක්. මම උදාහරණය ගන්නේ මේ ගරු සභාවෙන්මයි. මේ යන්ත්‍රය අප පාවිච්චියට ගන්නේ නැහැ. ඒ වාගේම තමයි මේ ඇඟිලි සලකුණු යන්ත්‍ර සම්බන්ධයෙන් ඉදිරිපත් වූ මතයත්. පාර්ලිමේන්තුවේ ආදර්ශය මේකටත් ගත්තා නම් හරි. ඒ මතයට ඇහුම්කන් දීපු නිසායි එහෙම කර තිබෙන්නේ. ඒක සාකච්ඡාව තුළින් ඉදිරියට යැමක්. මම කියන්නේ ඒකයි. මමත් ගරු මන්ත්‍රීතුමා කිව්ව ඒ මතයේ ඉන්නවා. මේක අප සියලු දෙනාම එකතු වෙලා වෙනස් කළ යුතු දෙයක්.

## ශ්‍රී ලංගම සතු බස් රථ : විස්තර
### இ.போ.ச. பேருந்துகள் : விபரம்
### SLTB BUSES : DETAILS

3034/'12

**6. ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) අද වන විට ශ්‍රී ලංගම සතු මුළු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ අතරින් ධාවනයට සුදුසු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) ධාවනයට නුසුදුසු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iv) වර්ෂ පහළොවකට වැඩි කලක් ධාවනයේ යොදවා ඇති ශ්‍රී ලංගම බස් රථ සංඛ්‍යාව කොපමණද;

(v) වර්ෂ දහයකට අඩු කාලයක් ධාවනයේ යොදවා ඇති ශ්‍රී ලංගම බස් රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වයර් සහ බැටරි නොමැතිකම සහ වෙනත් විවිධ හේතූන් මත ශ්‍රී ලංගම බස් රථ ධාවනයෙන් ඉවත් කර තිබේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் இலங்கை போக்குவரத்து சபை வசமுள்ள மொத்த பேருந்துகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) மேற்படி பேருந்துகளில் ஓட்டத்திற்கு தகுதியான பேருந்துகளின் எண்ணிக்கை எத்தனையென் பதையும்;

(iii) ஓட்டத்திற்கு தகுதியற்ற பேருந்துகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iv) பதினைந்து வருடங்களுக்கு மேலாக ஓட்டத்தில் ஈடுபடுத்தப்பட்ட பேருந்துகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(v) பத்து வருடங்களுக்குக் குறைவாக ஓட்டத்தில் ஈடுபடுத்தப்பட்ட பேருந்துகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) வயர் மற்றும் பெட்டரி இல்லாமையினாலும் வேறு பல்வேறு காரணங்களினாலும் இ.போ.ச பேருந்துகள் ஓட்டத்திலிருந்து அகற்றப்பட்டுள்ளதா என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he state -

(i) the total number of buses belonging to the Sri Lanka Transport Board by now;

(ii) the number suitable for running, out of these buses;

(iii) the number not suitable for running;

(iv) the number of SLTB buses that have been run for more than 15 years; and

(v) the number of SLTB buses that have been used in running operations for less than 10 years ?

(b) Will he also state whether any buses of the Sri Lanka Transport Board have been dropped off from running operations due to shortage/lack of cables and batteries or for various other reasons ?

(c) If not, why ?

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පාර්ලිමේන්තුවට ඇවිල්ලා දැන් අවුරුදු 19ක් වෙනවා. අද තමයි මම ඉතාම සන්තෝෂ වෙන දවස. මේ වාගේ රූමත් නෝනා මහත්මියක් මගෙන් ප්‍රශ්න අහනවාට මම අද ගොඩාක් සන්තෝෂ වෙනවා. ඔබතුමියට බොහොම ස්තුතියි මගෙන් ප්‍රශ්නය ඇහුවාට. ඔබතුමිය ගිය බ්‍රහස්පතින්දාත් ප්‍රශ්නයක් අහලා තිබුණා. නොවැළැක්විය හැකි හේතුවක් මත -ඒත් ඔබතුමිය වාගේම කෙනෙක් නිසා - මට එදින එන්න බැරි වුණා.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
බොහොම ස්තුතියි. එහෙම නම් ඉතින් සන්තෝෂයෙන් පිළිතුරුත් දෙමු.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
පොඩ්ඩක් ඉන්න. මම තවම වෙවුලනවා. දැන් මට කථා කර ගන්නත් බැහැ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ඔබතුමා වචන පටලවා ගන්න එපා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
පටලැවෙනවා නේ, නෝනා මහත්තයා ඔබතුමිය දැක්කාම.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු ඇමතිතුමාට නොවෙයි කිව්වේ. අර පිටිපස්සේ-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා පිටුපස බලන්න එපා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
රෝසි සේනානායක මන්ත්‍රීතුමියනි, මම කෙළින්ම බලන්නේ ඔබතුමියගේ මුහුණ දිහා. නියෝජ්‍ය කථානායකතුමාගේ මුහුණ දිහාවත් බලන්නේ නැහැ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
එතුමිය දැක්කාම ඔබතුමාට මොකක්ද වන්නේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එතුමිය දැක්කාම මට වෙන දෙය කියන්න බැහැ. පොඩ්ඩක් එළියට ආවොත් මම කියන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයට අදාළ පිළිතුර මෙසේයි.

(අ) (i) 7,735
(ii) 5,932
(iii) 1,803
(iv) 2,156
(v) 2,676

(ආ) ටයර් සහ බැටරි නොමැතිව - 297
වෙනත් විවිධ හේතූන් මත - 929
එකතුව - 1,226

(ඇ) අදාළ නොවේ

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය යොමු කරන්න ඉස්සෙල්ලා ගරු ඇමතිතුමාට කාරුණිකව කියනවා, මගේ මතු පිට පෙනුම නිසාවත්, මම නිසාවත්, මගේ නම නිසාවත් නොවෙයි මේ ප්‍රශ්නයට උත්තර දිය යුත්තේ කියලා. ගරු ඇමතිතුමනි, මම ඉතාමත් වැදගත් ප්‍රශ්නයක් ඇහුවේ. ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට ඔබතුමා මෙතැනට පැමිණීම ගැන මම සතුටට පත් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාවක් විධියට මම එතුමාගේ කථාව දකින්නේ මට කරපු අපහාසයක් හැටියටයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
කිසිම අපහාසයක් නොවෙයි.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මගේ මතු පිට පෙනුම ගැන එතුමා මෙතැනට පැමිණ එවැනි දෙයක් කීම මට කරපු අපහාසයක් හැටියටයි මම දකින්නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කවදාවත් කාන්තාවන්ට අපහාස කරන්නේ නැහැ. ඒක මන්ත්‍රීතුමිය හොඳටම දන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඔක්කෝම කාන්තාවන්ට ආදරෙයි.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ඒක මම දන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, to me, it is a sexist remark.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමියගේ සහ ඔබතුමාගේ පෞද්ගලික දේවල් පාර්ලිමේන්තුවෙන් පිටතදී කථා කරන්න.

දැන් අතුරු ප්‍රශ්නවලට යමු. ගරු මන්ත්‍රීතුමිය, අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා පුවත් පතකට ප්‍රකාශ කර තිබුණා, ලංකා ගමනාගමන මණ්ඩලයට චීන සමාගමකින් ගෙවීමේ ක්‍රමයට තාක්ෂණයෙන් දියුණු බස් ලබා දෙන්න කටයුතු කරනවා, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයත්, භාණ්ඩාගාරයත් සාකච්ඡා කරමින් පවතිනවා කියලා.

[ගරු රෝසි සේනානායක මහත්මිය]

මේ වන කොට ඒ චීන සමාගමෙන් බස් රථ ලබා ගැනීමට කටයුතු කර තිබෙනවාද? ලබා ගෙන තිබෙනවා නම් කොපමණ මුදලක් ඒ සඳහා වැය කර තිබෙනවාද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
චීන සමාගම් තුනක් සහ ඉන්දියානු සමාගම් කිහිපයක් එක්කත් අපි සාකච්ඡා කර තිබෙනවා, රජයේ මුදල් වැය කරන්නේ නැතිව හම්බ කර ගෙවීමේ ක්‍රමයට හෙවත් "Earn and Pay" ක්‍රමයට බස් රථ ලබා ගන්න. ඒකට රජයෙන් ශත පහක්වත් වැය කරන්නේ නැහැ. නමුත් දැන් පෞද්ගලික අංශය, පෞද්ගලික බස් රථ සංගම් විශාල වශයෙන් මේකට විරුද්ධතාවක් පානවා. මේ බස් රථ ගෙනෙන්නේ ඇණිය වැඩි කර ගන්න නොවෙයි. ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය අහලා තිබෙන ප්‍රශ්නයේ තිබෙනවා අවුරුදු 10ක්, 15ක් පරණ බස් කොපමණ තිබෙනවාද කියා.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ලංගම බස් රථවල අඩු පාඩුවක් තිබෙන නිසාම තමයි මා මේ ප්‍රශ්නය ඇහුවේ. මම හිතනවා එකී ගෙවීම් ක්‍රමයට බස් රථ ලබා ගන්න පුළුවන් නම් එය හොඳ ක්‍රියාවලියක් කියලා. ඒ ආකාරයට බස් රථ අරගෙන තිබෙනවාද? ඒ සම්බන්ධ තත්ත්වය මොකක්ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
පෞද්ගලික අංශය දැන් විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙනවා, අලුත් බස් රථ ගෙනෙනවාට. අපි දැන් මේ ගැන සාකච්ඡා කර ගෙන යනවා. තවම නිශ්චිත නිගමනයකට ඇවිල්ලා නැහැ. මේක තවම finalize කර නැහැ. නමුත් අපි කථා කරගෙන යනවා. අපි පෞද්ගලික බස් රථ සංගම් සමහත් සාකච්ඡා කරනවා, මේවා ගෙනාවාට ඒ අයට කිසිම අහේනියක් වන්නේ නැහැ කියන කාරණය පිළිබඳව දැනුවත් කිරීම සඳහා.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා මාධ්‍ය හමුවේ ප්‍රකාශයක් කර තිබුණා-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ඔව්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක දෙවන අතුරු ප්‍රශ්නයයි.

ගරු ඇමතිතුමා මාධ්‍ය ඉදිරියේ ප්‍රකාශයක් කර තිබුණා විශේෂයෙන් ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන්ට භාණ්ඩාගාරය ගෙවිය යුතු රුපියල් 10,100 සැප්තැම්බර් මාසය වන කොට ඒ අයගේ ගිණුම්වලට බැර කරනවා කියලා, ඒක හැම මාසයේම 8වැනි දායින් පස්සේ ගෙවනවා කියලා. මේ වන කොට ඒ ක්‍රියා දාමය සිදු වෙලා තිබෙනවාද? ඒ අයට මේ ගෙවීම කර තිබෙනවාද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
සත්තකින්ම ඔව්. ඒ ක්‍රියාදාමය කරගෙන යනවා. අපි රුපියල් 10,100ක් හැම සේවකයාගේම බැංකු account එකට දානවා. ඒක දැන් දිගටම කර ගෙන ඇවිල්ලා තිබෙනවා.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
සැප්තැම්බර් මාසයේ ඉඳලා පටන් ගත්තා ද ගරු ඇමතිතුමා?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
සැප්තැම්බර් මාසයට ඉස්සෙල්ලා පටන් ගත්තේ. මට හරියටම මාසය දැන් කියන්න බැහැ. අපි ඒක පටන් ගත්තා. හැම මාසයේම ඒ වෙලාවට ඒ රුපියල් 10,100 බැංකු ගිණුමට දානවා.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මාගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය ගරු සජිත් ප්‍රේමදාස මහත්මයා අහනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, හැම මාසයකම ලංකාවේ ඩිපෝවල සේවක පිරිස අර්බුදයකට ලක් වෙනවා. මොකද දුරකථනවලින් අපිට ඉල්ලීම් කරනවා, මේ වැටුප් ලබා දීමේ ප්‍රමාදය ගැන පාර්ලිමේන්තුවේ මතු කරන්න, ඇමතිතුමාගෙන් අහන්න කියලා. තිරසාර අන්දමට හැම මාසයකම නියමිත දිනයට ඒ ඩිපෝවල සේවක මහත්ම මහත්මීන්ට ඒ වැටුප් පියවන්නට යම් කිසි සැලසුම්සහගත ක්‍රියාදාමයක් දියත් කරන්නට ඔබතුමා කටයුතු කරනවාද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒකත් ඉතාම වැදගත් ප්‍රශ්නයක්. මොකද ගරු රෝසි සේනානායක මන්ත්‍රීතුමිය ඇහුවා වාගේ අපි අපේ පැත්තෙන් ඒ සේවකයාගේ ගිණුමට රුපියල් 10,100ක් දානවා. ඉතුරු ටික ඒ ගොල්ලන් හම්බ කර ගන්න ඕනෑ. මොකද මේක බස් ව්‍යාපාරයක් නේ. මේක මුදල් අතට එන ව්‍යාපාරයක්. ණයට කවුරුවත් යන්නේ නැහැ නේ. DS මහත්තයා, ඒ සේවකයෝ ඉතුරු වැටුප හම්බ කර ගන්න ඕනෑ. මේ ගොල්ලන් ඒක හම්බ කර ගන්නේ නැහැ. මොකද private අංශයට සමහර අය තමන්ගේ turn එක විකුණනවා. ඒක ඔබතුමා දන්නවා. සමහර DS මහත්වරු විතරක් නොවෙයි, ඒ බස් එකේ යන රියැදුරු මහත්වරුත්, කොන්දොස්තර මහත්වරුත් තමන්ගේ turn එක private අංශයට දෙනවා.

ප්‍රයිවට් බස් එකට යන්න ඉඩ දීලා තමයි සීටීබී බස් එක යන්නේ. සමහර අය මේ වාගේ වැරදි කරනවා. ඒ ගොල්ලන්ගෙත් යුතුකමක් තිබෙනවා, ඒ ගොල්ලන්ගේ ඉතුරු වැටුප් භාගය හොයා ගන්න. මොකද, ආණ්ඩුවෙන් බස් දීලා තිබෙනවා. ආණ්ඩුවෙන් හැම දේම දෙනවා. එහෙම නම් ඒ ගොල්ලන්ගේ යුතුකමක් තිබෙනවා, මහන්සි වෙලා වැඩ කර ඒ ගොල්ලන්ගේ වැටුප හොයා ගන්න. දැන් මේක කෙරෙන්නේ නැහැ. ඒ ගොල්ලන් බලන්නේ

හැම එකම ආණ්ඩුවෙන් නිකම් ගන්නයි. මම ඒකට එකඟ නැහැ. ඒකයි මම ඉස්සෙල්ලා කිව්වේ, අපි බස් ගෙන්වන කොට රජයෙන් සීටීබී එකට නිකම් බස් දෙන්න නරකයි කියලා. නිකම් බස් දුන්නාම ඒ වැඩ කරන සේවකයෝ වැඩ කරන්නේ නැහැ නේ. අර සමෘද්ධිය හම්බ වෙනවා වාගේ තමයි. සමෘද්ධිය ගන්න එක්කෙනා නිකම් ඉන්නවා. එයා දන්නවා, මාසය අන්තිමට එයාට ගණන එනවායි කියලා. දිවි නැගුමෙන් පස්සේ දැන් ගණන තවත් වැඩි වෙලා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒක හරි. හරි ප්‍රකාශයක් කළේ. ඒක වැදගත්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
සීටීබී එකේ අයත් දැන ගන්න ඕනෑ, මහන්සි වෙලා වැඩ කරන්න; සල්ලි හම්බ කරන්න. මොකද, බස් එකේ යන හැම එක්කෙනාම සල්ලි දීලා ටිකට් එකක් ගන්නවා. බොහෝ තැන්වල ටිකට් එක දෙන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවට එන අයගෙන් අහන්න. ටිකට් එක දෙන්නේ නැහැ, සල්ලි අරගෙන සාක්කුවේ දා ගන්නවා. විරුද්ධ පාර්ශ්වයේ අය හැටියට ඔබතුමන්ලාත් මේ ගැන උනන්දු කරවන්න. සීටීබී බස් රථයෙන් නේ අපි හැමෝම පාසල් ගියේ. කවුරුත් මේ බස් එකේ ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලාත් මේ ගොල්ලන්ව උනන්දු කරවන්න, තමන්ගේ ආදායම හොයා ගන්න කියලා. අඩු ගණනේ ඉතුරු වැටුප් භාගයවත් හොයා ගන්න කියලා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 1-1947/'11-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 2-2320/'12-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රවි කරුණානායක මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)\
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති හයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 187 වත්තේ පැල්පත් : නව නිවාස
### 187ஆம் தோட்ட குடிசைகள் : புதிய வீடுகள்
### SHANTIES IN "187 WATTA": NEW HOUSES

2372/'12

**4. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Dayasiri Jayasekara)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) කොළඹ 07, ටොරින්ටන්හි, 187 වත්තේ පැල්පත් නිවාස හිමි සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නිවාස සඳහා ස්ථිර අයිතිවාසිකම් හෝ බලපත්‍ර ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඔවුන් එම හිමිකම් භුක්ති විඳිමින් සිටින කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිවාස කඩා ඉවත්කිරීමට රජය විසින් යම් තීන්දුවක් ගෙන තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ට එම ස්ථානයේම හෝ වෙනත් ස්ථානයක නව නිවාස ලබා දෙන්නේද;

(iii) වෙනත් ස්ථානයක නව නිවාස ලබා දෙන්නේ නම්, එම ස්ථානය කුමක්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නව නිවාස සංකීර්ණයක් ඉදිකර එම නිවාස මුදල් අය නොකර 187 වත්තේ පදිංචිකරුවන්ට ලබා දීමට යෝජනාවක් ඉදිරිපත් වී තිබුණේද;

(ii) එසේ නම්, එම යෝජනාව මෙතෙක් ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ජෝන් අමරතුංග මහතා]

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு 07, ரொறிங்ரனில் 187ஆம் தோட்டத்தில் குடிசை வீட்டுரிமையாளர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) இவர்களது வீடுகளுக்காக நிரந்தர உரிமை அல்லது உரிமப்பத்திரங்கள் வழங்கப் பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், இவர்கள் மேற்படி உரிமையை அனுபவித்து வருகின்ற கால எல்லை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி வீடுகளை உடைத்து அகற்றுவதற்காக அரசாங்கம் தீர்மானமொன்றை எடுத்துள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், இவர்களுக்கு அதே இடத்தில் அல்லது வேறோர் இடத்தில் புதிய வீடுகள் பெற்றுக்கொடுக்கப்படுமா என்பதையும்;

(iii) வேறோர் இடத்தில் புதிய வீடுகள் பெற்றுக் கொடுக்கப்படுமெனில் அந்த இடம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) புதிய வீடமைப்புத் தொகுதியொன்றை நிர் மாணித்து அந்த வீடுகளைப் பணம் அறவிடாமல் 187ஆம் தோட்டத்தின் குடியிருப்பாளர்களுக்கு பெற்றுக்கொடுப்பதற்கான ஒரு முன்மொழிவு சமர்ப்பிக்கப்பட்டிருந்ததா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி பிரேரணை இதுவரை நடைமுறைப்படுத்தப்படாமைக்கான காரணங்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Will he state -

(i) the number of persons who own shanties in "187 Watta" at Torrington, in Colombo 7;

(ii) whether they have been granted the ownership of those houses or whether they have been given permits for them; and

(iii) if so, the period of time during which they have been enjoying the aforesaid ownership?

(b) Will he also state -

(i) whether any decision has been taken by the Government to demolish the aforesaid houses;

(ii) if so, whether they will be provided with new houses in the same location or elsewhere; and

(iii) if new houses are provided elsewhere, what that new location is?

(c) Will he inform this House -

(i) whether a proposal had been made to construct a new housing complex and provide those houses to the residents of "187 Watta" free of charge; and

(ii) if so, of the reasons for not implementing the aforesaid proposal up to now?

(d) If not, why?

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා හැම දාම පාර්ලිමේන්තු එනවා. අද එතුමා නැවිත් ඉන්නේ ඊයේ සමුළුවේදී විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ජයග්‍රහණය කළ වේදනාවටද දන්නේ නැහැ?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

නැහැ, නැහැ. ඒක අපි බේරා ගන්නම්. තමුන්නාන්සේ කරදර වෙන්න එපා ඒක ගැන. ඒක අපේ වැඩක්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ සමුළුවේදී ජයග්‍රහණය කරලා, අද විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඉතා සතුටින් ඉන්නවා පෙනෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

කවදාත් එහෙමයි හිටියේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

අපි එතුමාට සුබ පතනවා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේ මුහුණ නම් එච්චර හරි නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

එතුමාත් සතුටින් ඉන්නවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

එතුමාගේ මුහුණ එච්චර හරි නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එතුමාත් සතුටින් ඉන්නවා. එතුමා නියෝජ්‍ය නායකයා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පැල්පත් නිවාස හිමි සංඛ්‍යාව 46කි.

(ii) ඔව්. නිවාසලාභීන් 13 දෙනෙකුට ඔප්පු ලබා දී ඇත.

(iii) 1973 වර්ෂයේ සිට

(ආ) (i) සියලු පදිංචිකරුවන් ස්ව කැමැත්තෙන් නිවාසවලින් ඉවත් වී ඇත.

(ii) ඔව්.

(iii) ඔව්. බොරැල්ල බේස්ලයින් මාවත සිංහපුර දෙවන අදියර මහල් නිවාස යෝජනා ක්‍රමයෙනි.

(ඇ) (i) ඔව්. අංක 11/0674/517/016 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට ලත් අනුමැතිය ප්‍රකාරව සිංහපුර 11 අදියර නිවාස යෝජනා ක්‍රමයෙන් 187 වත්තේ පදිංචිකරුවන්ට නොමිලේ නිවාස ලබා දී ඇත.

(ii) යෝජනාව මේ වන විටද ක්‍රියාත්මක වී ඇත.

(ඈ) යෝජනාව ක්‍රියාත්මක වී ඇත.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 5-2961/'12-(1), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අකිල විරාජ් කාරියවසම් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 7-3100/'12-(1), ගරු පී. හැරිසන් මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු පී. හැරිසන් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 8-3135/'12-(1), ගරු වසන්ත අලුවිහාරේ මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු වසන්ත අලුවිහාරේ මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රධාන කටයුතු,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් නීතිඥවරයෙක් හැටියට මම මේ කරුණු ඔබතුමාටත් පෙන්වා දෙන්න කැමැතියි. විශේෂයෙන්ම මේ වන විට ව්‍යවස්ථානුකූලව ඒ වාගේම පවතින ස්ථාවර නියෝගවලට අනුකූලව විශේෂ කාරක සභාවක් පත් කර යම් කිසි ක්‍රියාදාමයක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මම ඔබතුමාගේ-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
It is not a point of Order. You have to raise it at the Party Leaders' Meeting.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
No, it is a point of Order. Mr. Deputy Speaker -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I am very sorry. Matters pertaining to the Select Committee will have to be raised at the Party Leaders' Meeting.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රධාන කටයුතු, විසර්ජන පනත් කෙටුම්පත 2013 - කාරක සභා අවස්ථාව. [බාධා කිරීමක්]

## විසර්ජන පනත් කෙටුම්පත, 2013
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2013
## APPROPRIATION BILL, 2013

***කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: නොවැම්බර් 30]***
***[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி : நவம்பர் 30 ]*
[பிரதிச் சபாநாயகர் *அவர்கள் தலைமை வகித்தார்கள்*]

*Considered further in Committee* - [*Progress: 30th November*]
[MR. DEPUTY SPEAKER *in the Chair*.]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Mr. Chairman, I am on a point of Order.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
What is the point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I am respectfully requesting you to give my assertion a hearing. Then, you can either accept it or reject it.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Hon. Member, matters pertaining to Committees appointed by Parliament cannot be taken up under Standing Orders. That is very clear. So, please do not -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I am speaking about a Standing Order. මම ඔබතුමාට කරුණු විදහා දක්වන්නේ ස්ථාවර නියෝගයක් පිළිබඳවයි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඒ ස්ථාවර නියෝගය මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ස්ථාවර නියෝග 78අ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක්-

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
You cannot cast aspersions or explain the validity of such.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
No, I am not questioning the validity.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
So?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, you are not giving me a hearing.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
You cannot raise a point of Order under Standing Order No. 78A. That pertains to something else.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභාපතිතුමනි, ඔබතුමා නීතිඥවරයකු හැටියට ස්වාභාවික නීතියේ මූලධර්ම පිළිගන්නවානේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
I am very sorry, Hon. Member, you cannot question the Chair and I am turning down that request. ස්ථාවර නියෝග හෝ කමිටුවක් සම්බන්ධව ඔබතුමාට යම් කිසි ප්‍රශ්නයක් තිබේ

නම් පක්ෂ නායක රැස්වීමේදී ඒ පිළිබඳව ගරු කථානායකතුමා දැනුවත් කිරීමෙන් අනතුරුව සාකච්ඡා කර තීරණයකට පැමිණිය හැකිය.පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයක් තිබෙනවා; පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග තිබෙනවා. ඒ අනුව කටයුතු කිරීමට අපි බැඳී සිටිනවා. [බාධා කිරීමක්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

පළමුවැනි උපලේඛනය, ශීර්ෂ අංක 166, 152, 282, 160 සහ 283 සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 6.00 දක්වා.

**166 වන ශීර්ෂය.- ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 116,000,000

**தலைப்பு 166.- நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 116,000,000

HEAD 166. - MINISTER OF WATER SUPPLY AND DRAINAGE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 116,000,000

**152 වන ශීර්ෂය.- වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 108,770,000

**தலைப்பு 152.- நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 108,770,000

HEAD 152. - MINISTER OF IRRIGATION AND WATER RESOURCES MANAGEMENT

Programme 1.- Operational Activities - Recurrent Expenditure, Rs. 108,770,000

**160 වන ශීර්ෂය.- පරිසර අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 186,930,000

**தலைப்பு 160.- சுற்றாடல் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 186,930,000

HEAD 160.- MINISTER OF ENVIRONMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 186,930,000

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

විවාදය ආරම්භ කරන්නේ ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා.

[පූ.භා. 9.57]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු සභාපතිතුමනි, "2013 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේදී අද දින -2012.12.03 වැනි සඳුදා- සාකච්ඡා කරන අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 166, 152, 282, 160 සහ 283 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩ සටහන්හි සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, ඉතාම වැදගත් අමාත්‍යාංශ කිහිපයක් වන ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේත්, පරිසර අමාත්‍යාංශයේත්, වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ විවාදයයි අද තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මා මේ අවස්ථාවේදී විශේෂයෙන් අපේ ගරු වෙල්ගම අමාත්‍යතුමාට මගේ සතුට ප්‍රකාශ කරනවා; ස්තුතිය ප්‍රකාශ කරනවා. කට බොරු කිව්වත් දිව බොරු කියන්නේ නැහැ වාගේ එතුමා එකක් හරියට කිව්වා. ඒ මොකක්ද? "සමෘද්ධියෙන් කළේත් බොරුව; 'නිකම්මු' බෝ කරන එක." කියලා එතුමා කිව්වා. ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමනි, "සමෘද්ධියෙන් 'නිකම්මු' බෝ කළාය" කිව්වා. දැන් දිවි නැඟුමෙන් කරන්නේත් ඒ ටිකමයි කිව්වා. මේක මා නොවෙයි කියන්නේ, ගරු වෙල්ගම අමාත්‍යතුමා. ගරු රෝසි සේනානායක මැතිනියගේ ප්‍රශ්නයකට උත්තර දෙද්දී තමයි ගරු වෙල්ගම අමාත්‍යතුමා එහෙම කිව්වේ. "නිකම්මු" බෝකරන ප්‍රතිපත්තියක්ද, රවට්ටන ප්‍රතිපත්තියක්ද දැන් අප ගෙන යන්නේ, එහෙම නැති නම් සමාජය දියුණුවන, සමාජය නැඟිටුවන වැඩ පිළිවෙළක්ද, සමාජයේ පුරවැසියාට අත දෙන ප්‍රතිපත්තියක්ද අප ගෙන යන්නේ කියා මා අහනවා. ඒ ප්‍රතිපත්තිය නොවෙයි, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය මේකයි. කියනමක් තිබෙනවා, "මිනිහෙකුට මාළුවෙක් නොවෙයි දෙන්න ඕනෑ, මාළුවෙක් අල්ලා ගන්න බිලි පිත්තක් දෙන්න ඕනෑ" කියලා. ඒක චීන කියමනක්. අද චීනයෙන් ඉගෙන ගන්නේ නැති එකයි වරද වෙලා තිබෙන්නේ. චීනය, බිලි පිත්ත දීලා මාළුවෙක් අල්ලාපන් කියනවා. ඒ සඳහා අවශ්‍ය ආම්පන්න දෙනවා. අන්න සමාජය නැඟිටුවන ක්‍රමය! මා ඊට වඩා ඒ ගැන කථා කරන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, ජල සම්පාදන හා ජලාපවහන, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ සහ පරිසර කියන අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී, මේ අමාත්‍යාංශ අපේ ජීවයත් එක්ක බැඳී තිබෙන අමාත්‍යාංශ බව කියන්න ඕනෑ. ජලයත් එහෙමයි. පරිසරයත් එහෙමයි. ඒ දෙකෙන් තමයි මිනිසාගේ අනාගත පැවැත්ම හෝ නැතිවීම තිබෙන්නේ. මේ ලංකාව කියන පින්වත් භූමියේ ඉපදෙන්නත් පින් කර තිබෙන්න ඕනෑ. මේ රට අවුරුදු පන්දහසක් කල් සම්බුද්ධ ශාසනය පවතින රට. බුදුරජාණන් වහන්සේ ඉපදුන, බුද්ධත්වයට පත් වුණු, පිරිනිවන් පෑ දඹදිව නොවෙයි, බුද්ධ ශාසනය පවතින්නේ. මේ අපේ ශ්‍රී ලංකා ද්වීපයේයි බුද්ධ ශාසනය පවතින්නේ.

ඒ විතරක් නොවෙයි. ලෝකයේ කිසිම රටක නැති දෙයක් මේ කුඩා දූපතේ තිබෙනවා. ඉතිහාසයේ සිට හැම දෙනාම අපේ රටට කියනවා,"වැව් බැඳි රාජ්‍යය" කියලා. මේ වැව් බැඳි රාජ්‍ය කියන වචනය ආවේ කොහොමද? ඒක අවුරුදු දහස් ගණනක ඉඳලා එන වචනයක්. මේ කුඩා දූපතේ තිබෙන වැව් ගණනාවකින් අපට ජලය ලැබෙනවා. අපේ පරාක්‍රමබාහු රජතුමාගේ ප්‍රකාශය තමයි, "අහසින් වැටෙන එක ජල බිංදුවක්වත් ප්‍රයෝජනයට නොගෙන

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

මුහුදට යෑමට ඉඩ නොතැබිය යුතුය" කියන එක. ඒ ජලය පොළොවේ, වායු ගෝලයේ, මිනිසාගේ, ගහ කොළවල, සතා සීපාවාගේ යහපත සඳහා රඳවා තබා ගත යුතුය, තැන්පත් කළ යුතුය කියන එතුමාගේ වදන අනුව එදා කටයුතු සිද්ධ වුණා; ක්‍රියාත්මක වුණා.

විජය රජු පුත්තලමේ තම්බපන්නියට ගොඩ බැස්සාට, වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬා වැවෙන් තමයි -මගේ මිත්‍ර අනුර යාපා පරිසර ඇමතිතුමාත් දන්න- මේ වාරි සහ කෘෂි සංස්කෘතියේ ආරම්භයක් ඇති වෙලා තිබෙන්නේ. ඒ මිස වෙන කොහෙන්වත් නොවෙයි.

ගරු සභාපතිතුමනි, අද මම ඉතිහාසය යුග කිහිපයකට වර්ග කරනවා. මොනවාද ඒ? අපි දැක්කා, රාජ්‍ය යුගය කියන යුගය, අවුරුදු 400කට පමණ එහා තිබුණා. අවුරුදු දෙදහස්, තුන්දහස් ගණනක සිට තිබුණ රාජ්‍ය යුගයේ තමයි අපේ වාරි සහ කෘෂි කියන සංස්කෘතිය බිහි වුණේ. එදා ගම, පන්සල, වැව සහ දාගැබ කියන සංකල්පය බිහි වුණා. මේ ආගමික ආභාසය තුළින් සදාචාරයෙන් සංවරකමෙන් අපේ සමාජය පෝෂණය වෙලා ගහ කොළ, සතා සිවුපාවා, වායුගෝලය සමඟ සම්බන්ධ වුණා. අපට කිරි ටික දුන්න, ගොම ටික දුන්න කිරි අම්මා මස් බවට පත් කර කන්න පටන් ගත්තේ විදේශ ආක්‍රමණයත් එක්කයි. මස් කන්න පටන් ගත්තා වාගේම මත්පැන් බොන්න පටන් ගත්තේත් විදේශ ආක්‍රමණයත් එක්කයි. ඒ පළමුවෙනි යුගය.

මම දෙවෙනි යුගය වශයෙන් සඳහන් කරන්නේ, බ්‍රිතාන්‍ය, ලන්දේසි සහ පෘතුගීසි ආධිපත්‍යයෙන් පසුව ඇති වුණ ඩී.එස්. සේනානායක යුගයයි. එතුමා, -1932 දී ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයත් සමඟ- කෘෂිකර්ම හා ඉඩම් ඇමති වෙලා, අවුරුදු 600ක් 700ක් තිස්සේ විදේශ ආක්‍රමණ නිසා වල් බිහි වෙලා, විනාශ වෙලා, පුරන් වෙලා තිබුණු මින්නේරිය, පරාක්‍රම සමුද්‍රය, ගිරිතලේ, දැදුරු ඔය වැනි ජලාශ ප්‍රතිසංස්කරණය කළා. සුදු ජාතිකයාගේ පාලනයෙන් පසුව ඒ උත්තමයා අනාගතය දිහා බලලා තමයි ඒ කටයුතු කළේ. ඒ යුගය එක යුගයක්.

එතුමා ජනපද ඇති කර ඒවායේ මිනිසුන් පදිංචි කරවද්දී එදා සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය කිව්වේ මොකක්ද? එන්.එම්. පෙරේරලා කිව්වේ මොකක්ද? ඒ ජනපදවල කාක්කෝ වාගේ මැලේරියා මදුරුවෝ ඉන්නවාය කිව්වා. ඒවායේ සිංහල මිනිසුන්ව පදිංචි කරවලා සිංහල ජාතිය විනාශ කරනවාය කිව්වා. කඳු රට කළා වාගේ දකුණු ඉන්දියාවෙන් දෙමළ මිනිසුන් ගෙනැල්ලා, ඒවායේ පදිංචි කරවන්නේ නැත්තේ ඇයි කියලා ඇහැව්වා. අනේ දෙවියනේ! අපි ඒ ටික කළා නම්, -නිමල් සිරිපාල ඇමතිතුමා ඔළුව වනනවා- අද මේ රට දෙමළ රාජ්‍යයක් නේද? මම එහෙම කියන්නේ දෙමළ ජනතාවට අපහාස කිරීමේ අදහසින් නොවෙයි. ඉන්දියාවේ දෙමළ ජනතාව කියන්නේ අපේ ලේ උරුමය තිබෙන කොටසක්. අපි ඉන්දියාවෙන් රැජිණියන් ගෙනාවා. ලේවල ප්‍රශ්නයක් ගැන නොවෙයි මම මේ කියන්නේ. මම එතුමාට අපහාස කරනවා නොවෙයි. මම සිංහල, දෙමළ, මුස්ලිම් කියන ජාතීන් ඔක්කොටම ගරු කරන කෙනෙක්.

අනාගතය දෙස බලා නොසෙල්වී කටයුතු කළ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමාගේ යුගය; ජනපද බිහි කළ ඒ උත්තමයාගේ යුගය දෙවන යුගයයි. මම දකින තුන්වන යුගය මොකක්ද? ඩඩ්ලි සේනානායක, ජේ.ආර්. ජයවර්ධන යුගයයි. ඩඩ්ලි සේනානායක මැතිතුමා අවුරුදු 32ක් සැලසුම් හදලා පස් වතාවක් අගමැති වුණු මහා ශ්‍රේෂ්ඨ නායකයෙක්; ආදර්ශවත් නායකයෙක්.

එදා පොල්ගොල්ලේ වාරි යෝජනා ක්‍රමයට මුල් ගල තැබුව වෙලාවේ මැතිවරණයක් ආවා. මොකද වුණේ? හඳෙන් හරි හාල් සේරු දෙකක් ගෙනැවිත් දෙනවාය කියා ඡන්ද දායකයා රැවැට්ටුවා. පොල්ගොල්ලේ මුල් ගල තියලා ආරම්භ කළ වැඩ කටයුතු නැවතුණා. එතැනින් කලා ඔයට එනතුරු වතුර නැවතුණා. ඊට පසු අවුරුදු 7ක්ම වල් බිහි වුණු මහවැලියක පොත් ටික විතරයි තිබුණේ. මෛත්‍රීපාල සේනානායක මැතිතුමාට මම ගරු කරනවා.

ජේ.ආර්. ජයවර්ධන කියන්නේ දක්ෂ නායකයෙක්. ගරු සභාපතිතුමනි, අපි මේ කාරණය මතක තියා ගන්න ඕනෑ. කථා කිරීමේ දක්ෂකම කාටත් තිබෙනවා. ඊටත් වඩා දක්ෂකම කියන්නේ කථා කර කියන දේ ක්‍රියාත්මක කරන එකයි. ඊටත් වඩා අවශ්‍ය වන්නේ මොකක්ද? මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා කිව්වා, තමන්ට දර්ශනයක් තිබෙන්න ඕනෑ කියලා. තමාව නායක තනතුරකට පත් කළා නම්, -දේශපාලකයෙක් වෙන්න පුළුවන්. නිලධාරියෙක් වෙන්න පුළුවන්. පුරවැසියෙක් වෙන්න පුළුවන්. පෞද්ගලික අංශයේ කෙනෙක් වෙන්න පුළුවන්.- ඒ පත් කළ නායකයා කියන පුද්ගලයා ඉදිරිය බලලා අනාගතය දෙස බලලා කටයුතු කරන්න ඕනෑ. අවුරුදු සියයක් දෙසියයක් පන්සියයක් ඉදිරිය බලලා මේ සමාජයේ මුතුන් මිත්තෝ, රජවරු, මහා අමාත්‍යවරු කටයුතු කළා; වැව් හැදුවා. ආර්ථිකය දියුණු කර සදාචාරසම්පන්න සමාජයක් බිහි කළා.

පළමුවන යුගය මහාමාන්‍යවරු රජයන යුගය, දෙවන යුගය ඩී.එස්. සේනානායක යුගය; වාරි යුගය. තුන්වන යුගය තමයි මහා ශ්‍රේෂ්ඨ යුගය; ජේ.ආර්. ජයවර්ධන, ඩඩ්ලි සේනානායක යුගය. ඒ යුගයේ තමයි ඩඩ්ලි සේනානායක මැතිතුමා ආරම්භ කළ යෝජනා ක්‍රම අවුරුදු හතක් වල් බිහි වුණේ. 1977 දී අපි පාලන බලයට එද්දී හාල් පොලු, මිරිස් පොලු තිබිලා අඳින්න රෙදි කැල්ලක් නැතුව ආර්ථිකය විනාශ වෙලා තිබුණේ. මට මතකයි ඒ කාලය. භාණ්ඩාගාරය කියනවා, Ceylon Tobacco Company එකට ගිහින් හවස එක්කාසු වන සල්ලි ටික අරගෙන ඇවිත් පඩි නඩි ටික ගෙවලා තමයි එදා රට ගෙන ගියේ කියා. කන්න තිබුණේ නැහැ.

ඒ යුගයේ 1977 දී අපි හයෙන් පහක පාලන බලය ගත්තා. අපි කෙඳිරි ගෑවේ නැහැ; අපි ඇඬුවේ නැහැ. ජේ.ආර්. ජයවර්ධන උත්තමයා ඒ අභියෝගය භාර අරගෙන ලෝකයට දොර ඇරියා. එදා රජයේ සේවකයෙකුට ශිෂ්‍යත්වයකට පිට රට යන්න බැහැ; ඉගෙන ගන්න යන්න බැහැ; විදේශ විනිමය දෙන්නේ නැහැ; මැද පෙරදිග ගිහින් රක්ෂාවක් කරන්න කෙනකුට ඉඩ දුන්නේ නැහැ. අපි ලෝකයට දොර ඇරියා. ඒ එක පැත්තක්. ඒ තුළින් දේශීය ආයෝජකයා නැඟිට්ටා.

තුන්වනුව එතුමා අනාගතය දිහා බලලා කෘෂිකර්මාන්තය සඳහා ජලය සහ වාරි ක්ෂේත්‍රයන්ට මුල් තැන දෙන්න ඕනෑ කියලා කළේ මොකක්ද? මේ ජනාධිපතිතුමා තරුණ ගාමිණී දිසානායක මැතිතුමා එක්ක ජාවත්ත පාරේ තිබුණ මහවැලි කාර්යාලයට ගිහිල්ලා වික්ටෝරියා, රන්දෙණිගල, කොත්මලේ වැනි මහා ජලාශ හදන්න සැලසුම් හැදුවා. නමුත් සල්ලි නැහැ. ඒ කාලයේ අපට විදුලිය තිබුණේ නැහැ. ඒ ජලාශවල ජල විදුලිබලාගාර ඇති කළා. ඒ ජලාශවලින් උතුරු නැඟෙනහිර පළාත්වලට ජලය ලබා දීලා ඒ පළාත්වල ජනපද බිහි කිරීම සඳහා අවුරුදු 32 සැලසුම ක්‍රියාත්මක කළා. බලන්න, ඒ උත්තමයා භාණ්ඩාගාරයෙන් ශතයක්වත් ගත්තේ නැහැ. ඒකයි නොසෙල්වුණ නායකත්වය කියන්නේ. "චේතනා හං භික්ඛවේ කම්මං වදාමි" චේතනාව පිරිසිදුයි. අවංකයි. එතුමා ගාමිණී දිසානායක මැතිතුමාට කිව්වා "මේකට මම අවුරුදු අටයි දෙන්නේ. මගේ ජීවිත කාලය තුළ මේ කටයුතු අවසාන වෙන්න ඕනෑ." කියලා. අවුරුදු අටෙන් ඒ කටයුතු අවසන් කලා. ඒ අභියෝගය ගැන තමුන්නාන්සේලා කාටවත් කථා කරන්න බැහැ.

පී. දයාරත්න මැතිතුමා විදුලිබල ඇමති වෙලා හිටියා. දැන් එතුමා ඉන්නේ තමුන්නාන්සේලා ළඟ. විදුලිය ඉතිරි කිරීමෙන්, තෙල්වලට, ඉන්ධනවලට යන මුදල් ඉතිරි කිරීමෙන් ඒ ගත්ත මුළු ණය මුදල අවුරුදු 10න් අපි එදා ගෙව්වා. පොළොන්නරුව, පුත්තලම පැත්ත දක්වා ඇවිල්ලා ව්‍යාප්ත වුණු ප්‍රභාකරන්ගේ රාජ්‍ය නැති කළේ ජේ.ආර්. ජයවර්ධන මහා උත්තමයායි. ගාමිණී දිසානායක මැතිතුමා මේ උත්තම නිලධාරින් එක්ක ඉලක්කයට වැඩ කළා. "Target into Vision - Vision into Mission" කියලා ඒවා ක්‍රියාත්මක කළා. ඒ ඊළඟ යුගය.

2001 දී අද තමුන්නාන්සේලා එක්ක ඉන්න එස්.බී. දිසානායකලා, ජී.එල්. පීරිස්ලා අපත් එක්ක ඇවිල්ලා සාම ගිවිසුමක් අත්සන් කළා. අද තමුන්නාන්සේලාත් එක්ක ඉන්න නැඟෙනහිර පළාතේ විනායගමූර්ති මුරලිදරන්ලා සාම සාකච්ඡා කරමින් ඉන්න කොට නැඟෙනහිර පළාත ප්‍රභාකරන්ගෙන් කඩලා ගත්තා.

ඊළඟට අපේ තිබුණ ඉලක්කය මොකක්ද? ප්‍රභාකරන් භය වුණා. ප්‍රභාකරන් භය වුණේ මොකටද? රනිල් කියන්නේ කපටි ඔළුවක්. භයානකයි. මේ පළාත් සංවර්ධනය තුළින් අහිංසක දෙමළ ජනතාව, මුස්ලිම් ජනතාව, සිංහල ජනතාව ප්‍රභාකරන්ගෙන් බේරා ගත්තා. නැඟෙනෙහිර පළාත නිදහස් කර ගත්තා. එදා මෙතුමන්ලා ඔක්කොම ආවා.

දෙවන අදියර මොකක්ද? ප්‍රභාකරන් දන්නවා, එක්සත් ජාතික පක්ෂය බලයට ආවා නම්, රනිල් මැතිතුමා ජනාධිපති වුණා නම් උතුරු පළාතේ ප්‍රභාකරන්ගේ බලකොටුව විනාශ කර අවිහිංසාවාදය තුළින් යුද්ධය ජයගෙන රට සංවර්ධනය කරනවා කියලා. ඒ නිසයි මංගල සමරවීර මැතිතුමායි, අලස් කියන එක්කෙනායි, මැරුණු අපේ සූරියආරච්චි මැතිතුමායි ප්‍රකාශ කළේ, ඡන්දයට පැය 48කට කලින් ගිහිල්ලා කෝටි ගණනක් ප්‍රභාකරන්ට දුන්නා කියලා. කවුද දුන්නේ? මොකටද දුන්නේ? රනිල් පරාජය කරන්න. අන්න එතැනින් පස්සේ වුණු දේ ගැන මා කියන්නේ නැහැ. යුද්ධය දිනපු එක බොහොම හොඳයි. අපි ගියේ අවිහිංසාවාදය තුළින් යුද්ධය දිනන්න.

අපි ව්‍යාපෘති හැදුවා. වාරිමාර්ග ඇමති විධියට මගෙනුත් සැලසුම් ඉල්ලුවා. මාදුරු ඔය, උමා ඔය, දැදුරු ඔය, වෙහෙරගල ජලාශය මේ ඔක්කෝම දාලා මම සැලසුම් දුන්නා, ව්‍යාපෘති 62කට. සියයට එකකටත් අඩු පොලියකට දීර්ඝ කාලීන ණය ලැබුණේ. සියයට 7, 8 පොලියට චීනයෙන් ණය ගන්නවා වාගේ නොවෙයි.

චන්ද්‍රිකා මැතිනිය කියන්නේ මොකක්ද? ජනාධිපති විධියට මම විමල් වීරවංශගේ ලණු කාලා එක්සත් ජාතික පක්ෂ රජය විසුරුවා හැරපු එක මේ රටට කරපු අපරාධයක්, පවක් කියලා. විසුරුවා හැරියේ ඊර්ෂ්‍යාවෙන්. චන්ද්‍රිකාටත් මගේ අනුකම්පාවක් නැහැ, සරත් සිල්වාට වාගේම. ඇයි, එයාට අනුකම්පා කරන්නේ? මේ රට කෑවා. රටේ සංවර්ධනයට මොනවාද කළේ? අපේ කෙනෙක් එහෙම කළා නම් ඔහුටත් මම ඒ ටිකයි කියන්නේ.

මම දේශපාලන අන්ධ භක්තිකයෙක් නොවෙයි, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි. මම දෙවතාවක් පාර්ලිමේන්තුවෙන් ඉල්ලා අස් වුණු කෙනෙක් කියා දන්නවානේ. මම 1988 ඉඳලා වයඹ පළාත් සභාවේ කටයුතු කරලා පෙන්නුවා. 1989 දන්නවානේ, තුවක්කු බෝම්බ අරගෙන ඇවිල්ලා මට වෙඩි තියන්න හදපු හැටි. ගරු සභාපතිතුමනි, ඡන්දය දමන්න යන්න ලෑස්ති වෙද්දී, පාන්දර 5.00ට දිවංගත ගරු සරත්චන්ද්‍ර රාජකරුණා මැතිතුමාගේ භාර්යාව -මැතිනිය- මට call එකක් දීලා කිව්වා, "අනේ මල්ලියේ ඡන්දය දමන්න යන්න එපා." කියලා. මම ඇහුවා, "මොකද අක්කේ එහෙම කියන්නේ?" කියලා. මම කියන්නේ අසත්‍යය නම් අහන්න. එතුමියත් නාවල ඉන්නේ. නාවල නිහාල් කියන පුද්ගලයා ඇතුළු කණ්ඩායමට කොන්ත්‍රාත් එක දීලා. ඡන්ද මධ්‍යස්ථානයට එහා පැත්තේ කනත්ත තිබෙන ප්‍රදේශයේ කැලේ ඉඳලා මාව මරන්න ඉන්නවා කියලා ඊ කෙනෙක් ඇවිල්ලා කිව්වාලු. ඔහුව හඳුනන්නෙත් නැතිලු. ඒ ආපු කෙනා කිව්වලු, "අනේ මැතිනිය මේක ගැන කාටවත් කියන්න එපා. කියන්න කෙනෙක් නැති නිසයි ඔබතුමියට කියන්නේ. ඇමතිතුමාට පණිවිඩය දෙන්න. එතුමා රත්තරං මිනිහෙක්" කියලා. චන්ද්‍රිකා හැදුවා මගේ ආරක්ෂාවට හිටපු STF නිලධාරින් එළවන්න, Director, CID එවලා. කාටවත් මාව මරන්න බැහැ, ගරු ඇමතිතුමනි. මම ධර්මය තුළ ජීවත් වන කෙනෙක්. මතක තියා ගන්න. පුළුවන් නම් කරන්න. ඒ ආපු කෙනාටම කැරකේවි වෙඩි උණ්ඩය. එදා මාව මරන්න ඒ පිරිස එව්වේ කවුද කියලා මම දන්නවා. නමුත් මම කියන්නේ නැහැ. ඉදිරියේදී මගේ පොතක නම සඳහන් කරනවා, සාක්ෂි ඔක්කෝම ඇතුළත්ව. මේවා ජීවිතයට භයෙන් කරන කථා නොවෙයි. රටක අනාගතය දිහා බලලයි මා මේ කථා කරන්නේ.

ගරු සභාපතිතුමනි, වාරිමාර්ග හා මහවැලිය කියන්නේ අපේ හදවත. ඒ අංශය තමයි ගරු ඇමතිතුමනි, ඔබතුමාට තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, අහන්න තමුන්නාන්සේගේ නිලධාරින්ගෙන්, මම වාරිමාර්ග ඇමති විධියට කටයුතු කළ කාලයේ මේ අංශයේ හොඳ විනයක් ඇති කෙරුවා. හරියටම උදේ දහයහමාර වෙද්දි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේත්, මහවැලි අමාත්‍යාංශයේත් මහා ජලාශවල, මධ්‍යම ජලාශවල report එක එනවා මගේ මේසය උඩට. ඒ වාර්තාවේ තිබෙන්නේ මොනවාද? දැනට තිබෙන ජල ප්‍රමාණය, නිකුත් කළ ජල ප්‍රමාණය, -මොනවාටද ජලය නිකුත් කළේ, විදුලියටද, වාරි කටයුතු සඳහාද- වැස්ස ආවා නම් එයින් ආපු ජල ප්‍රමාණය, ඉතිරි වන ජල ප්‍රමාණය පිළිබඳ විස්තරය. හැම දාම උදේට මම ඒ වාර්තාව බලනවා. මම නිලධාරින්ට දුරකථනයෙන් කථා කරලා අහනවා, "මේ මේ දේවල්වලට මෙහෙම වුණේ මොකද?" කියලා. ඒ විනය අනුගමනය කරන්න.

ඔබතුමා නිලධාරින්ට බණින්න එපා. ඔබතුමා ඊයේ පෙරේදා ගොවීන්ට බැණලා තිබුණා. මම ඒකට එකඟ නැහැ. මම මේ උගන්වන්නේ අපි ජනතාවගෙන් වැඩ ගන්න හැටි. නිලධාරින්ගෙන් වැඩ ගන්න දැන ගන්න. කවුරුවත් විවේචනය කරන්න එපා. කාටවත් අපහාස කරන්න එපා. මගේ අසූචි ටික අයින් කරගෙන වැඩ කරන්න මම දැන ගන්න ඕනෑ. එහෙම නැත්නම් මම ඒ ඇමතිකමට සුදුසු නැහැ. නිලධාරින් මට එහෙම එව්වා ඒ වාර්තාව. ගරු වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමාගෙන් මම අහනවා අද ඒ නිලධාරින් එහෙම වාර්තා එවනවාද කියලා. කරුණාකරලා ඔබතුමා ඒවා ගෙන්වා ගන්න.

ගරු සභාපතිතුමනි, මට මේ වාගේ අභියෝගයක් ආවා. මම මේ නිලධාරින්ට හරි ගරු කරනවා. කිරි වෙහෙරේ නායක හාමුදුරුවෝ බණ්ඩාරනායකලාගේ කාලයේ සිට කියපු දෙයක් තමයි මැණික් ගඟ හරහා කුඩාගල්අමුණ හදලා වතුර ටික දෙන්න කියලා.

හැබැයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා විපක්ෂයේ ඉන්දෙද්දි කිරි වෙහෙරට ගිය වෙලාවක නායක හාමුදුරුවන්ට කියා තිබෙනවා මම බලයට ආවොත් මේ කටයුත්ත කරනවා කියලා. එතුමා බලයට ඇවිල්ලා හරියටම සතියයි, ආණ්ඩු පක්ෂයේ ඔබතුමා ඔය වාඩි වෙලා ඉන්න පේළියේම වම් අත පැත්තට වෙන්න තිබෙන තැනක ඉඳගෙන මට කිව්වා, "ජයවික්‍රම, මම පොරොන්දුවක් වුණා" කියලා. මම ඇහුවා, "ඒ මොකක්ද?" කියලා. " මම අගමැති වුණාම මැණික් ගඟ හරහා බැම්මක් බඳින්න පොරොන්දු වුණා" කියලා කිව්වා. මම කිව්වා "සර්, මම එහෙන් තමයි පටන් ගන්නේ" කියලා. මම රුහුණුපුරය හදනවා කිව්වා. සුදු ජාතිකයන් විනාශ

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

කරපු ආර්ථිකය, වැව් රාජ්‍යය, ඌව වෙල්ලස්ස මම හදනවා කිව්වා. ඒ නිසා මම කතරගම දෙවියන්ට බාරයක් වෙලා ඒක කරනවා කියලා කිව්වා. මගේ ලොකු භක්තියක් තිබෙනවා. එහෙම ගිහිල්ලා වැඩ ආරම්භ කරන්න හදන කොට ඔන්න පරිසරකාරයෝ නඩුවක් දැම්මා. මේක යාල භූමියට අයිති නැහැ කියලා තීන්දුව එන්න හරියට අවුරුද්දක් ගියා. අපේ නායකතුමා අගමැති හැටියට හරියටම පොසොන් පෝය දා කතරගමට ආවා. එතුමා කතරගම දේවාලයට ගිහින් ඉවර වෙලා නායක හාමුදුරුවෝ එක්ක කිරි වෙහෙරට ආවා. එදා මම උඩවලවේ ගොවීන් එක්ක අලුත් සහල් මංගල්‍යයට සහභාගි වෙමින් වුණු වෙලාව. කිරි වෙහෙරේ නායක හාමුදුරුවෝ මගෙන් ඇහුවා-මම බොරු කියනවා නම් ගිහින් අහන්න- "ඇමතිතුමනි, කවදාද මෙහි වැඩ ආරම්භ කරන්නේ, අවසන් වෙන්න කොච්චර කල් යයිද?" කියලා. අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා කිව්වා, "හාමුදුරුවනේ, මේ කටයුත්තට කෝටි එකසිය ගණනක් යනවා. මැණික් ගඟ හරහා අඩි දෙසිය ගණනක බැම්මක් බැඳලා, අඩි 40ක් පොළොව කැණලා, කිලෝමීටර් 16ක් ගෙනියලා වැව් 16ක් හැදීමේ කාර්යයට අවුරුදු එකහමාරක් දෙකක් යයි" කියලා.

ගරු සභාපතිතුමනි, මට කතරගම දෙවියෝ කියෙව්වා වාගේ මම කිව්වා, "නැහැ මම තුන් මාසයෙන් මේක කරනවා" කියලා. මගේ දිහා අමුතු විධියට - sarcastic විධියට- බලලා කිව්වා, "Okay, we will see" කියලා. I took up that challenge. I called my Secretary and said, "I am coming tomorrow morning. Get all the officers of the Department of Irrigation and Mahaweli Authority summoned". මාස තුනෙන් හැදුවා. ඒ රත්තරන් නිලධාරින් රෑ, දවල් වැඩ කර ඔය කියන බැම්ම හදලා වියළි භූමිය තෙත් භූමියක් කළා. හරියටම සැප්තැම්බර් 10වැනි දා එවකට අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒක විවෘත කෙරුවා.

ගරු ඇමතිතුමනි, මෙන්න මේක තමයි අපේ නිලධාරින්ගේ තිබෙන දක්ෂකම. ඔවුන්ගෙන් වැඩ ගන්න අපි ඉගෙන ගන්න ඕනෑ. ඉලක්කයක් දුන්නොත් ඒ අය වැඩ කරන්න සූදානම්. හොඳ ලේකම්වරයෙක් ඉන්නවා. මම එතුමා ගැන දන්නවා. එතුමා හරි දක්ෂයි. මම කළ ටිකම මේ අයට දෙන්න. ඇයි, ඒවා වහගෙන ඉන්නේ? ඇයි, ඔබතුමා ඒවා දෙන්නේ නැත්තේ? ඇමතිවරු කියන්නේ වැඩ වැඩියි කියලායි. මම මේ කථා කරන්නේ එහෙම එකක් නොවෙයි. ගරු සභාපතිතුමනි, එදා කෝටි එකසිය ගණනක් යනවාය කියපු ව්‍යාපෘතිය මම කෝටි 58ක් වියදම් කරලා මාස තුනෙන් අවසන් කළා. I completed the project with Rs. 580 million. The then Prime Minister asked me, "Jayawickrama, what are you going to do with the balance? I said, "Give me the money, I will start Weheragala". He said, "No, I want to send these officers abroad for what they have done. I must show my respect for these dedicated officers". That was the answer he gave. They were like that.

ඒ වුණාට එවැනි ව්‍යාපෘතියක් සඳහා ඔබතුමන්ලා ඇස්තමේන්තු කළ මුදල් ඉතුරු කරනවාද කියලා බලන්න. ඔබතුමන්ලා ඇස්තමේන්තු කරන මුදලට වඩා දහ ගුණයක් වැඩියෙන් වියදම් කරනවා. මාඔය හරහා කොටදෙණිය පල්ලේගම පාලම හැදුවා. ඒ ගැන බැසිල් ඇමතිතුමාත් දන්නවා ඇති. අද ඒ මතින් කන්ටේනර් පවා යනවා. ඒ සඳහා මාස තුනක කාලයකුයි ගත වුණේ. කාන්තාවන් රෑ, දවල් කෑම ඉව්වා. ලක්ෂ 38යි ආණ්ඩුවට වියදම් වුණේ. ජනතා සහභාගීත්වයෙන් ඒ වැඩේ කෙරුවා. මෙන්න මෙහෙමයි එක්සත් ජාතික පක්ෂය ජනතාවගේ සහයෝගය ගත්තේ. මම කිව්වා, බිලී පිත්තේ කථාව. තමුන්නාන්සේලා කරනවා වාගේ නොවෙයි අපි වැඩ කරන්නේ. අපි ජනතාවටයි නායකත්වය දෙන්නේ. ගොවි සංවිධාන ගැන බලන්න.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහනවා, "මේ ගොවි සංවිධාන තිබෙන්නේ කොහේද?" කියලා. මේ ගොවි සංවිධාන දේශපාලනීකරණය වෙලා. ගරු ඇමතිතුමනි, මම මේ විවේචනයක් නොවෙයි, ආදරයෙන් කියන්නේ. යන්න මඩාටුගමට. ගිහිල්ලා තමුන්නාන්සේගේ නිලධාරින්ගෙන් අහන්න. ජල කළමනාකරණය සම්බන්ධයෙන් මම තදින් ක්‍රියාත්මක වුණා. අක්කරයට අඩි අටක් ගිය වතුර ප්‍රමාණය -වැලි පසට ටිකක් යනවා. මඩට එච්චර යන්නෙත් නැහැ.- මම අක්කරයට අඩි තුනහමාරට ගෙනාවා. මම ගොවි සංවිධානවලට වගකීම් දුන්නා, ඔබතුමන්ලා පාලනය කරන්න කියලා. තරගයක් තිබුණා. ගරු සභාපතිතුමනි, දඹුල්ලේ ඉඳලා කැකිරාව හරහා මඩාටුගමට එන කිලෝමීටර් 16ක් දිග ඇළේ පාලන බලය මම ගොවීන්ට දුන්නා. ඔවුන් ඒක කළා. සල්ලි ඉතුරු කෙරුවා.

ජලය කළමනාකරණය කරලා quota එක වශයෙන් දීපු ජලය අක්කර අඩි තුනහමාර ඔවුන් ඉතිරි කරලා. ගරු ඇමතිතුමා මේ ගැන දන්නවා ඇති. අපේ අර ගරු මන්ත්‍රීතුමාත් මේ ගැන දන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා ඒ ගැන. මම අසත්‍ය කියනවා නම් ඒ බව කියන්න. ඒ ජලය අක්කර අඩි තුනහමාර ඉතිරි කර ඒ අය මගෙන් ඇහුවා, "සර්, ඉතිරි වතුර ටික අපි එහා පැත්තට විකුණන්නද?" කියලා. මම කිව්වා, "අනේ අම්මේ! ඒක නම් කරන්න එපා. ජලය විකුණන්න පටන් අරගෙන කියලා මට කියාවි." කියලා. එදා ඒ ගොවියෝ ජලය ඉතිරි කළා. අද ඒක කැඩුවා තමුන්නාන්සේලා. අද බලන්න සිදු වෙලා තිබෙන විපත. මා බොරු කියනවා නම් ඔය ඉන්න නිලධාරින්ගෙන් දැන් අහන්න ගරු ඇමතිතුමා. ඔය ඉන්නේ වියළි කලාපයේ පුත්‍රයෝ.

ගරු සභාපතිතුමනි, මොන තරම් වැස්සාද අප්‍රේල් සහ මැයිවල. වැස්ස තිබුණේ නැද්ද? තිබුණා නේද? අප්‍රේල් මැයිවල වැහි ටිකක් තිබුණා පොළොව තෙමෙන්න. ඒ වැස්සත් එක්ක වැඩ කරන්න තිබුණා. එහෙම වුණා නම් ඔය වතුර ටික -සියයට 65ක්, 70ක්, 80ක්- බේරාගෙන වැස්සෙන් ලැබෙන වතුර ටිකෙන් අස්වැන්න නෙළාගන්න හැකියාව තිබුණේ නැද්ද? කලා වැව ප්‍රදේශය ගැන විතරක් නොවෙයි, අනෙක් පළාත් ගැනත් එක්කයි මා මේ කියන්නේ. කිසිම කළමනාකාරිත්වයක් නැහැ ගරු ඇමතිතුමනි. දැන් යන්න මහවැලි "සී" කලාපයටයි, "බී" කලාපයටයි. මොන තරම් වහිනවාද කියලා බලන්න. තවමත් වහිනවා. නමුත් දැන් වැස්ස ඉවර වේගෙන එනවා. තවම වගා කටයුතු පටන්ගෙන නැහැ මහවැලි "බී", "සී" කලාපවල හෙක්ටෙයාර 16,000ක වගේ ප්‍රමාණයක. ඒ වැහි ටිකත් එක්ක වගා කරන්න ගොවීන් උනන්දු කරවීම එක මාර්ගයක්.

දෙවන එක මොකක්ද? ගරු සභාපතිතුමනි, මමත් ගොවියෙකු විධියට අමුඩය ගහන්නේ නැතිව කොට කලිසම ගහලා ට්‍රැක්ටරයෙන් හාපු කෙනෙක්, වපුරපු කෙනෙක්. මගේ පියා එක්ක වැඩ කරලා අද්දැකීම් රාශියක් ලබා ගත්තු මිනිහෙක් මම. ගරු ඇමතිතුමනි, කැකුලන් පදමක් අහු වෙනවා කියන්නේ සොබා ධර්මය විසින් අස්වැන්න වැඩි කර දීමක්. ඇයි කැකුලන් පදමට වැඩ කරන්නේ නැත්තේ? තමුන්නාන්සේලාගේ ජල කළමනාකරණ මණ්ඩලය තවම උපදෙස් දීලා නැත්තේ ඇයි කියා මම අහනවා. ඇයි, ඒ ලැබෙන වතුර ප්‍රමාණයෙන් වැඩ ගන්නේ නැත්තේ? මම එහෙම කෙරුවා. ගරු අර්ල් ගුණසේකර මැතිතුමාගෙන් අහන්න. අප ඒ කාලයේ නායකතුමාට ගිහින් කිව්වා, "සර්, ගිරිතලේ වගාවන් මැරෙනවා වතුර නැතිව" කියලා. "ජයවික්‍රමට වතුර දෙන්න" කියලා කිව්වා. තද පාලනයක් ඇතිව වතුර ටික දීලා අස්වැන්න අරගෙන දුන්නා. ඇයි බැරි ඒ විධියට කරන්න?

ගරු සභාපතිතුමනි, කැකුලන් පදමට අද කොහේවත් වපුරවන්නේ නැහැ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව එහෙම කරවන්නේ නැති එක ගැන හරි කනගාටුයි. ගොවි සංවිධානවලට ඒ සඳහා උපදෙස් දෙන්නේ නැහැ. වැවට වතුර ඇවිල්ලා පිරෙන කල් තවමත් වැඩ කරන්නේ නැහැ. දැන් තමයි "සී" කලාපයේත් - මාදුරු ඔය දිහා එහෙම- ටික ටික වගා කරන්න පටන්ගෙන තිබෙන්නේ. එතකොට වතුර ඉවරයි. ගරු ඇමතිතුමනි, මං කියන්නේ ක්‍රමය වෙනස් කරන්න කියලායි. ගොවීන්ට තැන දෙන්න. ඔබතුමා පොල්ගොල්ලේ හෝ කොහේ හෝ ගොවි සංවිධාන රැස්වීම තියනවා නේද, වාරිමාර්ග එකේ නිලධාරීන් ඇතුළු සියලු දෙනා එක්ක? ඒ නිලධාරි මහත්වරු මේ විස්තර ඔක්කෝම දන්නවා.

ගරු සභාපතිතුමනි, අවුරුදු දෙකයි මට තිබුණේ. මට තවත් අවුරුදු දෙකක් තිබුණා නම්, අපට තවත් අවුරුදු දෙකක් බලය දුන්නා නම් අද මේ ආර්ථික අර්බුදයත් නැහැ. ණය බර වූ සමාජයකුත් නැහැ. අද උද්ධමනයකුත් නැහැ. අපි ප්‍රභාකරන් මෙල්ල කරනවා -කරුණා මන්ත්‍රීතුමා ආවා වාගේ- අවිහිංසාවාදය තුළින්. එහෙමයි අපි වැඩ කළේ. නමුත් අද මේ විධියට සිද්ධ වෙලා තිබෙන්නේ මොකද කියලා මම තමුන්නාන්සේලාගෙන් අහනවා.

ගරු ඇමතිතුමනි, කෘෂිකර්මය සම්බන්ධයෙන් මම මේ ප්‍රශ්න හැම දාම දිගටම අහනවා.

What is your national planning? Do you have a think tank? I am just asking you. When I was the Minister of Irrigation, the Hon. S.B. Dissanayake was the Minister of Agriculture and Livestock. So, I told him, “SB we will meet and work out a plan”. Why did we do that? Because for the success of agriculture the support of the Irrigation Department - all the tanks and Mahaweli projects - was a necessity. The centre of our nervous system is there. I met the Minister and the agrarian officers to work out a plan. The former Secretary, Mr. Wijedasa also participated. We worked out a 12-month calendar to see when the shortage of onions, chillies and other things occur in this country. Kalpitiya is an area where there was no war. In Kalpitiya, you get 2 - 3 feet of high water level. There are areas like that where water storage facilities are necessary. We worked out a system with my experience as a Chief Minister and a District Minister. I did that in the North Western Province. But, I am very sad to say that you are not using these. The Hon. Basil Rajapaksa, to make your “Divineguma” a success, first bring your Ministry in order. Do not waste millions and billions of money. There is no point in having records and all. We do not want money from foreign countries. We have the resources; we have the talent; we have the wealth, get them to task, target and work out your plan. Your officers are not running the show. I do not blame them. The peon becomes the minister; the saddest history of this country. I cannot understand. I feel sorry for this country. Take the examples of China and India. See how they have developed their agriculture. The rural sector income has gone up. People in rural areas used to go to the town areas. Now, they are coming back. That is development. That is what we want. So, I am not criticizing. I am telling you that your *govi* committees must have a national planning, link with the Irrigation Department and other sectors. I am telling you to work out a plan.

ඒ විධියට කටයුතු කරන්න. එහෙම නැතිව ඔබතුමන්ලා කියනවා, “වී වවපල්ලා” කියලා. දැන් වී අතිරික්තයක් තිබෙනවා. දඹුල්ලට ගිහිල්ලා බලන්න, සිදු වන විනාශය දිහා. උඩවලවේ පැත්තේ දැන් කෙහෙල් විකුණා ගන්න බැහැ. ඇයි ඔක්කොම කුඹුරු විනාශ කරලා ඇඹුල් කෙසෙල් වවලා. ඔක්කොම ඇඹුල් කෙසෙල් කයිද? බත් වෙනුවට කෙසෙල් කාවිද? ඇයි පිට රටවලින් ඉල්ලන දේවල් වගා කරන්න සැලැස්මක් ඇති කරන්නේ නැත්තේ?

ගරු ඇමතිතුමා, ශස්‍ය මාරු ක්‍රමය කියලා එකක් තිබෙනවා. හම්බන්තොට තිබෙන scheme එකක් බලන්න මාව එක්ක ගෙන ගියා. මට ඒකේ නම මතක නැහැ. කුඹුරුවල අස්වැන්න නෙළලා හාන්නේ නැතිව තණ පිඩැලිත් එක්ක මුං ඉහිනවා. එහෙම නේද ඇමතිතුමා? ඒ ගැන දන්නවා වන්නියේ ඉන්න ඇත්තෝ. මොකක්ද වෙන්නේ? තෙතමනයට මුං හැදෙනවා. දවස් 45න් අස්වැන්න ගන්නවා. මුං කියන්නේ විදේශ විනිමය ලබා දෙන භෝගයක්. ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපිට ගුණදායක ආහාරයක්.

බඩ ඉරිඟු වගාවත් එහෙමයි. තමුන්නාන්සේ දන්නවා, මම ඇමති වෙලා ඉන්න කාලයේ අක්කර තුන්දාහක බඩ ඉරිඟු වගා කළා. මම ඇමෙරිකාවේදී දැක්කා වාගේ පොඩි පොඩි ඉඩම්වල වගා කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පළාතේ අනුරාධපුරයේ ගමකට මම ගියා. ඒ ගම මොකක්ද කියලා මට මතක නැහැ. කාන්තාවක් ඒ ප්‍රදේශය ඩෝසර් කරලා පස් කණ්ඩි ගහලා තිබුණා. පුළුවන් නම් ඇය වැඩට ගන්න.

හැබැයි දේශපාලන වශයෙන් හංවඩු ගහලා නොවෙයි. අමුඩයට පාටක් නැහැ. "මඩ සෝදා ගත් කල ගොවියා රජකමටත් සුදුසුයි" කියලා කියමනක් තිබෙනවා නේ. අර කාන්තාව ඉඩම ඩෝසර් කර තිබෙනවා. මාව ඩෝසරයට නැග්ගුවා. ජනපද ඉඩම්වල අක්කර භාගයේ, අක්කරයේ ප්‍රමාණවල බඩ ඉරිඟු වවලා තිබෙනවා. අර ගල්ගමුවේ රාජා කියලා කෙනෙක් මහා පරිමාණයෙන් - on large scales - බඩ ඉරිඟු වවලා තිබෙනවා නේ. එයා ගැන තමයි ඔබතුමන්ලා කථා කළේ. ඒවායින් ත්‍රිපෝෂ හදනවා. අද කැනඩාවටත් ඒවා යවනවාය කියනවා.

ගරු ඇමතිතුමා, මේ පොළොවේ හැම ජාතියම හැදෙනවා. ඒක සීමා කරන්න බැහැ. ඖෂධ වර්ග තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාද කරන දවසේත් මම මේ ගැන කිව්වා. මම ප්‍රධාන ඇමති හැටියට වැඩ කළා. ඉස්සර කුරුණෑගල, හෙට්ටිපොළ, නිකවැරටියේ කරපිංචා තිබුණා. දැන් කරපිංචා ලබා ගන්න තඹුත්තේගමටත් එහාට යන්න ඕනෑ. මම කරපිංචා ගම්මාන පටන් ගත්තා. මම අනාගතය දිහා බලලා තමයි වැඩ කටයුතු කළේ. මම පාරේ ගස් හිටවද්දී මට රාජාලියාගේ පක්ෂයේ ප්‍රේමචන්ද්‍රලා හිනා වුණා. ඒ ගස් ටිකත් දැන් කපනවා. තමුන්නාන්සේලා එක ගහක් හිටවලා තිබෙනවාද කියලා මම අහනවා. මම ගස් හිටෙව්වේ අනාගත පරපුර වෙනුවෙන්. මම වැඩ කළේ එහෙමයි. එක්සත් ජාතික පක්ෂය කියන්නේ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා, ඩඩ්ලි සේනානායක මැතිතුමා, කොතලාවල මැතිතුමා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, ප්‍රේමදාස මැතිතුමා හිටපු පක්ෂයක්. ප්‍රේමදාස මැතිතුමා "ගම හදා රට හදමු" කියලා ගෙවල් ටික දුන්නා.

ගෙවල් නිකම් දුන්නේ නැහැ. හදපල්ලා, ශ්‍රමයෙන් වැඩ කරපල්ලා කියලා ද්‍රව්‍ය ටිකයි දුන්නේ. මේ සංකල්පයයි මෙතැන ඕනෑ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසාන වෙමින් පවතිනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මට තව විනාඩි ගණනයි අවශ්‍යා වන්නේ.

ගරු සභාපතිතුමනි, මම ඒ ගැන මීට වඩා කථා කරන්නේ නැහැ, කාලයේ ප්‍රශ්නයක් නිසා. විශේෂයෙන්ම, මම කිව්ව අන්දමට ජලාශවල වතුරෙන් ඒ ටික වැඩ කරලා වතුර ඉතුරු කරන්නත් පුළුවන්. ගොවියාට බණින්න එපා ඇමතිතුමා. ඔබතුමා බැණලා තිබෙනවා, ගොවියෝ හිතුවක්කාරයි කියලා. නැහැ, ගොවීන්ට වචන දේවල් ගැන අවබෝධයක් ලබා දුන්නේ නැහැ. ඒක නිසායි මම එහෙම කිව්වේ. ඒ ගැන මම කථා කරන්නේ නැහැ, කාලය නොමැති නිසා.

ගොවි විශ්‍රාම වැටුප ගැන ශාපකාරී විධියට කටයුතු කරන්න එපා, පොහොරවල මිල ටිකක් නග්ගලා ඒ මුදලින් දෙනවා කියලා. මේ මුදල් සූරා කාලා. මේවාට මිනිස්සු ශාප කරනවා. වයසට ගිහිල්ලා, අත පය දුබල වෙලා ඉන්න මේ අයට අද කෑමට වඩා වියදම් යන්නේ බෙහෙත් ගන්න. ගරු ඇමතිතුමනි, අර අහිංසක ගොවියාව ආරක්ෂා කරන්න. මෙහෙම වුණාම කවුද ගොවිතැනට එන්නේ?

ගරු සභාපතිතුමනි, බිත්තර වී හැදීම "බී" කලාපයේ සහ "සී" කලාපයේ කොහොම කෙරෙනවාද මම දන්නේ නැහැ. දැන් ඒක CIC එකට භාර දීලා. ඒකටත් දෙයියනේ, CIC කාරයන්ගේ පිහිටයි! ඒකටත් දැන් සීඅයිසී සරණං ගච්ඡාමි කියන්නයි වෙලා තිබෙන්නේ. කනගාටුදායක තත්ත්වයක්. අපි ඒ කලාපවල කළ ඒවා දිගටම ගෙනියන්න, ව්‍යාප්ත කරන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

ඉංජිනේරුවරයකුගේ මළ ගෙදරකට ගිය අවස්ථාවකදී වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් අයිවන් සිල්වා මැතිතුමා මට කිව්වා, "කළු ගඟේ ජලය මී ඔයට දාලා යාපහුවට, ගල්ගමුවට ගන්න කටයුතු කරනවා" කියලා. ඒ සම්බන්ධයෙන් අමාත්‍යතුමාට ස්තුති කරනවා. එහෙම කරන්න. මම හොඳ දේට හොඳ කියනවා. මම ඔබතුමාට පෞද්ගලිකව මඩ ගැහුවේ නැහැ.

පරිසරය ගැන කථා කරද්දී මගේ ආසනයේ මිත්‍රයා -අනුර ප්‍රියදර්ශන යාපා මහත්තයා- ගරු සභා ගර්භයේ නැහැ නේ. මම ඇමතිව සිටි කාලයේ ජපානයේ පැවැති සමුළුවකට ගිය අවස්ථාවකදී වතුරේ තිබෙන ශක්තිය පිළිබඳව "වෝටර් ක්‍රිස්ටල්" කියලා පරීක්ෂණයක් කරලා පෙන්නුවා. ඒ පරීක්ෂණ වාර්තාව මම **සභාගත*** කරනවා.

Tumbler එකකට වතුර දාලා, සිංදු කියද්දී microscope එකෙන් බැලුවාම ඒ වතුර නටනවා පෙනෙනවා. ඇයි ජලයට පිරිත් කියලා දෙන්නේ, පල්ලියේ ආශිර්වාද පැන් දෙන්නේ, හින්දු ආගමේ ශුද්ධ වූ ජලය දෙන්නේ? මේ ජලයේ මහා ශක්තියක් තිබෙනවා.

තමුන්නාන්සේලා වැලි ටික අරගෙන විනාශ කරනවා. කැලෑවේ ගස් කපනවා. ජනාධිපතිතුමා කිව්වා, සියයට 33ක් කැලෑ නැවත වගා කරනවා කියලා. මම දන්නේ නැහැ "කොහෙන් ඉඩම් අරගෙනද වවන්නේ?" කියලා. මුහුද පුරවලා අරගෙනද ඒ කටයුත්ත කරන්නේ කියලා මම අහනවා. කොහොමද කරන්නේ කියලා අපට කියන්න ඕනෑ.

අනුරාධපුරයේ අලි කොරිඩෝ එකත් තිබුණා. දැන් ඒකෙත් ගල් කඩනවා. කැලය විනාශ කරනවා. මොනවාද මේ වෙන්නේ? පරිසරයට ආදරයකින්ද මේවා කෙරෙන්නේ? ජනතාව අසරණ වෙලා බලා ගෙන ඉන්නවා. ලොකු ක්‍රසර් ගෙනැල්ලා පරිසරය විනාශ කරනවා. ඒ වාගේ සමාජයකුයි අද තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මා තව එක කාරණයක් කියලා කථාව අවසන් කරනවා. ඒ කාලයේ Water Supply and Drainage Board එකෙන් කලා වැවේ වතුර ගන්න හැදුවා. මම ගන්න දුන්නේ නැහැ. මගේ වත්තේ වැවක් තිබෙනවා. ගරු කථානායකතුමා ඒ වැව බලන්න එනවා කිව්වා. 1980 ඉඳලා තවම ඒ වැවේ වතුර තිබෙනවා. වැවේ වතුර leak එකක් තිබුණා. මම පස් දාලා හැදුවා. මේ වැවේ වතුර සියයට 70ක් පොළවටයි උරා ගන්නේ. පායන්න, පායන්න water table එක අඩු වෙද්දී වතුර මට්ටම පහළට යනවා. මම ජලාපවහන මණ්ඩලයට කිව්වා, වැවේ වතුර ටික ගන්නේ නැතුව, ලොකු ටැංකි හදලා වැකණ්ඩියෙන් පහළ උල්පත්වලින් යන වතුර pump කරලා ගන්න කියලා. දැන් දැදුරු ඔයෙනුත් filter කරලා වතුර ගෙනි යනවා. ඒ නිසා ගරු ඇමතිතුමාට මා කියනවා, මේවා ප්‍රශ්න නොවෙයි, බුද්ධිමත්ව -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු සභාපතිතුමනි, එහෙම නම් මා කාලය ගන්නේ නැහැ. කියන්න නම් හුඟක් දේවල් තිබෙනවා. කාලය වටිනවා. ඒ නිසා මම සභාවට ගරු කරමින් මගේ කථාව අවසන් කරනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
මීළඟට ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා.

විනාඩියක් නිශ්ශබ්ද වෙන්න. The Hon. Deputy Chairman of Committee will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு,* பிரதிச் சபாநாயகர் *அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் *அவர்கள் [*மாண்புமிகு முருகேசு சந்திரகுமார் *] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[පූ.භා. 10.31]

**ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා (වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.பி. ஏக்கநாயக்க - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. W.B. Ekanayake - Deputy Minister of Irrigation and Water Resources Management)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැව් බැඳි රාජ්‍යයේ වැසියෙක් හැටියට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වචන කීපයක් කථා කරන්න මට අවස්ථාව ලබා දීම සම්බන්ධව මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මෙවර අය වැයෙන් රුපියල් බිලියන 102ක් වාරිමාර්ග කටයුතු සඳහා වෙන් කර තිබීම ගැන අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ට ගොවි ජනතාව වෙනුවෙන් අපේ ගෞරවණීය ස්තුතිය පුද කරනවා. වාරි කර්මාන්තය යනු මෙරට අනන්‍යතාවයි. මහා පරාක්‍රමබාහු, වසභ, මහසෙන් ආදී හෙළ මහ රජදරුවන්ගෙන් පෝෂණය වූ අපගේ වාරි තාක්ෂණය අද්විතීයයි. ඒ කරුණ සම්බන්ධව හොඳට තේරුම් ගත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ වාරිමාර්ග වැඩිදියුණු කිරීම සඳහා, නවීකරණය කිරීම සඳහා අවශ්‍ය කරන මුදල් කලට වෙලාවට ලබා දුන් නිසා වාරි කර්මාන්තය දිනෙන් දින දියුණු කර ගෙන යන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

පසු ගිය කාලයේ නියඟය ආපු වෙලාවේ ජනාධිපතිතුමා විසින් ගොවි ජනතාව අරලිය ගහ මන්දිරයට ගෙන්වා ගත්තා. ගොවි සංවිධානවල නියෝජිතයෝ ගෙන්වා ගෙන ඔවුන් එක්ක සාකච්ඡා කර ඔවුන් කළ ඉල්ලීම් අනුව තමයි අතිගරු ජනාධිපතිතුමා ඒ අවස්ථාවේදී ඒ අවුරුද්දේ තිබුණු මුදල් අනුව යම් මුදල් ප්‍රමාණයක් වෙන් කරලා දුන්නේ. එතුමා මෙවර ඊටත් වඩා වැඩි මුදලක් වෙන් කරලා දීලා වාරි මාර්ග කටයුතු දියුණු කරන්න අවස්ථාව සලසා දීලා තිබෙනවා. මේ රටේ ගොවි ජනතාවට විශේෂ සැලකිල්ලක් දක්වන නායකයෙක් හැටියට, ගොවි ජනතාව ගැන හොඳට තේරුම් ගත් කෙනෙක් හැටියට, කුඹුරේ ඇවිද්ද, වෙල්ලේ ඇවිද්ද, වක්කඩෙන් අත හෝදා ගත් කෙනෙක් හැටියටයි එතුමා අද මේ රටේ නායකත්වයට පත් වෙලා ගොවි ජනතාව වෙනුවෙන් අද ඒ කටයුතු කර ගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මුල් වෙලා පසු ගිය නියං සමයේ විනාශ වුණු වැව්, සිඳී ගිය වැව් අලුත්වැඩියා කළා. එතුමා මාත් එක්කම වැව් 15කට, 20කට වැඩිය අලුත්වැඩියා කිරීම් ආරම්භ කරන්න ගිහිල්ලා තිබෙනවා. එක දවසකට වැව් 10ක, 11ක විතර අලුත්වැඩියා කිරීම් ආරම්භ කරන්න ගියා. එතුමා දවල්ට ආහාරවත් ගන්නේ නැතිව ගිහිල්ලා උදැල්ල අරගෙන ගොවි ජනතාවත් එක්ක ඒ වැව්වල වැඩ ආරම්භ කළා. මිනිස්සු කියනවා, "අද ඒ වැව් වීදුරු බෝලයක් වාගේයි" කියලා.

රොන් මඩ ඉවත් කළාට පස්සේ හොඳට වැව් පිරිලා ඉතිරිලා තිබෙනවා. අද වතුරත් ක්‍රමානුකූලව නතර වෙලා තිබෙනවා. මේ වතාවේ වතුර ආව තරමට ගියේ නැහැ. වතුර රැඳුණා. ඒ මොකද වැව් ගැඹුරු කිරීම නිසායි. නොයෙකුත් බාධක ආවා. ඒ සියල්ලම මැඩ ගෙන තමයි ගොවි ජනතාවගේ ඉල්ලීම පරිදි අතිගරු ජනාධිපතිතුමා මේ කටයුතු කරන්න අපේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට භාර දුන්නේ. ඒ අනුව එතුමා ඒවා ක්‍රමානුකූලව මහජන නියෝජිතයොත් එක්ක සම්බන්ධ වෙලා, ගොවි ජනතාවත් එක්ක සම්බන්ධ වෙලා, තමුන් වැවට ගිහිල්ලා උදැල්ල අරගෙන වැව්වල රොන් මඩ ඉවත් කිරීමේ වැඩ ආරම්භ කළේ. ඒ නිසා තමයි අද අපට භයක් සැකක් නැතිව අපට වතුර තිබෙනවා කියලා කියන්න පුළුවන් වන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේ අද වතුර නැහැ කියලා කියන්න බැහැ. අද අපට ඕනෑ තරම් වතුර ඉතුරු වෙලා තිබෙනවා. එයින් අද ජනතාව ගොවිතැන් කර ගෙන යනවා. මම මේ ටිකේම අපේ ප්‍රදේශයට ගිහිල්ලා ඇවිද්දා. පෙරේදා තන්තිරිමලේට ගියාම තන්තිරිමලේ ගොවි ජනතාව මාත් එක්ක කිව්ව කථාවක් තමයි, මේ වතාවේ තමයි ක්‍රමානුකූලව ගොවිතැනක් කෙරිලා තිබෙන්නේ කියන එක. මොකද ගොඩ ගොවිතැනයි, මඩ ගොවිතැනයි දෙකම මේ වෙන කොට වැඩ අවසන් වෙලා තිබෙනවා. ඒ වාගේ දේවල් කරන්න පුළුවන් වුණේ වාරි මාර්ග අංශයට විශේෂ සැලකිල්ලක් දැක්වූ නිසායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අපේ ඇමතිතුමා මේ නොයෙකුත් ස්ථානවලට ගියා. මම හිතන හැටියට එතුමා වැඩිපුර නිදාගන්නේ කාර් එකේ. එතුමාත් එක්ක යන නිසා මම ඒක දන්නවා. එතුමා දිවා රාත්‍රී නොබලා ගොවි ජනතාව වෙනුවෙන් ඉතාමත්ම කැප වීමෙන් වැඩ කරන ඇමතිවරයෙක්. එතුමා පැමිණියාට පස්සේ මොන තරම් උනන්දුවකින් අපේ වාරි මාර්ග අමාත්‍යාංශයේ වැඩ කටයුතු කර ගෙන යනවාද කියන එක අපි දැක්කා. රට සංවර්ධනය කරන අතරේ, රටේ සංවර්ධනය උදෙසා පරිසරය, සතා සිවුපාවා, ගස් වැල් ආදී සොබා දහම ආරක්ෂා කර ගෙන වාරි කර්මාන්තය දියුණු කිරීමට රජය කටයුතු කර ගෙන යන බව පැහැදිලි කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒත් එක්කම දැනටමත් අපි මහා පරිමාණයේ වාරි කර්මාන්ත ගණනාවක් අපගේ දේශීය තාක්ෂණය හා දැනුම උපයෝගී කර ගෙන ඉදි කරගෙන යනවා. මව්ආර, වෙහෙරගල, කැකිරිඔබඩ, වෑමැඩිල්ල ආදී වාරි කර්මාන්ත ඉදි කිරීම මඟින් අපගේ දේශීය වාරි තාක්ෂණයේ අසිරිමත් බව ලොවටම එළි දක්වා තිබෙනවා. දැදුරු ඔය, රඹුක්කන් ඔය, යාන් ඔය, කළුගල් ඔය, ගුරුගල් ඔය, මොරාන, උමා ඔය ආදී බහු කාර්ය යෝජනා ක්‍රම ගණනාවකම ඉදි කිරීම් කටයුතු ළඟිලඟියේ සිදු වෙමින් පවතිනවා. දැනට නව වාරි මාර්ග යෝජනා ක්‍රම මඟින් අලුතෙන් හෙක්ටෙයාර 20,674ක් වගා කිරීමටත්, වාරි පහසුකම් වැඩිදියුණු කිරීමටත් හැකි වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොරගහකන්ද, උමා ඔය, දැදුරු ඔය, රඹුක්කන් ඔය, යාන් ඔය ආදී බහු කාර්ය වාරි යෝජනා ක්‍රම මඟින් අපේ රටේ වර්ෂාව අඩු උතුරු, නැඟෙනහිර, වයඹ හා දකුණේ වියළි ප්‍රදේශවලට වාරි සැපයීමට බලාපොරොත්තු වනවා. ඒ සඳහා රුපියල් බිලියන 102ක් වෙන් කර තිබෙනවා. වසර 2015වන විට මේ ව්‍යාපෘති සියල්ල ජනතා අයිතියට පැවරීමට හැකි වනවා ඇති. මා ඔය සහ දැදුරු ඔය හැරවීමෙන් වයඹ පළාතේ ජල හිඟයට පිළියම් යෙදීමට ද රජය අධ්‍යයනය කරමින් සිටිනවා.

පසු ගිය දවස්වල අතිගරු ජනාධිපතිතුමා ගිහින් ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කළා. ඒ වාගේම මහවැලි ව්‍යාපාරය යටතේ මහින්ද චින්තන ජාතික සංවර්ධන සැලැස්මේ 2010 - 2016 යටතේ අපේක්ෂා කෙරෙන වාරිමාර්ග, කෘෂිකර්ම හා ග්‍රාම සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමෙහි ලා මහවැලි සංවර්ධන වැඩසටහන අතිවිශේෂ දායකත්වයක් දෙනු ලබනවා. මහවැලි ව්‍යාපාරය යටතේ වාරිමාර්ග හා යටිතල පහසුකම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කිරීම, මහවැලි ප්‍රදේශයන්හි කෘෂි ඵලදාවන් ඉහළ නැංවීම හා මහවැලි මහා සැලැස්ම යටතේ යෝජිත ව්‍යාපෘතිවල සියලු සංවර්ධන කටයුතු ආරම්භ කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම වෙළි ආරක්ෂණ පනත යටතේ මේ වනකොට අපි විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කරගෙන යනවා. විශේෂයෙන්ම මහා වාරිමාර්ග යටතේ තිබෙන වැව් ප්‍රතිසංස්කරණය කිරීම කර ගෙන යනවා.

[ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා]

ඒ අනුව පරාක්‍රම සමුද්‍රය, කන්තලේ, ඉඟිනිමිටිය, තබ්බෝව, උස්ගල සියඹලන්ගමුව, රිදියගම, නාච්චාදූව, තිසාවැව, මින්නේරිය, හුරුළුවැව, ගිරිතලේ, නුවර වැව, කවුඩුල්ල, දඹුලු ඔය, කණ්ඩලම, බෝවතැන්න, චන්ද්‍රිකා වැව, කලා වැව, මාදුරුඔය, පොල්ගොල්ල, රන්දෙනිගල, රන්ටැඹේ, නෝර්ටන්, ලක්ෂපාන, කැනියොන්, කලටුවාව වැනි විශාල ජලාශ ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කිරීම වෙලි ආරක්ෂණ හා මෙහෙයුම් කාර්යාංශය යටතේ ක්‍රියාත්මක කර ගෙන යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේ අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ ඇල්මක්, දැක්මක් ඇතිව තමයි මේ වැඩ කටයුතු කරන්නේ කියන එක මම මතක් කරන්න ඕනෑ. අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා අපත් එක්කම පෞද්ගලිකවම ගිහිල්ලා මේ හැම දෙයටම මූලිකව කටයුතු කරනවා. ඒ එක්කම අපේ ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා "දිවි නැගුම" වැඩසටහන ගැන කිව්වා. මම හිතනවා, සමෘද්ධියත් ක්‍රමානුකූලව කර ගෙන -[බාධා කිරීමක්]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මම නොවෙයි කිව්වේ.

**ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு டபிள்யு.பி. ஏக்கநாயக்க)
(The Hon. W.B. Ekanayake)
ඒ කිව්ව එක ගැන තමයි මම මේ කියන්න යන්නේ. අපි ඒ වැඩසටහන ආරම්භ කරන්න ලැහැස්ති වෙනවා. මහජන නියෝජිතයන් හැටියට අපි එතුමාත් එක්ක සම්බන්ධ වෙලා, ඒ නිලධාරින් එක්ක සම්බන්ධ වෙලා ක්‍රමානුකූලව ඒ වැඩසටහන ක්‍රියාත්මක කරනවා. ඒ නිසා ඒක වැටෙන්න දෙන්නේ නැහැ. ඇත්තෙන්ම කියනවා නම් සමෘද්ධිය වැටිලාත් නැහැ. සමහර තැන්වල, සමහර පුද්ගලයන් ගන්නා දෙයින් හරියට ක්‍රියාත්මක වුණේ නැති නිසා තමයි ඒ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මතක ඇති අප දෙදෙනා තන්තිරිමලේ පාර හදන්න ගිය හැටි.

එවකට ඒ ආණ්ඩුවේ හිටපු මහාමාර්ග ඇමතිවරයාට කථා කළාම ඒක කරලා දුන්නේ නැහැ. නමුත් ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා වාරිමාර්ග සහ ජල කළමනාකරණ ඇමතිවරයා හැටියට සිටි කාලයේ ඔබතුමාට කිව්වාම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ machines ටිකත් අරගෙන අභාවප්‍රාප්ත පාරමී කුලතුංග ජෙනරාල්වරයා ලවා ඩීසල් ටිකක් ඉල්ලා ගෙන මාර්ග සකස් කළා. නමුත් අද එහෙම නැහැ. ඒ තත්ත්වය අද සම්පූර්ණයෙන් වෙනස් වෙලා. අද අපට පුළුවන් වෙලා තිබෙනවා, මේ රටේ ජනතාවට අවශ්‍ය කරන විධියේ සංවර්ධිත රටක් බවට මේ රට පත් කිරීමේ කටයුත්ත කර ගෙන යන්න. ජනතාවගේ අවශ්‍යතාවන් ඉෂ්ට කරන්න පුළුවන් ආණ්ඩුවක් හැටියට අතිගරු ජනාධිපතිතුමා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ යටතේ විශේෂයෙන්ම ගොවි ජනතාවට ඉමහත් සේවාවක් කරන්න අපට පුළුවන් කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව දීර්ඝව කථා කරන්න පුළුවන් අවස්ථාවක් නොවෙයි. ඒ නිසා අද මේ වෙනුවෙන් කැප වී කටයුතු කරන අතිගරු ජනාධිපතිතුමාට, ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාට, ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාට, ඒත් එක්කම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අධ්‍යක්ෂ ජනරාල්වරු, අනෙක් නිලධාරි මහත්වරු ඇතුළු සියලුම දෙනාටත්, මහවැලි අධිකාරියටත්, විශේෂයෙන්ම වෙරළ ආරක්ෂණ වැඩ පිළිවෙළ යටතේ කටයුතු කරන නිලධාරි මඩුල්ලටත් අපි අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒ වාගේම මේ රටේ ජීවනාලිය බඳු ගොවි ජනතාව නඟා සිටුවීමේ කටයුත්තේදී නායකත්වය අරගෙන වැඩ කරන අතිගරු ජනාධිපතිතුමා, කෘෂි කර්මාන්තයේ නියැළෙන මේ රටේ ගොවි ජනතාව ගොඩ අරගෙන ඔවුන් මේ රටේ කාටවත් අත නොපාන ජනතාවක් බවට පත් කරන්න කටයුතු කරනවා කියන එක අපට සියයට 100ක්ම විශ්වාසයි කියන එක ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[மு.ப. 10.41]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சு, நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சு ஆகியவற்றின் மீதான வரவு-செலவுத் திட்டக் குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு, சில விடயங்களை இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவர விழைகின்றேன். கிளிநொச்சி மாவட்டத்தின் பல்வேறு பிரதேசங்களில் நீர்ப்பற்றாக்குறை ஏற்பட்டிருக்கின்ற நிலைமையில், கிளிநொச்சி மாவட்டத்தில் இருக்கின்ற இரணைமடுக் குளத்தின் ஊடாக ஏறத்தாழ 22 ஆயிரம் ஏக்கர் நிலத்துக்கு நீர்ப்பாசனம் செய்யப்படுகின்ற சூழலிலும், கிளிநொச்சி மாவட்டத்தில் மழை நீரை நம்பியும் நீர்ப்பாசனம் மூலமும் 55 ஆயிரம் ஏக்கருக்கு மேற்பட்ட நிலங்களில் நெல் உற்பத்தி செய்யப்படுகின்ற நிலையிலும் இரணைமடுக் குளத்திலிருந்து யாழ்ப்பாண மாவட்டத்துக்கு நீர் வழங்குவது தொடர்பான சர்ச்சைகளும் ஏற்பட்டுக் கொண்டிருக்கின்றன. கிளிநொச்சி மாவட்டத்தின் பூநகரிப் பிரதேசம் முழுவதும் வைகாசி மாதத்திற்குப் பின்னர் பாரிய அளவிலான குடிநீர்ப் பிரச்சினைக்கு முகங்கொடுத்திருக்கின்றது. மிக முக்கியமாக ஆலங்கேணி, முக்கொம்பன், பூநகரி -நல்லூர், கறுக்காய்த்தீவு, பல்லவராயன்கட்டு, சோலை, ஜெயபுரம், இரணைதீவு, இரணைமாதா நகர், வலைப்பாடு, பள்ளிக்குடா, நாச்சிக்குடா, கிராஞ்சி, குமுழமுனை, வேரவில், முழங்காவில், கரியாலை நாகபடுவான் போன்றன ஒவ்வொரு வருடமும் பாரிய அளவிலான நீர்ப்பற்றாக்குறைக்கு முகங்கொடுத்துக் கொண்டிருக்கின்ற கிராமங்களாகும். அதேபோல இன்று கண்டாவளைப் பிரதேசச் செயலர் பிரிவில் கல்லாறு, சுண்டிக்குளம், ஆனையிறவு, தட்டுவன்கொட்டி, உமையாள்புரம், குஞ்சுப்பரந்தன் போன்ற பிரதேசங்கள் கூடுதலான நீர்ப்பற்றாக்குறையை எதிர்நோக்கியிருக்கின்ற சூழலில், கரைச்சிப் பிரதேசச் செயலர் பிரிவில் மக்கள் செறிந்து வாழ்கின்ற அக்கராயன், ஸ்கந்தபுரம், பாரதிபுரம், மலையாளபுரம், கிருஷ்ணபுரம், சாந்தபுரம், விநாயகபுரம், பொன்நகர், மாயவனூர், ஆனைவிழுந்தான், மணியன்குளம் போன்ற பிரதேசங்களும் நீர்ப்பற்றாக்குறையை எதிர்நோக்கி யிருக்கின்றன.

இந்தச் சூழ்நிலையில் யாழ்ப்பாணத்துக்கு நீர் வழங்கும் திட்டம் ஒன்று மிக விரைவாக நடைமுறைப்படுத்தப் படவிருக்கின்றது. அதாவது, மொறகஹகந்த குளத்து நீரை மகாவலி ஊடாக இரணைமடுக் குளத்துக்குக் கொண்டுவந்து சேர்க்கின்ற ஒரு திட்டம் முன்வைக்கப்பட்டிருக்கின்றது. இது தொடர்பாக 2013ஆம் ஆண்டின் வரவு செலவுத் திட்டத்திலும் முன்மொழியப்பட்டிருக்கின்றது. ஆனால், இது பல ஆண்டுகளுக்கு முன்னர் முன்வைக்கப்பட்ட ஒரு திட்டமாகும்.

ஆயினும் பல காரணங்களினால் அது பிற்படுத்தப்பட்டு அல்லது பிற்போடப்பட்டிருந்தாலும் இன்று இத்திட்டமானது கிளிநொச்சி மாவட்டத்தின் பாரிய அளவிலான நெற்செய்கையையும் அதேநேரம் கிளிநொச்சி மாவட்ட மக்களின் குடிநீர்ப் பிரச்சினையையும் கவனத்திலே கொள்ளாமல் மேற்கொள்ளப்படவிருக்கின்றது. யாழ்ப்பாணத்துக்குக் குடிநீர் வழங்குகின்ற இத்திட்டத்தின் ஊடாக யாழ்ப்பாணத்தில் இருந்து குடிபெயர்ந்து கிளிநொச்சி மாவட்டத்தில் குடியேறி வாழ்கின்ற கிட்டத்தட்ட 80 வீதத்துக்கு மேற்பட்ட மக்களும் மற்றும் வன்முறை காரணமாக மலையகப் பகுதிகளிலிருந்து கிளிநொச்சி மாவட்டத்தில் குடியேறி வாழ்கின்ற 25 வீதத்துக்கும் மேற்பட்ட மக்களும் பாரிய அளவில் குடிநீர்ப் பிரச்சினைக்கும் மற்றும் விவசாயச் செய்கைக்கான நீர்ப்பாசனப் பிரச்சினைக்கும் முகம்கொடுப்பார்கள். அதேநேரம் எதிர்காலத்தில் யாழ்ப்பாணத்துக்கும் கிளிநொச்சிக்கும் இடையில் பாரிய பிரச்சினையை உருவாக்கக்கூடிய, பாரிய தீய விளைவுகளை ஏற்படுத்தக்கூடிய ஒன்றாகவே இரணைமடுக் குளத்தின் நீரை யாழ்ப்பாணத்துக்குக் கொண்டுசெல்லும் இந்தத் திட்டத்தை எங்களால் பார்க்க முடியும்.

மிகக் குறிப்பாக கிளிநொச்சியில் இருக்கின்ற இரணைமடுக் குளத்தின் கட்டுமான வேலைகள் ஏற்கெனவே அறுபது ஆண்டுகளுக்கு முதல் நடைபெற்றிருப்பதனால், அதன் கட்டுகளில் உள்ள சிறிய சிறிய வெடிப்புக்களின் ஊடாக நீர் கசிந்தவண்ணம் இருக்கின்றது. இன்று அதன் அருகிலே ஒரு விமான நிலையமும் அமைந்திருப்பதால் விமான அதிர்வுகள் காரணமாக அந்தக் கசிவுத் தன்மை இன்னும் அதிகரித்திருக்கின்றது. ஆனால், அதன் புனர்நிர்மாண நடவடிவடிக்கைகள் எதுவும் இதுவரை மேற்கொள்ளப்படவில்லை. இந்த நிலையில் இந்தக் குளத்திலிருந்து யாழ்ப்பாணத்துக்கு நீரைக் கொண்டு செல்வதன்மூலம் கிளிநொச்சி மாவட்ட மக்கள் பெருமளவு பிரச்சினையை எதிர்நோக்க வேண்டியேற்படும். இதற்கு மாற்றீடான ஒரு திட்டம்தான், அதாவது யாழ். மாவட்டக் குடிநீர்ப் பிரச்சினையையும் விவசாயக் காணிகளின் நீர்த் தேவையையும் பூர்த்தி செய்யக்கூடிய ஒரு திட்டம்தான் ஆனையிறவு ஏரித்திட்டம். இத்திட்டமானது அதன் கிழக்குக் கரையில் உள்ள சுண்டிக்குளம் என்னும் குளத்தை மீளமைப்பதால் நிறைவேற்றப்படக்கூடியது. ஆனால், ஏற்கெனவே 1968ஆம் ஆண்டில் கட்டப்பட்ட இக்குளம் இன்று உடைந்த நிலையில் இருக்கின்றது. இதை மீளக் கட்டுவதற்கு 1983ஆம் ஆண்டில் அன்றைய ஜனாதிபதி ஜே.ஆர். ஜயவர்தன அவர்களால் ஒப்புதல் கொடுக்கப்பட்டது. ஆயினும் பின்னர் அந்தத் திட்டம் கைவிடப்பட்டிருந்தது. ஆனையிறவுக் கடல் நீரேரியில் கனகராயன் ஆறு, நெத்தலி ஆறு, பிரமந்தன் ஆறு, தேராவில் ஆறு போன்ற ஆறுகள் வந்து சேருவதால் சுண்டிக்குளக்கட்டை மீளமைத்து, கடல் நீர் உப்பாகாமல் மறிக்கும் திட்டத்தை மேற்கொண்டால், ஐந்து வருடங்களில் ஆனையிறவு ஏரி ஊடாக யாழ்ப்பாண மண்ணுக்கு நன்னீர் வழங்கக்கூடிய பெரும் வாய்ப்பு ஏற்படும்.

அதேபோல், ஆனையிறவு ஏரியிலிருந்து தொண்டைமானாறுக்குத் தண்ணீர் வழங்குவதற்கு வாய்க்கால் ஒன்று அமைக்கப்பட்டு, சுண்டிக்குளம் சேதமடைந்ததால் அந்த வேலைகள் இடைநடுவில் நிறுத்தப்பட்டுள்ளது. சுண்டிக்குளம் புனரமைக்கப்பட்ட பின் இவ்வாய்க்கால்களை அமைத்தால், இடையிலுள்ள ஊர்களுக்கான கிணறுகளும் உவர் நீரற்ற நன்னீர்க் கிணறுகளாக மாறக்கூடிய வாய்ப்புக்கள் உண்டு. இவ்வாய்க்கால்களுக்கு இடையே குறுக்காக நிலத்துக்குக்கீழ் போதுமான அளவு ஆழத்துக்கு "கொங்கிரீட்" கட்டுக்களை அமைத்து, நிலக்கீழ் குளங்களை - underground reservation - உண்டாக்கலாம் என்ற ஒரு திட்டமும் இதில் உள்ளடக்கப்பட்டிருக்கின்றது. இந்த நிலையில் மொரகஹகந்தையில் இருந்து நீரைக் கொண்டுவருவதென்ற மாயையைக் கைவிட்டு, ஆனையிறவு நீரேரித் திட்டத்தை மேற்கொள்வது பொருத்தமாக இருக்குமென நான் கருதுகின்றேன்.

கோடை காலங்களில் வட பகுதியில் தண்ணீர்ப் பிரச்சினையென்பது ஒரு பாரிய பிரச்சினையாகக் காணப்படுகின்ற சூழலில், 2009ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் 11ஆம் திகதிய "Sunday Observer" பத்திரிகையில் தனுஷி யட்டவர என்பவரால் எழுதப்பட்ட கட்டுரையில், மாங்குளத்தில் 2030ஆம் ஆண்டில் ஐந்து இலட்சம் மக்கள் குடியேற்றப்படுவார்கள் என்றும் மாங்குளத்தை யாழ்ப்பாணத்துக்கு நிகரான ஒரு நகராக உருவாக்க நகர அபிவிருத்தி அதிகாரசபையினால் தீர்மானிக்கப் பட்டிருப்பதாகவும் மாங்குளத்தில் மீள்குடியேற்றப் படவிருக்கின்ற ஐந்து இலட்சம் மக்களுக்கு இரணைமடுவிலிருந்து குடிநீர் வழங்கப்பட உள்ளதெனவும் குறிப்பிடப்பட்டுள்ளது. இந்த இரணைமடுக் குளத்தினுடைய தண்ணீர் கிளிநொச்சியைத் தாண்டி, மாங்குளத்துக்கும் அதனுடைய தெற்குப் பகுதிகளுக்கும் விநியோகிக்கப் படுமானால், எதிர்காலத்தில் கிளிநொச்சி மாவட்ட விவசாயிகளின் நீர்ப்பாசனப் பிரச்சினையும் அங்குள்ள மக்களது குடிநீர் பிரச்சினையும் என்னவாகும்? என்ற பாரிய கேள்வி அந்த மக்களுடைய மனங்களில் எழுகின்றது. இதுவரையில் நீர்வழங்கல், வடிகாலமைப்புச் சபையினால் கிளிநொச்சி மாவட்ட விவசாயிகள் அழைக்கப்பட்டு, அவர்களுக்கு இந்த நீர்வழங்கல் தொடர்பாக போதிய விளக்கம்கூட வழங்கப்படவில்லை; அவர்களோடு இது தொடர்பாகப் பேசப்படவுமில்லை. மாறாக, யாழ்ப்பாணத்துக்கு நீரை வழங்குவதற்கான பாரிய திட்டங்கள் நடைமுறைப் படுத்தப்படவுள்ளதாகப் பத்திரிகைகளில் வெளிவருகின்ற செய்திகளைத்தான் அந்த மக்கள் படிக்கின்றார்கள்.

இந்த இரணைமடுக் குளத்தை நம்பியிருக்கின்ற திருவையாறு, வட்டக்கச்சி, இராமநாதபுரம் மற்றும் உருத்திரபுரம் பகுதிகளில் இருக்கின்ற பாரிய அளவிலான வயல் நிலங்கள் உட்பட முரசுமோட்டை, கண்டாவளை போன்ற பிரதேசங்களில் உள்ள மக்களும் இதனால் பாதிக்கப்படக்கூடிய சந்தர்ப்பங்கள் இருக்கின்றன. ஆகவே, இதற்கென நிரந்தரமானதும் சரியானதுமான ஒரு தீர்வைப் பெற்றுக்கொள்ளவேண்டுமானால், அரசானது கிளிநொச்சி மாவட்டத்தில் இருக்கின்ற புத்திஜீவிகளையும் விவசாயிகளையும் ஒன்றிணைத்து, அவர்களுடன் இதுபற்றிக் கலந்துரையாடி, சரியான முறையில் ஆய்வுகளை மேற்கொள்ளவேண்டும். இதனைத் தவிர்த்து, எந்தவித சரியான திட்டமிடலுமின்றி, யாழ்ப்பாணத்துக்கு தண்ணீரைக் கொண்டுசெல்வதினூடாக, யாழ். மாவட்டத்துக்கும் கிளிநொச்சி மாவட்டத்துக்குமிடையில் ஒரு பனிப்போரை உருவாக்குவதற்கு அரசு முயற்சிப்பதாகவே மக்கள் உணர்கிறார்கள். இன்று அரசினால் கொண்டுவரப் பட்டிருக்கின்ற இந்தத் திட்டங்கள் மேம்போக்காக நல்லவையாகத் தோற்றமளித்தாலும்கூட, இவை அந்த மக்களுடைய வாழ்வாதாரத்திலே பாரியளவான தாக்கங்களை ஏற்படுத்தக்கூடியவையாக இருப்பதாகவே உணர்கின்றோம். இந்த மக்களுடைய குடிநீர் பிரச்சினையென்பது மிக முக்கியமானது. யாழ்ப்பாணத்தின் தீவகத்துக்கும் யாழ். மண்ணின் ஏனைய பகுதிகளுக்கும் குடிநீர் வழங்கப்பட வேண்டும் என்பதில் யாரும் மாற்றுக் கருத்துக்களைக்

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

கொண்டிருக்கவில்லை. ஆனால், கிளிநொச்சி மாவட்டத்திலுள்ள மக்கள் புறந்தள்ளப்பட்டு, அவர்களுடைய நிலைமைகள் புறக்கணிக்கப்பட்டு, அவர்களுடைய சூழல்கள் எதுவும் கருத்திற்கொள்ளப்படாமல் இந்தத் திட்டம் மேற்கொள்ளப்பட்டால், கிளிநொச்சி மண் ஒரு பாரிய துன்பத்தை சந்திக்கவேண்டிய நிலை ஏற்படும்.

நான் ஏற்கெனவே, குறிப்பிட்டதுபோல் "Sunday Observer" பத்திரிகையில் வெளியாகிய கட்டுரையில், 2030ஆம் ஆண்டில் ஐந்து இலட்சம் மக்கள் வன்னிவிளாங்குளம், அம்பாள்புரம், கொல்லவிளாங்குளம், ஒட்டறுத்தகுளம், மணவாளன்பட்ட முறிப்பு, தச்சடம்பன், ஒலுமடு, அம்பகாமம், மாங்குளம், பனிக்கங்குளம், திருமுறிகண்டி, இந்துபுரம், கனகராயன்குளம், மன்னகுளம் போன்ற பகுதிகளில் குடியமர்த்தப்பட இருப்பதால், அங்கு பாரிய வேலைத்திட்டங்களை மேற்கொள்ளப்போவதாக பல படங்களுடன் கூடிய விபரங்கள் குறிப்பிடப்பட்டுள்ளன. இதுவொரு திட்டமாக நடைமுறைப் படுத்தப்பட்டால், இரணைமடுக் குளத்திலிருந்து தண்ணீரானது என்ன திட்டத்தின் அடிப்படையில் கொண்டுசெல்லப்பட இருக்கின்றது? அங்கு 2030ஆம் ஆண்டில் குடியமர்த்தப் படவிருக்கும் ஐந்து இலட்சம் மக்களும் எந்தவகையில் குடியேற்றப்படுவார்கள்? என்கின்ற பாரிய வினாக்கள் அந்த மக்களுடைய மனங்களில் எழுகின்றன. இச்செயற்பாடானது தங்களைப் பாரியதொரு துன்பகரமான சூழலுக்குள் தள்ளவிருப்பதாகவே அந்த மக்கள் எண்ணுகின்றார்கள்.

அதேபோல, கீரிமலைப் பகுதியில் "கற்குவாரி" என்ற பெயரில் பாரிய அளவிலான கற்கள் தோண்டி எடுக்கப்பட்ட வண்ணம் இருக்கின்றன. அது தொடர்பாக 2010ஆம் ஆண்டு மே மாதம் 09ஆம் திகதிய "Sunday Times" பத்திரிகையில் ஒரு கட்டுரை வெளிவந்திருக்கின்றது. அந்தக் கட்டுரையிலே, இச்செயற்பாட்டின்மூலம் யாழ். குடாநாட்டுக்குள் கடல்நீர் உட்புகுந்து, அங்கு குடிநீர் எவ்வாறு பாதிப்படையும் என்பது பற்றி மிகத் தெளிவாகச் சொல்லியிருக்கின்றார்கள். யாழ்ப்பாணத்தில் நடைமுறைப்படுத்தப்படுகின்ற கற்குவாரி வேலைகளைத் தடுத்து நிறுத்தவேண்டுமென நாங்கள் இந்தச் சபையினூடாகப் பலமுறை கோரிக்கை விடுத்திருந்தோம். ஆனால், தொடர்ந்தும் அங்கு அந்தக் கற்கள் தோண்டப்படும் வேலை நடைபெற்று வருவதனால், யாழ்ப்பாணக் குடாநாட்டுக்குள் கடல்நீர் உட்புகுந்து பாரிய பாதிப்புக்கள் ஏற்பட்டுக்கொண்டிருக்கின்றன.

வட மாகாணத்தின் பல இடங்களிலும் இருக்கின்ற மக்களுடைய குடிநீர்ப் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு, குறிப்பாக நெடுந்தீவிலே, இரண்டு வகையான நீர்ப்பாசன நடவடிக்கைகளை மேற்கொள்ளலாம். ஒன்று இயற்கையாக வழிந்தோடும் நீர்ப்பாசன முறை - gravitational irrigation, மற்றையது ஏற்று நீர்ப்பாசன முறை - lift irrigation. நீர் நிலை உயரமாகவும் பயனடையும் நிலம் தாழ்வாகவும் இருந்தால் முதலாவதாகக் குறிப்பிட்ட நீர்ப்பாசன முறையைப் பயன்படுத்த முடியும். நீர்நிலை தாழ்வாகவும் பயனடையும் நிலம் உயர்வாகவும் இருந்தால் இரண்டாவதாகக் குறிப்பிட்ட நீர்ப்பாசன முறையே பொருத்தமானதாகும். நெடுந்தீவிலுள்ள குளங்கள் களிமண்ணால் நிரப்பப்பட்டிருப்பதால் அக்களி மண்ணுக்கூடாக மழைநீர் வடிய முடியாது வெளியேறிச் சென்று கடலுடன் கலப்பதைக் காணக்கூடியதாகவுள்ளது. ஆகவே, அக்குளங்களில் நிரம்பியிருக்கும் களிமண்ணை அகற்றி, நிலத்தில் மழைநீரைத் தேக்கி கற்பூமிக்குள் வடிய விடுவதன்மூலம் நீரின் உப்புத்தன்மை அகற்றப்படுவதுடன், நெடுந்தீவு மண்ணிலே கூடுதலான குடிநீர் பெறுவதற்கும் கோடை காலங்களில் நீர்த்தட்டுப்பாடு ஏற்படுவதைத் தடுப்பதற்கும் வாய்ப்புக் கிடைக்கும் என்பது எனது கருத்தாகும்.

ஆகவே, இரணைமடுக் குளத்திலுள்ள நீரை யாழ்ப்பாணத்துக்குக் கொண்டுசெல்லும் முயற்சி முறையாகக் கையாளப்பட வேண்டியது அவசியமாகும். அதற்கு, முதலில் கிளிநொச்சி மாவட்ட விவசாயிகள் விவசாயம் செய்வதற்கும், அம்மாவட்டத்திலுள்ள மக்களுடைய இதர தேவைகளுக்கும் போதிய அளவு நீரைப் பகிர்ந்தளித்ததன் பின்னர் அரசு அந்த நீரை வட மாகாணத்துக்குத் திசைதிருப்பிச் செல்வதற்கேற்ற திட்டத்தை அமுல்படுத்துவதே சரியானதாகும். அதனைவிடுத்து, அதனைத் திசைதிருப்புவதற்காக மொறகஹ கந்தை திட்டம் ஏற்படுத்தப்படும் என்று அல்லது மகாவலியின் "எச்" வலயம் கொண்டுவரப்படும் என்று சொல்வதன்மூலம் அல்லது வேறு திட்டங்களை அறிவிப்பதன்மூலம் அப்பிரதேச மக்களுக்கு எந்த விதமான விமோசனமும் கிடைக்கப் போவதில்லை. ஆகவே, இலங்கையில் கடைசியாக உருவாக்கப்பட்ட கிளிநொச்சி மாவட்டம் இந்த நீர்ப் பிரச்சினையால் பாரிய துன்பங்களைச் சந்திக்கக்கூடிய சூழல் தோன்றியுள்ள நிலையில், இவ்விடயம் தொடர்பில் கூடிய கவனம் செலுத்தப்பட வேண்டும் என நான் இச்சபையினூடாகக் கேட்டுக்கொள்கின்றேன்.

இதைவிட, கடந்த வாரம் யாழ்ப்பாணப் பல்கலைக்கழகத்திலே நடைபெற்ற ஒரு முக்கிய பிரச்சினை தொடர்பாக இச்சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். இரண்டு நாட்களுக்கு முன்னர் - 2012.11.30ஆந் திகதி -பல்கலைக்கழக நிர்வாகத்துக்கு அறிவிக்காமல், யாழ். பல்கலைக்கழகக் கலைப்பீட மாணவர் ஒன்றியத்தின் தலைவர் கனகசுந்தரசுவாமி ஜெனமேஜெயன் என்பவரையும் விஞ்ஞானபீட மாணவன் சண்முகம் சொலமன் என்பவரையும் கைதுசெய்வதற்கான முயற்சிகள் மேற்கொள்ளப்பட்டபொழுது, பல்கலைக்கழக நிர்வாகம் அவர்களை கடந்த 30ஆம் திகதி கோப்பாய் பொலிஸ் நிலையத்தில் ஒப்படைத்திருந்தது. அதைவிட, 2012.12.01ஆந் திகதி அதிகாலை 1.30 மணியளவில் யாழ். பல்கலைக்கழக மாணவர் ஒன்றியத்தின் செயலாளர் பரமலிங்கம் தர்சானன் என்பவரும் மருத்துவபீட மாணவன் கணேசமூர்த்தி சுதர்சன் என்பவரும் எந்தவித அறிவித்தலுமின்றி அவர்களின் வீடுகளில் வைத்துக் கைதுசெய்யப்பட்டிருக்கிறார்கள். அதேபோன்று 2012.12.02ஆந் திகதி - நேற்றைய தினம் அதிகாலை 3.30 மணியளவில் யாழ். பல்கலைக்கழக முகாமைத்துவபீட மாணவர் ஒன்றியத்தின் தலைவர் பரந்தாமன் சபேஷ்குமார் என்பவருடைய வீட்டுக்குச் சென்ற பொலிஸார் அவரை நேற்றுக்காலை 9.30 மணிக்கு முன்னர் பொலிஸாரிடம் ஒப்படைக்கும்படி கூறியுள்ளனர். அதேவேளையில் பருத்தித்துறையில் உள்ள யாழ். பல்கலைக்கழக விஞ்ஞானபீட மாணவன் செல்வரத்தினம் ரேணுகாந்தன் என்பவருடைய வீட்டுக்குச் சென்ற பொலிஸார் அவரையும் 9.00 மணிக்கு முன்னர் தங்களிடம் ஒப்படைக்குமாறு அவருடைய வீட்டிலுள்ளவர்களுக்குக் கட்டளையிட்டுள்ளனர். இந்நிலையில் யாழ். பல்கலைக்கழகத்திலுள்ள மாணவர்கள் மிகவும் அதிகளவு துன்பங்களைச் சந்தித்திருக்கிறார்கள். ஏற்கெனவே குற்றத்தடுப்புப் புலனாய்வுப் பொலிஸாரிடம் நால்வர் ஒப்படைக்கப்பட்டிருப்பதாக நேற்றைய தினம் உறுதிப்படுத்தப்பட்டிருக்கிறது.

பொலிஸார் மாணவர்களைக் கைது செய்வதாயின் சரியான முறையில் அவர்களுக்கு முன்னறிவித்தல் கொடுத்து, பகல் நேரங்களில் கைதுசெய்ய முடியும். ஆனால்

அவ்வாறின்றி என்ன காரணத்துக்காக நள்ளிரவு 1.30 மணிக்கும் நள்ளிரவு 3.30 மணிக்கும் சென்று பாரிய குற்றம்புரிந்த பயங்கரவாதிகளைக் கைதுசெய்வதைப்போன்று, பாரிய படைநகர்த்தலுடன் அவர்களைப் பயமுறுத்தும் வகையிலே கைது செய்ய வேண்டும்? என்ற கேள்வி யாழ்ப்பாண மக்களிடம் எழுந்துள்ளது. இத்தகைய நிகழ்வு அம்மக்கள் மத்தியில் மிகப்பெரிய அச்ச சூழலையும் பீதியையும் தோற்றுவித்துள்ளது. இந்தச் செயற்பாடுகளினால் இன்று யாழ்ப்பாணப் பல்கலைக்கழகம் அல்லோலகல்லோல நிலையை அடைந்துள்ளது. யாழ். பல்கலைக்கழக ஆசிரிய சமூகம் எடுத்த முயற்சியினால் இன்றைய தினம் அவர்கள் பொலிஸாருடன் பேச்சுவார்த்தையில் ஈடுபட்டிருக்கிறார்கள். பல்கலைக்கழக நிர்வாகத்தினரால் பொலிஸாரிடம் ஒப்படைக்கப்பட்ட அம்மாணவர்கள், அவர்களுக்குத் தெரியாமலேயே இன்று வவுனியாவுக்குக் கொண்டு செல்லப்பட்டுள்ளனர். இன்னும் பல மாணவர்கள் தேடப்பட்டுவருவதாகவும் அறிகிறோம்.

இந்த நிலையில் ஒன்றை நீங்கள் புரிந்துகொள்ள வேண்டும். அதாவது, இவ்வருடம் நவம்பர் மாதம் 27ஆந் திகதி இந்து மக்கள் அனுஷ்டிக்கும் கார்த்திகை விளக்கீட்டுத் தினமாகும். அதனால் அன்றைய தினம் இந்து மக்கள் கார்த்திகை விளக்கீட்டுக்கான தீபத்தை ஏற்றவேண்டியது அவர்களின் சமயக் கடமையாகும். ஆனால், மாவீரர் தினமும் அன்றைய தினத்தில் அனுஷ்டிக்கப்படுவதால், அன்றைய தினம் மாலை 5.00 மணிக்கே இராணுவத்தினரும் பொலிஸாரும் யாழ்ப்பாணப் பல்கலைக்கழகத்துக்குள் உட்புகுந்திருக்கின்றனர். கார்த்திகை மாதத்தில்தான் இந்து மதத்தவர்கள் கௌரி விரதம், கந்தசஷ்டி விரதம், கார்த்திகை விரதம், கார்த்திகை விளக்கீடு ஆகிய விரதங்களை அனுஷ்டிப்பது வழக்கம். இந்த மாதத்தில் அனுஷ்டிக்கப்படும் இந்த விடயங்களைத் தொடர்ந்துதான் பிள்ளையார் கதை, திருப்பாவை, திருவெம்பாவை போன்ற விரதங்கள்கூட அனுஷ்டிக்கப்படுவதுண்டு. ஆகவே, இந்தக் கார்த்திகை மாதத்தில் வருகின்ற தமிழர்களுடைய விரத நாட்களைக்கூட அவர்களால் அனுஷ்டிக்க முடியாத ஒரு சூழல் அங்கு உருவாக்கப்பட்டிருக்கிறது. இந்த கார்த்திகை மாதத்தில்தான் பிரித்தானியாவில் வீரர்களுக்கான தினத்தைக் கொண்டாடுகிறார்கள். ஏன், இலங்கையில்கூட ஜே.வி.பீ.யினர் இறந்துபோனவர்களுக்கான தியாகிகள் தினத்தை 'கார்த்திகை வீரர்கள் தினம்' எனக் கொண்டாடுகிறார்கள். இந்த நிலையில்தான் தமிழர்கள் கேட்கிறார்கள், தங்களுக்காக இறந்துபோனவர்களை, தங்களோடு வாழ்ந்த பிள்ளைகளை தாங்கள் மட்டும் ஏன் நினைவுகூரக்கூடாது? என்று. அதில் நியாயம் இருக்கின்றது.

சிங்கள மக்களுக்கு ஒரு வகையான நியாயமும் தமிழர்களுக்கு இன்னொரு வகையான நியாயமும் இருப்பதன்மூலம் இந்த நாட்டிலே நல்லிணக்கத்தை ஏற்படுத்த முடியாது. தன்னோடு வாழ்ந்தவர்களுக்காக, தன்னுடைய பிள்ளைக்காக, தன்னுடைய தந்தைக்காக, தன்னுடைய தனயனுக்காக அன்றைய தினம் ஒரு விளக்கு கொளுத்துவதற்குக்கூட அவர்களுக்கு முடியவில்லை. இந்த மண்ணிலே அந்த உரிமைகூட தமக்கு இல்லையென்ற எண்ணம் தமிழர்களிடம் ஏற்பட்டிருக்கிறது. இதேபோல, முள்ளிவாய்க்காலில் இறந்துபோன மக்களுக்காக கடந்த மே மாதம் 18ஆம் திகதி விளக்கு கொளுத்த முயன்றபோது படையினர் அவர்களைத் தடுத்த சூழ்நிலையையும் இந்த மக்கள் கண்டிருக்கிறார்கள். எதிர்வரும் மே மாதத்திலும் உங்களால் அதனைப் பார்க்க முடியும். ஆகவே, மக்கள் தங்களுடைய மன நிம்மதிக்காகவும் மன ஆறுதலுக்காகவும் விளக்குகளைக் கொளுத்தி ஆராதனை செய்வதற்கு இந்த அரசு அனுமதிக்க வேண்டும். இது ஒரு மனித உரிமைப் பிரச்சினை! இது அவர்களுடைய மனங்களோடும் மனித நேயத்தோடும் சம்பந்தப்பட்டதாகும்.

மக்களுடைய நிம்மதியான வாழ்வுக்கு அபிவிருத்தி மட்டும் போதுமானதல்ல, நிம்மதியான, நியாயமான வாழ்வு கிடைப்பதென்பதும் முக்கியமானது. இந்த வாழ்விலே முக்கியமாக பல்கலைக்கழக மாணவர்களுடைய கருத்துக்கள் மற்றும் அவர்களுடைய நிலைமைகள் கவனத்திலெடுக்கப்பட வேண்டும். தமிழ் மாணவர்கள் இவ்வாறு இடைநேரங்களில், அதுவும் அதிகாலை மற்றும் இரவு வேளைகளில் கைதுசெய்யப்படுவது இந்த நாட்டில் பயங்கரமான சூழ்நிலையைத் தோற்றுவித்திருக்கிறது. இதை அரச பயங்கரவாதம் என்று சொல்வதா? அல்லது இராணுவ அடாவடித்தனம் என்று சொல்வதா? இதைப் பார்க்கும்போது யாழ்ப்பாணம் என்ன சூழ்நிலையில் இருக்கின்றதென்பதை வெளிப்படையாகக் கேட்கவேண்டிய சூழல் தோன்றியிருக்கிறது.

கடந்த 30ஆம் திகதி பலஸ்தீனத்துக்கு ஐக்கிய நாடுகள் சபையிலே பார்வையாளர் அந்தஸ்து கிடைத்திருக்கிறது. யாஸீர் அரபாத் அவர்கள் இன்று உயிருடன் இல்லை. ஆனால், அவரது பூதவுடல் தோண்டியெடுக்கப்பட்டு ஆராய்ச்சி செய்யப்படுகின்றது. அந்த நாட்டுக்கு இன்று அங்கீகாரம் கிடைத்திருக்கிறது. ஏற்கெனவே, தென்னாபிரிக்காவும் இந்த நிலையிலே ஒரு விடுதலையைப் பெற்றுக்கொண்டது. இந்தியாவின் பிரபல சஞ்சிகையான "இந்தியா ருடே" 1990களில் ஒரு கருத்துக் கணிப்பை வெளியிட்டிருந்தது. உலகத்திலே மூன்று முக்கிய கரந்தடிபடைத் தலைவர்களின் பெயர்களை அதிலே குறிப்பிட்டிருந்தது. நெல்சன் மண்டேலா, யாஸீர் அரபாத் மற்றும் வேலுப்பிள்ளை பிரபாகரன் என்போரோ அந்த மூவருமாவர்.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கிறது.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
நெல்சன் மண்டேலா அவர்கள் தன்னுடைய காலத்திலே அந்த நாட்டுக்கு விடுதலையைப் பெற்றுக்கொடுத்தார். யாஸீர் அரபாத் இன்று உயிருடன் இல்லாவிட்டாலும் இன்று அந்த நாடு பூமிப்பந்திலே ஓர் அந்தஸ்தைப் பெற்றிருக்கிறது. வேலுப்பிள்ளை பிரபாகரன் இறந்தாரென்பது இன்னும் விஞ்ஞான ரீதியாக உறுதிப்படுத்தப்படவில்லை. பலஸ்தீனமும், தென்னாபிரிக்காவும் இன்று ஐக்கிய நாடுகள் சபையில் அங்கத்துவம் பெற்றிருப்பதைப்போல தங்களுக்கும் ஓர் அந்தஸ்து கிடைக்கும் என்ற நம்பிக்கை தமிழர்களிடம் இருக்கிறது. ஆகவே, இன்றைய காலச்சூழலையும் உலகத்தினுடைய சரியான நிலைப்பாடுகளையும் தமிழர்களுடைய உண்மையான மனநிலைகளையும் புரிந்துகொண்டு அவர்களுக்கு ஒரு தீர்வு வழங்குவதற்கு இந்த அரசு முன்வர வேண்டும். இந்த மக்களுடைய இனப்பிரச்சினை தீர்க்கப்படாதவரை, இந்த நாட்டில் புரையோடிப் போயிருக்கின்ற இனப் பிரச்சினைக்கு ஒரு தீர்வு காணப்படாதவரை இந்த நாட்டில் அமைதியின்மையும் பிரச்சினைகளும்தான் தொடர்ந்து கொண்டிருக்கும்.

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

ஏற்கெனவே, இந்த நாட்டில் மாணவர்கள்மீதும் இளைஞர்கள்மீதும் நடத்தப்பட்ட அடாவடிகள் இப்பொழுது பல்கலைக்கழக மாணவர்கள்மீதும் அரங்கேறியிருக்கின்றன. இந்த அடாவடிகளுக்கு ஒரு முற்றுப்புள்ளி வைக்க வேண்டுமென்று கேட்டு, நிறைவுசெய்கின்றேன். நன்றி.

[11.00 a.m.]

**ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා (නැවත පදිංචිකිරීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு விநாயகமூர்த்தி முரளிதரன் - மீள்குடியேற்ற பிரதி அமைச்சர்)

(The Hon. Vinayagamoorthi Muralidaran - Deputy Minister of Resettlement)

Thank you, Hon. Deputy Chairman for this opportunity given to speak when the Votes of two very important Ministries, the Ministry of Water Supply and Drainage and the Ministry of Irrigation and Water Resources Management, are being taken up for discussion.

First of all, I would like to answer the Hon. Shritharan who spoke about the Iranamadu Scheme. He need not fear because there will not be any problem for the people of Kilinochchi when water from the Iranamadu Tank is taken to Jaffna. Now, we are going to allocate more than Rs. 20,000 million to raise the Iranamadu Tank bund by more than five feet and only excess water will be supplied as drinking water to the people of Jaffna. We have already done a project such as this in Unnichchai in the Eastern Province. We have raised the Unnichchai Tank bund by five feet and we supply drinking water to 300,000 people in the Batticaloa District. There is no harm caused to the farmers of Unnichchai due to this project. They have done more cultivation in those areas this year and have got good profits also. That is why I say that you need not fear about that scheme.

People in Jaffna are also our people. So, we have to give water to them. Otherwise, who is going to give them water? You are speaking about Tamil people, but you neglect giving water to the Jaffna people. They are also our people. That is why our Government has made a decision to provide drinking water to them. There are no bad effects created by this project.

Sir, I really appreciate our Minister, the Hon. Nimal Siripala de Silva. He came several times to the Batticaloa District and allocated a large sum of money to major irrigation schemes. There are more than 10 major irrigation schemes in the Batticaloa District. The Hon. Minister allocated Rs. 45 million for the Kaddumurivu Scheme. Under that scheme, he allocated Rs. 92 million for the concretion of a road used by the farmers. It is the longest road in the Batticaloa District and about 19 kilometres of the road has already been completed by now. Through that scheme, people have benefited. They have cultivated nearly 1,000 acres of paddy during the last Yala season and have got a lot of benefits from that. At the same time, under the Wakaneri Scheme, which is one of the major schemes, he has already allocated Rs. 5 million to renovate the tank and allocated Rs. 7 million for the Sempayadi Anicut. Further, he has allocated Rs. 6 million for the Punanai Anicut, which supplies water to about 8,500 acres of paddy lands and people are doing paddy cultivation with that water. In the last Yala season, they have got a lot of harvest in those areas.

The other major scheme is the Rugam Scheme. Under that scheme, Rs. 150 million has been allocated for the Mavadi Odai Anicut. That work is going on now. On completion of that project, people of those areas will be getting a lot of benefits. At the same time, Rs. 200 million has been allocated for renovation of the dam and that also has already been done. Nearly 9,750 acres of paddy land have been cultivated during the Yala season from the water that people get under the Rugam Scheme.

Hon. Minister and I went nearly 60 kilometres into the Thoppigala Junction and we saw the Kitulwewa Tank and the Rugam Tank. We are going to join these tanks in a future project. The Hon. Minister has already ordered the Secretary and other officers to do a feasibility study in that area. If we implement that project, we would be able to cultivate 9,750 acres of land in that area. I really appreciate the support given by our Hon. Minister who is here in this House now.

The other is the Unnichchai Dam Project. The Unnichchai Dam is the biggest dam in the Batticaloa District. For that, Rs. 883 million has already been allocated from the Votes of the Ministry of Irrigation and Water Resources Management to raise the tank bund by five feet.

The Hon. Dinesh Gunawardena, Minister of Water Supply and Drainage, is also present in the House. He has allocated Rs. 11 million for that water supply project. Now 300,000 people living in that area are getting the benefit. They get drinking water from that tank. At the same time, I must tell you that people there have cultivated 12,750 acres of land and they got a big profit during the last Yala season.

A sum of Rs. 50 million has been allocated for the renovation of Navakiri Tank, which comes under one of the major irrigation schemes. People of that area are cultivating 17,500 acres of land from the waters of the Navakiri Tank. I really appreciate the work done by the Hon. Minister in this regard. People in the Batticaloa District are benefited from this project and there are no more problems related to water there.

A sum of Rs. 5 million was allocated for the renovation of Wadamunai Tank and for the renovation of Welkakandi Tank, Rs. 3 million was allocated. A sum of

Rs. 2 million was allocated for the renovation of Thumpankerni Anicut. People in those areas are getting the benefits and 47,300 acres have been cultivated by them. I must especially mention one fact. That is, during the last Yala season, many districts were affected by the drought. People in Anuradhapura, Polonnaruwa, Ampara, Hambantota, Kurunegala and Monaragala Districts lost their paddy harvest due to the drought. The harvest got from those areas was very poor. Even we, in the Batticaloa District, faced the drought, but no one lost a single acre of paddy due to the drought. I really appreciate the Hon. Minister for doing very good water resources management projects in that area. That was why people were able to harvest 300,700 metric tons of paddy in the last Yala season. Hon. Members representing the TNA from the Batticaloa District are present here in the House. They know the reality from A to Z. Nobody can deny that. I would like to again appreciate the Hon. Minister for the development work done in those areas.

The Ministry of Irrigation and Water Resources Management is doing a lot of work not only in our areas but also around the country. Moragahakanda, Kalu Ganga and Kantalai projects are among those. People in the Trincomalee District are getting drinking water from the Kantalai Tank. At the same time, they are getting a lot of benefits from the development work done in those areas. Therefore, without acknowledging those facts, you cannot just blame the Government saying that the Government has done nothing in those areas. After 30 years of war, we cannot do all the development work in those areas just in three years. Development work in those areas has already been started. Water resources management projects in the Eastern Province have already been started. I really appreciate the work done by the Hon. Dinesh Gunawardena and the Deputy Minister, Hon. (Mrs.) Nirupama Rajapaksa.

There is one village called, "Tirunelveli", where there was no drinking water; the Hon P. Ariyanethran of TNA knows that very well. More than Rs. 10 million has been allocated for the water supply project there. We are going to get water from Ampara and we will be able to complete this water supply project at the end of next year. Thereafter, people in the Batticaloa District will never face a problem of drinking water. We are going to complete drinking-water projects in those areas.

In the same way, we are going to do water resources management projects in the Northern Province also. But, are there problems. We accept that. The Ministry of Water Supply and Drainage and the Ministry of Irrigation and Water Resources Management have done the necessary feasibility studies and they will start water supply projects in the Northern Province as well. We are going to complete all the projects in those areas within two years. Thereafter people in those areas, especially the people in the Jaffna District, will also get the benefits. We are going to supply water to the areas in the Jaffna District from the Iranamadu Tank. As you know, the scientists are telling now that after 20 or 50 years, the waters in the Jaffna Peninsula will turn salty, because the Jaffna Peninsula is surrounded by the sea. They have found that calcium gets mixed with the water and as a result the water turns salty. That is why His Excellency the President has given directions to start these water supply projects using the water from the Iranamadu Tank. That is for our Tamil people. Why you are neglecting them? They are also your people. We want you to give water to them. That is why I kindly request you not to disturb these kinds of projects. Come and give all the support to the Minister to supply water to those areas.

That is why I repeat again and again that I really appreciate the Hon. Nimal Siripala de Silva. He came several times to Batticaloa. He has completed Wakaneri Scheme in Pondugalchenai Road where people faced a lot of hardships to cross the rivers. There are two rivers. Now, he has allocated nearly Rs. 50 million. We have already constructed one causeway and the other causeway is in progress. We are going to finish that project by January. I kindly request the Hon. Minister to come and open that bridge for the people, once it is completed. We are also constructing a nine-kilometre concrete road in the same area. Rupees 60 million has been allocated for Wakaneri Pondugalchenai Scheme. We have already got the money. Work is going on very well. Now, farmers are getting a lot of benefits. We are going to do many projects like that.

I really appreciate the work of both key Ministries - one providing drinking water and the other providing water for the agricultural sector. I really appreciate His Excellency President Mahinda Rajapaksa and the Minister, Hon. Basil Rajapaksa in the same way, He visited our Rugam Tank two or three times. He promised to develop that tank. I am grateful to the Ministers, Hon. Basil Rajapaksa, Hon. Nimal Siripala de Silva, Hon. Dinesh Gunawardena, and the Deputy Ministers, Hon. (Mrs.) Nirupama Rajapaksa and Hon. W.B. Ekanayake. I am also grateful to the staff of the Ministries and their permanent Secretaries. I really appreciate the work done by all of you. You have done a marvellous job in the Eastern Province. Thank you so much everybody.

Thank you.

[පූ.භා. 11.12]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ රටේ වැදගත් අමාත්‍යාංශ කිහිපයක් පිළිබඳව විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේදී කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම සම්බන්ධව සතුටු වෙනවා. අපේ රට වාරි කර්මාන්තය අතිනුත් වාරි තාක්ෂණය අතිනුත් ඉතිහාසය පුරාවට ඉතා ඉහළින්ම වැජඹුණු රටක්. අපේ රටේ පිහිටීම අනුව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

[ගරු අනුර දිසානායක මහතා]

මධ්‍යම කඳුකරයෙන් පටන් ගෙන රුරා හැලෙන ගංගා පද්ධතියක් රට පුරා විවිධ ප්‍රදේශවලින් මහ මුහුදට වැටෙනවා. වලවේ ගඟ අම්බලන්තොටින්, නිල්වලා ගඟ මාතරින්, ගිං ගඟ ගිංතොටින්, කළු ගඟ කළුතරින්, කැලණි ගඟ කැලණියෙන්, කලා ඔය පුත්තලම් දිසාවෙන්, මහවැලි ගඟ ගෝකන්නෙන් මහ මුහුදට වැටෙනවා. ඉතාමත් සුවිශේෂ වූ වැදගත්කමකින් යුතු පිහිටීමක් උරුමයක් අපේ රටට ලැබිලා තියෙනවා. අපේ රටේ මූලික ජනාවාස ගොඩ නැඟුණෙත් මේ වාරි පද්ධතිය කේන්ද්‍රගත කර ගෙනයි. මල්වතු ඔය අසබඩ අනුරාධ ග්‍රාම, කලා ඔය අසබඩ විජිත ග්‍රාම ආදී වශයෙන් අපේ රටේ ග්‍රාම පද්ධතිය ගොඩ නැඟුණේ වාරි පද්ධතිය කේන්ද්‍රගත කර ගෙනයි. අපේ ඉතිහාසයේ තාක්ෂණය ගොඩ නැඟුණෙත් වාරි පද්ධතිය කේන්ද්‍රගත කර ගෙනයි.

අපේ පුරාණ රජවරුන්ගේ හපන්කම් සහ ඔවුන්ගේ ගුණ වයන්නෙත් මේ වාරි කර්මාන්තය තුළ ඉටු කරන ලද ශ්‍රේෂ්ඨ සේවාවන් හේතු කොට ගෙනයි. පරාක්‍රමබාහු රජ්ජුරුවෝ මහා නරපතියෙක් හැටියට අපේ මනස තුළ තිබෙන්නේ, ධාතුසේන රජ්ජුරුවෝ මහා නරපතියෙක් හැටියට අපේ හිත් තුළ තිබෙන්නේ, ඒ වාගේම පළමු වැව හැටියට බසවක්කුලම වැව නිර්මාණය කළ පණ්ඩුකාභය රජ්ජුරුවෝ අපේ හදවත් තුළ නොනැසෙන චරිතයක් බවට පත් වී තිබෙන්නේ වාරි කර්මාන්තයට කරන ලද සේවය හේතු කොට ගෙනයි. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තිබෙන කනගාටුව මේකයි. පුරාණයේ අපි ආරක්ෂා කරන ලද වාරි පද්ධතියත් ඒ හා ගැට ගැහුණු මහා දැවැන්ත කෘෂි කර්මාන්තයත් අද ඉතාමත් අතුරු අන්තරායකාරී තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා.

විශේෂයෙන්ම අපේ රටේ ඉතිහාසයේ පුරාණයේ වැව් 32,000ක් තිබිලා තියෙනවා. මේ වැව්වලින් දැන් ඉතිරි වී තිබෙන්නේ 14,000යි. ඒ 14,000නුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 12,000ක් විනාශය අභිමුවට ඇවිත් තිබෙන්නේ. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් අපේ රටට පටවන ලද යම් ආර්ථික කරුණු හේතු කොට ගෙන මහා දැවැන්ත වාරි කර්මාන්තයක් විනාශයට පත් වුණා. උදාහරණයක් හැටියට ගත්තොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වාරියපොලින් පටන් ගෙන හලාවත දක්වා කිලෝමීටර් 50ක් දක්වා දිවෙන ඒ පාරට පමණක් වැව් අමුණු විශාල ප්‍රමාණයක් ගිල ගෙන තිබෙන බව අපි ඉතිහාසයේ අහලා තිබෙනවා. නමුත් අපේ පුරාණ රජවරු අහසින් වැටෙන වතුර ටික එක් රැස් කර ගත්තේ කොහොමද? එක පැත්තකින් වියළි කලාපය පුරා පැතිරුණු කුඩා හා මධ්‍ය පරිමාණ වැව් පද්ධතියෙන් වතුර ටික රැස් කර ගත්තා. අනෙක් පැත්තෙන් මධ්‍යම කඳුකරය ආරක්ෂා කර ගනිමින් රුරා ගලන ගංගා පද්ධතිය අංගම්මැඩිල්ල වේල්ලෙන් හරස් කර වතුර ටික උඩට ගත්තා. හැබැයි, අපේ රටේ සංවර්ධනයේ මහා විකෘති මිථ්‍යාව හමුවේ අපේ මධ්‍යම කඳුකරය විනාශයට පත් කළා. රන්දෙනිගල, රන්ටැඹේ, කොත්මලේ ඒ වාගේම සමනලවැව ජලාශ හදලා මධ්‍යම කඳුකරයට මහා දැවැන්ත හානි ගෙන එන ලද, මධ්‍යම කඳුකරය මුළුමනින්ම විනාශයට පත් කරන ලද වාරි කර්මාන්තයකට මේ රට අවතීර්ණ කළා. ඒක වැරැදියි.

අද මාස තුනක් හතරක් පායන කොට සියලු ගංගා පද්ධති හිඳෙන තත්ත්වයට පත් වී තිබෙන්නේ කුමක් නිසාද? තමුන්නාන්සේලා අපේ රටේ තිබුණු ස්වාභාවික සම්පත, එහි පිහිටීම, එහි ගුණාංග පිළිබඳ සැලකිල්ලට ලක් කොට අපේ රටේ වාරි කර්මාන්තය දියුණුවට ගෙනෙනවා වෙනුවට මධ්‍යම කඳුකරය මුළුමනින්ම විනාශ කරන තැනට පත් කර තිබෙනවා.

මධ්‍යම කඳුකරයේ ගොඩ නඟා තිබෙන ජලාශ දවස් දෙකක් නොකඩවා වහිනකොට උතුරා ගලන තත්ත්වයට පත් වී තිබෙනවා. එම ජලාශ සියයට 30කින්, 40කින් රොන් මඩවලින් පිරිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මධ්‍යම කඳුකරය මුළුමනින්ම විනාශයට පත් කර තිබෙනවා. හැබැයි, පුරාණයේ වැව් 32,000ක් තිබුණත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක වැවක්වත් මධ්‍යම කඳුකරයේ තිබුණේ නැහැ. මධ්‍යම කඳුකර පද්ධතියේ වැව් හැදුවේ නැහැ. ඒක අපේ රටේ ස්වාභාවික උරුමය. ඒ මත තමයි අපේ රටේ ජලස්කන්ධය රඳා පැවතුණේ. ඒ මත තමයි අපේ රටේ ස්වාභාවික සම්පත ආරක්ෂා වුණේ. හැබැයි, මහා විකෘති සංවර්ධනයක ප්‍රතිඵලයක් හේතුකොටගෙන මධ්‍යම කඳුකරය මුළුමනින්ම විනාශයට ලක් වී තිබෙනවා. අද එහි ප්‍රතිඵල බවට පත් වී තිබෙන්නේ මොකක්ද? කුඩා කාලයක් වහින්නේ නැති වන විට මේ ගංගා පද්ධතිය වියැළෙන තැනට පත් වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගිය අවුරුද්දේ පැවැති නියඟය දැවැන්ත නියඟයක් ලෙස අර්ථ කථනය කළත් එවැනි නියඟයක් තිබුණේ නැහැ. නමුත් මහා වාරි කර්මාන්ත පද්ධතියක් එක්ක ගොඩ නැඟී තිබුණු සියලු කෘෂිකර්ම බිම් විනාශ වුණා. මහවැලි "එච් " කලාපයේ කෘෂිකර්ම බිම් සියල්ල විනාශ වන්නට පටන් ගත්තා. ඒ වාගේම ගිරිතලේ ව්‍යාපාරය, කවුඩුල්ල ව්‍යාපාරය විනාශ වන්නට පටන් ගත්තා. නාච්චදුව ව්‍යාපාරයේ වතුර දුන්නේ නැහැ. මේ විධියට මේ වැරදි වාරි කර්මාන්තය හේතු කොට ගෙන අපේ රටේ මේ වාරි සම්පත ඉතාම අතුරු අන්තරාකාරී තත්ත්වයකට පත් වී තිබෙනවා. අඩුම තරමේ මේ දෙස මනා හැඟීමකින් යුතුව බලමින් මෙය නිවැරදි කරනවා වෙනුවට තමුන්නාන්සේලාත් අවතීර්ණ වෙලා තිබෙන්නේ ඒ දිසාවටම තමයි. ඒක තමයි තිබෙන කනගාටුව. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මහත්වරුන්ට දැනුම තාක්ෂණය තිබෙන්නට පුළුවන්. හැබැයි, ඔවුන් අපේ රටේ පිහිටීම, අපේ රටේ ස්වාභාවික සම්පත, ඒ ස්වාභාවික සම්පත අනාගත පරාම්පරාවන් ගණනාවකට ආරක්ෂා කර දෙන්නේ කොහොම ද, ඒ ස්වාභාවික සම්පත මත අපේ රටේ ජීවන වෘත්තිය සකස් කරන්නේ කොහොමද යන කාරණා ගැනත් සලකා බැලීම අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වාරි කර්මාන්තය කියන්නේ අපේ ජීවිතය. අපේ ජීවිතය ගැට ගැහිලා තිබුණේ ඒකත් එක්ක. අපේ සංස්කෘතිය ගොඩ නැඟුණේ එතැන. අපේ සභ්‍යත්වය ගොඩ නැඟුණේ එතැන. අපේකම ගොඩ නැඟුණේ එතැන. අපේ තාක්ෂණය හැදුණේ එතැන. මේ දැවැන්ත වාරි කර්මාන්තය අද බිහිසුණු අනතුරුකාරී තත්ත්වයකට පත් කර තිබෙනවා. තමුන්නාන්සේලා උඩු යටිකුරු කරන ලද මේ සංවර්ධනයේ ප්‍රතිඵල නිසා කුඩා ඉඩෝරයකට පවා මහා දැවැන්ත නියඟයක් ඇති කරන තත්ත්වයක් අද අපට ගෙනැවිත් දී තිබෙනවා. වැරදි සංවර්ධනයේ ප්‍රතිඵල, වැරදි සංවර්ධනයේ ඉලක්ක අපේ රටට මහා දැවැන්ත විනාශයක් ඇති කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ පොදු කරුණු එසේ තිබෙන අතර වර්තමාන ගරු ඇමතිතුමාගෙන් කරුණු කිහිපයක් මට දැන ගන්නට අවශ්‍යයි. පළමුවන කරුණ මේකයි. 2012.06.29 වනදා ඔබතුමන්ලා දමා තිබෙන කැබිනට් පත්‍රිකාව මා සතුව තිබෙනවා. මෙම කැබිනට් පත්‍රිකාව සකස් කිරීම සඳහා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා කමිටුවේ සභාපතිවරයා හැටියට කටයුතු කර තිබෙනවා. ඒ වගේම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා - අදාළ අමාත්‍යාංශයේ නිලධාරීන් ටික විතරක් ගත්තොත් - ඒ වාගේම මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සම්බන්ධ වෙලා තිබෙනවා. මේ ආයතන සම්බන්ධ වෙලා තමයි මෙම කැබිනට් පත්‍රිකාවට අවශ්‍ය මූලික පදනම හදා තිබෙන්නේ.

පළමු පියවරේදී වැව්, ජලාශ, විල් 17ක් දිය මත පාවෙන අහස් යානා ගොඩ බැස්සවීම සඳහා තෝරා ගෙන ඇත කියන කාරණයට මේ කැබිනට් පත්‍රිකාවෙන් තමුන්නාන්සේලා එකඟ වෙලා තිබෙනවා. මේක තමයි ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව. මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර දිය මත පාවෙන අහස් යානා ගොඩ බැස්සවීම වෙනුවෙන් තෝරා ගෙන තිබෙන ජලාශ 17 මේ පාර්ලිමේන්තුවට දැන් ඉදිරිපත් කරන්නය කියා. ජලාශ 17ක් තෝරා ගෙන තිබෙන බව කැබිනට් පත්‍රිකාවේ තිබෙනවා. මේ ජලාශ 17 මොනවාද, එයින් අපේක්ෂා කරන ප්‍රතිඵල කවරේද, එය අපේ රටේ වාරිමාර්ග ක්ෂේත්‍රයට කරන බලපෑම කවරේද, එය අපේ රටේ පදනම වූ කෘෂි කර්මාන්තයට කරන බලපෑම කවරේද කියා විග්‍රහාත්මක ප්‍රකාශයක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි. මේ වැව් අපේ රටේ ජනතාවගේ වැව්. ඒවා නිකම් කොන්ත්‍රාත්කාරයින්ට, සාමාන්‍ය පුද්ගලයන්ට, ඇමතිවරයාට හෝ නිලධාරින්ට අයිති වැව් නොවෙයි. මේවා අපේ රටේ ගොඩ නැඟුණු ඓතිහාසික උරුමයන්. එය මත ගනු ලැබූ තීන්දු, තීරණ මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශයට පත් කළ යුතුයි. මේ වැව් 17 මොනවාද කියා ප්‍රකාශ කළ යුතුයි.

ඊළඟට මම ඔබතුමාගෙන් දැන ගන්නට කැමතියි, 2011 අවුරුද්දේ පෙබරවාරි මාසයේ 07 වන දා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පළ කරන ලද දැන්වීම ගැන. ඒ දැන්වීමේ තිබෙන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජලාශවල සංචාරක බෝට්ටු සේවාවන් පැවැත්වීම සඳහා බදු දීමට සුදුසු ආයෝජකයන් කැඳවීම ගැනයි. ජලාශ 23ක් තිබෙනවා. මින්නේරියේ මින්නේරිය වැව, පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය, දඹුල්ලේ ඉබ්බන්කටුව වැව, ඒ වාගේම අනුරාධපුරයේ තිසා වැව, මහනුවර නුවර වැව ආදී වශයෙන් ප්‍රධාන ජලශ 23ක් සංචාරක බෝට්ටු ව්‍යාපෘතිය වෙනුවෙන් බදු දෙන්න ආයෝජකයන් කැඳවා තිබෙනවා. මේ වැව් 23 සඳහා දැනට ඉදිරිපත් කර තිබෙන බදු මුදල් ප්‍රමාණය කවරේද, තෝරා ගත් ආයෝජකයන් කවුද, ඒ ආයෝජකයන් අතර ඇති කර ගත් ගිවිසුම් මොනවාද කියා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. මේ බදු දෙන්නට හදන්නේ තමන්ගේ ඉඩමක් හෝ තමන්ගේ පරම්පරාවෙන් හම්බ වුණ බූදලයක් හෝ නොවෙයි. අපේ රටේ උපන් නූපන් පරම්පරාවට අයිති, අපේ රටේ ඓතිහාසික උරුමයක් පවට පත් වුණු, අපේ රටේ මුතුන් මිත්තන් හදපු, අපේ පරම්පරාවන් ආරක්ෂා කළ වැව් පද්ධතිය තමයි සංචාරක බෝට්ටු ව්‍යාපාරය වෙනුවෙන් බදු දෙන්නට තමුන්නාන්සේලා පත්තරයේ දැන්වීම දාලා තිබෙන්නේ. මේ දැන්වීම අනුව මේ ජලාශ 23 සඳහා දැන් ඇවිත් තිබෙන ආයෝජකයන් කවුද, මිල ගණන් මොනවාද, කොන්දේසි මොනවාද, එළඹෙන ලද එකඟතාවයන් මොනවාද කියා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කර තිබෙන්වේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි.

ඊළඟට මම තමුන්නාන්සේගෙන් මේ කාරණය ගැනත් දැන ගන්නට කැමතියි. කන්දකඩුව ගොවිපළ භූමිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයිතිව තිබුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එයට හෙක්ටෙයාර් 4,630ක් අයිතියි. අක්කර ප්‍රමාණය ගත්තොත් අක්කර 11,675යි. අක්කර 11,675කින් යුතු කන්දකඩුව ගොවිපළ පශු සම්පත් දෙපාර්තමේන්තුව සතුව තිබුණාට, ඉඩම මහවැලි අධිකාරිය සතුයි. මේ පිළිබඳව ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව මා ළඟ තිබෙනවා.

2012.02.10වන දින, මහින්ද රාජපක්ෂ මැතිතුමා, රාජ්‍ය ආරක්ෂක හා නාගරික කටයුතු අමාත්‍යවරයා හැටියට ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව මා ළඟ තිබෙනවා. මේ කැබිනට් පත්‍රිකාවෙන් මේ මුළු ඉඩමම යුද හමුදාව වෙත පවරා ගන්නවා. මහවැලි අමාත්‍යාංශය සතුව, භුක්තියේ තිබුණ ඉඩම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා ආරක්ෂක හමුදාව වෙත අත් පත් කර ගන්නවා. මේ කැබිනට් පත්‍රිකාවට අනුව මේ ඉඩම හෙක්ටයාර් 4,630ක ඉඩමක්. ඉන් පසුව මේ භූමියට මොකක්ද කළේ? තමුන්නාන්සේගෙන් මේ භූමිය නිදහස් කර ගන්න විට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය නිශ්චිත ලෙස කියනවා, අහවල් කටයුත්ත වෙනුවෙන් තමයි මේක යොදවන්නේ කියලා. හමුදාව මැදිහත් කර ගන්නා පශු සම්පත් ගොවිපොළක් තමයි මෙහි ආරම්භ කරනවා කිව්වේ. නමුත් අද ඒ ගොවිපොළ කරන්නේ හමුදාව නොවෙයි. කොම්පැනිවලට පැවරුවා. අපේ රටේ පොළොන්නරුවේ ගොවි අම්මා තාත්තාගේ දූවා දරුවන්ට ඉඩ කඩම් නැහැ. තුන්වෙනි පරම්පරාවේ ගොවි අම්මා තාත්තාගේ දූවා දරුවන්ට ඉඩ කඩම් නැහැ. කවුඩුල්ල ව්‍යාපාරයේ, ගිරිතලේ ව්‍යාපාරයේ, මින්නේරිය ව්‍යාපාරයේ, පොළොන්නරුවේ අම්මා තාත්තාගේ දූවා දරුවන්ට ඉඩ කඩම් නැතිව තිබියදී තමුන්නාන්සේලා මහවැලි අධිකාරිය සතුව තිබූ ඉඩම් අක්කර 11,675ක් යුද හමුදාවට පවරලා, යුද හමුදාව විසින් දැන් ඒක කොම්පැනිවලට පවරා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ ඉඩම් කොන්ත්‍රාත්කාරයින්ට පවරා දෙන්න හමුදාවට අයිතියක් තිබෙන්නේ කොහොමද කියලා අපි අහනවා. හමුදාවට business කරන්න අයිතියක් තිබෙනවාද? ඉඩම් පවරන්න හමුදාවට තිබෙන අයිතිය මොකක්ද? දැන් ඒ ඉඩම් ටිකට වෙලා තිබෙන්නේ මොකක්ද? මහවැලි කලාපයේ, පොළොන්නරුවේ ගොවි අම්මා තාත්තාගේ දූවා දරුවන්ට ගොවිතැන් බත් කරන්න, ගෙයක් දොරක් හදා ගන්න තිබුණ ඉඩ කඩම්වලට තමුන්නාන්සේලා කරලා තිබෙන දේ මොකක්ද? මේ ඉඩම අක්කර 11,675ක්. කුඩා ප්‍රමාණයක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ගිරිතලේ ව්‍යාපාරයේම තිබෙන්නේ අක්කර 7,500යි. මේ ඉඩම ගිරිතලේ ව්‍යාපාරය වාගේ එකහමාරක් විශාල ඉඩමක්. ගිරිතලේ ව්‍යාපාරයේ පවුල් 3,500ක් පදිංචි වෙලා ඉන්නවා. එතකොට මේ ඉඩමේ කොපමණ පවුල් ප්‍රමාණයක් පදිංචි කරවන්න පුළුවන්ද කියලා කල්පනා කරලා බලන්න. මේ රටේ මහ ජනයාට අයිති ඉඩම් තමුන්නාන්සේලා කොම්පැනියකට පැවරුවා. ඒ කොම්පැනිය ගොවිපොළ දාලා ගියා. ඉන් පසුව ආයෙත් කොම්පැනියකට පැවරුවා. පරිසර දෙපාර්තමේන්තුවේ අවසරය නැහැ. මධ්‍යම පරිසර අධිකාරියේ සැලසුම් ගැන සැලකිල්ලක් දැක්වූවේ නැහැ. ගස් කොළන් විනාශ කළා. පුරා විද්‍යා වටිනාකම් තිබෙන ස්ථාන විනාශ කළා. එහෙම කරලා අද ඒ ඉඩම් කොම්පැනිවලට පවරලා තිබෙනවා. තමුන්නාන්සේ ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවට පැහැදිලි කළ යුතුයි. මේවා මේ රටේ ජනතාවගේ ජාතික උරුමයන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට මොරගහකන්ද ව්‍යාපාරය ගැන බලමු. මොරගහකන්ද ව්‍යාපාරය මහවැලි ව්‍යාපාරයට අනුබද්ධව තිබුණා. හැබැයි මේ මොරගහකන්ද ව්‍යාපාරය, මහවැලි ව්‍යාපාරයෙන් පැත්තකින් තිබ්බා. ඒ වන විට කරන ලද පරීක්ෂණ අනුව කියනවා මොරගහකන්ද ජලාශය පිරවිය හැක්කේ, -අපේ රටේ සාමාන්‍ය වර්ෂාපතනය ඇගැයීමකට ලක් කළොත් අවුරුදු 10කට වරක් මහා වර්ෂාවක් ලැබෙනවා. 1978 දී අපේ රටට ඒ විදියේ වර්ෂාවක් ආවා. 1988 දී ආවා. මේ විදියට අවුරුදු 10කට වරක් අපේ රටට මහා දැවැන්ත වර්ෂාවක් එනවා. - අවුරුදු 10කට වරක් එන ඒ වර්ෂාවට විතරයි කියලායි. දැන් මොරගහකන්ද ජලාශය පටන් ගත්තා. දැන් සිදු වෙලා තිබෙන්නේ මොකක්ද?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මොරගහකන්ද ජලාශය වතුර නැති අනතුරකට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා ඒ සම්බන්ධව කළු ගඟ ව්‍යාපාරය පටන් ගන්නවා. මම ගාව කළු ගඟ ව්‍යාපෘතිය ගැන විස්තර තිබෙනවා. "ලග්ගල, පල්ලේගම කළු ගඟ ව්‍යාපෘතිය. ප්‍රධාන අරමුණ වන්නේ

[ගරු අනුර දිසානායක මහතා]

මොරගහකන්ද ජලාශයට ජලය සැපයීමයි. මෙහිදී නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි මාසවලදී සැලකිය යුතු ජල ප්‍රමාණයක් ඒකරාශී විය හැකි අතර අනෙක් කාලවලදී එය ඉතා කුඩා වේ." ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නමුත් කළු ගඟ ව්‍යාපෘතියේත් නොවැම්බර්, දෙසැම්බර් සහ ජනවාරි විතරයි වතුර තිබෙන්නේ. අනෙක් කාලවල කුඩා වෙනවා. එතකොට ඒකේ වතුර මොරගහකන්දට ගන්න බැහැ. ඒ නිසා ඊ ළඟ ව්‍යාපෘතිය හදනවා. මොකක්ද? මොරගහකන්දට රත්දෙනිගලින් වතුර ගන්න හදනවා. ඒක තමයි තමුන්නාන්සේලාගේ ඊ ළඟ සැලැස්ම. "රත්දෙනිගල, කළු ගඟ උමං ව්‍යාපාරය. රත්දෙනිගල ජලාශයේ සිට උමගකින් කළු ගඟ ජලාශයට ජලය ඒමේ ව්‍යාපෘතියක් සඳහා මූලික විමර්ශන කටයුතු සිදු කරමින් සිටි. රත්දෙනිගල ජලාශයේද ජලය නොමැත." ඊට පස්සේ දැන් රත්දෙනිගල ජලාශයේ වතුර නැහැ.

ඊ ළඟට කරන්නේ මොකක්ද? ඊ ළඟට තමුන්නාන්සේලා පහළ උමා ඔය යෝජනා ක්‍රමය යෝජනා කරනවා. "රන්ටැඹේ ජලාශයට වැටෙන උමා ඔය මැදින් හරවා කිලෝමීටර් 8ක් පමණ දිග උමගක් මඟින් රත්දෙනිගල ජලාශයට ජලය ගෙන ඒමට යෝජිතය." දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? මොරගහකන්ද ජලාශය හැදුවා. මොරගහකන්ද ජලාශයට වතුර නැහැ. ඊට පස්සේ කළු ගඟ ව්‍යාපාරය හදනවා. කළු ගඟ ව්‍යාපාරයටත් වතුර නැහැ. ඊට පස්සේ රත්දෙනිගලින් කළු ගඟට වතුර ගේනවා. ඊට පස්සේ රත්දෙනිගලට පහළ උමා ඔයෙන් වතුර ගේනවා. ඒ නිසා තමුන්නාන්සේලා මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කළ යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොරගහකන්ද ව්‍යාපාරය ගොඩ නැඟීම වෙනුවෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ Millennium Fund එක ඉස්සෙල්ලා සල්ලි දෙන්න එකඟ වුණා. ඒ ගොල්ලෝ ශක්‍යතා අධ්‍යයනයෙන් පස්සේ ඒක අත් හැරියා. ඊළඟට කුවේට් අරමුදල මුදල් දෙන්න එකඟ වුණා. ඒ ගොල්ලෝත් ශක්‍යතා අධ්‍යයනයෙන් පසුව අත් හැරියා. ඊ ළඟට දැන් තමුන්නාන්සේලා චීන රජයත් සමඟ එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. කරුණාකරලා, චීන රජයෙන් මේ ජලාශයට සල්ලි දීම සඳහා එන ලද එකඟතාවන්, ගිවිසුම්, පොලී පිළිබඳව මේ පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කළ යුතුයි. මොකද, මේවා මහ ජනයාගේ මුදල් සමඟ කරන කටයුතු නිසා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊ ළඟට අපේ දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව මම ඉතා කෙටියෙන් වුණත් කරුණු කිහිපයක් දක්වන්නට කැමැතියි. ඒක ජල සම්පත් හා ජල කළමනාකරණ අමාත්‍යාංශය. [බාධා කිරීමක්] මොකක් හරි, ජල සම්පත් අමාත්‍යාංශය. ඔබතුමාගේ අමාත්‍යාංශයේ නමත් හරියට කියන්න ඕනෑ නිසා මම කියන්නම්, මෙය ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය. දැන් ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය කියා කිව්වාට මෙම අමාත්‍යාංශයට නිශ්චිත ලෙස තිබෙන්නේ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විතරයි. අපි දන්නා විධියට National Water Supply and Drainage Board එක විතරයි. ඒකට ඇමතිතුමාත් ඉන්නවා; නියෝජ්‍ය ඇමතිතුමියත් ඉන්නවා; සභාපතිවරයාත් ඉන්නවා. එතකොට තිබෙන්නේ එක ආයතනයයි. ඒ එක ආයතනය වෙනුවෙන් ඇමතිවරයෙක් ඉන්නවා; නියෝජ්‍ය අමාත්‍යතුමියක් ඉන්නවා; සභාපතිවරයෙක් ඉන්නවා. හැබැයි, තුන් දෙනාටම තිබෙන්නේ එක ආයතනයයි. දැන් මම අහන්නේ, මේ තුන් දෙනාගෙන් බලවත් කවුද කියන එකයි.

ගරු අමාත්‍යතුමා සහ වෘත්තීය සමිති නියෝජිතයන් අතර 2012.08.15වැනි දා පැවැත්වුණු සාකච්ඡාවට මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඒ සාකච්ඡාවේ කරුණු අඩංගු පත්‍රිකාව මා ළඟ තිබෙනවා. මෙයට වෘත්තීය සමිතිවලින් ආවා, චන්ද්‍රසිරි පෙරේරා, උපාලි රත්නායක, මංජුල පෙරේරා, සුජීත් ප්‍රියන්ත, නිහාල් ලියනාරච්චි, ඒ.එච්.එම්. සුරවීර කියන අය. ඒ වාගේම සභාපතිතුමා, සාමාන්‍යාධිකාරීතුමා සහභාගි වුණා. ගරු අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ ලේකම් ඒ. අබේගුණසේකර මැතිතුමා මේ සාකච්ඡාවට සහභාගි වුණා. සේවා සාධක ඇගයීමේ ලකුණු 50 සීමාව, ලකුණු 60 දක්වා වැඩි කර තිබෙනවා, ඒක අඩු කරන්න කියලා ඒ සාකච්ඡාවේදී වෘත්තීය සමිති නියෝජිතයන් ඉල්ලා සිටියා. ඒ මොකද, සාමාන්‍යයෙන් ගත්තොත් අවුරුදු 55ට පසුව සේවා දිගුවක් දෙන කොට සේවා කාලය, හැසිරීම, යෝග්‍ය අයෝග්‍ය බව, විශ්වාසය, කාර්යක්ෂමතාව ආදී නිර්ණායකයන්ගෙන් ලකුණු 50ක් ගත්තාම සේවා දිගුවට සුදුසුකම් ලබනවා. හැබැයි, කලින් තිබුණ විධියට සේවා දිගුවට සුදුසුකම් ලබන්නේ ලකුණු 50ක් ගත්තාමයි. හැබැයි ඒක ලකුණු 60ක් කරන්න ඕනෑ කියලා තමුන්නාන්සේලාගේ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් අර ගෙන තිබුණා.

ඒ තීරණය මා ළඟ තිබෙනවා. එහෙම තීරණය කළාට පස්සේ ඒ සාකච්ඡාවේදී ගරු ඇමතිතුමා ඒ ගැන අවධානය යොමු කරලා මෙහෙම කියනවා. "ඒ කථාව සාධාරණයි, මේ සම්බන්ධව මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයකට යන්න, ඒක ලකුණු 50 සීමාව දක්වා ගෙන එන්න." මේක තමයි ඔබතුමා දුන්න නිර්දේශය. මම අහන්නේ ඒ නිර්දේශය දැන් ක්‍රියාත්මකද කියලායි. දැන් ඇමතිතුමා ඉන්නවා. නියෝජ්‍ය ඇමතිතුමිය ඉන්නවා. ඊට පස්සේ සභාපතිවරයා ඉන්නවා. දැන් ඇමතිවරයා තීරණයක් දීලා තිබෙනවා. ඒක ක්‍රියාත්මක කරන්න තිබෙන්නේ සභාපතිවරයාටයි. සභාපතිවරයා ඒ තීරණය ක්‍රියාත්මක කළාද? මේ සාකච්ඡාව සිද්ධ වුණේ අගෝස්තු මාසයේ 15වැනි දා. දැන් මාස හතරකට කිට්ටු වෙලා තිබෙනවා. හැබැයි, අමාත්‍යවරයා දුන්න තීරණය අද සභාපතිවරයා ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ අනුව මේ තුන් දෙනාගෙන් බලවත් කවුද? සභාපතිවරයා නේ. අද ඇතිවෙලා තිබෙන තත්ත්වය මට වඩා හොඳට ඔබතුමා දන්නවා නේ.

ඊළඟට මම ඔබතුමාගේ අවධානය යොමු කරවන දෙවැනි කරුණ මෙයයි. "ජලය සම්ප්‍රේක්ෂණ සහ බෙදා හැරීම, නළ එළීම සමඟ මාර්ග සංවර්ධන ව්‍යාපෘති හදිසි අවශ්‍යතා සඳහා ජල නළ විශාල ප්‍රමාණයක අවශ්‍යතාව" යන මැයෙන් ඔබතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. ඔබතුමා ඉදිරිපත් කළ ඒ කැබිනට් පත්‍රිකාව මා ළඟ තිබෙනවා. ඒ කැබිනට් පත්‍රිකාවෙන් ඔබතුමා ඉල්ලා සිටියේ වෙන මොකක්වත් නොවෙයි, භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 500ක් හා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් රුපියල් මිලියන 200ක් අර ගෙන අලුතින් ජල නළ තොගයක් ගෙන්වීමටයි. ඒ ජල නළ තොගයක් ගැනීම වෙනුවෙන් තමයි භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 500ක් ඉල්ලලා, තමුන්නාන්සේලා රුපියල් මිලියන 200ක් දෙන්නම් කියලා මේ කැබිනට් පත්‍රිකාව දැම්මේ. හැබැයි, ඒ කැබිනට් පත්‍රිකාව කැබිනට් මණ්ඩලයෙන් සම්මත වුණාද? මේ කැබිනට් පත්‍රිකාව සම්මත වුණේ නැහැ. ඒක ඔබතුමා දන්නවා. සම්මත වුණේ නැත්තේ ඇයි? ජල නළ පද්ධතියක් මිල දී ගන්න ඕනෑ, ඒ සඳහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 500ක් හා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් රුපියල් මිලියන 200ක් දෙන්නම් කියලා තමයි තමුන්නාන්සේ කැබිනට් පත්‍රිකාව දැම්මේ.

කැබිනට් පත්‍රිකාව කැබිනට් මණ්ඩලයෙන් අනුමත කළේ නැහැ. අනුමත නොකරන්න හේතුව මොකක්ද? හේතුව වෙන මොකක්වත් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ වන විටත් මණ්ඩලය සතුව රුපියල් බිලියන 1.8ක -රුපියල් මිලියන

1800ක- තොග තිබියදී මෙසේ ඉල්ලීම සුදුසු නැති බව අවධාරණය කරලා, ඒක ප්‍රතික්ෂේප කළා. එහෙම නම් රුපියල් මිලියන 1800ක ජල නළ තොගයක් තිබියදී, නැවතත් රුපියල් මිලියන 700ක ජල නළ මිල දී ගැනීම සඳහා ඉල්ලීමක් කළේ ඇයි? ඒ ඉල්ලීම සඳහා කැබිනට් පත්‍රය සකස් කරන්න සභාපතිවරයාගේ මැදිහත්වීම මොකක්ද? මම හිතන්නේ සභාපතිතුමා විසින් කරන ලද දේ තමයි ඔබතුමා කැබිනට් මණ්ඩලය ඉදිරියේ අපහසුතාවට පත් කිරීම. මොකද, සභාපතිවරයා දැන ගෙන හිටියා, ගෙනාපු තොග තිබෙනවා කියලා. හැබැයි, ගෙනාපු තොග ඔහේ පුස්කෑවට සල්ලි හම්බ වෙන්නේ නැහැ. ඒවා ඔහේ ගොඩ ගැහිලා තිබෙනවා. අලුතින් තොග ගෙනාවොත් විතරයි ඒ ගොල්ලන්ට යමක් හම්බ වෙන්නේ. ඒ නිසා තොග ගොඩ ගහලා තිබියදී අලුතින් තොග ගන්න ඕනෑ කියලා කැබිනට් පත්‍රිකාවක් දැම්මා.

හැම දේම අනුමත කරපු කැබිනට් මණ්ඩලය මොකක් හෝ හේතුවකට මේ කැබිනට් පත්‍රිකාව නම් අනුමත කරලා නැහැ. ඒ පිළිබඳව අපි ස්තුතිවන්ත වෙන්නත් ඕනෑ. අඩුම තරමින් ඒ කැබිනට් පත්‍රිකාව අනුමත නොකිරීම පිළිබඳව. මීට කලින් අනුමත කරපු ඒවා පිළිබඳව තමයි අපට විවේචන තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ කරුණ ඉදිරිපත් කරපු එක ගැන ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා ඔය කියවන්නේ භාණ්ඩාගාරයෙන් එවන ලද නිරීක්ෂණ. නමුත් එම නිරීක්ෂණ සාධාරණ නැති බවට අපි කරුණු පැහැදිලි කර තිබෙනවා. පයිප්ප වර්ග ගණනාවක් තිබෙනවා. එක පයිප්ප වර්ගයකින් මේ සියලු කටයුතු කරන්න බැහැ කියා තමුන්නාන්සේත් දන්නවා. ඒ නිසා භාණ්ඩාගාරයේ නිරීක්ෂණය නිවැරදි කිරීමට අපි නැවත යවා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හොඳයි. හැබැයි, ඒ කැබිනට් පත්‍රිකාවත් මා ළඟ තිබෙනවා; මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණත් මා ළඟ තිබෙනවා; ඊට පසුව කැබිනට් මණ්ඩලය ගත්තු තීරණයත් මා ළඟ තිබෙනවා. කැබිනට් මණ්ඩලය පොතක් එවනවානේ, තීරණ ඇතුළත් කරලා. ඒ තීරණයේ copy එකකුත් මා ළඟ තිබෙනවා. මා ළඟ තිබෙන්නේ මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ විතරක් නොවෙයි. කැබිනට් පත්‍රිකාවයි, මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණයි, කැබිනට් මණ්ඩලයේ තීරණ දැනුම් දෙන පොතේ ඒ පිටුවට අදාළ ඡායා පිටපතයි මා ළඟ තිබෙනවා.

ඊළඟට මා ඔබතුමාට මේ කාරණය අවධාරණය කරන්න කැමැතියි. ඔබතුමන්ලාගේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගත්තා, "ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාණ්ඩ ආනයනය කරන කොට මානව සංවර්ධන ඉලක්ක සැපිරූ ඉහළ රටවලින් ඒ භාණ්ඩ ගැනීමට කටයුතු කරනවා" කියලා. 2012.09.27 වැනිදා ඔබතුමා අමාත්‍යාංශයේ නිලධාරින් සියලු දෙනා එක්ක සාකච්ඡාවක් පවත්වා තිබුණා. ඒ සාකච්ඡාවේ minutes තමයි මා ළඟ මේ තිබෙන්නේ. ඒ නිසා මේ මා කියන කරුණු වෙන කොහෙන්වත් ලබා ගත් උපුටා ගැනීම් නොවෙයි. මා මේ ඔක්කෝම කරුණු කිව්වේ, එක්කෝ කැබිනට් පත්‍රිකාවලින්, එක්කෝ පුවත් පත් දැන්වීම්වලින්, එක්කෝ සාකච්ඡා පත්‍රිකාවලින්.

ගරු ඇමතිතුමනි, ඒ සාකච්ඡාවේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරින් අමතමින් ඔබතුමා අසා තිබෙනවා, "මානව සංවර්ධන දර්ශකය පදනම් කර ගනිමින් ප්‍රසම්පාදන කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය යම් තීරණයක් ගෙන ඇත්ද" කියලා. ඔබතුමා ඒක අහපු එක හොඳයි. මේ මිලදී ගැනීම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය අරගෙන තිබෙන තීරණය කුමක්ද? ඔවුන් තීරණය කර තිබෙනවා, මානව සංවර්ධන දර්ශක පදනම් කර ගනිමින් ඉහළ රටවල්වලින් ඒ භාණ්ඩ මිල දී ගන්න. ඊට පස්සේ සඳහන් වෙනවා, "ගරු ඇමතිතුමා අදහස් දක්වමින්, රජයේ ප්‍රතිපත්තිවලට එරෙහිව එවැනි තීරණයක් ගැනීමට කටයුතු කළ ආකාරය විමසූ අතර, එම තීරණයේ අරමුණ සංවර්ධිත රටවලින් පමණක් භාණ්ඩ ගැනීම බව ප්‍රකාශ කරන ලදී." කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියා තිබෙනවා, නිලධාරින්ගේ ඒ තීරණය වැරදියි කියලා. එවිට, සාමාන්‍යාධිකාරී කේ.එල්.එල්. ප්‍රේමනාත් මහතා අදහස් දක්වමින්, "එසේ නොවන බවත්, එහි අදහස සංවර්ධිත රටක් එම භාණ්ඩ ලබා ගෙන තිබිය යුතු වීම පමණක් බවත් පැහැදිලි කරන ලදී." යනුවෙන්.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! ඔබතුමාට තව විනාඩි දෙකක් පමණයි තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හොඳයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා අවසන් කරනවා.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාටත් පැහැදිලියි, අධ්‍යක්ෂ මණ්ඩලය ගන්නා ලද මේ තීරණය සාධාරණ තීරණයක් නොවන බව. මේ සාකච්ඡාවේදී දිගින් දිගටම ඔබතුමා ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කර තිබෙනවා. එතකොට ඔබතුමාත් එකඟ නොවෙන තීරණයක් අධ්‍යක්ෂ මණ්ඩලය අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අධ්‍යක්ෂ මණ්ඩලයට ඒක ප්‍රතිපත්තිමය තීරණයක් වෙලා තිබෙනවා. ඒක තමයි වැදගත්. ඒ තීරණය ගත යුතු වන්නේ කැබිනට් මණ්ඩලයෙන්. ඒ මිලදී ගැනීම් පිළිබඳව යම් යම් කොන්දේසි දමනවා නම්, වෙනස් කරනවා නම් ඒ තීරණ ගන්න ඕනෑ කැබිනට් මණ්ඩලයෙන්. එතකොට කැබිනට් මණ්ඩලය ගත යුතු ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට මේ අධ්‍යක්ෂ මණ්ඩලයට බලය දුන්නේ කවුද? ඔබතුමා ඒ ගැන විමසන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, ඒ පත්‍රිකාව අධ්‍යක්ෂ මණ්ඩලයට කවුරු විසින්ද ඉදිරිපත් කළේ? මා දන්නා විධියට එය ඉදිරිපත් කළේ සභාපතිවරයා. වෙන කවුරුත් නොවෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒ තීරණය වෙනස් කිරීමට මා උපදෙස් දීලා තිබෙනවා. ඔබතුමාට ඒ ඔක්කෝම විස්තර කවුරු හෝ දීලා තිබෙනවා. මා ස්තුතිවන්ත වෙනවා මේ කාරණය ඉදිරිපත් කළාට. මා ඉතා පැහැදිලිව කිව්වේ, ආසියාවේ දියුණු වුණු රටවල් ජාත්‍යන්තර තත්ත්වයට සුදුසුකම් ලබනවා නම් ඒ අයට ඒ ඉඩ කඩ දෙන්න ඕනෑ, අපට මේ වාගේ පොහොසත් රටවල අනුකරණවාදීන් වෙන්න බැහැ කියන එකයි. ඒකයි ඇමතිවරයා හැටියට මා දරන මතය. රජය දරන මතයත් ඒකයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔබතුමා ඒ විධියටම කියපු බව මේ නිරීක්ෂණවල තිබෙනවා. දැන් තිබෙන ප්‍රශ්නය තමයි, අමාත්‍යවරයාගේ බල සීමාවට ඇතුළු වෙන්න අධ්‍යක්ෂ මණ්ඩලයට අවසර ලැබුණේ කොහොමද කියන එක. ඒකයි මට තිබෙන ප්‍රශ්නය. මා නැවතත් අහන්නේ ඒකයි.

[ගරු අනුර දිසානායක මහතා]

මණ්ඩලයක් තිබෙනවා; ඇමතිවරයෙක් ඉන්නවා; නියෝජ්‍ය අමාත්‍යවරයෙක් ඉන්නවා; සභාපතිවරයෙක් ඉන්නවා. හැබැයි දැන් සිද්ධ වෙලා තිබෙන දේ තමයි ඇමතිවරු දෙදෙනාටම උඩින් සභාපතිවරයෙක් ඉඳීම. මේ තීරණවලින් මට පෙනෙන්නේ ඒකයි. ඊළඟට කරුණ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කථාව අවසන් කරනවා. මේ කරුණ කියන්න විතරක් මට ඉඩ දෙන්න.

ගරු ඇමතිතුමනි ඔබතුමා දන්නවා, ජල ව්‍යාපෘතියක් පිළිබඳ යෝජනාවක් එන කොට ඉස්සර වෙලාම කරන්නේ මහජන නියෝජිතයකු හරහා විශාල මුදලක් වැය වන ව්‍යාපෘතියක් ඇස්තමේන්තු කර ගැනීම බව. ඊට පසුව තමන් දන්නා කොන්ත්‍රාත් සමාගමක් එක්ක ක්ලබ්වලට, හෝටල්වලට ගිහින් ඒ ගැන කථා කරනවා. නැත්නම් සිංගප්පූරුවේ ආයතන එක්ක ඒ ගැන කථා කරනවා. ඒ කථා වට දෙක තුනක් යනවා. ඊට පස්සේ විදේශීය බැංකුවක් හෝ ආයතනයක් ආයෝජනයට හොයා ගන්නවා. ඒකත් ඒ අයගේම වැඩක්. ඒ ඇස්තමේන්තුවට බැංකු පොලී, අනිකුත් කුලී හා කොමිස් ආදිය එකතු වෙනවා. ඊට පස්සේ ඒ යෝජනාව ගෙනාපු දේශපාලනඥයාට කියනවා භාණ්ඩාගාරයෙන් ඒ ව්‍යාපෘතියට අනුමැතිය ගන්න කියලා. කොහොම හරි එයට අනුමැතිය අරගත්තාට පස්සේ, ජල සම්පාදන මණ්ඩලයෙන් කැබිනට් සන්දේශයක් දමලා අර ආයෝජකයා එවන මුදලින් මණ්ඩලය තෝරා ගත් කොන්ත්‍රාත්කරුට ව්‍යාපෘතිය පිරිනැමෙනවා. ඒක තේ, සිද්ධ වන ක්‍රියාවලිය. එතකොට ඇස්තමේන්තුව, ව්‍යාපෘතිය, කොන්ත්‍රාත්තුව, උප කොන්ත්‍රාත්තුව, ව්‍යාපෘතියේ වැඩ කිරීම, පරීක්ෂා කිරීම, බිල් කිරීම, බිල් ගෙවීම ආදී සියල්ල එකම තැනකින් සිදු වනවා. මේකට හොඳම උදාහරණයක් මා කියන්නම්. ඒ තමයි තවම සාකච්ඡා මට්ටමේ තිබෙන ඇඹිලිපිටිය කිරිඉබ්බන්ආර පානීය ජල ව්‍යාපෘතිය. ඒක මේ සිද්ධියට කදිම නිදසුනක්. ඔබතුමා බලන්න, එහි සාමාන්‍ය ඇස්තමේන්තුව මිලියන 600ක් පමණ තමයි තිබෙන්නේ.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
දැන් අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හැබැයි, මිලියන රුපියල් 600ට තිබෙන ඒ ඇස්තමේන්තුව මිලියන 3,000ක් දක්වා යන්නයි දැනට සාකච්ඡා වෙමින් තිබෙන්නේ. ජල බිල අධික ලෙස වැඩි කරමින් මහජනයාගෙන් එකතු කර ගන්නා මුදල් විශාල ලෙස කාබාසිනියා කරන ව්‍යාපෘතියක් ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.37]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
**(**மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ අප අමාත්‍යාංශය මඟින් ඉටු කරන සුවිශේෂී කාර්ය භාරය පිළිබඳ විස්තර කරන්න මා බලාපොරොත්තු වෙනවා.

වාරිමාර්ග ක්ෂේත්‍රය මෙරට ආර්ථික සංවර්ධනය සඳහා දායක වන සුවිශේෂ ක්ෂේත්‍රයක් ලෙස හඳුනා ගනිමින්, සෑම අය වැයකින්ම ඒ සඳහා දැවැන්ත මුදල් ප්‍රමාණයක් වෙන් කිරීම පිළිබඳව පළමුවෙන්ම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සංඛ්‍යා ලේඛන දෙස බැලුවොත් ඔබතුමාට පෙනේවි, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය වෙනුවෙන් 2010 වර්ෂයේ රුපියල් මිලියන 11,575ක්, 2011 වර්ෂයේ රුපියල් මිලියන 17,779ක්, 2012 වර්ෂයේ රුපියල් මිලියන 34,108ක් -බිලියන 34ක්- එන වර්ෂය සඳහා රුපියල් මිලියන 40,500ක් -බිලියන 40ක්- වෙන් කර තිබෙන බව. මෙයින් පෙනී යන්නේ මේ රටේ වාරි කර්මාන්තය සඳහා, ඒ වාගේම ජල සම්පත වැඩිදියුණු කිරීම සඳහා, පානීය ජලය ලබා දීම සඳහා අපේ දායකත්වය ලබා දීමේ අවශ්‍යතාව මහින්ද චින්තන ඉදිරි දැක්ම මඟින් ඉතාම ඉහළින් පිළිගෙන ඇති බවයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසු ගිය වර්ෂයේ ඇති වූ ගංවතුර නිසා අපට අභියෝග රාශියකට මුහුණ දෙන්න සිදු වුණා. අපේ රටට පමණක් නොවෙයි, දේශගුණික විපර්යාස නිසා ඇති වූ ඒ තත්ත්වයට ලෝකයේ සෑම රටකටම පාහේ මුහුණ දෙන්න සිදු වුණා. නමුත් අප ඒ අභියෝගයට මුහුණ දුන්නා. මනා ජල කළමනාකරණයක් තුළින් එහි හානිය අවම කර ගැනීමට අපේ නිලධාරින් හා අපේ අමාත්‍යාංශ සමත් වුණා. ඒ නිසා පිට රටින් සහල් ගෙන්වීමේ අවශ්‍යතාව අපට පසු ගිය අවුරුදු දෙක තුළදී පැන නැඟුණේ නැහැ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා ඇහුවා, අනිකුත් අමාත්‍යාංශ සමඟ අපේ සම්බන්ධීකරණයක් තිබෙනවාද, නැද්ද කියලා. අපි කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය, සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයත්, ඒ වාගේම මහා භාණ්ඩාගාරයත් සමඟ සම්බන්ධතාව ඇති කර ගනිමින් රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා ගත යුතු උපරිම වැඩ පිළිවෙළ හා ක්‍රමෝපාය භාවිත කළා. විශේෂයෙන්ම එතුමා කිව්වා, මුල් කාලයේදී වැහි ජලයෙන් මඩ වැඩ කරන්න අපේ ගොවීන්ට උගන්වන්න ඕනෑ කියලා. ඒකට තමයි මාත් මේ උත්සාහ කරන්නේ. එතුමා කියනවා මා ගොවීන්ට බනිනවා ලු. ඒ ගොවීන් ඒවා කරන්න බැහැ කිව්වාම ඇත්ත වශයෙන්ම මා පෙන්වා දෙනවා ඒක වැරදියි කියලා. අපි කාලාන්තරයක් තිස්සේ කියන දෙයක් මේක. පසු ගිය දින කීපයේම අපි කිව්වා, වැස්ස තිබෙන නිසා මඩ වැඩ පටන් ගන්න කියලා. නමුත් ඔවුන් කියනවා, "වැවෙන් වතුර දෙනකම් අපි වැඩ පටන් ගන්නේ නැහැ" කියලා. ඉතින් මේ ආකල්පමය වෙනස එතුමා ඇති කරන්න හැදුවා වාගේම, අපිත් ඒ වෙනස ඇති කිරීමට කටයුතු කරනවා. ඒක අපි කළ යුතුයි. ජල කළමනාකරණය පිළිබඳව ගොවි ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අපේ අමාත්‍යාංශය වෙහෙස ගන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වාරිමාර්ග ක්ෂේත්‍රයට මේ තරම් දැවැන්ත මුදල් ප්‍රමාණයක් ලබා දුන්නාට, භෞතික සම්පත්වලින් පමණක් වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කරන්න අපට පුළුවන්කමක් නැහැ. අපට ඒ සඳහා මානව සම්පතක් අවශ්‍යයි. අද වාරි ඉංජිනේරුවන් -බීඑස්සී උපාධිය ගන්න ඉංජිනේරුවරු- අපේ දෙපාර්තමේන්තුවට එන්නේ නැහැ. එයට හේතුව මොකක්ද? අද පෞද්ගලික අංශයට ගිහින් කොළඹට වෙලා ශීත කාමරවල ඉඳගෙන, මීට වඩා වැඩි පඩියක් අරගෙන වැඩ කරන්න පුළුවන්කම තිබෙන නිසා, අපි දෙන අඩු වැටුපට ඔවුන් අපේ සේවයට එන්නේ නැහැ.

මම අපේ ලේකම්තුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද එතුමා මේ පිළිබඳව භාණ්ඩාගාරයට කියලා ක්ෂේත්‍රයේ සේවය කරන ඉංජිනේරුවන් වෙනුවෙන් රුපියල් 15,000ක අමතර දීමනාවක් ලබා දුන්නා. දැන් තත්ත්වය ටිකක් හොඳයි. නමුත් කාර්මික නිලධාරින්ගේ අවශ්‍යතාව අපට හුඟාක් තිබුණා. අවුරුදු ගණනාවක් තිස්සේ -ජයවික්‍රම පෙරේරා මහත්මයාගේ කාලයේත්- ගල්ගමුව අපේ මධ්‍යස්ථානයෙන් පුහුණු කළේ කාර්මික නිලධාරින් 20යි; 25යි. මම දැනට ගල්ගමුව මධ්‍යස්ථානයේ 200ක් පුහුණු කර තිබෙනවා. අන්තර් ජාතික මට්ටමේ මෙවැනි කාර්මික පුහුණු මධ්‍යස්ථානයක් මාසයකට ඉස්සෙල්ලා අපි කොත්මලේ ප්‍රදේශයේ විවෘත කළා. එය ඉතාම දර්ශනීය, ගුණාත්මකභාවයෙන් ඉහළ හොඳ මධ්‍යස්ථානයක්. ඒ මධ්‍යස්ථානයේ දැන් 60 දෙනෙකු පුහුණු වෙනවා. කොළඹත් මේ වාගේ මධ්‍යස්ථානයක් හදලා ඉදිරි අවුරුදු තුන තුළදී මෙවැනි කාර්මික නිලධාරින් දහසක් බිහි කරන්නටයි අපි බලාපොරොත්තු වන්නේ. එහෙම කළොත් තමයි මේ වාරි ක්ෂේත්‍රයේ තිබෙන දැවැන්ත වැඩ ප්‍රමාණය ඉදිරියට කරගෙන යාමට අපට අවශ්‍ය මානව සම්පත ලබා ගන්න පුළුවන් වන්නේ. එවැනි දර්ශනයකින් යුතුව තමයි අපේ අමාත්‍යාංශය වැඩ කටයුතු කරන්නේ.

මේ වාරි මාර්ග ක්ෂේත්‍රය තුළ සේවය කරන කාර්මික නිලධාරින්ට ඉංජිනේරුවන් වීමේ වරප්‍රසාදය ලබා දෙමින් ඔවුන්ට වැඩි දුර අධ්‍යාපනය සඳහා උපකාරීවන සියලු අවශ්‍යතාවන් සපුරන්න අපි කටයුතු කරනවා. විශේෂයෙන්ම අපි ආඩම්බර වෙන්නට ඕනෑ, අපේ වාරි මාර්ග ඉංජිනේරුවරුන් විදේශ උපදේශකයන් නැතුව, විදේශ අයගේ සහයෝගයක් නැතුවම දැවැන්තම වාරි ව්‍යාපාර තුනක කටයුතු කරගෙන යෑම සම්බන්ධව. ඒවායින් රඹුක්කන් ඔය වාරි ව්‍යාපෘතිය අපි එන අවුරුද්දේ මාර්තු මාසය වෙන කොට විවෘත කරනවා. සම්පූර්ණ දේශීය තාක්ෂණයෙන්, දේශීය ඉංජිනේරුවන් විසිනුයි ඒ කටයුතු කරන්නේ. විදේශීය consultantsලා කවුරුත් නැහැ. දැදුරුඔය ව්‍යාපෘතියත් එහෙමයි. ඒ වාගේම ගුරුගල් ඔය ව්‍යාපෘතියත් එහෙමයි. මේ ව්‍යාපෘති තුනම අපි එන අවුරුද්දේ විවෘත කරනවා. දේශීය තාක්ෂණයෙන්, දේශීය ඉංජිනේරුවරුන්ගේ දායකත්වයෙන් තමයි මේ සියල්ලම කරන්නේ. ඒ ගැන අපි ආඩම්බර වෙන්නට ඕනෑ. අපේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අඩු පාඩුකම් තිබෙනවා. එහි යල් පැන ගිය පරිපාලන පද්ධතීන් තිබෙනවා. ඒවා වෙනස් කර ගන්න ටිකක් අමාරු වුණත් ඔවුන්ගේ තාක්ෂණික දැනුමට හා හැකියාවට මම හැම වෙලාවේම හිස නමනවා. නමුත් මේක පරිපාලනමය වශයෙන් වඩාත් ශක්තිමත් දෙපාර්තමේන්තුවක් බවට පත් කිරීමට තමයි මම නිතරම වෙහෙසෙන්නේ.

විශේෂයෙන්ම මොරගහකන්ද ව්‍යාපෘතියේ වැඩ අපි රජයේ මුදල්වලිනුයි ආරම්භ කර තිබුණේ. අපි සන්තෝෂ වෙනවා, මේ අවුරුද්දේදී අපට චීනයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 252ක මුදලක් ලබා ගෙන ඒ වැඩ කටයුතු කරගෙන යන්න ලැබෙන එක ගැන. China Sinohydro සමාගම මොරගහකන්ද ව්‍යාපෘතියේ ඉදිකිරීමේ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම කුවේට් අරමුදලෙන් අපි කළුගඟ ව්‍යාපෘතිය ආරම්භ කරනවා. ඒ සඳහා අවශ්‍ය කරන උපදේශකයන් තෝරා ගැනීමේ වැඩ කටයුතු මේ දිනවල කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමා කියන විධියට නියඟයක් ආවාම මේ ව්‍යාපෘතිවල ජලය හිඳී යාවිය කියලා හිතන්න බැහැ. මෙවැනි ව්‍යාපෘතියක් කරන කොට, අපි පසු ගිය අවුරුදු 30ක වර්ෂාපතනය ගණන් බලලා තමයි ඒ ව්‍යාපෘතියේ සාර්ථකභාවය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනය කරන්නේ. ඒ අධ්‍යයනයන් සියල්ල කරලා තමයි මේ ව්‍යාපෘතිය ඇතුළු සියලුම ව්‍යාපෘතීන් අපි ආරම්භ කරලා තිබෙන්නේ. ඉඳලා හිටලා මේ විධියට අවුරුදු 10කට වතාවක් නියඟයක් ආවා කියලා අපට වැව් හදන එක නතර කරන්න බැහැ. මේ ව්‍යාපෘතීන් හදන එක අපට නතර කරන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊට වඩා ගැඹුරු ලෙස අපි මේ පිළිබඳව කථා කරන්නට ඕනෑ. ඒ වාගේම තමයි උමා ඔය ව්‍යාපෘතිය. අපි සියලු දෙනාම දන්නවා, ඇමෙරිකාව ඉරානයට ආර්ථික සම්බාධකයන් පැනවීම නිසා ඉරානයෙන් ඒ මුදල් ප්‍රේෂණය කිරීමේ යම් යම් ගැටලුකාරී තත්ත්වයන් ආපු බව. අපි දැන් ඒවා විසඳාගෙන නැවතත් උමා ඔය ව්‍යාපෘතියේ වැඩ කරගෙන යනවා. උමං හෑරීමේ මැෂින් - tunnel boring machine - එකක් ගෙනෙන්නයි සිටියේ. උමං හෑරීමේ මැෂින් දෙකක් ගෙන්වලා ඒ ව්‍යාපෘතියේ වැඩ ඉක්මන් කිරීමට අපි කටයුතු කරලා තිබෙනවා. ඒ හින්දා ඒ ව්‍යාපෘතියත් අපි අනිවාර්යයෙන්ම ඉදිරියට කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ අත්තික්කා අමුණ, බදුල්ල දිස්ත්‍රික්කයේ විලකන්ඩිය වැව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇල්ලපොතාන අමුණ, මාතර දිස්ත්‍රික්කයේ උඩවතුර වැව, මොනරාගල දිස්ත්‍රික්කයේ තෙබුආර, මල්ලිඇල ඇතුළු ප්‍රදේශ ගණනාවක මධ්‍යම පරිමාණයේ වැව් රාශියක කටයුතු අපි දැන් ආරම්භ කරලා තිබෙනවා.

ඒවා සියල්ල ඉදිරි වසර තුළදී නිම කිරීමට බලාපොරොත්තු වෙනවා. මොනරාගල දිස්ත්‍රික්කයේ පහළ ඌව සංවර්ධනය යටතේ කුඩා වැව් සහ ඇළ මාර්ග ගණනාවක් දැනට ඉදි කරගෙන යනවා. අපි ඒවායේ වැඩත් අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අම්පාර දිස්ත්‍රික්කයේ ජනතාව කාලයක් තිස්සේ කරපු ඉල්ලීමක් වුණේ කළුගල් ඔය ව්‍යාපෘතියයි. ඒ සඳහා වන ශක්‍යතා අධ්‍යයන දැන් කරලා අවසානයි. 2013 අය වැයෙන් කළුගල් ඔය ව්‍යාපෘතිය සඳහා අපට මුදල් වෙන් කර තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැණික් ගඟ ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා රුපියල් මිලියන 300ක්, අම්පාර දිස්ත්‍රික්කයේ රඹුක්කන් ඔය ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 142ක්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ යාන්ඔය ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 700ක් වෙන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහවැලි මහ සැලැස්ම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරලා නැහැ. මහවැලි මහ සැලැස්මෙන් ක්‍රියාත්මක කරලා තිබෙන්නේ සියයට 45ක් පමණයි. මහවැලි ජලය ඉරණමඩුව ජලාශය දක්වාම ගෙන යන්න ඕනෑ. යාන්ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා වව්නියාව, මැදවච්චිය ආදී ප්‍රදේශවල ජනතාවට ජලය දෙන්න ඕනෑ. දැන් අපි එහි වැඩ කටයුතු ශ්‍රී ලාංකික මුදල්වලින් ආරම්භ කර තිබෙනවා. ලබන අවුරුද්ද සඳහා මුදල් වෙන් කර තිබෙනවා. යාන්ඔය ව්‍යාපෘතියත් සමඟම මහවැලි මහ සැලැස්මේ ඉතිරි කොටස්ද කර ගෙන යන්න අපි කටයුතු කරනවා. ඒ වාගේමයි NCP canal එක හෙවත් උතුරු මැද ඇළ පද්ධතිය. මල්වතු ඔයෙන් ජලය ගෙන ගිහිල්ලා ඉරණමඩුව ජලාශය දක්වා ජලය ගෙන යන වැඩ පිළිවෙළ සඳහා ශක්‍යතා අධ්‍යයනවලට අපි මුදල් වෙන් කර තිබෙනවා. රටේ සමස්ත ජල අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා අපි මේ වැඩ කටයුතු කරනවා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාරි මාර්ග ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කොත්තු රොටියක් හදනවා වාගේ 'ඔන්න දැම්මා - මෙන්න ගත්තා' කියලා කරන්න පුළුවන්කමක් නැහැ. එක පැත්තකින් අපේ පරිසර ඇමතිතුමා ඉන්නවා. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව තිබෙනවා. ව්‍යාපෘතියක් කරන්න ගියාම ඒ අය එම ව්‍යාපෘතියට යට වන කැලෑ ප්‍රමාණය බලනවා; පණුවන් කොච්චර යට වෙනවාද කියලා බලනවා; කුරුල්ලන් කීදෙනකු අවතැන් වනවාද කියලා බලනවා; අලි කීදෙනෙකු අවතැන්

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

වෙනවාද කියලා බලනවා. ඒ පැත්තත් බලන්න ඕනෑ. තවත් පැත්තක් තිබෙනවා. සමහර ජලාශ හදන කොට ජනතාව අවතැන් වෙනවා. ඉතින් ඒ ජනතාව කැමැති නැහැ ඒ ව්‍යාපෘතිය කරනවාට. ඒ ජනතාව කියන්නේ අපට වාරි ව්‍යාපෘතිය එපා කියලායි. රත්නපුරයේ ජල ගැල්ම නවත්වන්න අපි ව්‍යාපෘතියක් හදන්න ගියා. මිනිස්සු ඉඩම්වත් මනින්න දුන්නේ නැහැ. "නැහැ, නැහැ, මල්වල හදනවා නම් අපට එපා. වතුරට යට වුණාට කමක් නැහැ. අපට ඒ ව්‍යාපෘතිය එපා." කිව්වා. ඉතින් ජනතා අභිප්‍රායන්ට එරෙහිව කටයුතු කරන්නත් බැහැ නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ජනතාව එපා කියනවා නම් අපට බලෙන් පටවන්න පුළුවන්කමකුත් නැහැ. හැබැයි ඉතින්, ගං වතුරට යට වුණායින් පස්සේ ආණ්ඩුවට තමයි බණින්නේ. ඒ නිසා මේ පිළිබඳ සමතුලිතතාවකින් කටයුතු කරන්න ඕනෑ. ඉඩම් පවරා ගන්න ඕනෑ. ශක්‍යතා අධ්‍යයන -feasibility study- කරන්න ඕනෑ. එහෙම කරලා තමයි අදාළ කටයුත්ත කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කුඩා වැවක ඉඩම් කැල්ලක් පවරා ගන්න ගියාම හරිම අපහසුයි. ඒ සම්බන්ධයෙන් මම අපේ නිලධාරින්ට හැම වෙලාවේම කථා කරනවා; දවසකට 25 සැරයක් 30 සැරයක් විතර කථා කරනවා. සමහර වෙලාවට අවුරුද්දක්, අවුරුදු එකහමාරක් යනවා කුඩා ඉඩම් කැබැල්ලක් පවරා ගැනීමේ ක්‍රියාවලියට. මෙය අපේ රටේ තිබෙන නීති රීති අනුව සිදු වන දෙයක්. අපේ රට ඒකාධිපති රටක් නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කරන ලද අයිතිවාසිකම් තිබෙනවා. ඒවාටත් ගරු කරමින් තමයි අප මේ වැඩ කටයුතු කරන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා ඒ ක්‍රියාවලියේ යම් ප්‍රමාදයක් පෙනෙනවා. නමුත් ඒ සඳහා යම් කාල පරාසයක් ගත වන බව ප්‍රකාශ කරන්න ඕනෑ.

තවත් ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. මං විශේෂයෙන් මේ කාරණය ගැනත් කියන්න ඕනෑ. මා නියෝජනය කරන බදුල්ල දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද කොට්ඨාසයේ ජනතාවගේ විශාල ඉල්ලීමක් වුණේ නාගදීප වැව උස්සන්න කියන එකයි. හැබැයි නාගදීප වැව ඉස්සුවොත් පිටුපසින් තිබෙන විහාරස්ථානය සම්පූර්ණයෙන් යට වෙනවා; ගම යට වෙනවා. අපි ඒකට විකල්පයක් හෙව්වා. විකල්පය තමයි ඒ සඳහා වෙනම මොරාණ කියන ජලාශය හදන එක. දැන් ඒ ජලාශය හදන එක අපි ආරම්භ කර තිබෙනවා. ශක්‍යතා අධ්‍යයන ඉවරයි. ඒ පිළිබඳ ඇස්තමේන්තු කටයුතු කරලා ඉවරයි. එන අවුරුද්දට ඒ මුදල් වෙන් කර තිබෙනවා. ඉතාම දුප්පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වන රිදීමාලියද්දේ ජනතාවට කන්න දෙකම වැඩ කරන්න පුළුවන් විධියට ජලය ලබා දීමේ වැඩ කටයුත්ත අපි ඉෂ්ට කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් උමා ඔය ව්‍යාපෘතියත් සමඟම මීගහකිවුල, බදුලුඔය ජනතාවගේ ඉල්ලීමක් තිබුණා තල්පිටිගල ජලාශය හදන්න කියලා.

ඒ සඳහා මිලියන 300ක් එන වර්ෂයට වෙන් කරලා තිබෙනවා. හැබැයි ඊට වඩා විශාල මුදලක් යනවා. අපට ආරම්භක කටයුතු කරන්න පුළුවන්. මේ ජනතාවගේ ඉල්ලීම් පිළිබඳවත් කල්පනා කරලා මේ වැඩ කටයුතු අපි ඉතාම ඕනෑකමින් කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මහවැලි අධිකාරිය ගැන ගත්තොත් විශේෂයෙන්ම අපි කියන්නට ඕනෑ, රටේ ජාතික වී නිෂ්පාදනය අනෙකුත් ප්‍රදේශයන්හි හෙක්ටෙයාරයක් සඳහා මෙට්‍රික් ටොන් 4යි කියන කාරණය. මහවැලි ප්‍රදේශවල නිෂ්පාදන ඵලදායිතාව මෙට්‍රික් ටොන් 6යි. හැම වෙලාවේම අපි ඉහළ ඵලදායිතාවයක් මහවැලි ප්‍රදේශයන්හි අත්කරගෙන තිබෙනවා. නමුත් 2012 වර්ෂයේ දී මේ නියඟය නිසා හෙක්ටෙයාර් 17,680ක්, එනම් සියයට 18කින් අපට අස්වැන්න නැති වුණා. නමුත් අපේ නිෂ්පාදන ප්‍රවණතාව අඩු වුණේ නැහැ. අනික් තැන්වල ඒ නිෂ්පාදන මට්ටම පවත්වා ගැනීමට පුළුවන් වුණා. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මිලියන 455ක මුදලින් දැනටමත් මිලියන 414ක් අපට එවලා තිබෙනවා. මම ස්තුතිවන්ත වෙනවා, පී.බී. ජයසුන්දර මැතිතුමාට. විශේෂයෙන්ම වාරි මාර්ග ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සඳහා සමස්ත මුදල් ප්‍රමාණයෙන් සියයට 85ක් මේ වන කොට එතුමා අපට ලබා දීලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඉතුරු සියයට 15ත් ඉදිරි කාලයේ දී අපිට ලැබේවිය කියලා. විශේෂයෙන්ම අපේ ටීඑන්ඒ පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමා වැලිඔය ප්‍රදේශය ගැන කථා කළා. මහවැලි "එල්" කලාපයේ කිවුල් ආර ජලාශය ඉදිකිරීමේ ශක්‍යතා අධ්‍යයනය කරනවා. එතකොට මහවැලි "එල්" කලාපය සඳහාත් අවශ්‍ය ජලය ලබා දීමට අපට පුළුවන් වෙනවා. ඒ වාගේම මහවැලි සංවර්ධනය සඳහා අලුතින් එකතු වූ රඹකැන්ඔය කලාපය තුළ දිළිඳුභාවය තුරන් කිරීම සඳහාත්, ත්‍රස්තවාදයෙන් බැට කාපු, හේන් ගොවිතැන් කරන ජනතාවට වාරි ජලය සහිත කුඹුරු ඉඩම් ලබා දීමේ වැඩ පිළිවෙළත් දැන් අපි ආරම්භ කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මහවැලි ව්‍යාපාරය ආරම්භයේ දී තිබුණු ඉඩම් කට්ටි ප්‍රමාණය 232,210යි. මෙයින් මම අමාත්‍යාංශය බාර ගන්න කොට ඔප්පු සහ දීමනා පත්‍ර දීලා තිබුණේ 123,650කට පමණයි. මට විශාල අභියෝගයක් තිබෙනවා, ඉතුරු ලක්ෂයට කොහොමද මේවා ලබා දෙන්නේ කියලා. සමහර අය අනවසර වශයෙන් පදිංචි වෙලා ඉන්නවා. ඉඩම් දීපු අය තව කාට හරි අත යට ඒවා විකුණාගෙන තිබෙනවා. මුළු ලංකාවේම ඉඩම් මනින්න ඉන්නේ මිනින්දෝරුවෝ 586යි. ඉතින් කොහොමද ඉඩම් කට්ටි මෙපමණ ප්‍රමාණයක ඔවුන් වැඩ කරන්නේ? දැන් ඒ පිළිබඳව අපි මිනින්දෝරු දෙපාර්තමේන්තු සමඟ කථා කරලා තිබෙනවා. මේ අවුරුද්දේ ඉඩම් කට්ටි 15,000කට අපි ඔප්පු ලබා දීලා තිබෙනවාය කියන කාරණය ඉතා සතුටින් කියනවා. තව 10,000කට මේ මාසයේ දී ඉඩම් ලබා දීමට කටයුතු කරනවා. ඒ පිළිබඳව විශේෂ ප්‍රගතියක් තිබෙන බවත් ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම මහවැලි ගොවි ජනතාවගේ දෙවැනි හා තුන්වැනි පරම්පරාවන් වෙනුවෙන් ස්වයං රැකියා සපයා දීමේ අරමුණින් විසිතුරු මසුන් ඇති කිරීම හා වෙනත් කර්මාන්තයන් සඳහා ඉඩම් හා ණය ආධාර ලබා දීමේ වැඩසටහන, ගව පාලනය , සත්ව පාලනය සඳහා වැඩපිළිවෙළවල්, කෘෂි ළිං සඳහා සහනාධාර සපයා දීම, ගවගාල් සඳහා සියයට 50ක සහනාධාර ලබා දීම, කිරි හරක් හා කුකුල් පැටවුන් සහනදායී මිලකට ලබා දීම වැනි වැඩ කටයුතු රාශියක් අපි කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම වියපත් වූ වැව් විශේෂයෙන්ම පිළිසකර කිරීම සඳහා වෙලි ආරක්ෂණ ව්‍යාපෘති මඟින් බිලියන 8ක පමණ මුදලක් වෙන් කර තිබෙනවා. මේ ව්‍යාපෘතියෙන් දැන් ප්‍රධාන වැව් අමුණු 32ක් ප්‍රතිසංස්කරණය කරනවා. එයින් 28ක වැඩ ආරම්භ කරලා තිබෙනවා. 6ක වැඩ කටයුතු දැනට අවසන් වෙලා තිබෙනවා. ඉතුරු වැව් 4 කටයුතු මී ළඟ මාස කීපය තුළ දී අපි ඉෂ්ට කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මහවැලි කේන්ද්‍රයේ වාරි කෞතුකාගාරය ඉදි කිරීමේ වැඩ කටයුතු දැන් බොහෝ දුරට අවසන් කර තිබෙනවා. අපේ රටේ ජනතාවට අපේ වාරි ශිෂ්ටාචාරයේ විවිධ පැතිකඩවල් පෙන්වීම සඳහා මේ වාරි කෞතුකාගාරය සකස් කර දෙන බව ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අපේ ජල සම්පත් මණ්ඩලය, ශ්‍රී ලංකාවේ භූගත ජලය පිළිබඳව වූ පුළුල් සමීක්ෂණයක යෙදී සිටිනවා. ශ්‍රී ලංකාවේ භූගත ජලය පිළිබඳ දත්ත සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතියක් දැනටමත් තෝරා ගත් දිස්ත්‍රික්ක හයක ක්‍රියාත්මක කරනවා. නළ ළිං සෑදීමේ කටයුතු කරනවා. උතුරු නැඟෙනහිර ජනතාව නැවත පදිංචි කරවීමට අදාළවත්, පසු ගිය නියං සමයේ ජනතාවට සහනය දීම සඳහාත් විශේෂයෙන්ම විශාල වැඩ පිළිවෙළක් මේ මණ්ඩලයෙන් ක්‍රියාත්මක කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මම ඉතාම සතුටු වනවා, මාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය - CECB එක - ඉතා විශාල ප්‍රගතියක් ලබා ගෙන තිබීම සම්බන්ධව. විශේෂයෙන් ඔවුන් රුපියල් මිලියන 8,900ක මුදලක් උපයා ගෙන තිබෙනවා. අන්තර්ජාතික වශයෙන් රුපියල් මිලියන 400ක විදේශ විනිමය උපයාගෙන තිබෙනවා. ආණ්ඩුවෙන් සතයක්වත් ගන්නේ නැතුව ඉංජිනේරුවන් 400ක් ඇතුළු විශාල පිරිසක් පෝෂණය කරමින් මිලියන 419ක ලාභයක් ලබා ගෙන තිබෙනවා. ඒක අපේ ප්‍රගතියට හේතුවක්. අද බොහෝ විට රාජ්‍ය ආයතන බිඳ වැටෙන අවස්ථාවක මෙවැනි ආයතනයක් මේ ආකාරයෙන් පවත්වාගෙන යෑම මෙන්ම එහි අතිදක්ෂ ඉංජිනේරුවන් රාශියක් කටයුතු කිරීමත් අපේ සතුටට කාරණයක්. ඒ නිසා අපි මේ ආයතනය වඩාත් ශක්තිමත් කිරීමේ පියවර ගණනාවක් එන වර්ෂයේදී ගන්නා බව ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අපේ ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා, එතුමා ඇමති වශයෙන් සේවය කරද්දී එතුමා නිලධාරීන්ට ටෙලිෆෝන් කරලා, කථා කරලා ජල මට්ටම් පිළිබඳ විස්තර එහෙම ගෙන්වා ගන්නවා කියලා. නවීන තාක්ෂණය අනුව එහෙම කරන්න අවශ්‍ය නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපි අද වේලි ආරක්ෂණ ව්‍යාපෘති යටතේ මේ ජල පද්ධති පිළිබඳව විශේෂ computer programme එකක්, විශේෂ වැඩසටහනක් අපි දැන් සකස් කර ගෙන යනවා. ඒ අනුව අතිවිශාල මුදලක් වැය කරලා මේ ව්‍යාපෘතිය යටතේ අපි දැන් ඒ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරලා තිබෙනවා. ඕනෑම කෙනකුට, -මට, වාරිමාර්ග අධ්‍යක්ෂතුමාට, ලේකම්තුමා ඇතුළු මේ පිළිබඳ ඕනෑම කෙනෙකුට- මේ පිළිබඳව දැන ගැනීමට හැකි වන පරිදි අපට පුළුවන්, ඒ විස්තර ඉන්ටර්නෙට් එකට දමන්න. ඒ ඒ අවස්ථාවන්හිදී කොච්චර ජල ප්‍රමාණයක් ඒ ඒ ජලාශ තුළ තිබෙනවාද කියන කාරණය පිළිබඳව දත්ත ඒ මඟින් බලා ගැනීමට පුළුවන්.

ගිං-නිල්වලා ව්‍යාපාරයේ ජල ගැල්ම අවම කිරීම සඳහා පොම්ප 20ක් පමණ සවි කරලා ඒ කටයුතු කර තිබෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Minister, you have only one more minute.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මගේ වෙලාව ගත වූ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් මතු කරන ලද ඒ ප්‍රශ්න සියල්ලටම මම කියනවා, අපි කොන්ත්‍රාත් දුන්නු ඒවා, ඒ ලිපි ගොනු සියල්ලක්ම එතුමාට බලන්න දෙන්නම් කියලා. හැබැයි එතුමා අපේ ඊළඟ උපදේශක කාරක සභාවට එතුමා එන්න ඕනෑ. එතකොට දියමත පා වෙන ගුවන් යානා ප්‍රශ්නය, ඒ වාගේම මොරගහකන්ද ව්‍යාපෘතිය ඇතුළු එතුමා මතු කරන ලද සියලු ප්‍රශ්නවලට අපේ උපදේශක කාරක සභාවේදී අපි උත්තර දෙනවා.

ඒ වාගේම කන්දකඩුව ෆාර්ම් එක අපට අයිති දෙයක් නොවෙයි. අපි ඒක පශු සම්පත් අමාත්‍යාංශයට දුන්නා. ඊට පස්සේ කැබිනට් සංදේශයක් අරගෙන ආරක්ෂක අමාත්‍යාංශය ඒ ෆාර්ම් එක භාර ගත්තා. ඉතින් ඒ පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නම් ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අවස්ථාවේදී කථා කරලා දැන ගන්න කියලා මම එතුමාට උපදෙස් දෙන්න කැමැතියි.

අවසාන වශයෙන්, මාගේ මේ වැඩ කටයුතු කර ගෙන යෑම සඳහා සුවිශේෂී දායකත්වයක් දැක් වූ මගේ නියෝජ්‍ය අමාත්‍ය ඒකනායක මැතිතුමාටත්, ඒ වාගේම මාගේ අමාත්‍යාංශයේ ලේකම් අයිවන් සිල්වා මැතිතුමාටත්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල්තුමියටත්, අනෙකුත් සියලුම නිලධාරීන්ටත් මගේ ස්තුතිය පුද කරමින් මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ මේ රට ආසියාවේ ආශ්චර්යය කරා ගෙන යන ගමනට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයෙන් අපි උපරිම සහයෝගය එන වර්ෂයේදීත් ලබා දෙන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

[පූ.භා. 11.59]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් මේ රටේ ගොවි ජනතාවට ඉතා වැදගත් අමාත්‍යාංශයක් වන වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේත්, ඒ වාගේම පරිසර අමාත්‍යාංශයේත්, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳව වූ කාරක සභා අවස්ථාවේදී කථා කරන්නට ලැබීම ගැන මම සන්තෝෂ වනවා.

අපේ වාරි කර්මාන්තයේ ඉතිහාසය දෙස බලන විට අපේ රට සහලින් ස්වයංපෝෂණය වුණු යුගයක් ඈත අතීතයේ තිබුණු බව පෙනෙනවා. නමුත් 1948 අපි නිදහස ලබා ගන්න කොට ඒ සියලු දේවල් විනාශ වෙලා, අධිරාජ්‍යවාදී සමයේදී අපේ රටේ මිනිසුන්ට හාල් ටික පිටරටින් එන තෙක් බලා ඉන්නට සිද්ධ වුණා. නමුත් අද අපේ රටේ සහල් අතිරික්තයක් තිබෙනවා. අපේ රට සහලින් ස්වයංපෝෂණය වෙලා තිබෙනවා. මම හිතන්නේ ඒකේ විශේෂ ගෞරවය අපේ එක්සත් ජාතික පක්ෂයේ ආරම්භක නායකයා වූ ඩී.එස්. සේනානායක මැතිතුමාගේ ඉඳලා ජේ.ආර්. ජයවර්ධන, ගාමිණී දිසානායක මැතිතුමන්ලා දක්වා ඒ සියලු දෙනාටම අපි පිරිනමන්න ඕනෑ. එදා ඩී.එස්. සේනානායක මැතිතුමා උතුරු මැද පළාතේ අනුරාධපුර සහ පොළොන්නරුවේ පටන් ගත්ත මිනිපේ ව්‍යාපාරය, ගල්ඔය ව්‍යාපාරය නිසා තමයි අද රට සහලින් ස්වයංපෝෂණය වුණේ. ලංකාවට වැඩියෙන්ම වී නිෂ්පාදනය කරන පළාත විධියට අද නැඟෙනහිර පළාත අපට නම් කරන්න පුළුවන් වන්නේ ගල්ඔය හරස් කරලා සේනානායක සමුද්‍රය හදපු නිසායි. අද මේ රට සහලින් ස්වයංපෝෂණය වීමේ ගෞරවය වාගේම, විදුලිබල පද්ධතියට වැඩි විදුලිය ප්‍රමාණයක් ජල විදුලියෙන් නිපදවීමේ හැකි වීමේ ගෞරවයත් එතුමන්ලාට හිමි වන්නේ අවුරුදු 30කින් අවසන් කරන්න තිබුණු මහවැලි ව්‍යාපාරය එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත්, ගාමිණී දිසානායක මැතිතුමාත් අවුරුදු 6කින් අවසන් කරපු නිසායි.

අපේ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමා මැණික් ගඟ ව්‍යාපාරය ගැන කිව්වා. මම කියන්න කැමැතියි, මැණික් ගඟ වෙහෙරගලදී හරස් කරලා අද හම්බන්තොටට වතුර ටික ගෙන යන බව. මට මතකයි, ගරු කථානායක චමල් රාජපක්ෂ මැතිතුමා මේ රටේ වාරිමාර්ග ඇමතිවරයා විධියට ඉන්න කොට එතුමාගේ ප්‍රධානත්වයෙන් සියලු පක්ෂවල මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් ඒ ගැන මූලික සාකච්ඡාවක් තිබුණා. එතුමා අපට

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

කිව්වා, වෙහෙරගල හරස් කරලා ඒ වතුර ටික හම්බන්තොටට ගෙන යනවා කියලා. එදා අපි එතුමාට කිව්වා, ලංකාවේ වාරි මාර්ගයෙන් වැඩ කරන කුඹුරු අක්කර 600,000ක් විතර තිබෙනවා කියලා. එදා මොනරාගල දිස්ත්‍රික්කයට කිවුවේ වෙල්ලස්ස කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙල්ලස්සේ තිබෙන්නේ මහා වාරි මාර්ගයෙන් වැඩ කරන කුඹුරු අක්කර 16,000ක් විතරයි. මොනරාගල දිස්ත්‍රික්කයේ සම්පත් තිබෙනවා. ගල්ඔය කෙළවරේ ඉඟිනියාගල සේනානායක සමුද්‍රය හදලා වතුර ටික අරගෙන තිබෙනවා අම්පාර දිස්ත්‍රික්කයට. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමා මට පසුව උත්තර දෙන්න. වලවේ ගඟ හරස් කරලා වතුර ටික අරගෙන තිබෙනවා ඇඹිලිපිටිය පැත්තට. කිරිඳි ඔය හරස් කරලා හම්බන්තොටට වතුර ටික අරගෙන තිබෙනවා. එදා අපට පොරොන්දුවක් දුන්නා නමුණුකුල කන්දෙන් පටන් ගන්න මැණික් ගඟ හරහා සියලුම යෝජනා ක්‍රම ටික අපට කරලා දෙනවා කියා. මෙවර අය වැයෙන් ඒවාට සල්ලි වෙන් කර තිබෙනවා මම දැක්කේ නැහැ. මැණික් ගඟ නමුණුකුලෙන් පටන් අරගෙන, මොනරාගල දිස්ත්‍රික්කයේ කෙළවරින් පහළට ගලා බසින කොට අපි කිවුවා, බඩල්කුඹුරේ තිබෙන යෝජනා ක්‍රම ටික හදලා දෙන්න කියලා. එකක්වත් කළේ නැහැ. එතුමා එදා පොරොන්දුවක් දුන්නා මේක කරන ගමන් ඒ ටික කරනවා කියලා. එදා අපි බුත්තල ප්‍රදේශයෙන් රජඇළ ව්‍යාපෘතිය පටන් ගත්තා. ඒක රජ කාලයේ තිබුණු එකක්. මුතුකෙලියාවෙන් පටන් ගන්නා රජඇළ ව්‍යාපෘතිය මම හිතන්නේ තමුන්නාන්සේලා මේකට ඇතුළු කරලා නැහැ. ලංකාවේ දුප්පතුන් වැඩිම ප්‍රතිශතයක් ඉන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ. අඩුවෙන් වතුර ලැබෙන්නේත් මොනරාගල දිස්ත්‍රික්කයට. මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඒ ව්‍යාපෘතිය කරලා දෙන්න කියා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා නක්කල ජලාශය ගැන කිවුවා. මම දන්නවා නක්කල ජලාශය ඉදි කරන්න ඕනෑ කියලා. නමුත් අද ලොකු කථාවක් තිබෙනවා, ඒ නිසා පාරම්පරික ගම්මාන කීපයක් යට වෙනවා කියලා. ඒ වාගේම ජනතාව අතර ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, ලොකු කුතුහලයක් තිබෙනවා, ඒ වතුර ටිකත් ගෙන යන්නේ හම්බන්තොටටද කියලා. මම දන්නේ නැහැ ඇමතිතුමනි, මේකත් හරස් කරලා වතුර ගෙන යන්නේ හම්බන්තොටටද කියලා. මොකද, මොනරාගල දිස්ත්‍රික්කයේ කුඹුක්කන් ඔය ව්‍යාපාරයේ ඉඩම් අක්කර දහස් ගණනක් තිබෙනවා, වතුර දෙන්න. ඉතින් ඔබතුමා මොණරාගල ප්‍රදේශයට ඇවිල්ලා අපේ ජනතාවට මේ ගැන පැහැදිලි කර දෙන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා. මේකෙන් යට වෙන පාරම්පරික ගම්මාන කිහිපයක් තිබෙනවා. රත්තනදෙනිය, කරවිල, දාහතේ කණුව වාගේ යට වෙන ගම්මාන සම්බන්ධයෙන් තවමත් ජනතාව දැනුවත් කර නැහැ. තමුන්නාන්සේලා ඒ මුදලින් සියයට 50ක් වෙන් කර තිබෙන්නේ ශක්‍යතා පරීක්ෂණ කරන්නද කියලා මම අහනවා. ජනතාව හම්බ වෙලා මේ ගැන කථා කරන්න ඕනෑ. මොකද, මේකෙන් පාරම්පරික ගම්මාන තමයි යට වෙන්නේ. මා දන්නා විධියට උඩුගම් ඔය ව්‍යාපාරයට ඉහළින් තිබෙන ගම්මාන යට වෙන්නේ නැතුව ඔය හරස් කරන්න තැනක් තිබෙනවා. ඒ නිසා ඒ ගැනත් බලන්නය කියා මම ගරු ඇමතිතුමාට කියනවා. පාරම්පරික පවුල් 400ක්, 500ක්, 1000ක් අයින් කර අලුතින් 1000කට කුඹුරු දෙනවා නම් එතැනත් යම් ප්‍රශ්නයක් තිබෙනවා.

ඊළඟ කාරණය තමයි, තමුන්නාන්සේලා පටන් ගත්තු සුගලාදේවි ව්‍යාපාරය තවම අවසන් කරලා නැහැ කියන එක. මම දැක්කේ නැහැ, මේ අවුරුද්දේ ඒ සඳහා මුදල් වෙන් කර තිබෙනවාද කියා. තවම සුගලාදේවි ව්‍යාපාරයේ ඇළ වේලි කපන්න තිබෙනවා. මම හිතන හැටියට ඒකේ බැම්ම හදා අවුරුදු 10කට වැඩියි.

අනික් එක තමයි මාලිම්පත ව්‍යාපාරය. පහළ ඌව සංවර්ධන ව්‍යාපාරය යටතේවත් මාලිම්පත ව්‍යාපාරය සඳහා මුදල් වෙන් කර තිබෙනවාද කියා මම දන්නේ නැහැ. මාලිම්පත ව්‍යාපාරයේ වැඩත් බාගෙට කර නවත්වලා තිබෙනවා. මම ඔබතුමන්ලාගේ අය වැය ඇස්තමේන්තුව කියෙව්වා. ඒකේ කොහේවත් මාලිම්පත ව්‍යාපාරය ගැන හෝ සුගලාදේවි ව්‍යාපාරය ගැන හෝ කියා තිබුණේ නැහැ. රණසිංහ ප්‍රේමදාස මැතිතුමා 1993 දී සද්ධාතිස්ස ව්‍යාපාරය හදලා අවුරුදු 17ක් ගියායින් පසුව තමයි තමුන්නාන්සේලා ඒකේ කුඹුරු ටික බෙදුවේ. ඒකෙත් දකුණු ඉවුර සංවර්ධනය කර තිබෙනවා. වම් ඉවුර යටතේ තව අක්කර 1000කට දෙන්න තරම් වතුර වැවේ තිබෙනවා. ඒ නිසා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, සද්ධාතිස්ස ව්‍යාපාරයේ වම් ඉවුරත් සංවර්ධනය කරන්න අවශ්‍ය කටයුතු කරන්නය කියා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් මෙහෙම ඉල්ලන්නේ ඔබතුමන්ලාට ඡන්දය දෙන වැඩි පිරිසක් ඉන්නේ මොණරාගල දිස්ත්‍රික්කයේ නිසායි. ලංකාවේ වැඩියෙන්ම දුප්පත් ජනතාව ඉන්නේත් මොණරාගල දිස්ත්‍රික්කයේයි. විභාග අඩුවෙන්ම පාස් වෙන අය ඉන්නේත් මොණරාගල දිස්ත්‍රික්කයේයි. නූගත්කමට සහ දුප්පත්කමටද දන්නේ නැහැ වැරදිලා ඡන්දය දෙන්නේ. අඩු ගණනේ ඡන්දය දුන්නු එකටවත් සලකන්නය කියා අපි ඉල්ලා සිටිනවා.

මහා වාරිමාර්ග මඟින් වැඩ කරන කුඹුරු අක්කර 16,000යි මොණරාගල දිස්ත්‍රික්කයේ තිබෙන්නේ. මේකට ඉස්සර කිව්වේ වෙල්ලස්ස කියායි. සුද්දන්ට විරුද්ධව සටන් කරපු නිසා තමයි අපේ ඇළ වේලි කඩා දැම්මේ. නිදහස ලබා අවුරුදු 64ක් ගෙවිලා ගියත් ඒ ප්‍රදේශය දුප්පත්කමින් ගොඩ ගන්න තවමත් අපට බැරි වුණා. උමා ඔය ව්‍යාපාරය අපට සම්බන්ධ කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. මම දන්නා විධියට නම් උමා ඔය ව්‍යාපාරයේ වැඩ කටයුතු ටිකක් අඩ පණ වෙලා තිබෙනවා. මොකද, ඉරානයෙන් තමයි මේ කටයුතු කෙරෙන්නේ. ඉරානයේ දැනට පවතින ප්‍රශ්න නිසා මේකත් නවතීවිද කියා මම දන්නේ නැහැ. පහු ගිය දවස්වල සල්ලි තිබුණේත් නැහැ. වැඩ කටයුතුත් මඟ නැවතිලා තිබුණේ. අපි දන්නේ නැහැ, ඉරාන යුද්ධය නිසා මේ කටයුතු නැවතුණාද කියා.

අපේ ප්‍රදේශයේ කෙළවර වැව් දහස් ගණනක් තිබෙනවා. තමුන්නාන්සේලා ඒකෙන් අක්කර පනස් දහසක් මැනලා, පිට රටද මේ රටේද දන්නේ නැහැ කොම්පැනිවලට බාර දෙන්න පුවත් පත් දැන්වීම් පළ කර තිබුණා. කරුණාකරලා මේක නවත්වන්න ගරු ඇමතිතුමනි. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අක්කර 50,000ක් මැනලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ වැව් සිය ගණනක් තිබෙනවා. කරුණාකරලා ඒ වැව් ටික හදලා අපේ දිස්ත්‍රික්කයේ මිනිස්සුන්ට මේ ඉඩම් ටික දෙන්නය කියා අපි ඉල්ලනවා. සමහර ව්‍යාපාරවල දෙවැනි, තුන්වැනි පරම්පරා ඉන්නවා, කුඹුරු නැතිව, වතුර නැතිව. ඒ අය දුප්පත්කමේ කෙළවරටම ගියපු අයයි.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ පහළ ඌව සංවර්ධන යෝජනා ක්‍රමය ගැන කිව්වා. මම දන්නා විධියට නම්, ඒකෙත් පොඩි වැව් ටිකක් තමයි හදලා තිබෙන්නේ. හංසවිල වැනි සංවර්ධන ව්‍යාපාරත් තිබෙනවා. මම හිතන හැටියට තමුන්නාන්සේලා තවම ඒවා ගැන සොයා බලා නැහැ. ඒවා ගැනත් සොයා බලා අපට උදවු කරන්නය කියා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, මේ රටේ ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීමේ කටයුත්ත තමුන්නාන්සේටයි භාරව තිබෙන්නේ. අනුරාධපුර දිස්ත්‍රික්කය හැරුණාම අද වකුගඩු රෝගීන් වැඩිපුර ඉන්නේ මොණරාගල දිස්ත්‍රික්කයේයි. මොණරාගල දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් සියයට 35කට, 40කට පිරිසිදු පානීය ජලය නැහැ.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවක් මම කියෙව්වා. මම නියෝජනය කරන දිස්ත්‍රික්කයේ සියඹලාන්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තමයි ලංකාවේ දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය. ඒ ප්‍රදේශයේ පිරිසිදු පානීය ජලය නැති සියයට 46.3ක් ඉන්නවා. මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියයට 37.7ක් ඉන්නවා. තණමල්විල සියයට 30.8ක් ඉන්නවා. මොනරාගල නගරයේ පිරිසිදු පානීය ජලය නැති ජනතාව සියයට 31.9ක් ඉන්නවා. බඩල්කුඹුරේ සියයට 43යි. බිබිලේ සියයට 36යි. මා හිතන හැටියට මේ නිසා තමයි වකුගඩු රෝගයට ගොඩක් අය ගොදුරු වෙන්නේ; මේ නිසා තමයි ළමයින්ට නොයෙක් නොයෙක් අසනීප හැදෙන්නේ. මට මතකයි, මොනරාගල රෝහලේ විශේෂඥ වෛද්‍යවරයෙක් මට දවසක් මුණ ගැහුණු වෙලාවේ කිව්වා, මොනරාගල ජල යෝජනා ක්‍රමයෙන් ගොඩක්ම එන්නේ අපිරිසිදු, අපද්‍රව්‍ය මිශ්‍ර වුණු ජලය කියලා. කරුණාකරලා මේ සඳහා වැඩ පිළිවෙළක් හදන්න.

මම දන්නවා, පසු ගිය වකවානුවේ මොනරාගල නගරයට දවස් තුනකට, හතරකට සැරයක් තමයි වතුර දුන්නේ කියන එක. නව නාගරික ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න හෝ තිබෙන ක්‍රම වැඩිදියුණු කරන්න අවුරුදු 25කින් තමුන්නාන්සේලා කටයුතු කරලා නැහැ. 1988 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබුණු කාලයේ ගෙනාපු ජල යෝජනා ක්‍රමයට පස්සේ මේ ප්‍රදේශයට ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරලා නැහැ. ජනගහනය තුන් ගුණයකින් විතර වැඩි වෙලා තිබෙනවා. වතුර ගේන්න මිනිස්සු කරත්ත අරගෙන යන්න ඕනෑ. අපි එදා සැලසුම් කරලා තිබුණා, කුඹුක්කන් ඔයෙන් ජලය ගේන්න. පිරිසිදු පානීය ජලය පාවිච්චි නොකරන ජනතාව සිටින දිස්ත්‍රික්ක ගත්තාම වැඩිම ප්‍රතිශතයක් ඉන්නේ අපේ දිස්ත්‍රික්කයේයි. තමුන්නාන්සේලාගේ අය වැය ඇස්තමේන්තුවල මොනරාගල දිස්ත්‍රික්කයට එකම ජල යෝජනා ක්‍රමයක්වත් තිබුණේ නැහැ. එකක්වත් තිබුණේ නැහැ. මම ඉස්සෙල්ලාත් කිව්වා වාගේ තමුන්නාන්සේටත් කියන්න තිබෙන්නේ, තමුන්නාන්සේලාට වැඩියෙන් සලකන අය තමයි අපේ පැත්තේ ඉන්නේ කියලා. සමහර වෙලාවට ඒක මෝඩකම කියලා හිතනවාද දන්නේත් නැහැ. මේ දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය ලබන අයත් අඩුයි නේ. ඉතින් මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, ග්‍රාමීය ජල යෝජනා ක්‍රම තව දියුණු කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා. ඒක මූලික අවශ්‍යතාවක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට මධ්‍යම පරිසර අධිකාරිය ගැන කථා කරන්න මම කැමැතියි. මේ අවස්ථාවේ පරිසර අමාත්‍යතුමා මේ ගරු සභාවේ නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. අද ජනතාවට ගෙයක් හදා ගන්න වැලි ටිකක් ගැනීම ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා කිව්වා, දැන් වැලි ප්‍රවාහනයට බලපත්‍ර ඉවත් කරලා තිබෙනවා කියලා. ප්‍රවාහනයට බලපත්‍ර ඉවත් කළාට, අහිංසක මිනිහෙක් ගෙයක් හදා ගන්න වැලි ටිකක් ගත්තාම ට්‍රැක්ටරයට නම් රුපියල් 50,000ක් දඩ ගහනවා. මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍ර ගන්න ගියාමත් - [බාධා කිරීමක්] මම අහන්නේ මිනිහෙකුට ගෙයක් හදා ගන්න වැලි ටිකක් ගත්තාම රුපියල් 50,000ක් දඩ ගහන්නේ ඇයි කියලායි. ව්‍යාපාරිකයින්ට දඩ ගැහුවාට අපට කමක් නැහැ. අපි දන්නවා මේ ව්‍යාපාරය කරන්නේ මහවැලි ගඟෙන්, පොළොන්නරුවෙන්, මහියංගනයෙන් -[බාධා කිරීමක්]

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர் - சுற்றாடல் பிரதி அமைச்சர்)

(The Hon. A.R.M. Abdul Cader - Deputy Minister of Environment)

ගරු මන්ත්‍රීතුමා, පොඩි මිනිහෙකුට වැලි ටිකක් ගන්න අපි අවසර දීලා තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)

(The Hon. R.M.Ranjith Madduma Bandara)

අද මධ්‍යම පරිසර අධිකාරියෙන් වැලි permit එකක් ගන්න ගියාම මිනිස්සු මාස දෙක, තුන රස්තියාදු වනවා. තමුන්නාන්සේ යන්න මධ්‍යම පරිසර අධිකාරියේ -

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)

(The Hon. A.R.M. Abdul Cader)

සමාවෙන්න. තමුන්නාන්සේ මගේ ළඟට එන්න. දවස් දෙකෙන් මම ඒ වැඩේ කර දෙන්නම්.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)

(The Hon. R.M.Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඕක ප්‍රායෝගික නැහැ නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මොනරාගල ඉඳලා, අම්පාරේ ඉඳලා තමුන්නාන්සේ හම්බ වෙන්න ආවාම තමුන්නාන්සේ පල්ලි ගිහිල්ලා කියයි; තමුන්නාන්සේට නෝම්බි කියයි; තමුන්නාන්සේට සනීප නැහැ කියයි. ඕක ප්‍රායෝගික නැහැ නේ නියෝජ්‍ය ඇමතිතුමනි. තමුන්නාන්සේ ළඟට එනවා නම්, නිලධාරින් අවශ්‍ය නැහැ නේ. බදුල්ලේ මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යාලයක් තිබෙනවා. සමහර අයට වැලි permit එකක් ගන්න, ගල් permit එකක් ගන්න මාස දෙක, තුන යනවා. නිලධාරි හිඟයක් ඇති. එහෙම නම් නිලධාරින් වැඩි කරන්න. සිටින නිලධාරින්ට වැඩ වැඩි ඇති. මම නිලධාරින්ට දොස් කියන්නේ නැහැ. අඩු තරමේ මිනිස්සු මේ විධියට-

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)

(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් කථා කරන්න ඉඩ දෙනවාද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)

(The Hon. R.M.Ranjith Madduma Bandara)

කමක් නැහැ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)

(The Hon. Anura Priyadharshana Yapa)

මේ පිළිබඳව තමුන්නාන්සේ කියන කාරණාව අපි පිළිඅරගෙන තිබෙනවා. ඇත්තටම සාමාන්‍ය ජනයාට මෙහිදී සැහෙන පමණ කරදරයක් තිබෙනවා. මේ පනත ගෙනැල්ලා තිබෙන්නේ තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලයේදීයි. වැලි බලපත්‍ර සම්බන්ධයෙන් වෙනස්කමක් කරන්න නම් අපට මේ පනතට සංශෝධනයක් ගේන්න වනවා. අපි දැන් ඒකත් කරන්න යනවා. පසු ගිය කාලයේ සාමාන්‍ය ජනතාවට වෙන කරදර අඩු කරන්න අපි ප්‍රාදේශීය ලේකම්වරුන්ට අවසර දුන්නා, මසකට cube 200ක් සඳහා සාමාන්‍ය ජනයාට බලපත්‍ර නිකුත් කරන්න කියලා. නමුත් මේ වාගේ අත්‍යවශ්‍ය ගොඩනැඟිලි ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් හැම කෙනෙකුටම බලපත්‍රයක් ගන්න අවස්ථාව ලබා දුන්නාම -වාණිජ බලපත්‍රත් පෞද්ගලික වශයෙනුත් බලපත්‍ර ගන්න දුන්නාම- ඒකේ ප්‍රමාදයක් සිදු වනවා. ඒක තමුන්නාන්සේ පිළිගන්නවා. අපේ කාර්යාල තිබෙන බොහෝ තැන්වල අපි මේ කාර්යය නිවැරැදි කර

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

තිබෙනවා. නමුත් ඉදිරි කාලයේදී මේ පිළිබඳ පනත සංශෝධනය කරන්නට නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව එකඟ වෙලා තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී තමුන්නාන්සේ කියන ප්‍රශ්නයට විසඳුම් හොයන්න අපට පුළුවන් වෙයි. දැනට ඒ ප්‍රශ්නය තිබෙනවා. මම ඒක පිළිගන්නවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)

(The Hon. R.M.Ranjith Madduma Bandara)

බොහොම ස්තුතියි ගරු ඇමතිතුමනි. තමුන්නාන්සේලාගේ භූ විද්‍යා හා පතල් කාර්යාංශය හොඳට කටයුතු කරනවා. අපි ඒ වාගේ හොඳට කටයුතු කරන තැන් ගැනත් කියන්න ඕනෑ. සමහර නිලධාරින් ඉන්නවා, -අපි ඒ අයට කවදාවත් බලපෑම් කරලා නැහැ- අපි නිකම් හරි කථා කරලා වැඩක් කිව්වොත්, "නැහැ, මන්ත්‍රීවරුන්ගේ ඒවා අරගෙන එන්න එපා" කියලා කියනවා. ඒ විධියේ නිලධාරිනුත් ඉන්නවා. ඒවා ගැනත් කල්පනා කරන්න. ඒ කවුද කියලා මම කියන්නේ නැහැ. අපි බලපෑම් කරන්නේත් නැහැ, අපි අසාධාරණයක් කරන්න කියන්නේත් නැහැ.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමා යටතේ තමයි මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මැණික් කර්මාන්තයේ විශාල කඩා වැටීමක් තිබෙනවා. පසු ගිය වාර්තා කියවන කොට මම දැක්කා, මේ රටේ කර්මාන්ත ප්‍රගතිය පටන් ගන්න ඉස්සෙල්ලා අපේ අපනයන ආදායම වුණේ තේ, රබර් සහ පොල්. නමුත් 1970 ගණන්වල එක අවුරුද්දක පොල්වලින් ලැබුණු අපනයන ආදායමටත් වැඩිය මැණික්වලින් ලද අපනයන ආදායම වැඩි වෙලා තිබුණා. මීටර් 3,000ක් යට තිබෙන තෙල් ගැන අපි දැන් කථා කරනවා. ගරු ඇමතිතුමනි, අඩි 20ක්, 30ක් යට තිබෙන මැණික් ගල් ගැන අපි බලන්නේ නැත්තේ ඇයි? අපි මේ රටේ ඈත ඉතිහාසය ගත්තොත්, මේ රට මැණික් කර්මාන්තය සම්බන්ධව ලෝක ප්‍රසිද්ධ රටක්. අපි මැණික් අපනයනය කළා. ලංකාවේ මැණික්වලට තමයි අද විශාල වටිනාකමක් තිබෙන්නේ.

අද මැණික්වල මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. මම මැණික් ව්‍යාපාරිකයෙක් නොවෙයි. නමුත් මගේ ප්‍රදේශයේ මැණික් ගරන අය ඉන්නවා. අද මැණික් පතල් කර්මාන්තය විශාල වශයෙන් කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. පරිසර ඇමතිතුමායි, මැණික් ඇමතිතුමායි දෙන්නාම තමුන්නාන්සේ. පරිසරය රකින ගමන් මැණික් කර්මාන්තයටත් අවස්ථාවක් දෙන්න. මා ළඟ තිබෙන මේ සංඛ්‍යා ලේඛනවල තිබෙන විධියට -මම මේ ආසන්න සංඛ්‍යාව කියන්නේ- 2007 දී මැණික් අපනයනයෙන් ඇමෙරිකන් ඩොලර් මිලියන 105ක් ලැබී තිබෙනවා. 2008 දී ඇමෙරිකන් ඩොලර් මිලියන 76ක් ලැබී තිබෙනවා. 2009 දී ඇමෙරිකන් ඩොලර් මිලියන 69ක් ලැබී තිබෙනවා. 2010 දී ඇමෙරිකන් ඩොලර් මිලියන 70ක් ලැබී තිබෙනවා. ඒ කියන්නේ මැණික් අපනයනයෙන් අපට ලැබෙන ආදායම අඩු වෙලා තිබෙනවා. මම දන්නා විධියට දැන් තිබෙන නීතිරීති නිසා මිනිස්සු මැණික් ගරන්නේ නැහැ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)

(The Hon. Anura Priyadharshana Yapa)

මම ඔබතුමාට ඒ පිළිබඳව පැහැදිලි කරන්නම්. අපි ඒ සම්බන්ධයෙන් සෑහෙන වැඩ පිළිවෙළක් කරලා තිබෙනවා. තමුන්නාන්සේට ලැබී තිබෙන සංඛ්‍යා ලේඛනවල පොඩි දුර්වලකමක් තිබෙනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)

(The Hon. R.M.Ranjith Madduma Bandara)

මේ සංඛ්‍යා ලේඛන මම Central Bank එකෙන් ගත්තේ. මේ සංඛ්‍යා ලේඛන මම තමුන්නාන්සේට එවන්නම්.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)

(The Hon. Anura Priyadharshana Yapa)

මේ මොහොත වන විට මැණික් සංස්ථාව දළ වශයෙන් මැණික් පතල් බලපත්‍ර 9,000කට වැඩිය දීලා තිබෙනවා. පසු ගිය කාලය තුළ ලබා දුන් වැඩිම බලපත්‍ර ප්‍රමාණය තමයි දැන් අපි දීලා තිබෙන්නේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)

(The Hon. R.M.Ranjith Madduma Bandara)

තමුන්නාන්සේලා බලපත්‍ර ලබා දුන් ඒවා ගැනත් තොරතුරු මගේ ළඟ තිබෙනවා. මැණික් අපනයනය පිළිබඳව සඳහන් වූ Central Bank Report එකක් තිබෙනවා. මේක හරියට හරි.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)

(The Hon. Anura Priyadharshana Yapa)

දැනට තිබෙන තත්ත්වය ගැනයි මම ඔබතුමාට කියන්නේ. මැණික් කර්මාන්තයේ තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, මැණික් ගල් අපනයනයේදී බොහෝ නීති රීති ලිහිල් කරලා තිබුණා වුණත් තවමත් මැණික් ගල් හොර පාරෙන් යෑම. ඒ නිසා ඒවායේ නියම වටිනාකම පිළිබඳ තොරතුරු භාණ්ඩාගාරයට ලැබෙන්නේ නැහැ. නමුත් රජයක් හැටියට මැණික් කර්මාන්තය දිරිමත් කිරීමට අවශ්‍ය සියලුම සහන අපි ලබා දීලා තිබෙනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)

(The Hon. R.M.Ranjith Madduma Bandara)

තමුන්නාන්සේලා මැණික් කර්මාන්තය සඳහා බලපත්‍ර නිකුත් කරනවා. තමුන්නාන්සේලා බලපත්‍ර ගාස්තු විශාල ලෙස වැඩි කර තිබෙනවා. මම විශාල පරිමාණයේ ව්‍යාපාරිකයෝ ගැන කථා කරන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා අපි බොහොම සලකන වැදගත් ඇමතිවරයෙක්. මම දන්නා විධියට ඊයේ පෙරේදා රජයට සම්බන්ධ බලධාරීන් ඇලහැර ප්‍රදේශයේ මැණික් ගැරුවා. මැණික් සංස්ථාවේ නිලධාරින් ගියාට පස්සේ දැන ගෙන තිබෙනවා, ඒ ගොල්ලන්ගේ guard එකට ඉන්නේ ASP කෙනෙක් බව. ඒ අය මැණික් සංස්ථාවේ නිලධාරීන් පන්නලා දාලා තිබෙනවා. තමුන්නාන්සේ මේවා ගැන බලන්න. අද පොඩි මිනිහාට අවස්ථාව දෙන්නේ නැහැ. මහා පරිමාණයෙන් මැණික් ව්‍යාපාරය කරන කට්ටියට තමයි අවස්ථාව දෙන්නේ. මැණික් ඉල්ලමක් හොයා ගන්නේ පොඩි මිනිස්සු වැඩ කළොත්නේ. ඉල්ලම් පාරක් සංස්ථාව හොයා ගන්නේ නැහැනේ. එම නිසා ඒ පොඩි මිනිස්සුන්ටත් අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අනවසර මැණික් ගැරීම් සම්බන්ධයෙන් අද උසාවියෙන් දඩ ගහනවා. මේක හරිම අරුම පුදුම කථාවක්. බදුල්ල දිස්ත්‍රික්කයෙන් අනවසර මැණික් ගැරීමක් ඇල්ලුවොත් උසාවි දඩය රුපියල් 3,000යි. මොණරාගල දිස්ත්‍රික්කයෙන් අහු වුණොත් රුපියල් 50,000යි. කුඹුක්කන් ඔය බදුල්ලේ ඉඳලා මොනරාගල දක්වා තිබෙනවා.

අපේ හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාත් මෙතැන ඉන්නවා. බදුල්ල දිස්ත්‍රික්කයට පොලීසිය වැඩිය දමන්නේ නැහැ. මොකද, රක්ෂිත වැඩියෙන් තිබෙන්නේ මොනරාගල නිසා මොනරාගලට පොලීසිය වැඩියෙන් දමනවා. ඒ ප්‍රදේශයට වැඩියෙන් පොලීසිය දමන්නේ, එහෙම ඇල්ලුවාම ඒ ගොල්ලන්ටත් සියයට ගණනක reward එකක් හම්බ වෙන නිසායි. රුපියල් 50,000ක් දඩ ගහපු අපේ සමහර මිනිස්සු -සල්ලි ගෙවා ගන්න බැරි දුප්පත් මිනිස්සු- හිරේ ඉන්නවා, ගරු ඇමතිතුමනි. ඒ අයට කිසියම් සහනයක් ලබා ගන්න අවස්ථාවක් දෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම පසු ගිය කාලයේ මොනරාගල දිස්ත්‍රික්කයේ කතරගම තම්මැන්නාවේ මැණික් ඉල්ලමක් පැදුණා. කතරගම මිනිස්සු කියන්න පටන් ගත්තා, "කතරගම දෙයියෝ තමයි අපට මේක දුන්නේ, කතරගම දෙයියෝ තමයි අපේ දුප්පත්කම දැකලා මේ මැණික් ටික දුන්නේ" කියලා. දහස් ගණනක් ගිහිල්ලා එතැන වැඩ කළා. දවස් දෙකයි තුනයි වැඩ කළේ. මොනවාද කළේ? හමුදාවෙන්, පොලීසියෙන් ඇවිල්ලා මිනිස්සු පැන්නුවා. එහෙම පන්නලා බලවත්තු ටික මොනවාද කළේ? Tipper trucksවල පටවලා ඒ මැණික් ඉල්ලම් ටික ගෙනගියා. අද ගිහිල්ලා ඒ මිනිසුන්ගෙන් අහලා බලන්න. සමහර මිනිස්සුන්ට ගහලා පැන්නුවා. කතරගම තම්මැන්නාවේ දුප්පත් මිනිස්සුන්ට දෙයියෝ දුන් මැණික් ඉල්ලම රජයේ බලවතුන් කොල්ල කෑවේ ඒ විධියටයි.

ඒක රහසක් නොවෙයි. රජයේ මැති ඇමතිවරුත් ඒ වැඩේට ගියා. ඊට පස්සේ තමුන්නාන්සේලා මොනවාද කළේ? ඊට පස්සේ තමුන්නාන්සේලා මේ ඉඩම් ටෙන්ඩර් කළා. ඒ ටෙන්ඩර්සියේදී මොකද වුණේ? මා ළඟ තිබෙනවා ඊට අදාළ විගණන වාර්තාව. මේ මැණික් ඉඩම් වෙන්දේසි කරනකොට පුවත් පත් දැන්වීමක් දානවා කොන්දේසි සමඟ. විගණන වාර්තාවේ කියන්නේ මොනවාද? විගණන වාර්තාවෙන් කියනවා, මැණික් ඉඩම් වෙන්දේසි කළාම ඒ වෙලාවේම ඇපයක් තැන්පත් කරන්න ඕනෑ කියලා. නමුත් 16 දෙනෙක් ඇප තැන්පත් කරලා නැහැ. ඒත් ඒ අයට මැණික් ගරන්න ඉඩ දුන්නා. Chequesවලින් මුදල් තැන්පත් කරන්න බැහැ කියලා ටෙන්ඩර් දැන්වීමේ තිබෙනවා. නමුත් විරිත්තමුල්ල කියන එක්කෙනා විසිඅටලක්ෂ හැත්තෑපන්දාහක cheque එකක් දුන්නාම, මැණික් සංස්ථාව ඒක භාර ගත්තා. භාර අරගෙන මොනවාද කළේ? ඒ මනුස්සයා සුමානයක්, දෙකක් විතර මැණික් ගරලා බැලුවා; මැණික් නැහැ. චෙක් එක "stop payment" කළා. මෙන්න රජයේ මුදල් විනාශ වෙලා තිබෙන විධිය. මේ විධියේ වැඩ කරපු නිලධාරින්ට අවශ්‍ය දඬුවම දෙන්න ගරු ඇමතිතුමනි. ඒ Audit Report එක මගේ ළඟ තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ ඉඩමට කම්බි වැටක් ගහලා තිබෙනවා. ඒ කම්බි වැට ගහන්න අට ලක්ෂ ගණනක් ගිහින් තිබෙනවා. කම්බි වැටක් ගහලා මැණික් ගරන එක නවත්වන්න බැහැ. හමුදාව සහ පොලීසිය දාලා තමයි නවත්වාගෙන තිබෙන්නේ. මේ විධියටයි මේ සල්ලි ඉවර වෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ඒ වෙන්දේසියෙන් අපට විශාල මුදලක් ලැබුණා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

හරි. වෙන්දේසියෙන් මුදල් ලැබුණාට වැඩක් නැහැ නේ. නාස්ති වුණ ඒවා, හොරකම් කරපු ඒවා, අසාධාරණ වුණ ඒවාත් කියන්න එපායැ. ඒ ලියැවිල්ල ඇතුළු ඉදිරියේදී මා ඉදිරිපත් කරන සියලු ලියැවිලි **සභාගත***කරනවා. ඒ ලියැවිලිවල සියලු විස්තර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සම්බන්ධව යමක් කියන්න ඕනෑ. සාමාන්‍යයෙන් රජයේ තිබෙන සම්ප්‍රදායය, නීතිය තමයි, රජයේ සේවයට බැඳෙනකොට වයස අවුරුදු 45ට අඩු වන්න ඕනෑය කියන එක. නමුත් මේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සේවයට බඳවා ගන්නකොට වයස අවුරුදු 52යි.

මා කැමැති ඇමතිවරයකු නිසායි ඔබතුමාට මේ කාරණය කියන්නේ. සාමාන්‍යයෙන් මෙම අධිකාරියට එවැනි නිලධාරියකු බඳවා ගන්නවා නම් මැණික් කර්මාන්තය පිළිබඳව නිපුණතාවක් තිබෙන්න ඕනෑනේ. මේ පුද්ගලයාට එහෙම එකකුත් නැහැ. එහෙම නැත්නම් රජයේ සේවයේ හෝ සංස්ථා සේවයේ කළමනාකරණ මට්ටමක අවුරුදු 15ක පුරුද්දක් තිබෙන්නට ඕනෑ. ඔහුට එහෙම පළපුරුද්දකුත් නැහැ. එහෙමත් නැත්නම් ඉංජිනේරු හෝ මැණික් විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් තිබෙන්නට ඕනෑ. ඔහුට එහෙම එකකුත් නැහැ. මා පුද්ගලයන් විවේචනය කරනවා නොවෙයි. නමුත් මේ වාගේ අය බඳවා ගෙන කොහොමද මැණික් කර්මාන්තය දියුණු කරන්නේ?

මැණික් සංස්ථාවේ නිලධාරින් පිරිසක් ස්ථානීය දඩ ගහද්දී අල්ලස් ගත්තාය කියලා අල්ලස් දෙපාර්තමේන්තුවෙන් ඇවිත් අත් අඩංගුවට අරගෙන උසාවියට ඉදිරිපත් කර තිබෙනවා. අල්ලස් නිලධාරින් මේ නිලධාරින් අවිස්සාවෙල්ලේදී තමයි අත් අඩංගුවට අරගෙන තිබෙන්නේ. සාමාන්‍යයෙන් රජයේ නිලධාරියෙක් උසාවියට ඉදිරිපත් කළාම වැඩ තහනම් කරනවා නේ. නමුත් මේ අය සම්බන්ධයෙන් එහෙම කරලා නැහැ. ඊට පස්සේ චක්‍රලේඛයක් එවා තිබෙනවා, ස්ථානීය දඩ ගහන්න එපා කියලා. ඒක එවා තිබෙන්නේ 2012 අගෝස්තු මාසයේ 13වන දා. නමුත් අගෝස්තු 15 වන දා සිට ආපසු ස්ථානීය දඩ ගහනවා. මා ඉදිරිපත් කරන ලියවිලිවල ඒ විස්තර ඔක්කොම තිබෙනවා. මා ඒවා සභාගත කළා. මා මේ කරුණු කියන්නේ තමුන්නාන්සේට දැනගන්නයි. මේ විධියේ දූෂණ වන නිසා තමයි මා ඒවා ගැන කථා කරන්නේ. සුදුසු නැති නිලධාරින් බඳවා ගත්තාම තමයි මේ වාගේ කටයුතු වෙන්නේ.

මැණික් විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය ගත්ත සුදුසු නිලධාරින් මේ ක්ෂේත්‍රයේ ඉන්නවා. ලංකාවේ තමයි ලෝකයේ මැණික් ව්‍යාපාරය පිළිබඳ වැඩිම හොඳ දැනුම තිබෙන ව්‍යාපාරිකයෝ ඉන්නේ. ඉතින් මේ මැණික් කර්මාන්තය දියුණු කරන්න. රටට ආදායම ගෙනෙන්නයි අපට ඕනෑ. මේ වාගේ සුදුසුකම් නැති නිලධාරින් යොදා ගත්තාම මේ කර්මාන්තය හරියනවාද? මේ නිලධාරියාගේ ඉතිහාසය තිබෙනවා. නමුත් මා ඒවා කියන්න යන්නේ නැහැ හොඳ නැති නිසා. මා පෞද්ගලිකව කෙනෙකුට පහර ගහන්නේ නැහැ. කෙසේ වෙතත්, සුදුසු පුද්ගලයන් මේ තනතුරුවලට පත් කරන්න ඕනෑ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා වරක් පැමිණිල්ලක් කළා, නිලධාරින් එක්කාසු වෙලා නිව්තිගල කළු පාලමේ මැණික් ගරපු එක ගැන. ගරු ඇමතිතුමා මේවා සම්බන්ධයෙන් කටයුතු කරන්න. මා හිතන හැටියට මේවා කිව්වාම මේ අයට දඬුවම් කරන්න තමුන්නාන්සේටත් හොඳ අවස්ථාවක් ඇති වේවි.

ඒ විතරක් නොවෙයි. ලෝකයේ ප්‍රධාන පෙළේ ප්‍රදර්ශනවලට තියන මැණික් ගල් අපේ රටේ තිබෙනවා. ලෝකයේ තිබෙන වටිනාම මැණික් ගල් තුනක් අපට තිබෙනවා. ඒකට කියන්නේ මැණික් ත්‍රිත්වය කියලා. එකක් තමයි, "Blue Giant of the Orient" ඒක blue sapphire එකක්; බර කැරට් 466යි. තව තිබෙනවා, "cat's eye" එකක්. ඒකේ බර කැරට් 423යි. තවත් එකක් තිබෙනවා. ඒකේ බර කැරට් 400යි. මේවා සහ රේගුවෙන් අල්ලන මැණික් එක තැනක තැන්පත් කරලා තිබෙනවා. මේවා තැන්පත් කර තිබෙන ස්ථානයේ යතුරක් නැති වුණා. ඇමතිතුමනි, නැති වුණා නේද? නැති වුණා. ඒ ගැන කවුරුත් කිව්වේ නැහැ. නමුත් එතැන හිටපු නිලධාරියෙක් ඒ ගැන පැමිණිලි කළා. මොනවාද කළේ ඒ නිලධාරියාට? ඒ නිලධාරියා අවුරුදු 57න් ගෙදර යැව්වා; විශ්‍රාම යැව්වා. මේ වාගේ දෙයක් හෙළි කළාම ඒ පුද්ගලයාව තියා ගන්න ඕනෑ නේ. මා ඒ නිලධාරියාගේ නම කියන්නම්. ඒ නිලධාරියා ගෙදර යැව්වා. අපට භයක් තිබෙනවා, කෞතුකාගාරයේ තිබුණ කෞතුක වස්තුවලට වුණ දේ මැණික් සංස්ථාවේ මැණික්වලටත් වෙයිද කියලා. ඇමතිතුමනි, සේප්පුවේ යතුර නැති වුණාම, ඒක බලවත් වරදක් නොවෙයිද? ඒ ගැන හෙළි කරන තුරු කිව්වේ නැහැ නේ. පස්සේ ඒකට යතුරක් හැදුවා. ඒත් අපි කියන්නේ මේ වාගේ වංචා කරන උදවිය කරුණාකර අයින් කරන්න කියලායි. තමුන්නාන්සේලා සියලුම දෙනා උත්සාහ කරන්නේ මේ රටේ ආදායම වැඩි කරන්නයි. අපි ඒකට කැමැතියි. අපි කැමැතියි මේ රටේ මිනිසුන් හොඳින් ඉන්නවා දකින්න.

අද මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සම්පූර්ණයෙන්ම අක්‍රිය ආයතනයක් බවට වෙලා. පසු ගිය කාලයේ වැටලීම් කළ නිලධාරින් අවුරුදු 57න් ගෙදර යවලා. ඇයි ඒ අය යැව්වේ? රජයට සම්බන්ධ අයගේ මැණික් වැටලීම් කළා කියලා තමයි ඒ අය ගෙදර යැව්වේ. මැති ඇමතිවරුන්ගේ ඒවාත් ඒ අතර තිබෙනවා. මා ඒවා කියන්නේ නැහැ, හොඳ නැති නිසා. ඒක පාර්ලිමේන්තු සම්ප්‍රදායයට හොඳ නැහැ. දඩ ගහපු ඒවාත් තිබෙනවා; අල්ලපු ඒවාත් තිබෙනවා. ඕනෑ නම් දැන ගන්න මා ඒ විස්තර ඔබතුමාට දෙන්නම්. ඒවා සම්බන්ධයෙන් කටයුතු කළ ලිපි ලේඛනත් අප ළඟ තිබෙනවා. ඇමතිතුමනි, මේ ආයතනය හදන්න. සමහර විට මේ ඉන්න නිලධාරියෙක් දෙන්නෙක් නිසා මේ ව්‍යාපාරයම නැති වෙනවා. මේ රටට හොඳ ආදායමක් ගේන්න පුළුවන් මේ ආයතනයෙන්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමනි, තමුන්නාන්සේලා කරන වාරි මාර්ග ව්‍යාපාරවලත් මැණික් තිබෙනවා. මොරගහකන්දේ විශාල වශයෙන් මැණික් තිබෙනවා. ඒ ව්‍යාපාරය ජලයෙන් වැහෙන්න ඉස්සර ඒ මැණික් ගරා ගන්න ඉඩ දෙන්න. මේ දවස්වල ඇලහැර ප්‍රදේශයේ ගරන බව අපි දන්නවා. ASPලා සහ මැණික් නිලධාරින් පැනලා තිබෙනවා, බකමූණේ. කරුණාකරලා ගමේ මිනිසුන්ට මේ මැණික් ගරා ගන්න අවස්ථාවක් දෙන්න. ලක්ෂ්මන් සෙනෙවිරත්න මහත්මයා අපිත් එක්ක තරහා නැතිව ඇති. දුප්පත්ම මිනිසුන් ඉන්නේ අපේ පළාතේ. එහෙම නේද ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා? ලංකාවේ දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දහයෙන් 6ක් තිබෙන්නේ මොනරාගලයි, බදුල්ලේයි. පළමුවෙනි දහයෙන් 6ක් තිබෙන්නේ ඌව පළාතේ. අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ මේ මැණික් ඒ ගමේ මිනිසුන්ට ඒ මැණික් ගන්න ඉඩ දෙන්න කියන එකයි. ඉස්සර හතර පස් දෙනෙක් එකතු වුණාම ගිහින් පතලක් කපන්න පුළුවන්. නමුත් ඇමතිතුමනි, දැන් ඒක ලොකු ව්‍යාපාරිකයන් අතට ගිහින්. දැන් පොඩි මිනිසුන්ට ඒක කරන්න බැහැ. තමුන්නාන්සේ ඒ සඳහා වැඩ පිළිවෙළක් හදන්න. අපත් තමුන්නාන්සේට සහයෝගය දෙන්නම්. තමුන්නාන්සේගෙන් අපි ඉල්ලන්නේ මේ ක්ෂේත්‍රයේ තිබෙන දූෂණ නැති කරන්න කියලායි.

එදා ලංකාවේ අපනයන ආදායමෙන් තුන්වෙනි තැනට තිබුණ ව්‍යාපාරය තමයි මැණික් ව්‍යාපාරය. පොල්වල ආදායමටත් වඩා ඒ ආදායම වැඩි වුණා. අපි තෙල් සොයනවා වෙනුවටව මැණික් සොයමු කියන යෝජනාව කරමින් මගේ කථාව අවසන් කරනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Thank you very much. The Sitting is suspended till 1.00 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு பி.ப. 1.00 மணி வரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.* பிரதிச் சபாநாயகர் அவர்கள் *தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed,* MR. DEPUTY SPEAKER *in the Chair.*

[අ.භා. 1.00]

**ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය (ජලසම්පාදන හා ජලාපවහන නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) நிரூபமா ராஜபக்ஷ - நீர் வழங்கல், வடிகாலமைப்பு பிரதி அமைச்சர்)
(The Hon. (Mrs.) Nirupama Rajapaksa - Deputy Minister of Water Supply and Drainage)

ගරු සභාපතිතුමනි, අපේ රජයේ අට වන අය වැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ වගකීම් 2012 වර්ෂයේදී ඉටු කර ඇති ආකාරයත්, 2013 වර්ෂයේ අපේ ඉලක්ක, අය වැයට සමගාමීව සාර්ථක කර ගන්නා ආකාරයත් මේ සභාවේ අවධානයට යොමු කරවන අවස්ථාවයි මේ.

මෙහිදී අපි අමතක නොකළ යුතු ප්‍රධාන කාරණයක් තිබෙනවා. එනම්, ත්‍රස්තවාදය අවසන් කරලා, ඉදිරිපත් කරන හතර වන අය වැයයි මෙය. පසු ගිය අවුරුදු 30 තුළ ඉදිරිපත් කළ අය වැයවලට වඩා, අද අමාත්‍යාංශවලට වගකීම් වැඩි වෙලයි තිබෙන්නේ. දැන් උතුරෙත්, නැඟෙනහිරත් ශීඝ්‍ර සංවර්ධනයක් වෙමින් පවතිනවා. ඊට සමගාමීව පිරිසිදු පානීය ජලය සැපයීමේ කාර්යයත් අපි ඉටු කර ගෙන යනවා.

වසර 2020 වන විට, සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුටම කාර්යක්ෂම තිරසාර ක්‍රමවේදයක් තුළින් පාරිභෝගිකයාට දැරිය හැකි පිරිවැයකට පිරිසිදු පානීය ජලය ලබා දීමටත්, ශීඝ්‍රයෙන් වැඩි වන නාගරිකකරණය හා කාර්මිකකරණයට අනුව වැඩි වන අපජල ප්‍රමාණය පරිසරයට හානි නොවන විධියට බැහැර කිරීමටත් සිදු වන නිසා අප අමාත්‍යාංශයේ ඉදිරි ඉලක්කයන් ළඟා කර ගැනීමට කාර්යක්ෂම වූත්, ඵලදායී වූත්, වියදම් රාමුවක්, අප විසින් ඉදිරිපත් කර තිබෙනවා.

2012 අය වැය කාරක සභා අවස්ථාවේදී අප අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් සඳහන් කළ කරුණු අනුව කටයුතු කරමින් මේ වන විට මුළු රට පුරාම, ජලසම්පාදන හා ජලාපවහන

කටයුතු සම්බන්ධව ශීඝ්‍ර සංවර්ධනයක් සිදු වෙමින් පවතිනවා. 2013 අය වැය කාරක සභා අවස්ථාවේ අප අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ 2013 වර්ෂයේ අප අමාත්‍යාංශයේ ඉලක්ක පිළිබඳව සඳහන් කරන්නට කැමැතියි. අප විසින් දැනට පසු ගිය කාලයේ ආරම්භ කළ ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමට කටයුතු කරමින් සිටිනවා. අවසන් කළ ව්‍යාපෘති ජනතා අයිතියට පවරන අතර අලුතින් ව්‍යාපෘති ආරම්භ කරනවා.

අපේ අමාත්‍යාංශයේ වගකීම් සම්බන්ධයෙන් සාකච්ඡා කරනවා නම්, ජනතා අයිතියට පවරන ලද ව්‍යාපෘතිවල නඩත්තු කටයුතු කරන්න තිබෙනවා. ආරම්භ කරන ලද ව්‍යාපෘති ඉතා ඉක්මනින් අවසන් කරන්නට තිබෙනවා. අපේ රටේ ජනතාවට පිරිසිදු පානීය ජලය සපයන්න පුළුවන් වන්නේ එවිටයි. අපි ජනතාවට සපයන ජලය සේවාවක් හැටියට නඩත්තු කරමින්, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය පාඩු ලබමින්, ජල නාස්තිය අවම කර ගනිමින්, කටයුතු කිරීමේ අභියෝගය අපේ ගරු ඇමතිතුමාත්, මමත් අමාත්‍යාංශ නිලධාරිනුත්, ජාතික ජලසම්පාදන හා ජලාවහන මණ්ඩලයේ සියලු නිලධාරිනුත් භාර ගෙන තිබෙන බව මතක් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, 2012 වර්ෂයේදී අලුතින් ජල ව්‍යාපෘති රාශියක් ආරම්භ කළා. එයින් කිහිපයක් පමණක් සඳහන් කරන්නම්. මහ දඹුල්ල ජල යෝජනා ක්‍රමය මඟින් ප්‍රතිලාභීන් එක් ලක්ෂ හැත්තෑ හතර දහස් එකසිය අසූවකට පමණ පිරිසිදු පානීය ජලය සැපයීම සඳහා ඉන්දියානු ණය ආධාර යටතේ රුපියල් මිලියන එකොළොස් දහස් එකසිය හතළිස් නවයක ආයෝජනයක් යොදවා තිබෙනවා.

කොලොන්න-බලංගොඩ ජල යෝජනා ක්‍රමය මඟින් ප්‍රතිලාභීන් එක් ලක්ෂ දාහත් දහස් පන්සියයකට පානීය ජලය සැපයීම සඳහා රුපියල් මිලියන හාර දහස් හයසිය පනස් අටක මුදලක් බෙල්ජියම් ණය ආධාර යටතේ යොදවා ක්‍රියාත්මක කර ගෙන යනවා. එක්සත් ජනපද එක්සිම් බැංකු ණය ආධාර යටතේ රුපියල් මිලියන දස දහස් තුන් සිය අනූවක මුදලක් වැය කරන ලද, බදුල්ල හාලිඇල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභීන් එක් ලක්ෂ දස දහසකට ජලය සැපයීමටද කටයුතු කරනවා. කුරුණෑගල ජල සම්පාදන යෝජනා ක්‍රමය මඟින් ප්‍රතිලාභීන් පහළොස් දහසකට රුපියල් මිලියන විසි දහස් අනූ අටක් ආයෝජනය කර ඒ ප්‍රදේශයේ ජනතාවටත් ජලය ලබා දීමට කටයුතු කරගෙන යනවා. ඒ වාගේම යාපනය, කිලිනොච්චිය ජලසම්පාදන හා සනීපාරක්ෂාව වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුව මඟින් රුපියල් මිලියන පහළොස් දහස් හාරසිය දහ අටක මුදලක් වැය කරනවා.

හලාවත, වවුනියාව, මන්නාරම හා පුත්තලම ජල යෝජනා ක්‍රම සඳහා ආසියානු සංවර්ධන බැංකුව මඟින් රුපියල් මිලියන නව දහස් හත්සිය හැත්තෑදෙකක මුදලක් ණය ආධාර ලෙස ආයෝජනය කර තිබෙනවා. තවත් යෝජනා ක්‍රම ගණනාවක් ගැන කියන්න තිබුණත් එයින් කිහිපයක් ගැන පමණයි මේ අවස්ථාවේ සඳහන් කිරීමට කාල වේලාව ඇත්තේ.

මහනුවර, මහ කොළඹට උතුරෙන් පිහිටි ප්‍රදේශ, අම්පාර, වියළි කලාපීය නාගරික ජල ව්‍යාපෘති, කැළණිය දකුණ ඉවුර ව්‍යාපෘතිය, හම්බන්තොට රුහුණුපුර ජල ව්‍යාපෘතිය, ත්‍රිකුණාමලය සහ මීගමුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය, මොරටුව, රත්මලාන, ජා ඇල ඇතුළු මුළු රටම ආවරණය වන පරිදි ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඉතිහාසයේ කිසිම දවසක පිරිසිදු පානීය ජලය සැපයීම සඳහා මෙපමණ මුදලක් කිසිම රජයකින් ආයෝජනය කර නැති බවත් මම සඳහන් කිරීමට කැමැතියි.

මෑතකදී ක්‍රියාත්මක කරන ලද බුත්තල, කන්තලේ, තම්පලාකාමම්, එච්චිලම්පත්තු, පොළොන්නරුව, අම්පාර වැනි අති සාර්ථක ව්‍යාපෘති ගණනාවකම වැඩ අවසන් කර ජනතා අයිතියට පවරා තිබෙනවා. ඒ තුළින් දෙලක්ෂ පනස්දහසකට පමණ නව ජල සම්බන්ධතා ලබා දී තිබෙනවා.

2013 වසරේ තවත් ඉලක්ක ගණනාවකට අපි යනවා. මහින්ද චින්තනය යටතේ, අපේ අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ මෙවර අය වැයෙන්, පිරිසිදු පානීය ජලය සැපයීම ඉදිරියටම ගෙන යනවා. ඉදිරි වසර තුන තුළ ලංකාවේ විවිධ දිස්ත්‍රික්කවල මහා පරිමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මකවීමත් සමඟ පවුල් පන්ලක්ෂ අසූදහසකට පමණ නව ජල සම්බන්ධතා ලබා දීමට හැකි වෙනවා. ඒ සඳහා 2012 අය වැයෙන් ද රුපියල් බිලියන එකසිය විසිහයක මුදලක් ලබා දීලා තිබෙනවා. මීට අමතරව දැනට සියයට 47ක් වන අපතේ යන ජල ප්‍රමාණය 2016 වන විට සියයට 17 දක්වා අවම කිරීමට සැලසුම් සකස් කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් බිලියන විසිපහක අතිරේක මුදල් ආයෝජනයක් ද වෙන් කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, 2012 අය වැය යෝජනා අනුව කුරුණෑගල, රත්නපුර, බදුල්ල, හාලිඇල, මහියංගනය හා බණ්ඩාරවෙල නව ජල ව්‍යාපෘති ක්‍රියාත්මක වීමත් සමඟ ඉදිරි වසර තුන තුළ තවත් පවුල් දසලක්ෂයකට පමණ පානීය ජලය ලබා දීමට හැකි වෙනවා. 2013-2015 මධ්‍ය කාලීන අය වැය රාමුවක් තුළ ඉතා ක්‍රමවත්ව අපේ අමාත්‍යාංශය සැලසුම් සකස් කර තිබෙනවා. ඒ ගැන අදහස් කිහිපයක් පමණක් කියන්නම්. මධ්‍යම මට්ටමේ ආදායම් ලබන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය ක්ෂේත්‍ර තුළ සිදු වන පිබිදීමත් සමඟ කාලගුණික වෙනස්කම් නිසා ඇති වන ගැටලු හමුවේ රට තුළ ජීවත් වන සැමට පිරිසිදු පානීය ජලය සැපයීමේ අභියෝගයට විසඳුම් සොයන්න ඕනෑ. මේ වන විටත් ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහයෙන් වැඩි පිරිසකට පිරිසිදු පානීය ජලය ලබා දීමට සමත් වෙලා තිබෙනවා. තවද කුඩා පරිමාණයේ නගර විශාල ප්‍රමාණයක් පවතින ආර්ථික ක්‍රියාවලිය තුළ, සේවාමය හා වාණිජමය කේන්ද්‍රස්ථාන බවට පරිවර්තනය වන විට අප අමාත්‍යාංශය හමුවේ ඇති කාර්යභාරය තවදුරටත් වැඩි වෙලා තිබෙනවා.

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය සමඟ සිදු වන නාගරිකකරණය හේතුවෙන් නවීකරණය වන නගර සඳහා විධිමත් අපජල බැහැර කිරීමේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම අවශ්‍ය වෙලා තිබෙනවා. 2005-2012 කාලය තුළ දී රජය විසින් රුපියල් මිලියන පහළොස්දහස් අටසිය හැත්තෑවක මුදලක් අපජල බැහැර කිරීම සඳහා ආයෝජනය කර තිබෙනවා.

එමෙන්ම දැනට මුළු ජනගහනයෙන් අපජල බැහැර කිරීමේ පහසුකම් තිබෙන ප්‍රතිශතය ලෙස වාර්තා වී තිබෙන්නේ සියයට 2.3ක ප්‍රමාණයක්. මේ ප්‍රතිශතය 2020 වන විට සියයට 7 දක්වා ඉහළ දැමීමටත් ඒ කාර්යය සාධනය සඳහා ආයෝජන මාර්ග හඳුනා ගැනීමටත් අප සැලසුම් කර තිබෙනවා.

විශේෂයෙන් වියළි කලාපය තුළ වකුගඩු රෝග මෙන්ම Dental fluorosis රෝගය බහුලව දක්නට තිබෙනවා. ශ්‍රී ලංකාවේ මාසයක් තුළ දළ වශයෙන් වකුගඩු කාන්දු පෙරීම හය දහසකට ආසන්න සංඛ්‍යාවක් සිදු වන බව වාර්තා වෙනවා. එයට එක් ප්‍රධාන හේතුවක් තමයි පිරිසිදු පානීය ජලය නොමැති වීම.

[ගරු නිරුපමා රාජපක්ෂ මහත්මිය]

අපට පානීය ජලය ලබා ගන්නා මාර්ග ගණනාවක්ම තිබෙනවා. භූමිය ඇතුළත ආරක්ෂිත ළිං මඟින්, නළ ජලය කරාම මඟින්, නළ ළිං මඟින්, බවුසර් මඟින්, බෝතල් ජලය ලබා ගැනීම තුළින්, ගංගා, වැව්, ඇළ මාර්ග, ජල උල්පත් හා වෙනත් මාර්ගවලින් අපේ ජනතාව ජලය සපයා ගන්නවා.

අතීතයේ තිබුණු ස්වාභාවික ජල උල්පත්, අද ශීඝ්‍ර සංවර්ධනයත් සමඟ සිදු වන පරිසර දූෂණය නිසා විනාශ වෙමින් පවතිනවා. ඒ නිසා තමයි අද අපිට පිරිසිදු පානීය ජලය සැපයීම විශේෂයෙන් රජයේ වගකීමක් හා සේවාවක් හැටියට පරිවර්තනය වෙලා තිබෙන්නේ. අද පිරිසිදු පානීය ජලය සැපයීමත් සත්කාරක සේවාවක් බවට පත්වී තිබනවා.

ආගමික ස්ථානවලට හා අඩු ආදායම්ලාභීන් සඳහා ඉතා සහනදායී මිලකට, ජලය සපයන අතර, රෝහල්වලට, පාසල්වලට, වතු ජනාවාසවලට, රාජ්‍ය ආයතනවලට, මහජන පොදු කරාම හා උද්‍යාන කරාම සඳහා වාණිජ හා කාර්මික ජනපදවලට, සංචාරක හෝටල්වලට, ආයෝජන මණ්ඩලයේ කලාපවලට, නැව් සඳහා ද වෙන වෙනම පාරිභෝජන ගාස්තු අඩු වැඩි වශයෙන් ලබා ගෙන පිරිසිදු පානීය ජලය සැපයීම අපගේ විශේෂිත වගකීමක් ලෙස ඉටු කරන බව සිහිපත් කරන්න කැමැතියි.

මේ හේතුව නිසා 2005-2011 කාල සීමාව තුළ රජය විසින් රුපියල් බිලියන එකසියහතලිස්පහක ආයෝජනයක් කර තිබෙනවා. ඒ කාල සීමාව තුළ නළ ජලය සැපයීම මඟින් ජනගහනයෙන් සියයට 29 සිට සියයට 43 දක්වා ප්‍රතිශතයකින් පිරිසිදු පානීය ජලය සැපයීම ඉහළ දැමීමට හැකි වෙලා තිබෙනවා. මේ සියලු කාර්යභාරය වෙනුවෙන් 2013 වසරේදී යෝජිත මූලධන ආයෝජනය රුපියල් මිලියන හතලිස්පන්දහස් පන්සිය හතක් වන අතර, මුළු පුනරාවර්තන වියදම රුපියල් මිලියන එකසියඅනුවක් ආයෝජනය කිරීමට සැලසුම් කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මා සඳහන් කරන්න කැමැතියි, මා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ 2012 වසරේ රුහුණුපුර ජල ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර තිබෙන බව.

දැන් අප දිස්ත්‍රික්කයේ ඉතිරිව තිබෙන ජල ව්‍යාපෘති කිහිපය වන්නේ කිරම-කටුවන, මිද්දෙනිය- අඟුණකොළපැලැස්ස, මුරුතවෙල, බරවකුඹුක, පල්ලෙරොටේ යන ග්‍රාමීය ව්‍යාපෘතියි. මේ ව්‍යාපෘති සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කර තිබෙනවා. මේ සඳහා විදේශ ආධාර මුදල් ඩොලර් මිලියන 75ක පමණ ප්‍රමාණයක් අවශ්‍ය වන බව දළ වශයෙන් ඇස්තමේන්තු කර තිබෙනවා. 2013 වසරේදී එම ව්‍යාපෘතිද සාර්ථකව ක්‍රියාත්මක කළාට පස්සේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සියයට සියයක් පිරිසිදු පානීය ජලය සැපයීම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ යුගයේදී අවසන් කරන්න හැකි වෙනවා.

ගරු සභාපතිතුමනි, මේ ව්‍යාපෘති සාර්ථක කර ගන්න සහයෝගය ලබා දෙන දේශීය හා විදේශීය මූල්‍ය ආයතනවලට ස්තුතිය පුද කරන්න ඕනෑ. මේ සියල්ල සාර්ථකව කරගෙන යන්න ශක්තිය හා ධෛර්යය ලබා දෙන අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, අප අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් පී.බී. ජයසුන්දර මැතිතුමාටත්, අප අමාත්‍යාංශයේ ලේකම් ඒ. අබේගුණසේකර මැතිතුමාටත්, ජාතික සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිතුමා, සාමාන්‍යාධිකාරීතුමා ඇතුළු සමස්ත නිලධාරින්ටත් මා ස්තුතිවන්ත වන අතර, 2013 වසරේදී අපේ ඉලක්ක ජය ගැනීමට ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

[பி.ப 1.13]

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**

(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)

(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)

கௌரவ தவிசாளர் அவர்களே, நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சு, நீர்ப்பாசன நீர்வள முகாமைத்துவ அமைச்சு மற்றும் சுற்றாடல் அமைச்சு ஆகிய முக்கிய அமைச்சுக்களின் மீதான வரவு செலவுத்திட்டக் குழுநிலை விவாதங்களில் கலந்து கொள்ள எனக்கும் சந்தர்ப்பம் கிடைத்தமையையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். எமது நாடு சிறந்த நீர்ப்பாசனப் பாரம்பரியத்தையுடையது. சிறந்த முறையில் நீர்ப்பாசனத்தைப் பயன்படுத்தியவர்கள் என்ற பெருமையும் எமக்குண்டு. இலங்கையின் பெருமளவு விவசாயம் நீர்ப்பாசனம் மூலமே மேற்கொள்ளப்படுகின்றது. இரண்டாயிரம் வருடங்களுக்கு முன்னர் உருவாக்கப்பட்ட நீர்ப்பாசன முறையின் தொடர்ச்சியை நாம் இன்னும் வளமாக்கித் தொடர்ந்து கொண்டிருக்கின்றோம். இப்பொழுது நாடு முழுவதும் 163 பாரிய குளங்களும் 2,617 சிறிய குளங்களும் 3,910 நீர்ப்பாசன வாய்க்கால்களும் உள்ளன. அதேநேரம் புதிய நீர்ப்பாசனத் திட்டங்கள் தொடர்ந்தும் உருவாக்கப்பட்டு வருகின்றன. இதற்காக அரசாங்கம் பல ஆயிரம் கோடி ரூபாயை ஆண்டுதோறும் செலவழித்து வருகின்றது. அந்த அளவுக்கு நாம் நீரின் பயனை அனுபவித்து வருகின்றோம். இலங்கைக்குத் தனிச் சிறப்பு கிடைத்துள்ளது என்றால் அது நீரினால்தான் என்று நான் நம்புகின்றேன்.

இன்று நீரைத் தேடி உலகம் பெரும் பாடுபடுகின்றது. இன்றைய உலகப் போக்கில் ஒரு லீற்றர் பாலின் விலையைவிட ஒரு லீற்றர் நீரின் விலை அதிகமாகியுள்ளது; இதுதான் யதார்த்தமாக இருக்கின்றது. கிரகங்களை நோக்கிய பயணத்திலும் அங்கு முதலில் தண்ணீரைத்தான் தேடுகின்றார்கள். இன்று வல்லரசுகள் செவ்வாய்க் கிரகத்தில் தண்ணீர் கிடைப்பதற்கான சாத்தியங்கள் உண்டா என்பது பற்றி அறிவதற்காகக் கோடிக்கணக்கான டொலரைச் செலவழித்துக் கொண்டிருக்கின்றன. நீரின் பெறுமதி அந்த அளவுக்கு உள்ளது. இதனால்தான் 'நீரின்றி அமையாது உலகம்' என்ற ஒரு முதுமொழியைச் சொல்கின்றார்கள். இனிமேல் ஓர் உலகப் போர் மூளுமாக இருந்தால் அது தண்ணீருக்கான போராகஇருக்கும் என்பதே பலருடைய கருத்தாக உள்ளது. எங்கள் நாட்டின் இறுதிப் போர்கூட - நான்காம் கட்ட ஈழப் போர் - தண்ணீருக்கான சண்டையாகத் தான் மாவிலாற்றில் ஆரம்பமானது. இத்தகைய முக்கியத்துவம் வாய்ந்த நீர் தொடர்பான விவாதத்தில் நான் மேலும் சில கருத்துக்களை முன்வைக்க விரும்புகின்றேன்.

வட பகுதியிலே நீண்ட காலமாகப் புனரமைக்கப் படாதிருந்த குளங்களையும் மற்றும் பாசன வாய்க்கால் களையும் புனரமைப்பதற்குப் பல்வேறு திட்டங்களினூடாக அரசாங்கம் நிதி ஒதுக்கீடு செய்துள்ளது. இதன்மூலம் வவுனிக்குளம், அக்கராயன்குளம், முத்தையன்கட்டுக்குளம், கட்டுக்கரைக்குளம் போன்ற பாரிய குளங்கள் முதல்

ஆயிரக்கணக்கான சிறு குளங்கள்வரை புனரமைக்கப் பட்டுள்ளன. மேலும் பல குளங்களைப் புனரமைக்கும் பணிகள் தொடர்ந்து நடைபெற்றுக்கொண்டிருக்கின்றன. அடுத்த ஆண்டில்கூட பல குளங்கள் புனரமைப்புக்காகத் தெரிவு செய்யப்பட்டுள்ளன. இதன்மூலம் பாசனத்துக்கான நீரைச் சேமிப்பது மட்டுமல்லாது நிலத்தடி நீர்ச் சேமிப்பும் இடம்பெறுகின்றது. ஒப்பீட்டளவில் பார்த்தால் இந்த நீர்ச் சேகரிப்பு விடயத்தில் நாம் மிகப்பெரும் முன்னேற்றத்தைக் கண்டுள்ளோம். இது எமக்குப் பெரும் வெற்றியாகும். இதற்காக நாம் கடுமையாக உழைத்துள்ளோம். அதேநேரம் எமது பாரம்பரியத்தையும் முன்னோரின் வழிமுறைகளையும் நாம் பாதுகாப்பதுடன் மேம்படுத்தியும் வருகின்றோம். இந்தப் பெரும் பணி பற்றி நாளைய வரலாறு சொல்லத்தான் போகின்றது. ஆனால், கடந்த காலங்களில் குளங்கள் உடைத்துவிடப்பட்டன, வாய்க்கால்களும் ஆறுகளும் சிதைத்து விடப்பட்டன. இது மக்களுக்கும் எமது முன்னோருக்கும் இழைத்த கொடுமையும் அவமரியாதையும் ஆகும். இவ்வாறு உடைக்கப்பட்ட கல்மடுக் குளத்தை நாம் எமது பதவிக் காலத்தில் மேன்மைதங்கிய ஜனாதிபதி அவர்களின் வழிகாட்டலின் கீழும் கௌரவ அமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களின் நிதி ஒதுக்கீட்டின் ஊடாகவும் மீள்நிர்மாணம் செய்துள்ளோம். இந்தக்குளம் இறுதி யுத்த காலத்தின்போது யுத்த காரணங்களுக்காக - மக்களின் விவசாயத் தேவையைக் கருத்தில் எடுக்காமல் - புலிகளினால் உடைத்துச் சிதைக்கப்பட்டதை எல்லோரும் அறிவார்கள்.

அடுத்த ஆண்டில் வடக்கின் மிகப் பெரும் குளமான இரணைமடுக் குளம் புனரமைக்கப்படவுள்ளது. இதற்காக 5.4 பில்லியன் இலங்கை ரூபாய் - 41.34 மில்லியன் அமெரிக்க டொலர் ஒதுக்கப்பட்டுள்ளது. இந்தப் புனரமைப்பின்மூலம் மேலும் 15,000 ஏக்கர் கன அடி நீரைத் தேக்கி வைக்க முடியும். இதனால் கிளிநொச்சி மாவட்டத்தின் விவசாயச் செய்கையை மேலும் மேம்படுத்துவதுடன் கிளிநொச்சி, யாழ்ப்பாணம் ஆகிய மாவட்ட மக்களின் குடிநீர்ப் பிரச்சினையும் தீர்த்து வைக்கப்படும். இன்று இந்த அவையிலே பேசிய தமிழ் தேசியக் கூட்டமைப்பைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர் ஒருவர் இதனைப் புரிந்துகொள்ளாமல், இந்த நீரை கிளிநொச்சி மாவட்ட மக்களின் நலன்களுக்கு எதிராக திட்டமிட்டு யாழ்ப்பாணத்துக்கு கொண்டுசெல்லப்படுகின்றது என்று கூறி, தேவையில்லாமல் பிரதேசவாதத்தைக் கிளப்ப முயற்சிக்கின்றார். இங்கு அவர் முன்வைத்த வாதங்களுக்கு நான் பதில் அளிக்க விரும்புகின்றேன். இரணைமடுக் குளத்தினூடான நீர் விநியோகத் திட்டத்தை நடைமுறைப் படுத்தும்போது அல்லது அத்திட்டம் தொடர்பில் ஆலோசிக் கப்படும் போது அல்லது அவர்களுடன் நடத்துகின்ற பல சுற்றுப் பேச்சுவார்த்தைகளின்போது, கிளிநொச்சி மாவட்ட விவசாயிகளின் நிபந்தனைகள் யாவும் ஏற்றுக்கொள்ளப்பட்ட பிறகுதான், இத்திட்டத்தினூடாக குடிநீரானது கிளிநொச்சி மாவட்ட மக்களுக்கும் யாழ். மாவட்ட மக்களுக்கும் வழங்கப்படும். இந்தக் குளத்தில் கிட்டத்தட்ட 15,000 கனஅடி நீர் மேலதிகமாகச் சேமிக்கப்படுகிறது. இதன் அணைக் கட்டினை இரண்டு அடியால் உயர்த்தி, குளக்கட்டிலுள்ள கசிவுகளைச் சீர்செய்து தண்ணீரை மேலதிகமாகத் தேக்குவதன்மூலம் ஏற்கெனவே கிளிநொச்சி மாவட்டத்தில் நீர்ப்பாசனம் இல்லாத விவசாய நிலங்களுக்கு நீரை வழங்கி னால், மேலும் பல்லாயிரக்கணக்கான ஏக்கர் நிலப்பரப்பில் நெற்பயிர் செய்யக்கூடிய சூழலை உருவாக்கலாம். இவ்வாறு வரட்சியான காலகட்டங்களில் கிளிநொச்சி மாவட்ட மக்களுடைய குடிநீர்ப் பிரச்சினை தீர்க்கப்பட்ட பின்னர், மீதித் தண்ணீர்தான் யாழ். மாவட்டத்தின் ஒரு சில பகுதிகளுக்குக் கொண்டுசெல்லப்பட இருக்கின்றது. அவ்வாறே, ஏற்றுப்பாசன நீரையும் திருவையாறு போன்ற பிரதேசங்களிலுள்ள விவசாய நிலங்களுக்கு வழங்கக்கூடிய வகையில், சகல கால்வாய் களையும் முழுமையாகப் புனரமைத்து, அதில் சில கால்வாய்களை சீமெந்துக் கால்வாய்களாக மாற்றி, உரிய நீர்ப்பாசன ஒழுங்குகள் செய்யப்பட இருக்கின்றன.

யாழ். மாவட்டத்தின் முழுமையான குடிநீர்ப் பிரச்சினையை இரணைமடுக் குளத்து நீரினால் மட்டும் தீர்த்துவிட முடியாது. அதற்கென வேறு திட்டங்கள் தயாரிக்கப்பட்டு எதிர்காலத்தில் செயற்படுத்தப்படும். இந்த விடயங்களையெல்லாம் கருத்திற் கொள்ளாமல், ஏதோ கிளிநொச்சி விவசாயிகளின் நலன் சார்ந்து நிற்பவர்போல், அந்த உறுப்பினர் இங்கு பேசினார். இவர்கள் அம்மக்களுடைய நலன்களில் அக்கறை உடையவர் களாக இருந்திருந்தால், அன்று கல்மடுக்குளத்தை உடைத்து, அதிலிருந்த தண்ணீரை வீண்விரயம் செய்து, கிட்டத்தட்ட 6,000 ஏக்கர் நிலப் பரப்பில் பயிர்ச்செய்கையை மேற்கொண்ட விவசாயிகளின் வாழ்க்கையை அழித்தவர்களையோ, அந்தச் செயலையோ ஏன், கண்டிக்க முற்படவில்லை? இன்று அரசாங்கமானது அந்தக் குளத்தின் அணைக்கட்டை உயர்த்தி மேலதிகமாக நீரைத் தேக்கி, கடந்த காலங்களில் எவருக்கு நீர் கிடைக்காமல் இருந்ததோ, அவர்களுக்கும் நீர் கிடைக்கக்கூடிய ஒரு சூழலை ஏற்படுத்தியிருக்கின்றது. இதன்மூலம் தர்மபுரம் பிரதேச மக்களின் நீண்டகால அபிலாசையும் தீர்த்து வைக்கப்பட்டு அவர்களும் நெற்பயிர் செய்யக்கூடிய சூழல் உருவாகியுள்ளது. இந்த விடயங்களைக் கருத்திற் கொள்ளாமல், அவர் தனது ஓர் அபிப்பிராயத்தை இங்கே குறிப்பிட்டார். அதாவது, ஆனையிறவு கடல் நீரேரியினது அல்லது சுண்டிக்குளம் கடல் நீரேரியினது நீரை நன்னீராக்கிச் சேமித்து, யாழ். மாவட்டத்துக்கு குடிநீரை வழங்கலாமென்று கூறினார். இது அர்த்தமற்ற ஒரு திட்டம். ஆனையிறவு கடல் நீரேரியானது இலங்கையின் உப்பு உற்பத்தியில் பெரும் பங்கை வகிக்கின்ற ஒரு பிரதேசம். கிட்டத்தட்ட 10,000 தொழிலாளர்கள் அதனை நம்பிருக்கின்றார்கள். அதுமட்டு மல்ல, ஆனையிறவு கடல் நீரேரியில் season காலத்தில் இறால் மற்றும் மீன் பிடிக்கின்ற கிட்டத்தட்ட 2,000 குடும்பங்கள் இருக்கின்றன. இவர்களுடைய எதிர்காலத்தைக் கருத்திற் கொள்ளாமல், அந்த நீரை நன்னீராக்கிச் சேமிக்க முடியுமென்ற திட்டமானது, ஒன்றுக்கும் உதவாத திட்டமென்றே நான் கருதுகின்றேன்.

அத்துடன், வட மாகாணத்தின் குடிநீர் விநியோகத்துக்கென வகுக்கப்பட்ட திட்டங்களுக்கு எவ்வளவோ மில்லியன்கள் ஒதுக்கப்பட்டிருக்கின்றன. யாழ்ப்பாணத்தில் மட்டும் கிட்டத்தட்ட 26,000 பயனாளிகள் நன்மை பெறக்கூடிய அளவுக்கு பல்வேறு திட்டங்கள் செயற்படுத்தப்பட்டிருக் கின்றன. இவ்வாறு அவர்கள் குடிநீரைப்பெறும் வகையில், 15 இடங்களில் நீர் விநியோகத்துக்குரிய community-based projects - சமூக மேம்பாட்டுத் திட்டங்கள் ஏற்படுத்தப் பட்டிருக்கின்றன. அதுமட்டுமல்ல வவுனியா மாவட்டத்தில் 7,200 பயனாளிகளுக்கு நீர் விநியோகிக்கும் திட்டமும் மன்னார் மாவட்டத்தில் கிட்டத்தட்ட 24,000 பயனாளிகளுக்கு நீர் விநியோகிக்கும் திட்டமும் செயற்படுத்தப்பட்டு வருகின்றன. இதனால் மொத்தமாக கிட்டத்தட்ட 58,000 பயனாளிகள் நன்மையடையவுள்ளனர்.

வடக்கின் துரித மீட்சித் திட்டத்தின்கீழ் நெடுங்கேணியில் 5,000 பேர் பயன் பெறக்கூடிய கிட்டத்தட்ட 175 மில்லியன் ரூபாய் செலவிலான நீர் விநியோகத் திட்டமும் விடத்தல்தீவில் 8,500 பேர் நன்மை பெறக்கூடிய 204 மில்லியன் ரூபாய் செலவிலான நீர் விநியோகத் திட்டமும் செயற்படுத்தப்பட்டு வருகின்றன. அதேபோன்று அடம்பன் பிரதேசத்தில் 5,860 பேர் பயன்பெறக்கூடிய 296 மில்லியன் ரூபாய் செலவிலான நீர் விநியோகத் திட்டமும் வல்வெட்டித்துறைப் பிரதேசத்தில்

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

10,000 பேர் பயன்பெறக்கூடிய கிட்டத்தட்ட 248 மில்லியன் ரூபாய் செலவிலான நீர் விநியோகத் திட்டமும் மேற்கொள்ளப் பட்டு வருகின்றன. இத்திட்டங்கள் 2012ஆம் ஆண்டு டிசம்பர் மாதம் நிறைவடையும் என உத்தேசிக்கப் பட்டுள்ளது. அதேபோன்று மருதங்கேணியில் 1,500 பேர் பயன்பெறக் கூடிய கிட்டத்தட்ட 25 மில்லியன் ரூபாய் செலவிலான நீர் விநியோகத்திட்டமும் முல்லைத்தீவு மாவட்டத்திலுள்ள பாண்டியன்குளத்தில் 2,260 பேர் பயன் பெறக்கூடிய கிட்டத்தட்ட 198 மில்லியன் ரூபாய் செலவிலான நீர் விநியோகத்திட்டமும் மேற்கொள்ளப்பட்டு வருகின்றன.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Hon. Member, please wind up your speech now.

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் )
(The Hon. Murugesu Chandrakumar )
Mr. Chairman, please give me five more minutes.

அதேபோன்று முல்லைத்தீவு மாவட்டத்திலுள்ள ஒட்டு சுட்டானில் 10,700 பயனாளிகள் பயன்பெறக்கூடிய கிட்டத் தட்ட 92 மில்லியன் ரூபாய் செலவிலான நீர் விநியோகத் திட்டமும் மல்லாவியில் 4,500 பேர் பயன்பெறக்கூடிய கிட்டத்தட்ட 192 மில்லியன் ரூபாய் செலவிலான திட்டமும் மேற்கொள்ளப்படுகின்றன. கிளிநொச்சி நீர் வழங்கல் திட்டத்தின்கீழ் கரைச்சி பிரதேசத்தில் 11கிராம சேவகர் பிரிவுகளையும், கண்டாவளை பிரதேசத்தில் குமாரபுரம் மற்றும் பரந்தன் நகரத்தையும் உள்ளடக்கியதாக 740 மில்லியன் ரூபாய் செலவிலான நீர் வழங்கல் மேம்பாட்டுத் திட்டம் அமுல்படுத்தப் படுகின்றது. அதேபோன்றே மடுத் தேவாலயத்திலும் மேற் கொள்ளப்படுகின்றது. மேலும், கிளிநொச்சி நகரில் 99 மில்லியன் ரூபாய் செலவிலான 12,000 பயனாளிகளுக்கான நீர் விநியோகத் திட்டம் வருகிற ஜனவரி மாதமளவில் ஆரம்பிக்கப்படவிருக்கின்றது. இதைவிட 674 மில்லியன் ரூபாய் செலவில் யாழ்ப்பாணத்தில் 22,000 பேர் பயன்பெறக் கூடிய பல்வேறு திட்டங்களுக்கான கரு உருவாக்கம் செய்யப்பட்டிருக்கின்றது. ஆகவே இன்னும் இரண்டு- மூன்று வருடங்களுக்குள் வட மாகாணத்திலுள்ள மக்கள் எதிர் கொள்ளும் குடிநீர்ப் பிரச்சினைக்கு முற்றுப்புள்ளி வைக்கப் படுமென நான் எதிர்பார்க்கிறேன். அரசியல் ஆதாயம் தேடும் நோக்கத்தில் சில அரசியல்வாதிகள் மக்களை மடையர் களாக்கப் பார்க்கின்றனர். சில ஊடகங்கள் இவர்களுக்கு ஒத்தூதுபவைகளாக இருக்கின்றன. நான் இந்த அவையிலே இவர்களிடம் ஒரு கேள்வியைக் கேட்க விரும்புகின்றேன். அதாவது, நீங்கள் உங்களுடைய சொந்தச் சகோதரர்களுக்கோ அல்லது நீங்கள் பெற்ற பிள்ளைகளுக்கோ தினமும் பொய்யைச் சொல்லி வளர்ப்பீர்களா? நீங்கள் அப்பிள்ளைகளுக்கு அவ்வாறு பொய் சொல்லி வளர்த்தால் எதிர்காலத்தில் அவர்கள் எத்தகைய குணங்களுடன் திகழ்வார்கள்? அதேபோன்றுதான் உங்களுக்கு வாக்களித்த உங்களுடைய மக்களுக்கு நீங்கள் பொய்யைச் சொல்கின்றீர்கள். தவறான கருத்துக்களையும் தவறான புள்ளிவிபரங்களையும் சொல்லிக் கொண்டிருக்கின்றீர்கள். அதனால்தான் இவ்வளவு காலம் போராடியும் தமிழ் மக்களால் வெற்றியடைய முடியவில்லை.

கடந்த பெரும்போகப் பயிர்ச்செய்கைக் காலத்தில் இலங்கை முழுவதும் கடும் வரட்சி நிலவியது. திட்டமிட்டு இரணைமடுக் குளத்திலுள்ள நீர் திறந்து விடப்பட்டதாகப் பிரசாரம் செய்தீர்கள். சில மாதங்களுக்கு முன்னர் இரணைமடுக் குளத்தில் மட்டுமன்றி இலங்கை முழுவதும் வரட்சி நிலவியது என்பதே உண்மை. எமது நாட்டின் புனரமைப்பு வேலைகள் செம்மையாக நடைபெற்றுவருவதை உறுதிப்படுத்துகின்ற கண்காணிப்பாளர்கள் பொறுப்புடன் கடமையாற்றுகின்றனரா என்பதைக் கௌரவ அமைச்சர் அவர்கள் கருத்தில் எடுத்துக்கொள்ள வேண்டும். பல்வேறு திட்டங்களை அமுல்படுத்துவதற்காக கோடிக்கணக்கில் பணம் ஒதுக்கப்பட்டுள்ளது. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் சரியான முறையில் கண்காணிப்பு நடைபெறுகிறதா என்பதை உறுதிப்படுத்த உரிய நடவடிக்கை எடுக்க வேண்டும். திட்டங்களை நடைமுறைப்படுத்துவதில் பல குறைபாடுகள் இருப்பதை நாம் அவதானித்துள்ளோம். அவ்விதம் குறைபாடுகள் ஏற்பட்டால் அவை மக்களுக்குத் தீமையாக அமைந்துவிடும். எனவே,அவற்றைக் கவனத்திற்கொள்ள வேண்டும். கிளிநொச்சி மாவட்டத்தில் நடைமுறைப் படுத்தப்பட்டு வரும் பல புனரமைப்புப் பணிகள் தொடர்பாக கமக்காரர் அமைப்பு போன்ற அமைப்புக்கள் தமது திருப்தியின்மையை வெளிப்படுத்தியிருக்கின்றன. ஆகவே, இவ்விடயம் தொடர்பில் நிலைமைகளை அவதானித்தல் அவசியமாகும்.

அடுத்ததாக, யாழ்ப்பாணம், கிளிநொச்சி ஆகிய மாவட்டங் களின் சுற்றுச்சூழல் பாதுகாப்பையும் நாம் கவனத்திற் கொள்ள வேண்டும். சுற்றாடல் பாதுகாப்பு என்பது வாழ்க்கைக்குத் தேவையான வளங்களைப் பாதுகாப்பதாகும். சிதைவடைந்து கொண்டிருக்கும் சுற்றாடலில் எந்தவொரு மனிதனாலும் வாழ முடியாது. யாழ்ப்பாணம், கிளிநொச்சி உட்பட்ட பல பகுதிகளின் சுற்றாடல் போரினால் மிக மோசமாகப் பாதிக்கப்பட்டுள்ளது. இதனை மீளுருவாக்கம் செய்வதற்குரிய சிறப்புத்திட்டங்களை நாம் உருவாக்க வேண்டும். துரதிஷ்டவசமாக இத்தகைய திட்டங்கள் எதுவும் இதுவரை மேற்கொள்ளப்படவில்லை. இதேவேளையில் அப்பிரதேசங் களில் சட்டவிரோத மணல் அகழ்வு, மரம் வெட்டுதல் போன்ற சுற்றாடல் அழிப்புக் குற்றச்செயல்கள் தொடர்ச்சியாக மேற்கொள்ளப்பட்டு வருகின்றன. இதுதொடர்பாக நாம் அங்கே முடிந்தளவிலான கட்டுப்பாட்டு நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றோம். இருந்தாலும், அவை எமக்கு மேலும் சவாலாகவே உள்ளன. சுற்றுச்சூழல் மேம்பாட்டின் முக்கியத்துவத்தைக் கருத்திற்கொண்டு, மேதகு ஜனாதிபதி அவர்கள் 500 மில்லியன் ரூபாயை இந்த வரவு செலவுத் திட்டத்தில் ஒதுக்கியுள்ளார். எனவே, நாம் ஒரு பொது வேலைத்திட்டத்தின் அடிப்படையில் இதுதொடர்பான அவதானங்களை மேற்கொள்ள வேண்டும்.

அடுத்ததாக, நீர் வழங்கல் தொடர்பாகச் சில விடயங்களை இங்கே முன்வைக்க விரும்புகின்றேன். கிளிநொச்சி மாவட்டக் குடிநீர்ப் பிரச்சினைக்கு 2015ஆம் ஆண்டளவில் நிரந்தரத் தீர்வு ஏற்படும் என எதிர்பார்க்கப்படுகின்றது. இதுதொடர்பாகச் சம்பந்தப்பட்ட அதிகாரிகளுடனும் கௌரவ அமைச்சர் அவர்களுடனும் கலந்துரையாடியுள்ளோம். அவர்கள் எம்முடன் இணைந்து நீர் வழங்கல் பணிகளை மேற்கொண்டு வருகின்றனர். இதற்கிடையில் அங்கு சிறிய அளவிலான நீர் விநியோகத் திட்டங்கள் ஆரம்பிக்கப்பட்டுள்ளன. வட்டக்கச்சி, இயக்கச்சி, அக்கராயன், நெடுந்தீவு, மாதகல் போன்ற இடங்களில் அப்பணிகள் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. இதற்கான ஏற்பாடுகளைச் செய்து தந்த கௌரவ அமைச்சர் அவர்களுக்கு நான் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். கிளிநொச்சி நகர நீர் விநியோகத் திட்டமும் மேலும் விரிவாக்கம் செய்யப்பட வேண்டியிருக்கின்றது. அந்தத் திட்டத்துக்குள் உள்ளடங்காத கிராமங்களையும் உள்ளடக்க

வேண்டுமென கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன். அதேபோல பரந்தன், கோரக்கன்கட்டு, பூநகரி - தெளிகரை போன்ற இடங்களிலும் பூநகரிப் பிரதேசத்தின் சமூக மேம்பாட்டுத்திட்ட நீர் விநியோகங்களை ஆரம்பிக்க வேண்டுமென்று நான் பரிந்துரைக்கின்றேன். எம்மைத் தங்களின் பிரதிநிதியாக இந்த மன்றுக்கு அனுப்பி வைத்த மக்களுக்கு உருப்படியாக எதையாவது செய்யவேண்டுமென்ற எமது நோக்கத்துக்குக் கிடைத்துவரும் வெற்றியையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன்.

பல ஆண்டுகளாகவே பாராளுமன்றத்தில் பிரதிநிதித்துவம் செய்துவரும் சில உறுப்பினர்களால் அவர்களது குடும்பங்கள் நன்மையடைகின்றதே தவிர, மக்களுக்கு எந்த நன்மையும் கிடைப்பதில்லை. இதைவிட, கிடைக்கின்ற நன்மைகளைத் தடுக்கின்ற விதமாகத்தான் அவர்களுடைய சிந்தனையும் பேச்சுக்களும் அரசியல் கொள்கைகளும் உள்ளன. இந்நிலை தொடர்வதையிட்டுப் பாதிக்கப்பட்ட மக்களின் சார்பாக அவர்களுடைய வேதனையையும் கண்டனத்தையும் நான் இவர்களுக்குத் தெரிவித்துக்கொள்கின்றேன். அழிந்தும் சிதைந்துமிருக்கின்ற பிரதேசங்களைக் கட்டியெழுப்பி, பாதிக்கப்பட்ட மக்களின் வாழ்க்கைக்கு உயிரூட்டுவதே எமது இன்றைய முக்கிய பணியாக நாம் கருதுகின்றோம். இதற்கு ஒத்துழைப்பு நல்கும்படி அனைத்துத் தரப்பினரையும் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Thank you very much. The next speaker is the Hon. Sajith Premadasa.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභාපතිතුමනි, මට වෙලාව කොපමණ තිබෙනවාද?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමාට දැනට විනාඩි 35ක් තිබෙනවා.

[අ.භා. 1.30]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා යටතේ තිබෙන ජල සම්පාදන ක්ෂේත්‍රය පිළිබඳව මගේ අදහස් දක්වලා මේ විවාදයට හරාත්මක එකතුවක් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වන පරිච්ඡේදයේ තිබෙන රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් යටතේ සඳහන් වන කාරණයක් දැන් මා කියන්නම්. ගරු සභාපතිතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 (2) (ඇ) අනු ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වනවා:

"ප්‍රමාණවත් ආහාරපාන, ඇඳුම් පැළඳුම් සහ නිවාස පහසුව ද, ජීවන තත්ත්වයෙහි නිරන්තර වර්ධනය ද විවේකය හා සමාජයීය සහ සංස්කෘතික ඉඩ ප්‍රස්තා නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම ද ඇතුළුව ප්‍රමාණවත් ජීවන මට්ටමක් සියලු පුරවැසියන් විසින් තමන්ට සහ තම පවුල්වල සාමාජිකයන්ට අත් කර දීම; "

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 (8) අනු ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා පොදු ජනතාවට හානිකර දේවල් වැළැක්වීමට රජය කටයුතු කළ යුතුය කියලා. එහි 27(9) අනු ව්‍යවස්ථාවේ තිබෙනවා සමාජ සුරක්ෂිතභාවය හා සුභසාධනය ඇති කිරීමට රජයේ පූර්ණ වගකීම තිබෙනවා කියලා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වන පරිච්ඡේදයේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් යටතේ සඳහන් වන්නා වූ මේ කාරණා රජයකට තිබෙන්නා වූ මූලික වගකීම් හැටියට හඳුන්වන්න පුළුවන්.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Order, please! The Hon. Udith Lokubandara will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක පුරවැසි පරපුරට පිරිසිදු පානීය ජලය ලබා දීම රජයේ වගකීමක්; එය රජයේ යුතුකමක්; එය ලක්ෂ 200ක් වූ අපේ රටේ පුරවැසි පරපුරේ මානව අයිතිවාසිකමක්; පූර්ණ අයිතියක්. විශේෂයෙන්ම ව්‍යවස්ථාමය පසුබිමක් ඉදිරිපත් කරන අතරතුරම මෙන්න මේ කාරණයත් මම ගරු ඇමතිතුමාට පෙන්නුම් කරන්නට කැමැතියි. ජල සම්පාදන ක්ෂේත්‍රයේ ආයෝජනය කරන සෑම ඩොලරයකටම තවත් ඩොලර් 9ක ආර්ථික ප්‍රතිලාභ රටකට ලැබෙනවා කියන එක ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තා තහවුරු කර තිබෙනවා. නමුත් අද වන විට අපට පෙනෙන්නට තිබෙන්නේ මොකක්ද? විශේෂයෙන්ම ජල සම්පාදන පහසුකම් ලබා දිය යුතු ප්‍රධානතම බල ප්‍රදේශවලට, වැඩිම ජල සැපයුම් ඉල්ලුමක් තිබෙන, විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙන බල ප්‍රදේශවලට ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන වෙන් නොවීමක් අපට පෙනෙනවා.

අප දන්නවා දැයට කිරුළ වැඩසටහනට අපේ රටේ මුදලින් රුපියල් කෝටි 1,200ක් වැය කළ බව. නමුත් උතුරුමැද පළාතේ ජල ප්‍රශ්නය කොයි තරම් උග්‍ර ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවාද කිව්වොත්, මිනිස් ජීවිත 30,000කට වැඩිය ගොදුරු කර ගත් වකුගඩු ආසාදනයට අදටත් පැහැදිලි විසඳුමක් ලැබිලා නැහැ. 66,000කට වැඩි ප්‍රමාණයක් අද මේ වකුගඩු රෝගයෙන් පෙළෙනවා. මෙන්න මේ කාරණයට මම ගරු ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ලෝක සෞඛ්‍ය සංවිධානය තුන් වතාවක්ම මේ පිළිබඳව වාර්තා ඉදිරිපත් කළා. 2011 ජුනි මාසයේත්, 2011 ඔක්තෝබර් මාසයේත්, 2012 පෙබරවාරි මාසයේත් ඔවුන් මේ පිළිබඳ වාර්තා ඉදිරිපත් කළා.

ශාන්ති මෙන්ඩිස් මහත්මියගේ මෙහෙයවීමෙනුයි ඒ වැඩසටහන ක්‍රියාත්මක කළේ. උතුරු මැද පළාතෙන් ඌව

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පළාතෙත් අවුරුදු 15ත්, 70ත් අතර සියයට 15ක් වකුගඩු ආසාදනවලට ලක් වෙලා තිබෙනවාය කියන එක ඒ වාර්තාවේ සඳහන් වුණා. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමන්ලා සභා ගර්භය තුළ ජංගම දුරකථනය පාවිච්චි කරන්න එපා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
**(மாண்புமிகு சஜித் பிரேமதாஸ)**
(The Hon. Sajith Premadasa)

වසර 10කට වැඩි ප්‍රමාණයක් ගොවිතැනේ නිරත වුණු අවුරුදු 40ට වැඩි පිරිමි අය මේ රෝගයට මුහුණ දීලා -ගොදුරු වෙලා- තිබෙනවා. මේ රෝගය නිසා මුත්‍රාවලින් ආසනික්, කැඩ්මියම් වාගේ වකුගඩුවලට විෂ කෘෂි රසායන පිට වෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය කියනවා, ඉක්මන් පියවර ගත්තේ නැත්නම් රටේ ජනතාවට බරපතළ තර්ජනයක්; විශේෂයෙන්ම බැර ලෝහ ඒක රාශිවීම, පළිබෝධ නාශක හා රසායනික පොහොර ජලයට මිශ්‍රවීමෙන් ජලයේ ගුණාත්මකභාවය පළුදු වන නිසා කෙටි කාලීන, මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන වැඩසටහන් ක්‍රියාත්මක කරන්න කියලා. එසේ වැඩසටහන් දියත් නොකළොත් මේ රටේ තරුණ පරම්පරාවට බරපතළ සෞඛ්‍ය ගැටලුවකට මුහුණ දෙන්න තිබෙනවා පමණක් නොවෙයි, අපේ රට දරුණු සමාජයීය, ආර්ථික ප්‍රශ්න රැසකට මුහුණ දීලා සංවර්ධනයට සෘණාත්මක පැත්තෙන් දැඩි අනිසි බලපෑමක් සිද්ධ වෙනවා කියන එක මම නොවෙයි කියන්නේ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක සෞඛ්‍ය සංවිධානය ඉදිරිපත් කර තිබෙන වාර්තා සෞඛ්‍ය අමාත්‍යාංශය හොර රහසේ තබා ගන්නා මොහොතක -අපේ ගරු ඇමතිතුමාවත් ඒ පිළිබඳව දැනුවත් කළාද කියලා මම දන්නේ නැහැ. ගරු ඇමතිතුමා මට දැන් පෙන්වූ සංඥාවෙන්ම පේනවා, එතුමා මොකුත් දන්නේ නැහැ කියලා. එහෙම නේද, ඇමතිතුමනි? -ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවකින් ඉදිරිපත් කර තිබෙන පිරිසිදු පානීය ජලය ලබා දෙන්න ඕනෑය කියන යෝජනා ටික සෞඛ්‍ය අමාත්‍යාංශය අඩුම තරමින් ජල සම්පාදන ඇමතිතුමාටවත් යොමු කරන්න අදක්ෂ වෙලා තිබෙනවාය කියන එක මා මතක් කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ලෝක සෞඛ්‍ය සංවිධානය වාර්තා තුනක් ඉදිරිපත් කර තිබෙනවා. පළමුවැනි වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකරන කොට 2012 පෙබරවාරි මාසයේ තුන්වැනි වාර්තාවකුත් ලෝක සෞඛ්‍ය සංවිධානය ඉදිරිපත් කළා. මේ වාර්තාවෙන් කියන්නේ මොනවාද? මේ ආසාදනයට ලක් වුණු ජනතාවගේ මුත්‍රාවල ක්‍රියටින්වලට වැඩිය සියයට 56ක් කැඩ්මියම් තිබෙනවා. ක්‍රියටින්වලට වැඩිය සියයට 63ක් ආසනික් තිබෙනවා. ඒ වාගේම ඒ අයගේ මුත්‍රාවල සියයට 88ක ආසනික් අඩංගු වෙනවා. සියයට 90කගේ හිස කෙස්වල ඉහළ ආසනික් ප්‍රමාණයක් තිබෙනවා. සියයට 94කගේ නිය පොතුවල ඉහළ ආසනික් ප්‍රමාණයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මෙන්න මේක වැදගත් කාරණයක් නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු මැද පළාතෙත්, ඌව පළාතෙත් ජල ප්‍රභවයන් 98ක් පරීක්ෂා කර බලන කොට සියයට 99කම -ඒ ජල ප්‍රභවයන් 98න් සියයට 99කම- ඉහළ කිවුල් තත්ත්වයක් තිබෙනවාය කියන එක සොයා ගෙන තිබෙනවා. එහෙම නම් ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නයට විසඳුම මොකක්ද? මේ ප්‍රශ්නයට විසඳුම කෝටි, ප්‍රකෝටි ගණන් රටේ සල්ලි, -ජනතාවගේ සල්ලි, මහජන ධනස්කන්ධය, බදු ගෙවන්නන්ගේ සල්ලි, භාණ්ඩාගාරයේ සල්ලි, රටේ ජාතික සම්පත- පිරිසිදු පානීය ජලය වෙනුවෙන් අපි වෙන් කරන්නට ඕනෑ. කෝටි, ප්‍රකෝටි ගණන් සල්ලි නාස්තිකාර "දැයට කිරුළ" වැනි සංදර්ශනවලට වෙන් කරලා එළක් වන්නේ නැහැ. ඒ කෝටි 1,200 ඌව පළාතෙත්, උතුරු මැද පළාතෙත් ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දෙන්න වියදම් කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කය, ඒ වාගේම උතුරු මැද පළාත වාගේ බල ප්‍රදේශවලට පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා "දැයට කිරුළ"ට වියදම් වෙන නාස්තිකාර වියදම වන රුපියල් කෝටි 1,200 වෙන් කළා නම් කොයි තරම් ඵලදායී වැඩක්ද, කොයි තරම් ප්‍රතිඵලදායක ක්‍රියා දාමයක්ද? ගරු ඇමතිතුමනි, ඒ මොනම හේතුවකටවත් වැඩිය කොයි තරම් පුන්‍ය කර්මයක්ද?

ගරු ඇමතිතුමනි, අන්න ඒ නිසා විශේෂයෙන්ම මා මේ අවස්ථාවේ ඔබතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරවන්න කැමැතියි. මේ මම කථා කරන මොහොතේ වකුගඩු රෝගයෙන් පෙළෙන 2,800ක් මැදවච්චියේ ඉන්නවා; පදවියේ 2,400ක් ඉන්නවා; සිරිපුර 1,600ක් ඉන්නවා; තවත් දහස් ගණනක් දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ, මහියංගණය ප්‍රදේශයේ ඉන්නවා. මේ ප්‍රදේශවල සංචාරය කරලා ඒ බරපතළ ප්‍රශ්නය පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගන්න ඔබතුමාට පුළුවන්.

අඩුම තරමින් පිරිසිදු පානීය ජලය සපයන ගරු ඇමතිතුමාව මේ කරුණු කාරණා පිළිබඳව දැනුවත් කරන්නට මේ ආණ්ඩුවේ සෞඛ්‍ය අමාත්‍යාංශය අපොහොසත් වෙලා තිබෙනවා නම්, රටට ආදරය කරන ජනතා පුත්‍රයෙක් හැටියට, මේ රටේ ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දෙන්නට ඉදිරිපත් වී සිටින හොඳ සත්පුරුෂ ගුණාංගයන්ගෙන් හෙබි වූ ඇමතිවරයෙක් හැටියට, ඔබතුමා මේ කාරණය මඟ හරින්නේ නැතිව, කල් දමන්නේ නැතිව, ඉබි ගමනින් යන්නේ නැතිව මේ බරපතළ ප්‍රශ්නය කෙරෙහි කරුණාබර අවධානය යොමු කරලා මේ ප්‍රශ්නයට තිරසාර විසඳුමක්, ඉක්මන් විසඳුමක්, ශීඝ්‍රගාමී විසඳුමක් ලබා දෙන්නට කටයුතු කරන්නය කියලා මා බොහොම කරුණාවෙන් ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නට, අපි හැමෝම කථා කරන ජාතික වැඩසටහන තුළ ක්‍රියා කරලා හරියන්නේ නැහැ. මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා කරුණාකර, වකුගඩු ආසාදනයෙන් පෙළෙන ජනතාව සිටින බලප්‍රදේශවලට වෙනමම කමිටුවක් පිහිටුවා, එයටම ආවේණික වුණු, එයටම අනොන්‍ය වුණු පැහැදිලි, විධිමත් වැඩසටහනක් දියත් කරලා ඉක්මන් ප්‍රතිපාදන වෙන් කරලා ඒ ජනතාවටත් පිරිසිදු පානීය ජලය ලබා දෙන්නට කටයුතු කරන්නය කියලා.

විශේෂයෙන්ම ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කරලා තිබෙනවා, 2011 අග භාගය වන විට මේ රටේ සියයට 85.5ක ජන පරපුරකට ජලය සහ සනීපාරක්ෂක ක්ෂේත්‍රයේ පහසුකම් සැපයීමේ ඉලක්කය කරා යන්නට රජයට හැකියාව ලැබී තිබෙනවා කියලා. ඒ වාගේම 2020 වන කොට මේ රටේ සනීපාරක්ෂක ක්ෂේත්‍රයේත්, පිරිසිදු පානීය නළ ජලය ලබා දීමේ ක්ෂේත්‍රයේත් සියයට සියයේ ඉලක්කයක් කරා යන්නට ඔබතුමා කටයුතු කරනවා කියා ප්‍රකාශ කර තිබෙනවා. ඒක බොහොම හොඳ ප්‍රවේශයක්. මා ඔබතුමාට ඒ පිළිබඳව සුබ පතනවා.

නමුත් ඔබතුමා ප්‍රකාශ කර තිබෙනවා, "ගුණාත්මක පානීය ජල ප්‍රවේශයන් මේ රටේ සියයට 82කට තිබුණත්, පිරිසිදු පානීය නළ ජලය සැපයීමේ ඉලක්කය සම්පූර්ණ කරන්නට හැකියාව ලැබිලා තිබෙන්නේ මේ රටේ සියයට 40කට පමණයි" කියලා. ඒ

වාගේම ඔබතුමා සඳහන් කර තිබෙනවා, පිරිසිදු පානීය නළ ජලය සැපයීමේ කාර්යයේ වාර්ෂිකව -වසරක් වසරක් පාසා- සියයට දෙකක ප්‍රවර්ධනයක් ඇති කරන්නට ඔබතුමා කටයුතු කරනවා කියලා. මම ඔබතුමාට බොහොම කරුණාවෙන් ප්‍රකාශ කර සිටිනවා, ඔබතුමා මේ ඉදිරිපත් කර තිබෙන ඉලක්කය ප්‍රමාණවත් මදි කියන එක. වාර්ෂිකව ඔබතුමා උත්සාහ කරන්නේ, පිරිසිදු පානීය නළ ජලය ලබා දීමේ ප්‍රවර්ධනය සියයට දෙකකින් පමණක් වැඩි කරන්නට නම්, යුද්ධයක් නැති ශ්‍රී ලංකාවේ ඒ වෙනුවෙන් ඉතිරි වන ඒ මහා මුදල් සම්භාරය හෝ මේ රටේ ජනතාවගේ මානව අයිතිවාසිකමක් වන පිරිසිදු පානීය ජලය ලබා දීමේ කර්තව්‍යයට -වැඩසටහනට- යොමු කරවා, වසරක් වසරක් පාසා සියයට දෙකකින් සිදු කරන වර්ධනය වෙනුවට අඩුම තරමින් සියයට 10ක නළ ජල ප්‍රවණතාවක්, වර්ධනයක් ඇති කරන්නට ඔබතුමාගේ වැඩි අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, අද විවිධාකාර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. නගර අලංකාර කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා. මා මොහොතකටවත් කියන්නේ නැහැ නගර අලංකාර වැඩසටහන වැරැදියි කියලා. ඒක හොඳ වැඩ සටහනක්. අද නගරබද ප්‍රදේශ අලංකාර කිරීමේ හොඳ වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා අපට දකින්න පුළුවන්. ඒක හොඳයි. නමුත් ජාතික ප්‍රමුඛතා තුළ ඒ කරුණ එන්න ඕනෑ ඉතාම පහළින්. ඇත්ත වශයෙන්ම ජාතික ප්‍රමුඛතාවක් හැටියට ගත්තොත්, පිරිසිදු පානීය නළ ජලය ලබා දීම නගර අලංකාර කිරීමේ වැඩ සටහනට වඩා ගව් ගණනක් ඉදිරියෙන්, ගව් ගණනක් ඉහළින් තිබිය යුතු, ජාතික න්‍යාය පත්‍රයේ, ජාතික ප්‍රමුඛතා ලේඛනයේ ඉහළින්ම තිබිය යුතු ඉලක්කයක්. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඔබතුමාගේ ශක්තිය, ඒ වාගේම හැකියාව උපයෝගී කරගෙන වැඩි මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් පිරිසිදු පානීය නළ ජලය මේ රටේ සුවහසක් ජනතාවට ලබා දෙන්න සහයෝගය ලබා දෙන්න කියලා. ඒ සඳහා ඔබතුමාගේ මැදිහත් වීම මා මේ අවස්ථාවේ බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂයය භාර ගරු ඇමතිතුමනි, මා මේ අවස්ථාවේ තවත් වැදගත් කාරණාවක් ඔබතුමන්ලාට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමනි, පිරිසිදු පානීය නළ ජල සැපයීම ගැන අප කොපමණ කථා කළත්, අප කොපමණ පුරසාරම් දෙඩුවත් වැඩක් නැහැ. අද බලන්න අපේ රටේ පාසල් පද්ධතිය අරගෙන. ගරු ඇමතිතුමනි, අපේ රටේ තිබෙනවා පාසල් 9,662ක්. ඒ පාසල් 9,662න් පාසල් 1,860කට පිරිසිදු පානීය නළ ජල පහසුකම් නැහැ. ඒ කියන්නේ මේ රටේ පාසල් පද්ධතියෙන් සියයට 19කට පිරිසිදු පානීය නළ ජලය නැහැ කියන එකයි.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම අපි වැසිකිළි කැසිකිළි පහසුකම් ඇතුළු සනීපාරක්ෂක ක්ෂේත්‍රය දිහා බැලුවොත් ඒ පාසල් 9,662න් පාසල් 1,299කට, එනම් සියයට 13කට පිරිසිදු සනීපාරක්ෂක පහසුකම් නැහැ. එහෙම කියන්නේ මා නොවෙයි. ගරු ඇමතිතුමනි, ඒ බව ඔබතුමාම කිව්වා ඔබතුමා ලබා දුන් සම්මුඛ සාකච්ඡාවේදී. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ රටේ පාසල් 9,662න් සියයට 19කට පිරිසිදු පානීය ජලය නැත්නම්, මේ රටේ පාසල් 9,662න් සියයට 13කට සනීපාරක්ෂක පහසුකම් නැත්නම් කොහොමද අපි ආසියාවේ ආශ්චර්යය ගොඩ නඟන්නේ කියලා. මට ඒ ගැන පොඩ්ඩක් කියන්න ගරු ඇමතිතුමනි. මා පිළිගන්නවා ආසියාවේ ආශ්චර්යය ගොඩ නඟන එක, එක පාරට කරන්න බැහැ කියලා. නමුත් ජාතික ප්‍රමුඛතාවක් හැටියට සලකා, ඉලක්කගත දිනයක් වන කොට - අඩුම ගණනේ ඊළඟ මාස හය තුළ වත්- හැම පාසලක්ම ආවරණය වන පරිදි මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අනෙක් ඔක්කෝම වැඩ පැත්තකට දමලා මේ රටේ මතු පරපුර - මේ රටේ දරු පරපුර, මේ රටේ ළදරු පරපුර- වෙනුවෙන්, රටේ අනාගතය භාර ගන්න සිටින අපේ දූවා දරුවන් වෙනුවෙන් ඉලක්කගත දිනයක් නම් කරලා, 'මේ දිනය වන කොට මම අනිවාර්යයෙන්ම මේ රටේ හැම පාසලකටම වැසිකිළි කැසිකිළි පහසුකම්, ජල පහසුකම් ලබා දීමට කටයුතු කරනවා' කියලා අධිෂ්ඨාන කරගෙන සුදුසු වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා. මා දන්නවා එය තමුන්නාන්සේට තනිවම කරන්න බැහැ කියා. ඒ සඳහා තමුන්නාන්සේලාගේ උගත් අධ්‍යාපන ඇමතිතුමාත් සමඟ අත් වැල් බැඳගෙන, ඒ වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇමතිතුමන්ලාත් සමඟ අත් වැල් බැඳගෙන ඒකාබද්ධ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ආසියාවේ ආශ්චර්යය ඇති කරන්න නම් ඔබතුමාට සිද්ධ වෙනවා මීටත් වඩා ගැම්මක් ඇතිව මේ පාසල් පද්ධතියට පිරිසිදු පානීය ජල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් ලබා දෙන වැඩ සටහනකට ප්‍රවේශ වන්න.

මා තමුන්නාන්සේට විශේෂයෙන් මෙන්න මේ කාරණාව අවධාරණය කරන්න ඕනෑ ගරු ඇමතිතුමනි. පිරිසිදු පානීය ජල ව්‍යාපෘති දියත් කළාට මදි. පිරිසිදු පානීය ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීමේ වැඩ සටහනකුත් දියත් කරන්නත් ඕනෑ. දැන් උතුරු මැද සහ ඌව ප්‍රදේශයේ තිබෙන බරපතළ වකුගඩු ආසාදනය අරගෙන බලන්න. ඇත්ත වශයෙන් ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීමේ විධිමත් ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක වුණා නම්, අපට මේ ප්‍රශ්නය අවම කරගන්න හැකියාව තිබුණා කියලායි මා හිතන්නේ.

මා ගරු ඇමතිතුමාගේ අවධානය මේ කරුණ කෙරෙහිත් යොමු කරන්න කැමැතියි. පසු ගිය කාලයේ පානීය ජල ඉල්ලුම බරපතළ ප්‍රශ්නයක් වුණා. ජනතාවගේ පිපාසය සංසිඳුවන්නට විවිධ රජයන් විවිධාකාර වැඩසටහන් දියත් කළත්, අවිධිමත් ආකාරයට ජල ව්‍යාපෘති බිහි වුණා. ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර හරහා සහ ලෝක බැංකුවේ මූල්‍ය ආධාර හරහා ප්‍රජා ජල ව්‍යාපෘති ඇරඹුණු බව ඔබතුමාත් මාත් දන්නවා. ඒ වාගේම ප්‍රජා සහභාගිත්ව ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක වුණා. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, අද වන විට මේවා විධිමත්ව ක්‍රියාත්මක වෙනවාද කියලා. පානීය ජලය ලබා දුන්නාට විතරක් මදි. මේ පානීය ජලයේ ගුණාත්මකභාවය තහවුරු කරන්නට විධිමත් වැඩසටහනක් තිබෙන්න ඕනෑ. ඔබතුමාගේ අමාත්‍යාංශයේත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරින්ගේත් නිරතුරු අධීක්ෂණයට මේ ජල සම්පාදන යෝජනා ක්‍රම ලක් වෙනවාද? ඒවායේ ප්‍රමිතිය, ගුණාත්මකභාවය සොයා බැලීම ක්‍රියාත්මක වෙනවාද, අධීක්ෂණය වෙනවාද, සමීක්ෂණය කරනවාද, අඩු පාඩුකම් හොයලා බලනවාද කියන මේ කරුණු පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ. මේ හැම ජල යෝජනා ක්‍රමයක්ම අධීක්ෂණය කරලා, විවිධ විධිවිධානවලට, නිර්දේශවලට අනුකූලව ක්‍රමවත් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට සැලැස්මක් දියත් කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ සියලුම ජල යෝජනා ක්‍රම ප්‍රජා සහභාගිත්ව, ප්‍රජා මූල වැඩසටහන් හරහා ක්‍රියාත්මක කරනවා වාගේම, විධිමත්භාවයකින් සහ ස්ථාවරභාවයකින් දියත් කරන්නටත් කටයුතු කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ ඉල්ලීම කරන අතරතුර ඔබතුමාට මා කියන්න කැමැතියි, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙය වීමෙන් ක්‍රියාත්මක කරන සමහර ජල යෝජනා ක්‍රම පිළිබඳව විවිධාකාර චෝදනා එල්ල වන බව. ජනතාවට අපවිත්‍ර ජලය ලබා දීම, අසූචි මිශ්‍ර ජලය ලබා දීම පිළිබඳව නොයෙකුත් අවස්ථාවල අපට පැමිණිලි එනවා. ඒ ගැන විවිධ මාධ්‍ය හරහා වාර්තා වෙනවා. මා කියන්නේ නැහැ, බහුතර ප්‍රදේශවල එහෙම සිද්ධ වෙනවා කියලා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නමුත් සමහර ප්‍රදේශවල ඒක සිදු වෙලා තිබෙනවා. මා ඔබතුමාට කියන්න කැමැතියි, තලවාකැලේ පානීය ජලයට මළ අපද්‍රව්‍ය මිශ්‍රවීමේ සිද්ධිය. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මේ චෝදනා ප්‍රතික්ෂේප කරන්න පුළුවන්. නමුත් මේ වාගේ සිදුවීම් ඇති නොවන්නට ඔබතුමා යම් කිසි විධිමත් වැඩසටහනක් දියත් කරන්න. මාධ්‍ය නාලිකා කිහිපයක රූප රාමුවලින් මාත් මේ කාරණය දැක්කා. ඒවා පානීය ජලයද කියලා හිතන්නවත් බැහැ. පානය කරනවා තියා ඒ ජලය දිහා බලන්නවත් බැහැ. ඒ ජලය ස්නානය කරන්නටවත් බැහැ. තලවාකැලේ පානීය ජල යෝජනා ක්‍රමයේ ජලය එක සිද්ධියක් පමණයි. මේවා සුළු ප්‍රමාණයකින් තිබුණත්, සුළු සිද්ධි නොවෙයි, බරපතළ සිද්ධි. කරුණාකරලා ඔබතුමාගේ අවධානය මේ ප්‍රශ්නයට යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

පසු ගිය කාලයේ -2012 මාර්තු මාසයේ- කුරුණෑගල ශික්ෂණ රෝහලේ හෘද රෝග අංශයට සපයන නළ ජලයට අසූචි මිශ්‍ර වීම ගැන චෝදනාවක් ආවා. ඒ වාගේම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයම පෙන්වලා දෙනවා, රත්නපුර දිස්ත්‍රික්කයේ ජල මූලාශ්‍රවලින් සියයට 40ක පමණ ප්‍රමාණයක් අපවිත්‍ර වෙලාය කියලා. ඇහැලියගොඩ නගරයට ජල සැපයුම ලබා දෙන බිසෝදොළ, පැල්මඩුල්ල ජල සම්පාදන ක්‍රමයට ජලය ලබා දෙන කිරිඇල්ල ජල ධාරාව, නිවිතිගල ජල සම්පාදන ක්‍රමයට ජලය ලබා ගන්නා වටපොත ජල උල්පත, කහවත්ත, බලංගොඩ, ගොඩකවෙල, ඇඹිලිපිටිය යනාදී ජලසම්පාදන ක්‍රමවලට ජලය සපයන මාදොළ, වළවේ ගඟ, රක්වාන ගඟ, වළව දකුණු ඉවුර යනාදී ප්‍රදේශවල ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම නිසා ජනතාවට පිරිසිදු පානීය ජලය අහිමි වීම බරපතළ ප්‍රශ්නයක් හැටියට මා දකිනවා. ඒ නිසා ඔබතුමාගේ අවධානය ඒ පිළිබඳවත් යොමු කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා. [බාධා කිරීමක්] ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමා පසුව උත්තර දෙන්න කෝ. ඒ වාගේම මා මේ ඉදිරිපත් කරන අදහස් චෝදනා මුඛයෙන් ඉදිරිපත් කරනවාය කියලා හිතන්න එපා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමනි, ඒවා හුඟක් වාර්තා පැරණි වාර්තා. වතුකරයෙන් ඇද හැලෙන අපවිත්‍ර දේ ජල ධාරාවන්ට මිශ්‍ර වීම් සිදු වනවා. දවසක් දෙකක් ඇතුළතදී අපි ඒවා නිවැරදි කරනවා. ඒ වාගේ ගැටලු තිබෙනවා. කොහොමත් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මෙම අනතුරු ඇඟවීම ගැන.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, පරණ වාර්තා නම් ඒවා අනතුරු ඇඟවීම් වෙන්න බැහැ. කමක් නැහැ. ඔබතුමා ඒවා සටහන් කර ගෙන පොඩ්ඩක් සොයලා බලන්න. මම මේවා ගැන හොඳට සමීක්ෂණය කරලායි කරුණු කාරණා ඉදිරිපත් කරන්නේ.

කෙසේ වෙතත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, නළ ළිං නඩත්තුව පිළිබඳව. ඔබතුමා දන්නවා, නළ ළිං යෝජනා ක්‍රම රාශියක් මේ රටේ බිහි වුණා කියලා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු සමයේ තමයි එම වැඩසටහන දියත් වුණේ. විශේෂයෙන්ම මම ඉල්ලීම් දෙකක් ඔබතුමාට ඉදිරිපත් කරනවා. මේ නළ ළිංවල තිබෙන ජල මූලාශ්‍ර, ඒ නළ ළිංවලින් ලබන ජලය ගුණාත්මක ජලයද, පරිහරණය කළ හැකි ජලයද යන්න පිළිබඳව සොයා බලන්න. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, නළ ළිඳක් පාසා යම් කිසි වැඩසටහනක් රටේම දියත් කරන්න කියලා. ඒ අතර තුර හොඳ පිරිසිදු පානීය ජලය ලබා ගත හැකි නළ ළිං ප්‍රතිසංස්කරණය කරන්නට යම් කිසි ජාතික වැඩසටහනක් දියත් කළ යුතුයි කියලාත් මම ඉල්ලීමක් කරනවා. පානීය නළ ජල පහසුකම් ලැබෙන තෙක් ඒ නළ ළිං විශේෂයෙන්ම ස්නානයට එහෙමත් නැත්නම් ගෘහ මූලික පවුල් ඒකකයක වෙනත් පරිභෝජන කටයුතු සඳහා උපයෝගී කර ගත හැකියි කියන කාරණය මම මේ අවස්ථාවේදී අවධාරණය කරන්නට කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, කොළඹ බල ප්‍රදේශයේ - ඔබතුමාගේ බල ප්‍රදේශයේ - නාගරික පැල්පත්වල, මුඩුක්කුවල තිබෙන ජල ප්‍රශ්න පිළිබඳව. ඔබතුමා දන්නවා, සංගණනවලින් තොරතුරු ලබා ගෙන තිබෙනවා, අපේ රටේ විශේෂයෙන්ම අගනුවර ප්‍රදේශයේ පැල්පත්, මුඩුක්කු 65,000ක් පමණ තිබෙනවා කියලා. ඒ සංඛ්‍යා ලේඛන අප සතුව තිබෙනවා. විශේෂයෙන්ම ඔවුන්ගේ ඉඩම් පිළිබඳ අවිනිශ්චිතභාවය නිසා, ඒ ඔප්පු තිරප්පු නොතිබීම නිසා ඒ අයට පිරිසිදු පානීය නළ ජල පහසුකම් ලබා දීමේ ඉඩ ප්‍රස්තාව අද ඇහිරිලා ගිහින් තිබෙනවා. ඒ නිසා ඒ සඳහාත් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, විශේෂයෙන්ම ඒ ඉඩම්වල නිරවුල්භාවය නිරාකරණය වන තෙක් ඒ පිරිසිදු පානීය නළ ජලය ලබා දිය හැකි ක්‍රමයක් හෝ යම් කිසි මැදි පිළිවෙතක් තිබෙනවා නම් ඒ මැදි පිළිවෙත හෝ ක්‍රියාත්මක කරලා ඒ නාගරික ජනතාවගේ, කොළඹ දිස්ත්‍රික්කයේ පැල්පත්වාසී මුඩුක්කුවල ජීවත් වන ජනතාවගේ ඒ මුඩුක්කු ටික සුවිසල් මන්දිර බවට පරිවර්තනය වන තෙක් හෝ ඒ අයගේ පිපාසය සංසිඳවන්නට පිරිසිදු පානීය නළ ජල පහසුකම් ලබා දීමේ මොනයම් හෝ වැඩසටහනක් දියත් කරන්න කියලා.

ගරු ඇමතිතුමනි, ෆ්ලෝරයිඩ් පිළිබඳව ලෝක සෞඛ්‍ය සංවිධානයේ යම් කිසි ප්‍රමිතියක් තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතියට අනුව වතුර ලීටරයකට තිබිය යුතු ෆ්ලෝරයිඩ් ප්‍රමාණය මිලිග්‍රෑම් 1.5යි. නමුත් ශ්‍රී ලංකාවේ වියළි කළාපයේ යම් යම් ප්‍රදේශවල ඒ ෆ්ලෝරයිඩ් ප්‍රමාණය වතුර ලීටරයකට මිලිග්‍රෑම් 6-8 දක්වා තිබෙන තත්ත්වයක් තුළ විශේෂයෙන්ම අපේ රටේ පුරවැසි පරපුරේ දත් දුඹුරු පැහැය ගැනීම, දත් දිරා යෑම, පුරවැසියන්ගේ එන්සයිම දුබලතාව, අස්ථිවල ෆ්ලෝරයිඩ් තැන්පත් වීමයන මේ ප්‍රශ්න පිළිබඳවත් මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතිය ලීටරයකට ෆ්ලෝරයිඩ් මිලිග්‍රෑම් 1.5ක් කියන තත්ත්වය හරිද, වැරදිද ඒ ප්‍රමාණය අපි තබා ගත යුතුද නැද්ද යන්න පිළිබඳව තිරසාර නිගමනයකට ඇවිල්ලා ෆ්ලෝරයිඩ් පාලනය කිරීමේ ජාතික වැඩසටහනක් දියත් කිරීමට ඔබතුමා කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඔබතුමාත් සමඟ පැවැති සම්මුඛ සාකච්ඡාවකදී ඔබතුමා සඳහන් කර තිබෙනවා, ජාතික අගැයීම් පද්ධතියක් - National Monitoring System එකක්- තිබෙනවායි කියලා; අවුරුදු තුනකට වරක් මේ රටේ ජල ඉල්ලුම, ජල සැපයුම පිළිබඳ යම්කිසි අගැයීම් වැඩසටහනක් ක්‍රියාත්මක කරනවායි කියලා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, වසර තුනකට වරක් පමණක් ක්‍රියාත්මක වීමේදී එම කාල පරතරය වැඩියි, සය මාසිකව හෝ ජාතික ඉලක්ක නවීකරණය කිරීමේ, යාවත්කාලීන කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කරන්නය කියලා.

සංඛ්‍යා ලේඛනවල සඳහන් වෙලා තිබෙනවා, වැසි ජලයෙන් සියයට 40ක් ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යනවා කියලා. අපි දන්නවා, පසු ගිය කාලයේ වැසි ජලය උපයෝගී කර ගෙන rainwater harvesting කියන වැසි ජල ටැංකි වැඩසටහන දියත් වුණු බව.

ගරු ඇමතිතුමනි, වැසි ජලය සංරක්ෂණය කිරීම තුළින් මේ රටේ ජල ඉල්ලුම සංසිඳවන්නට යම් වැඩසටහනක් දියත් කිරීම යෝග්‍යයි කියලා මා හිතනවා. මම ඉල්ලීමක් කරනවා, ඒ සඳහා අලුත් වැඩසටහනක් දියත් කරන්න කියලා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, විශේෂයෙන්ම පූජා භූමි බල ප්‍රදේශවල පූජනීය සිද්ධස්ථානවලට ජල සම්බන්ධතා ලබා දීම හා ජල සම්පත ලබා දීමේ වැඩසටහනක් තිබෙනවාය කියන කාරණය. එය අපි හැමෝම දන්නවා. නමුත් ගරු ඇමතිතුමනි, සම්බුද්ධත්ව ජයන්තිය අරභයා ඔබතුමා පැහැදිලි ප්‍රකාශයක් කළා, විශේෂයෙන්ම පූජනීය සිද්ධස්ථානවල ජල බිල්පත සියයට 75කින් අඩු කරනවා කියලා. ඒ වාගේම ඔබතුමා සඳහන් කරලා තිබෙනවා, ජල සම්බන්ධතා නොමැති සියලුම පන්සල්වලට ජල සම්බන්ධතා ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා කියලා. මා නැවත වරක් ඔබතුමාට මතක් කරන්න කැමැතියි, ඒ වැඩසටහන අක්‍රියවයි පවතින්නේ කියලා. ඒ නිසා, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පොරොන්දු වූ ආකාරයට සම්බුද්ධ ජයන්තිය නිමිත්තෙන් ලබා දෙනවාය කියපු සියයට 75 අඩු වීම, ඒ වාගේම නොමිලේ ජල සම්බන්ධතා ලබා දීමේ වැඩසටහන සක්‍රිය කරන්න කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ සහනය දුන්නේ මාසයකට-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මාසයකට විතරද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා කියපු ජල සම්බන්ධතා ලබා දීමේ වැඩ කටයුත්ත ඒ ආකාරයෙන්ම අවුරුද්ද පුරා කෙරෙනවා. නමුත් නළ ජල මාර්ග නැති තැන්වලට නළ ජලය ගෙනි යන්න බැහැ නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඉල්ලීමක් කළේ, නළ ජල යෝජනා ක්‍රම ආශ්‍රිතව තිබෙන පන්සල් පද්ධතියට නළ ජලය ලබා දෙන්න කියලා. ඒ වාගේම මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා වතුකරයේ ජනතාවට. විශේෂයෙන්ම වතුකර ක්ෂේත්‍රයේ ජනතාවට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා පානීය ජලය සම්බන්ධයෙන්. ඒක මටත් වඩා හොඳට ඔබතුමා දන්නවා. ඒ වාගේම උතුරු නැඟෙනහිර බල ප්‍රදේශයේ ජනතාවගේ ජල ඉල්ලුම පිළිබඳව ඔබතුමන්ලාත් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මා ඒ වාර්තාව දැක්කා. නමුත් මා නැවත වරක් අවධාරණය කරනවා, මීට වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දීම වැදගත් වෙනවා කියලා. මොකද, උතුරු නැඟෙනහිර බල ප්‍රදේශයේ ජීවත් වෙන්නේ අපේම රටේ, අපේම ජනතාව. ඒ ජනතාවගේ ජල පිපාසය සංසිඳවන්නට ඉක්මන් වැඩසටහනක් දියත් කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මා මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. මා එය පාර්ලිමේන්තු ප්‍රශ්නයක් හරහාත් ඔබතුමාට ඉදිරිපත් කළා. නැවතත් මා මේ කාරණයට ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඔබතුමා දන්නවා, යුද්ධය කාලයේ ලොකුම කොටි උවදුරකට ලක් වුණු බල ප්‍රදේශයක් තමයි උතුරු පළාත. එම පළාතේ නිකවැව, ඇතාවැටුණු වැව, මොනර වැව, ගජබාපුර, කල්‍යාණපුර, කිරිඉබ්බන් වැව වම හා දකුණ, ඇහැටුගස් වැව, ජනකපුර, නවමොනර වැව, නවපරාක්‍රමපුර යන ප්‍රදේශවල ජනතාව තමයි එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ කාල තුවක්කු ප්‍රහාරවලට මුහුණ දීලාත්, මොනම ආකාරයක ප්‍රශ්නයක් ආවත් ඒ ප්‍රදේශයන්වලින් ඉවත් නොවුණේ. මා ඔබතුමාගෙන් ඇහුවා, කවදාද ඒ ජනතාවගේ පිරිසිදු පානීය ජල ඉල්ලුම සම්පූර්ණ කරන්නේ කියලා. මා කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ, ඔබතුමා ඒ අයට -මා සඳහන් කරපු ගම්මානවලට- පිරිසිදු පානීය ජලය ලබා දෙනවාය කිව්වත්, මේ මොහොත වන තෙක් පිරිසිදු පානීය නළ ජල පහසුකම් ලැබිලා නැහැ කියලා. විශේෂයෙන්ම කොටි උවදුරෙන් වැඩිම පීඩාවකට ලක් වුණු ඒ බල ප්‍රදේශයේ ජනතාවට ඔබතුමාගේ අවධානය යොමු කරවලා ඒ කටයුත්ත ඉෂ්ට සිද්ධ කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, මගේ කථාවේ විවේචනාත්මකභාවය පිළිබඳව ඔබතුමා යම් කලකිරීමකට පත් වුණා නම්, එහෙම කනගාටුවෙන්න එපා. මොකද, විශේෂයෙන්ම මා මේ අවස්ථාව ඔබතුමාට ප්‍රශංසා කරන්න උපයෝගී කර ගන්නවා. ඔබතුමා හොඳාකාරවම දන්නවා, ළිං බද්දක් එන්නයි ගියේ කියලා. ඒක ඇත්ත කථාවක්. ඒක බොරුවක් නොවෙයි. [බාධා කිරීමක්] ඔබතුමා පොඩ්ඩක් ඉන්න. මට කථා කරන්න ඉඩ දෙන්න කෝ.

ළිං බද්දක් එන්නයි ගියේ. ඔබතුමා නැහැ කිව්වාට "දිවයින" පත්තරය බොරු කියන්නේ නැහැ නේ. 2012 ඔක්තෝබර් 22වැනිදා "දිවයින" පත්තරයේ මෙසේ පළ වෙලා තිබෙනවා:

"වාරි ඇමතිගේ ළිං බද්දට ජල ඇමතිගේ විරෝධය"

ඒ වාගේම "The Island" පත්තරය බොරු කියන්නේත් නැහැ. එදාම "The Island" පත්තරයේත් මෙය පළ වෙලා තිබෙනවා. I quote:

"Dinesh opposes govt.'s proposed well water tax"

මම මේ වරදක් නොවෙයි කියන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමා, එහෙම එකක් නැහැ. මා පාර්ලිමේන්තුවේදිත් කිව්වා. පත්තරයට වාර්තා දමන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ වාගේම අද පත්තරයෙත් කියනවා, "ළිංවලට බදු ගැනීමට ඇමති දිනේෂ්ගේ විරෝධය" කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විරෝධය?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. මම මේ වරදක් කියනවා නොවෙයි. ඔබතුමාට ප්‍රශංසාවක් කරන්නේ. විශේෂයෙන්ම මම ඔබතුමාට කියන්න කැමැතියි, ජල සම්පත් මණ්ඩලය භාර වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමාට ජනතාවගේ හද ගැස්ම නොදැනුණාට, ගරු පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ පුතාට ජනතාවගේ හද ගැස්ම හොඳට දැනුණා කියලා. මම ඔබතුමාව විවේචනය කරනවා නොවෙයි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඒ ගෙනෙන්නට ගිය දුර්දාන්ත ළිං බද්දට විරුද්ධව ආණ්ඩුව තුළ ඉඳගෙනම සටන් කිරීම ගැන මම ඔබතුමාට මගේ ස්තුතිය සහ ප්‍රශංසාව මේ අවස්ථාවේදී පුද කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වෙලාව අවසන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩි දෙකේ warning එක දුන්නේ නැහැ. මට තව විනාඩියක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි දෙකේ warning එක තමයි මේ දෙන්නේ. තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තව විනාඩියක් දෙන්න. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, මට විනාඩියයි තිබෙන්නේ. මේක විෂය පථයෙන් පොඩ්ඩක් බැහැර වුණත් විශේෂයෙන් මම මේ කාරණය ඔබතුමාට කියන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පියා තමයි අද ගොවි අයිතිය ආරක්ෂා කරන්නට 1957 දී කුඹුරු පනත ගෙනාවේ. ඔබතුමා කොච්චර හිනා වුණත් ඔබතුමාගේ හදවත දන්නවා, අද ගොවීන් ආරක්ෂා කරන්නටය කියා මේ ගෙනල්ලා තිබෙන පනත් කෙටුම්පතින්, අද ගොවියාට කිසිම සෙතක්, කිසිම සහනයක් සැලසුණේ නැහැ කියා. ඔබතුමා ඔළුව වන වනා කියන්නේ ඒක නේ? ඒක තමයි ඇත්ත කථාව. මම දන්නවා, ඔබතුමාට වාචිකව ඒක කියන්න බැරි බව. නමුත් ශාරීරිකව හරි ඔබතුමා ඒක පෙන්නුම් කිරීම ගැන මම මගේ ස්තුතිය පුද කරනවා. ගරු ඇමතිතුමනි, මේ රටේ ලක්ෂ පහකට වැඩිය අද ගොවීන්ගේ අද අයිතිය ආරක්ෂා කරන්නට ඔබතුමාගේ දයාබර පියාණන් වූ පිලිප් ගුණවර්ධන මැතිතුමා එදා ගෙනාපු කුඹුරු පනතට ඔබතුමාගේ සහයෝගයත් ලබා දී කරුණාකරලා ඒ මන්දගාමී පනත සක්‍රිය කරන්නට, ක්‍රියාවට නංවන්නට මැදිහත් වෙන්නටය කියා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම ඔබතුමාගේ හිත රිදුණා නම් මම කනගාටු වෙනවා. මම ඉදිරිපත් කරන කරුණු කාරණා නිකම් වල් පල් නොවෙයි. මට වේලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[பி.ப. 2.04]

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர் - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. A.R.M. Abdul Cader - Deputy Minister of Environment)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களின் மஹிந்த சிந்தனை எதிர்கால தொலைநோக்கின் இலக்குகளின் பிரகாரம் இந்த நாட்டின் அபிவிருத்தியைத் துரிதப்படுத்துவதை நோக்கமாகக் கொண்டு 2013ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டம் சமர்ப்பிக்கப்பட்டுள்ளது. அபிவிருத்தியை அடிப்படையாகக் கொண்ட இந்த வரவு செலவுத் திட்டமானது நிச்சயமாக இந்த நாட்டின் வளர்ச்சி வேகத்தை அதிகரிக்கச்செய்து அதன்மூலம் மக்களது வாழ்க்கைத் தரத்தை உயர்த்தும். இந்த நாட்டின் வடக்கிலும் கிழக்கிலும் மூன்று தசாப்த காலமாக நிலவிய பயங்கரவாதத்திற்கு எதிரான யுத்தம் முடிவடைந்ததைத் தொடர்ந்து மேதகு ஜனாதிபதி அவர்களால் வழிநடத்தப் படுகின்ற இந்த அரசாங்கம் துரித பொருளாதார வளர்ச்சி மற்றும் அபிவிருத்தியினூடாக மக்களின் வாழ்க்கைத் தரத்தை மேம்படுத்துவதற்கு முழு முயற்சியையும் எடுத்து வருகின்றது. உலகம் கடுமையான பொருளாதார வீழ்ச்சிக்கு முகம் கொடுத்துள்ளபோதிலும் மேதகு ஜனாதிபதி அவர்கள் வழங்கிய பலம்பொருந்திய தலைமைத்துவத்தின்கீழ் நிலையானதொரு பொருளாதார வளர்ச்சியைப் பேணிவருவதற்கு எமது நாட்டுக்கு இயலுமாயிருந்தது. அரசாங்கம் வீதி அபிவிருத்தி, துறைமுகங்களைக் கட்டியெழுப்புதல் போன்ற அபிவிருத்திச் செயற்பாடுகள், வீடமைப்பு மற்றும் நீர் வழங்கல் திட்டங்கள் ஆகிய உட்கட்டமைப்பு வசதிகள் பலவற்றை நடைமுறைப் படுத்தி வருகின்றது. மேற்படி செயற்பாடுகளுக்கு எமது தாய்நாட்டின் இயற்கை வளங்கள் பெருமளவில் பயன்படுத்தப் படுகின்றன. அபிவிருத்தி இலக்குகளை நோக்கி முன்னேறிச் செல்லும்பொருட்டு மேற்படி அபிவிருத்தி நிகழ்ச்சித் திட்டங்களை நிலைபேறானதாக ஆக்குவதற்குத் தேவையான நிதி ஏற்பாடுகள் இந்த வரவு செலவுத் திட்டத்தின்மூலம் வழங்கப்பட்டுள்ளன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மேதகு ஜனாதிபதி அவர்களால் வழிநடத்தப்படுகின்ற இந்த அரசாங்கம், எப்போதும் சுற்றாடலைப் பேணிப் பாதுகாத்தல் தொடர்பில் பெருமளவு கவனத்தைச் செலுத்துகிறது. கடந்த பல வருடங்களில் மேற்கொள்ளப்பட்டதைப் போன்று சுற்றா டலைப் பேணிப் பாதுகாக்கின்ற நிகழ்ச்சித்திட்டங்களை நடைமுறைப்படுத்துவதற்குத் தேவையான நிதி ஏற்பாடுகளை 2013ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தினூடாக வழங்கியுள்ளதன்மூலம் இது மீண்டும் நிரூபிக்கப்பட்டுள்ளது. திண்மக் கழிவுப்பொருள் முகாமைத்துவம், காடுகள் மற்றும் உயிர் பல்வகைத்தன்மையைப் பாதுகாத்தல், நீர் மற்றும் வளி மாசடைதலைத் தடுத்தல் ஆகியன தற்போது இந்த நாடு முகம்கொடுக்கின்ற பிரதானமான சுற்றாடல் சவால்க ளாயுள்ளன. சுற்றாடல் அமைச்சு தனது முகவராண்மை நிறுவனங்களுடன் சேர்ந்து மேற்படி சவால்களுக்கு வெற்றிகரமான விதத்தில் முகம்கொடுக்கும்பொருட்டு தனது நிகழ்ச்சித்திட்டங்களை நடைமுறைப்படுத்துவதற்குத் திட்ட மிட்டுள்ளது. 2013ஆம் ஆண்டிலும் தற்போது நடைமுறைப் படுத்தப்படுகின்ற கருத்திட்டங்கள் தொடர்ந்தும் முன்னெடுத் துச் செல்லப்படும் என்பதோடு புதிய கருத்திட்டங்கள் பலவற்றை நடைமுறைப்படுத்துவதற்கும் திட்டமிடப் பட்டுள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, காலநிலை மாற்றங்களைத் தொடர்ந்து வருகின்ற புவி வெப்பமடைதலானது, எமது நாட்டிற்கும் முழு உலகத்திற்கும் பிரதானமானதொரு அச்சுறுத்தலாயுள்ளது. இலங்கை புவி வெப்பமடைதலுக்கு மிகக் குறைந்தளவில் பங்களிப்புச் செய்கின்ற நாடாக இருந்தபோதிலும் அது புவி வெப்ப மடைதல் மற்றும் காலநிலை மாற்றங்களால் உருவாக்கப் படுகின்ற பெரும் சவால்களுக்கு முகம்கொடுத்து வருகின்றது.

இலங்கை ஒரு தீவாகக் காணப்படுவதால் எதிர்காலத்தில் புவி வெப்பமடைதல்மூலம் ஏற்படுகின்ற கடல் மட்டம் உயர் வடைவதன் எதிர்விளைவுகளுக்கு முகம்கொடுக்க நேரிடும். மாற்றமடைகின்ற காலநிலையின்மூலம் நீண்ட வரட்சிக் காலங்களும் வெள்ளப்பெருக்கும் உருவாகி எமது கமத் தொழிலுக்குப் பாரதூரமான தாக்கங்கள் ஏற்பட்டுள்ளன. இச்சவாலுக்கு முகம்கொடுக்கும் பொருட்டு சுற்றாடல் அமைச்சு இந்த நாட்டின் உணவுப் பாதுகாப்புக்கு வழிசமைக் கின்ற காலநிலை மாற்றங்கள் பற்றிய கொள்கைகளையும் ஏற்புடையதாக்கல் மூலோபாயங்களையும் தயாரித்துள்ளது. தமது பயிர்ச் சேதங்களுக்கு விவசாயிகள் முகம்கொடுப்பதை இயலுமாகும்பொருட்டு புதிய காப்புறுதித் திட்டமொன்றை உருவாக்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுமென்று மேதகு ஜனாதிபதி அவர்கள் வரவு செலவுத் திட்ட உரையின்பொழுது குறிப்பிட்டார். இது விவசாயிகளின் நேரடிக் கட்டுப்பாட்டின் கீழ் இல்லாத அழிவுகளுக்கு எதிராக விவசாயிகளைப் பலப்படுத்துவதற்கு உதவியாயமையும். அதேவேளை எமது அமைச்சானது புவி வெப்பமடைதல் மற்றும் காலநிலை மாற்றங்களின் எதிர்விளைவுகளைக் குறைப்பதற்கு நடவடிக்கை எடுக்கின்ற பல்வேறான பங்குதாரர் நிறுவனங் களின் இயலளவுத் தேவைகளை இனங்காண்பதிலும் ஈடுபடுகின்றது.

நான் இங்கு குறிப்பிட்டதுபோல், கடல்மட்டம் உயர்வடை தலானது, புவி வெப்பமடைதலினதும் காலநிலை மாற்றங் களினதும் எதிர்விளைவாகும். குறிப்பாகத் தீவுகளைப் பொறுத்தவரையில், இலங்கை ஒரு தீவாகக் காணப்படுகின்ற மையால், எதிர்காலத்தில் புவி வெப்பமடைதல் மற்றும் காலநிலை மாற்றங்களினால் உயர்வடைகின்ற கடல் மட்டத்தின் எதிர்விளைவுக்கு நாமும் முகங்கொடுக்க நேரிடும். ஆதலால், எனது அமைச்சின் பணியாளர்கள் அவ்வாறான சந்தர்ப்பங்களுக்கான தீர்வுகளை இனங்காண்பதில் ஈடு பட்டுள்ளனர். மாற்றமடைகின்ற காலநிலையின் பாதகமான விளைவுகளின்மூலம் நீண்ட வரட்சிக் காலங்கள் மற்றும் வெள்ளப்பெருக்குகள் ஏற்பட்டு, அவை கமத்தொழிலில் பெரும் தாக்கங்களை ஏற்படுத்தியுள்ளன. இச்சவாலுக்கு முகங் கொடுக்கும் பொருட்டு சுற்றாடல் அமைச்சினால் நாட்டின் உணவுப் பாதுகாப்புக்கு வழிசமைக்கின்ற வகையில் காலநிலை மாற்றங்களின் பாதகமான விளைவுகளுக்கு மாற்று வழிமுறைகளைக் கட்டியெழுப்புகின்ற காலநிலை மாற்றங்கள் பற்றிய கொள்கைகளும் ஏற்புடையதாக்கல் மூலோபாயங் களும் தயாரிக்கப்பட்டுள்ளன.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මිනිත්තු 15ක් තිබෙනවා. අපේ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් අහන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)

ඒක වැරැදියි. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා කෝ? මට මිනිත්තු 15ක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අපට දැනුම් දීලා නැහැ.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)

මට මිනිත්තු 15ක් තිබෙනවා. කථිකයන්ගේ නම් ඇතුළත් list එක කෝ? ඒ list එක ගන්න කෝ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කාලය ගත වෙනවා.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)

நாட்டின் பொருளாதாரத்திற்கும் சுற்றாடலுக்கும் சாதக மான விதத்தில் பங்களிப்புச் செய்கின்ற புத்திசாதுரியமான கொள்கைகளை வகுத்தல் மற்றும் நடைமுறைப்படுத்தலானது, இந்நாட்டில் நிலைபேறான அபிவிருத்தி இலக்குகளை நிறைவேற்றிக்கொள்வதற்கு அத்தியாவசியமான பூர்வாங்க நிபந்தனையாகும் என்பது அறியவந்துள்ளது. இத்தேவையை இனங்கண்டுள்ள சுற்றாடல் அமைச்சு, நாட்டின் ஏற்புடைய பங்குதாரர்களுடன் ஒன்றிணைந்து இலங்கைக்கான பசுமைக் கணக்கீட்டுப் பொறிமுறையொன்றையும் பசுமை அறிக்கை யிடல் முறைமையொன்றையும் ஆரம்பிப்பதற்குத் தேவையான நடவடிக்கையை மேற்கொள்ளவுள்ளது. அதற்கேற்ப, பசுமைக் கணக்கீட்டுப் பொறிமுறையைத் தாபிப்பதன் முதற்கட்டமாக மொத்த உள்நாட்டு உற்பத்திக்கான வனவளத் துறையின் பங்களிப்பை மதிப்பிடுதல் ஆரம்பிக்கப்பட்டுள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த வரவு செலவுத் திட்டம் பல முறைகளில் சுற்றாடல் மற்றும் பொருளாதார அபிவிருத்திக்கு உதவி செய்வதாக உள்ளது. மேதகு ஜனாதிபதி அவர்கள் அனைத்துத் துறைகளுக்கும் அதிகளவு முன்னுரிமை வழங்கி, அவற்றை மேம்படுத்தும் பொருட்டு 2013ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத் திட்டத்தைச் சமர்ப்பித்துள்ளார். இதில் குறிப்பிடப்பட்டுள்ள முக்கியமான மானியங்கள் மற்றும் நிதி ஏற்பாடுகளில் சிலவற்றை நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். வரட்சியுடன் தொடர்புடைய மக்களின் பிரச்சினைகளைத் தீர்க்கின்ற ஒரு சந்தர்ப்பமாக அரசாங்கம், அண்மையில் ஏற்பட்ட வரட்சியைப் பயன்படுத்தி நீர்ப்பாசனத் திட்டங்களை மறுசீரமைப்பதற்குத் தேவையான நடவடிக்கைகளை மேற்கொண்டுள்ளது. ஏற்கெனவே உலர் வலயத்தின் விவசாயிகளுக்கு மிகவும் தேவைப்படுகின்ற நீர்ப்பாசனத்தை வழங்குகின்ற பிரதானமான பல குளங்களில் வண்டலை அகற்றுவதற்கும் அரசு நடவடிக்கை எடுத்துள்ளது.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ වෙලාව අවසන්.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)

අපේ පක්ෂයේ කාගෙන් හරි වෙලාව අඩු කරන්න. මම නියෝජ්‍ය ඇමති කෙනෙක්. මට මිනිත්තු 15ක් දීලා නේ කථාව පටන් ගත්තේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව සභාගත කරන්න පුළුවන්.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)

සභාගත කරන්න නම් කථා කරන්න අවශ්‍ය නැහැ නේ. සභාගත කරනවා නම් කථාව පටන් ගන්න කොටම සභාගත කරන්න තිබුණා නේ. මට තව මිනිත්තුවක් දෙන්න.

சுற்றாடல் அமைச்சு இச்செயற்பாட்டையும் பங்காளர்களது விரிவான பங்களிப்பின் ஊடாகத் தயாரிக்கப்பட்டுள்ள தேசிய காலநிலை மாற்றங்கள் பற்றிய மூலோபாயங்கள் மற்றும் செயற்றிட்டத்தின் ஊடாக இனங்கண்டுள்ளது.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තව විනාඩි පහක් ගන්න.[බාධා කිරීමක්]

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)

තමුන්නාන්සේලා මට ලණු දෙන්න එපා. අපි ඒක කර ගන්නම්. තමුන්නාන්සේලා දැන් පැරදිලා ඇවිල්ලා මෙතැන ඉන්න එපා. ගෙවල්වලට යන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව මිනිත්තු කීයක් දෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කාලය දැන් අවසන්. ඔබතුමාට දැන් කථාව අවසන් කරන්න වෙනවා. ඔබතුමා වැඩිපුර විනාඩි දෙකක් අරගෙනත් තිබෙනවා.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)

මම මගේ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

*සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சியபகுதி:*
*Rest of the speech tabled:*

இயற்கை வளங்களான ஆறுகள், நீர்த்தேக்கங்கள், காடுகள் மற்றும் வன சீவராசிகளுக்கு நேரிட்டுள்ள அழிவை இனங்கண்டு, மஹிந்த சிந்தனை எதிர்காலத்துக்கான தொலைநோக்கில் சுற்றாடல் தொடர்பில் முழுமையானதோர் அத்தியாயம் ஒதுக்கப் பட்டுள்ளது. அதன்மூலம் பசுமைச் சுற்றாடல் எமது அபிவிருத்தியின் உச்ச நிலையாக இனங்காணப்பட்டுள்ளது. "சுற்றாடலை ஆபத்துக்குள்ளாக்குகின்ற வகையில் நடைபெறு கின்ற அபிவிருத்தி அர்த்தமற்றதாகும்" என மேதகு ஜனாதிபதி அவர்கள் எமக்கு எப்போதுமே வலியுறுத்திக் கூறுவது அதனாலாகும். எனவேதான் சுற்றாடலுக்கும் அபிவிருத்திக்கும் இடையிலான கொடுக்கல்வாங்கலைக் குறைத்துக்கொள்ளுமாறு மீண்டும் மீண்டும் வலியுறுத்தப்படுகிறது.

எமது நாடு அண்மையில் ஏற்பட்ட வரட்சியினால் பெரும் கஷ்டங்களை எதிர்நோக்கியது. அதேபோல் மழைக்காலங்களில் உயிர்களுக்கும் மக்களின் வாழ்வாதாரங்களுக்கும் அதைவிடப் பெரும் அழிவுகள் நேரிடுவதை நாம் காண்கின்றோம். அதிகளவு நீரும் அதேபோன்று நீர்ப் பற்றாக்குறையும் மக்களுக்குப் பல்வேறு விதத்திலும் தாக்கத்தை ஏற்படுத்துகிறது. கிராமப்புறங்களில் வாழும் மக்களும் குறைந்த வருமானம் பெறும் மக்களும் பெருமளவில் மேற்படி தாக்கத்துக்குள்ளாகின்றனர். உயர் நீரேந்து பிரதேசங்களைப் பாதுகாத்தல், உயிர் பல்வகைத் தன்மைப் பாதுகாப்பு, காணிகள் அழிவுறுவதைத் தடுத்தல், சுற்றாடல் விழிப்புணர்வை ஏற்படுத்துதல், ஒழுங்கான கழிவுப்பொருள் முகாமைத்துவம், சுற்றாடல் கொள்கைகள், சட்டங்கள் மற்றும் ஒழுங்குவிதிகளை இற்றைப்படுத்தல் என்பன காலத்தின் அவசியமாகும் என்பதைக் காணக்கூடியதாக உள்ளது. ஆதலால், மேற்படி தேவைகள் தொடர்பாக நடவடிக்கையெடுக்கும் பொருட்டுத் தகுந்த நிகழ்ச்சித்திட்டங்கள் மற்றும் செயற்பாடுகளை நடைமுறைப்படுத்துதல் எமது முக்கியமானதொரு கடமையாகும்.

நாட்டில் காணப்படுகின்ற பல்வேறு இயற்கை வளங்களின் பாதுகாப்பை இலக்காகக்கொண்டே அரசாங்கம் மூன்றாண்டு சுற்றாடல் பாதுகாப்புத் திட்டமொன்றை முன்மொழிந்துள்ளது. இத்திட்டத்திற்கு மூன்று ஆண்டு காலத்தினுள் பயன்படுத்தும் பொருட்டு இந்த வரவு செலவுத் திட்டத்தின்மூலம் ரூபா 1,500 மில்லியன் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளமை தொடர்பில் நான் மேதகு ஜனாதிபதி அவர்களுக்கு நன்றி தெரிவிக்கின்றேன். இந்த நிதியை முதலீடு செய்யவேண்டிய பொருத்தமான துறைகளை எனது அமைச்சு இனங்கண்டுள்ளதோடு, மேற்படி நிதியேற்பாடு மிகவும் பயனுள்ள விதத்திலும் பயன்படுத்தப்படும்.

விவசாய இரசாயனப் பொருட்கள் மற்றும் இரசாயனப் பசளை அதிகளவில் பயன்படுத்தப்படுவதன்மூலம் பண்ணை உற்பத்தி களின் உற்பத்திச் செலவு அதிகரிப்பது மட்டுமல்லாமல், அது எமது தூய்மையான சுற்றாடலை மாசடையச் செய்து சுற்றாடல் முறைமையின் முக்கியமான உயிர் பல்வகைத்தன்மைக்கும் சேதத்தை விளைவிக்கும். அதேபோன்று அது மண், வளி, மற்றும் நிலக்கீழ் நீரையும் மாசடையச் செய்கின்றது. ஆதலால், இந்த அனைத்து விடயங்கள் தொடர்பாகவும் விவசாயிகளை விழிப்படையச்செய்து, நிலைபேறான மற்றும் புத்திசாதுரியமான விதத்தில் கமத்தொழிலில் ஈடுபடுவதற்காக அவர்களை வழிநடத்து வதற்குரிய காலம் வந்துள்ளது.

இந்த வரவு செலவுத் திட்டத்தில், சேதனப் பசளையின் பயன்பாட்டை மேம்படுத்துவதற்கும் சேதனமற்ற பசளைகளின் மூலமும் இரசாயனப் பொருட்களின்மூலமும் எமது மண், நீர் மற்றும் உயிர்ப் பல்வகைத்தன்மைக்கு ஏற்படுகின்ற பாதகமான தாக்கங்களைக்

குறைக்கும்பொருட்டும் சேதனப் பசளை மற்றும் பீடைகொல்லிகளின் உற்பத்தி, விநியோகம் மற்றும் சந்தைப் படுத்தல் துறைகளில் ஈடுபட்டுள்ள தனியார் துறையினரை ஊக்குவிப்பளிப்பதற்கு முன்மொழியப்பட்டுள்ள பிரேரணைகள், சுற்றாடல் பாதுகாப்புத் தொடர்பில் கவனம் செலுத்துகின்ற ஓர் அமைச்சு என்ற வகையில் எனது அமைச்சின் பெரும் பாராட்டு தலுக்குள்ளாகியுள்ளன. அதேபோன்று, சேதனப்பசளை இடப்பட்டு உற்பத்தி செய்யப்படுகின்ற ஒரு கிலோகிராம் நெல்லுக்கு அதிக விலையைப் பெற்றுக்கொடுப்பதற்கும் இந்த வரவு செலவுத் திட்டத்தினூடாக முன்மொழியப்பட்டுள்ளது. இது எமது விவசாயிகளுக்கு சுற்றாடல் நேயம்மிக்க விதத்தில் தமது விவசாய நடவடிக்கைகளில் ஈடுபடுவதற்கு ஊக்குவிப்பளிக்கின்ற மிகச்சிறந்த சந்தை அடிப்படையிலான உபாய வழிமுறையாகும். இந்த உரப் பயன்பாடானது மிகவும் சுற்றாடல் நேயம்மிக்க பயிரியல் நடைமுறையொன்றாகும். இது பயிர்களுக்கு மிகவும் அவசியமான மேலதிக நுண்வளமூட்டியைப் பெற்றுக் கொள்வதற்கும் மண்ணினூடாக வளமூட்டிகள் தேய்வடைவதைத் தடுத்து, தாவரங்களுக்கான மேலதிக நுண்வளமூட்டிகளைத் தேக்கிவைப்பதற்கும் உதவியாக அமைகின்றது. அத்துடன், மண்ணின் நீரைத் தேக்கி வைக்கின்ற இயலுமையையும் உரப் பயன்பாட்டின் வினைத்திறனை வளர்ப்பதற்கும் உதவுகின்றது. ஆதலால், இது விவசாயிகளுக்குத் தமது உற்பத்திச் செலவைக் குறைத்துக் கொள்வதற்கும் மண் மற்றும் நிலக்கீழ் நீர் மாசடைவதைத் தடுப்பதற்கும் உதவியாக அமைவதோடு, அவர்களது விவசாய முறைகளின் உற்பத்தி விளைவுத் திறனையும் அதிகரிக்கச் செய்கின்றது.

சுற்றாடல் அமைச்சு, மத்திய சுற்றாடல் அதிகார சபையினூடாக அநேகமான உள்ளூராட்சி நிறுவனங்களுக்கு கூட்டுப்பசளை உற்பத்திச்சாலைகளைத் தாபித்துக் கொடுத்துள்ள தன்மூலம் திண்மக் கழிவுப்பொருள் முகாமைத்துவப் பிரச்சினை களைக் கட்டுப்படுத்துவதற்கு வழியமைத்துக் கொடுத்துள்ளது. மேற்படி உள்ளூராட்சி நிறுவனங்களுக்கு மேதகு ஜனாதிபதி அவர்களது சேதனப் பயிர்ச்செய்கை மற்றும் பசளை உற்பத்தி எண்ணக்கருவானது அவர்களது கூட்டுப்பசளை உற்பத்திச் செயற்பாட்டுக்கு பெரும் உறுதுணையாகவும் ஊக்குவிப்பாகவும் அமைந்துள்ளது. இது சுற்றாடலை மாசடையச் செய்கின்ற, எவ்வித பெறுமதியுமற்ற குப்பைகளை சுற்றாடல் பேணலுக்குப் பங்களிப்புச் செய்கின்ற கூட்டுப்பசளையாக மாற்றுவதற்கு உதவி யாக அமைகின்றது. இச்சூழமைவினுள் மேதகு ஜனாதிபதி அவர்களின் சேதனப் பசளைப் பயன்பாடு, உற்பத்தி மற்றும் சேதனப் பயிர்ச்செய்கையை ஊக்குவிக்கின்ற முன்மொழிவானது எமது அமைச்சின் செயற்பணி, நோக்கு மற்றும் குறிக்கோள்களை நிறைவேற்றிக்கொள்வதற்கு உதவியாக உள்ளது.

நாம் எப்போதுமே 'திவி நெகும' நிகழ்ச்சித்திட்டத்தை சுற்றாடல் நேயம்மிக்க முயற்சியொன்றாகவே கருதுகின்றோம். அதன் சிறுமனை அலகுகளை மேம்படுத்துகின்றதான ஒட்டு மொத்த நிகழ்ச்சித்திட்டமும் உண்மையிலேயே சுற்றாடல் பயன்பாடுகள் பலவற்றைக்கொண்டுள்ள முழுமையான பசுமைக் கிராமத்தைப் பிரதிபலிக்கின்றதாக உள்ளது. அது மக்களது வாழ்வாதாரத்தைப் பலப்படுத்துதல், சுகாதார மற்றும் உணவுப் பாதுகாப்பை உறுதிசெய்தல், சமூகத்தில் நிலவுகின்ற தற்போதைய சமூக, பொருளாதார, சுற்றாடல் சவால்களுக்குத் தாக்குப் பிடிக்கின்ற ஆற்றல் உருவாக்கப்படுதல் ஆகியவற்றை நிறைவேற்றுகின்றது. ஆதலால், இந்நிகழ்ச்சித்திட்டம் எப் போதுமே எனது அமைச்சின் செயற்பணிக்கான குறைநிரப்பை வழங்குகின்றது.

சிறிய விவசாயிகள் தமது அறுவடையை நீண்டகாலம் வைத்திருப்பதற்கு ஏற்றவாறு தமது வீடுகளின் பின்புறத்தில் களஞ்சிய வசதிகளை ஏற்படுத்திக்கொள்வதை ஊக்குவிப்பதற்கு இந்த வரவு செலவுத் திட்டத்தில் முன்மொழியப்பட்டுள்ளது. இது அவர்களுக்கு உணவுப் பாதுகாப்பை ஏற்படுத்திக் கொள்வதற்கும் நிரம்பல் குறைவாகவுள்ள காலகட்டங்களில் தமது உற்பத்திகளைச் சந்தைப்படுத்துவதன்மூலம் அதிக வருவாயைப் பெற்றுக் கொள்வதற்கு மான ஆற்றலை வழங்குகின்றது.

வர்த்தக ரீதியிலான இளம் விவசாயிகள் 1,000 பேரை இலக்காகக்கொண்டு அவர்களுக்கு விதைகள், நடுகைப் பொருட்கள், பச்சைவீட்டுத் தொழில்நுட்பம் ஆகியவற்றைப் பெற்றுக்கொடுப்பதன் மூலம் உதவி வழங்குவதற்கும் அவர்களைப் பழவகைகள், மரக்கறிகள் மற்றும் துணைப் பயிர்ச்செய்கைகளில் ஈடுபடுத்தும்பொருட்டு மாதிரி பச்சைவீட்டுப் பயிர்ச்செய்கையை உருவாக்குகின்ற விசேட கருத்திட்டத்தின்மூலம் வசதிகளை வழங்குவதற்கும் இந்த வரவு செலவுத் திட்டம் முன்மொழிகின்றது. இத்தகைய ஊக்கமளிக்கக்கூடிய கமத்தொழில் முயற்சிகள், எமது பாரம்பரிய விவசாயிகளினது விவசாய முறைகளைச் சுற்றாடல் நேயம்மிக்கதும் புதிய முன்மாதிரிகளுடன் கூடியதுமான நிலைக்கு மேலோங்கச் செய்கின்றன.

இறுதியாக, 2013ஆம் ஆண்டுக்காக முன்மொழியப்பட்டுள்ள மேற்படி வரவு செலவுத் திட்டமானது சுற்றாடலின் நன்மைக்கான பல ஆக்கக்கூறுகளைக்கொண்ட முழுமையான ஒரு திட்டம் என்பது தெளிவாகின்றது எனக்கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

සමා වෙන්න ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඔබතුමාගේ වේලාව අවසන්. ඊළඟට, ගරු චාමික බුද්ධදාස මන්ත්‍රීතුමා.

[අ.භා. 2.14]

**ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා**
(மாண்புமிகு ஏ.எம். சாமிக புத்ததாஸ )
(The Hon. A.M. Chamika Buddhadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, ඒ වාගේම පරිසර අමාත්‍යාංශය කියන සුවිශේෂී වූ අමාත්‍යාංශ තුනක වැය ශීර්ෂ සාකච්ඡා කරන අද දිනයේ මටත් අදහස් දක්වන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව ඔබතුමාටත්, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාටත් මාගේ ස්තුතිය පළමුවෙන්ම පුද කර සිටිනවා. ඔබතුමා මූලාසනයේ සිටින මොහොතේ මට අදහස් ප්‍රකාශ කිරීමට ලැබීම සතුටට කරුණක්. මොකද, ඔබතුමා මගේ කාලය සම්පූර්ණයෙන් ලබා දෙයි කියලා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන කොට මොණරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මොණරාගල දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන් විශාල ප්‍රමාණයක් සිටින බව. ඒක ඇත්ත. ඒ වාගේම රිදීමාලියද්දත් එක්ක ගත්තාම බදුල්ල දිස්ත්‍රික්කයේත් මේ වන කොට වකුගඩු රෝගීන් ප්‍රමාණය වැඩි වීමේ ප්‍රවණතාවක් අපට දකින්නට ලැබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ ගැන සුවිශේෂී අවධානයක් යොමු කරලා ග්‍රාමීය ජල ව්‍යාපෘති සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළක් ඌව පළාත තුළ දියත් කර සුවිශේෂී කාර්යයක් ඉෂ්ට සිද්ධ කිරීම පිළිබඳව එතුමාට අපි බෙහෙවින් ස්තුතිවන්ත වන්න ඕනෑ. මොකද ඌව පළාතේ වකුගඩු රෝගීන් සම්බන්ධව තිබෙන ප්‍රශ්නය වාගේම, පානීය ජලය සම්බන්ධව තිබෙන්නා වූ ගැටලුවලට විසඳුමක් වශයෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වසර හතරක කාල පරිච්ඡේදයක් තුළ රුපියල් මිලියන 2,000ක මුදලක් වෙන් කරලා ඒ ක්‍රියාවලිය ඉෂ්ට සිද්ධ කිරීමට ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාට එම කටයුතු භාර දීලා තිබෙනවා. මම කියන්න සතුටුයි, ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා එයට අවශ්‍ය කරන ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 300ක මුදලක් වෙන් කරලා, ඒ අවශ්‍ය නිලධාරින් පත් කරලා 2013 දී ඒ කටයුත්ත ආරම්භ කිරීමේ සැලැස්මක් මේ වෙන කොටත් දියත් කරලා තිබෙන බව. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වන්න ඕනෑ. එය බදුල්ල දිස්ත්‍රික්කය තුළ තිබෙන්නා වූ මේ පානීය ජල ගැටලුව විසඳීමට ගන්නා වූ එක් පියවරක් පමණයි.

[ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රදේශයේ ජනතාව පිරිසිදු පානීය ජලය සම්බන්ධව විශාල ගැටලුවකට මුහුණ පාලා තිබෙනවා. ඇල්ල, හාලිඇල, වාගේම ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා නියෝජනය කරන බදුල්ල ආසනයේ කොටසක් මේ ප්‍රශ්නයට මුහුණ දෙනවා. මෙයට විසඳුමක් වශයෙන් මේ ප්‍රදේශ ආවරණය වන ආකාරයට ජල සැපයුම් ලබා දීම සඳහා රුපියල් මිලියන 8,500ක මුදලක් වෙන් කර ඇල්ල ජල යෝජනා ක්‍රමය ආරම්භ කිරීමට ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා මේ වෙන කොටත් සැලසුමක් දියත් කරලා තිබෙනවා. මා දන්නා ආකාරයට ප්‍රතිලාභීන් ලක්ෂයකට වැඩි ප්‍රමාණයකට මේ ජල ව්‍යාපෘතියෙන් ජල සම්බන්ධතා ලබා ගැනීමට පුළුවන් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාගේ උමා ඔය ව්‍යාපෘතියත් එක්ක සහසම්බන්ධ කර ගෙන මාතැටිල්ල ජල යෝජනා ක්‍රමය හරහා බණ්ඩාරවෙල, දියතලාව සහ අපේ උදිත් ලොකුබණ්ඩාර මැතිතුමා නියෝජනය කරන ආසනය වන හපුතලේ යන ප්‍රදේශයන්හි තිබෙන්නා වූ ජල ගැටලුව සම්බන්ධයෙන් මෙවර අය වැයේදී යෝජනාවක් ඉදිරිපත් කරලා ඒ සම්බන්ධයෙන් සහයෝගය දීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාටත්, ඒ සඳහා ස්ථිරසාර විසඳුමක් ලබා දීමට කටයුතු කිරීම පිළිබඳව ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාටත් අපි අවංකවම ඒ ප්‍රදේශයේ ජනතාවගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැලිමඩ ආසනයේ ජනතාවත් විශාල පානීය ජල අර්බුදයකට මුහුණ පා තිබෙනවා. ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා කිහිප විටක්ම වැලිමඩ ආසනයට ඇවිල්ලා මේ සම්බන්ධව අපිත් එක්ක සාකච්ඡා කළා. එතුමාගේ නිරීක්ෂණය අනුව උමා ඔය ව්‍යාපෘතිය හරහා වැලිමඩ ජනතාවට ලබා දෙන්නා වූ පානීය ජලයේ පිරිසිදුභාවය පිළිබඳ ප්‍රශ්නයක් තිබූ නිසා ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා වැලිමඩ නගරයේ තිබුණා වූ ඒ ජල ව්‍යාපෘතියට රුපියල් මිලියන 265ක වියදමින් නව පිරිපහදුවක් ලබා දෙමින් ප්‍රතිලාභීන් 31,150කට, ඒ වාගේම පවුල් සංඛ්‍යාව බැලුවොත් පවුල් 6,230කට පිරිසිදු පානීය ජලය ලබා දීමේ කටයුතු නිම කරලා තිබෙනවා. එය ජනතා අයිතියට පත් කිරීම සඳහා දිනයක් වෙන් කර ගැනීමට මේ වන විට ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාත් එක්ක අපි සාකච්ඡා කරමින් සිටිනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ඒ තුළින් වැලිමඩ නගරයේ පානීය ජල ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබා දී තිබෙනවා. ඒ වාගේම ගරු අමාත්‍යතුමනි, බෝඹුරල ජල යෝජනා ක්‍රමය ගැනත් කියන්න ඕනෑ. ඒ ගැන අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාත් දන්නවා. එතුමා තමයි ඒ සඳහා මුල් ගල් තැබුවේ. ඒක පටන් ගන්න කොට විපක්ෂයේ ඇතැමුන් අපට චෝදනා කළා. එහි තිබෙන්නේ හරකුන්ටවත් සුදුසු නැති ජලය කියා තමයි එතුමන්ලා එදා අපට චෝදනා කළේ. නමුත් අද පවුල් 3,550ක ප්‍රතිලාභීන් 17,750ක් ඒ යෝජනා ක්‍රමය තුළින් ජලය පරිභෝජනයට ගන්නවා. අපටත් එහි පිරිසිදුභාවය පිළිබඳ යම් ගැටලුවක් තිබුණා. ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කළාම එතුමා රුපියල් මිලියන 382ක වියදමින් ඌව පරණගම බෝඹුරල ජල යෝජනා ක්‍රමයටත් පිරිපහදුවක් ලබා දී, මේ වනකොට එහි වැඩ සාර්ථකව කර ගෙන යනවා. ගරු අමාත්‍යතුමනි, උපදේශක කාරක සභාවේදීත් මම ඔබතුමාට ප්‍රකාශ කළා, මෙය හැකි ඉක්මනින් ජනතාවට ලබා දෙන්නය කියා. අප්‍රේල් සිංහල අවුරුද්දට ඌව පරණගම ජනතාවට පිරිසිදු ජලය ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවාය කියා ඔබතුමා පොරොන්දු වුණා. ඒ ගත්තා වූ ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මහියංගන, රිදීමාලියද්ද ප්‍රදේශයේ වකුගඩු රෝගීන් ගැනත් කියන්න ඕනෑ. අපේ හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාත් හැමදාම ඒ ගැන කථා කරනවා. වකුගඩු රෝගීන් පිළිබඳ ප්‍රශ්නය අපට තිබෙන ලොකුම ගැටලුවක්. මෙය පිරිසිදු පානීය ජලය නොලැබීම නිසා සෑදෙන රෝගයක්ය කියන එක මේ වනකොට නිගමනය කර තිබෙනවා. මහියංගනය, රිදීමාලියද්ද ප්‍රදේශයට පිරිසිදු පානීය ජලය ලබා දීමේ වැඩ පිළිවෙළක් සඳහා රුපියල් මිලියන 2,000ක මුදලක් වෙන් කරලා, මේ වනකොට ඒ ජල ව්‍යාපෘතියත් ආරම්භ කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳවත් මම කථා කරන්න ඕනෑ. මොකද, ගරු අමාත්‍යතුමා එතුමාගේ කථාවේදී සඳහන් කළේ, මහා පරිමාණයේ ව්‍යාපෘති ගැන පමණයි. නමුත් මා කියන්න සතුටුයි, ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා අප ප්‍රදේශයේ, -මම බදුල්ල දිස්ත්‍රික්කය විතරක් ගත්තොත්- බදුල්ල දිස්ත්‍රික්කයේ සෑම පළාතකම කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. මේ වෙන කොට එතුමා මා නියෝජනය කරන ඌව පරණගම ආසනයේ වැව් තුනක් පිරිසිදු කරලා, -රොන් මඩ ඉවත් කරලා- කෘෂි කර්මාන්තයට අවශ්‍ය කරන වාරි ජලය ලබා දීමේ වැඩ පිළිවෙළකට උර දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඌව පරණගම ආසනයේ ජීවනාලිය වන ඌමා ඇළ ව්‍යාපෘතිය පිළිබඳව ගරු අමාත්‍යතුමා හොඳ අධ්‍යයනයක් කරලා පළමුවැනි අදියර වශයෙන් එතුමාගේ අමාත්‍යාංශයෙන් අපට රුපියල් මිලියන 100කට වැඩි මුදලක් ලබා දීලා එම ඇළ ප්‍රතිසංස්කරණය කළා. ඒ තුළින් ඌව පරණගම ආසනයේ කෘෂි කාර්මික ජනතාවගේ වාරි ජලය සම්බන්ධව තිබූ ගැටලුව යම් තාක් දුරට නිරාකරණය කර ගැනීමට හැකි වුණා. ගරු අමාත්‍යතුමනි, එම ව්‍යාපෘතියත් එක්කම,

-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දුන් කාලය දැන් අවසන්.

**ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා**
(மாண்புமிகு ஏ.எம். சாமிக புத்ததாஸ )
(The Hon. A.M. Chamika Buddhadasa)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ලබා දුන්නා වූ ඒ ප්‍රතිපාදන හරහා ඌමා ඇළ ව්‍යාපෘතියේ ප්‍රතිසංස්කරණ කටයුතු කෙරුණා. නමුත් තවත් යම් යම් ගැටලු ටිකක් තිබෙනවා. ඉදිරි කාලයේදී ඒ පිළිබඳ සාකච්ඡා කරලා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා අප ආසනය තුළ වාගේම ශ්‍රී ලංකාව තුළත් ගෙන යන්නා වූ කෘෂි කර්මාන්තය නංවාලීමේ වැඩ පිළිවෙළට ඔබතුමාගේත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ සියලුම දෙනාගේත්, නියෝජ්‍ය අමාත්‍යතුමා ඇතුළු සියලු දෙනාගේත් දායකත්වය ලබා දෙන්නට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 2.24]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත්ම වැදගත් අමාත්‍යාංශ තුනක වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡාවට භාජනය කරන අවස්ථාවේ මටත් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන ප්‍රථමයෙන්ම මා ස්තුතිවන්ත වෙනවා.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන විට ඇත්ත වශයෙන්ම එම අමාත්‍යාංශයේ කටයුතු ගැන සෑහෙන දුරට සතුටට පත් වීමට හැකියාවක් තිබෙන බව මම ප්‍රධාන වශයෙන් මේ අවස්ථාවේදී මතක් කරනවා. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාට පසු ගිය වර්ෂයට වඩා වැඩිපුර මුදල් ප්‍රමාණයක් මෙවර ලැබිලා තිබෙනවා කියා මා හිතනවා. ඒ වාගේම එකම දිස්ත්‍රික්කය තුළ තිබෙන විශාල ව්‍යාපෘතීන් දෙකක් වන උමා ඔය ව්‍යාපෘතියටත්, ඒ වාගේම මොරගහකන්ද ව්‍යාපෘතියටත් වැඩිපුර මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තවත් ව්‍යාපෘති 11කට මුදල් වෙන් වෙලා තිබෙන බව අපි දන්නවා. අය වැය විවාදය කාලයේදී සාමාන්‍යයෙන් අපි වැඩිපුරම දැක්කේ ආණ්ඩුව විවේචනය කරන එකයි. නමුත්, අද ඊට වඩා වෙනස් වූ දෙයක් -විවේචනයක් නොවෙයි- ඇත්ත වශයෙන්ම සුබ පැතීමක් කරන්නයි මම සූදානම් වෙන්නේ. මොකද, එතුමා දක්ෂයි. එතුමාට හම්බ වෙන හැම අංශයක් තුළින්ම රැකියා උත්පාදනය කරලා, නැති රැකියා ඇති කරලා, දිස්ත්‍රික්කයේ සියලු දෙනාට රස්සා දීලා යූඑන්පීය හින්දන තත්ත්වයට පත් කරන ඇමතිවරයෙක් විධියට එතුමා, එතුමාගේ කාර්ය බදුල්ල දිස්ත්‍රික්කය තුළ ඉතාමත්ම හොඳින් සිදු කර ගෙන යනවා. ඉස්පිරිතාලෙදී කවුරු හරි ඇහේ හැප්පුණත් අපි කියන්නේ ඔහු බදුල්ල දිස්ත්‍රික්කයේ කෙනෙක් කියායි. ඒ වාගේම තමයි දැන් ඒ තත්ත්වය වාරි මාර්ගයටත් ඇති කරලා අපේ යූඑන්පී ශාඛාවල කට්ටියට තමයි එතුමා දැන් රස්සා දෙන්නේ. මොකද, එතරම් ශාඛා ප්‍රමාණයක ජනතාවට දැන් රස්සා දීලා ඉවරයි. මම හිතනවා අනෙක් මන්ත්‍රීවරුන් එතුමාගෙන් jobs ටිකත් ඉල්ලා ගන්න ඕනෑ කියලා. මොකද, එහෙම නැති වුණොත් බදුල්ලේ ශාඛා කාර්යාලවල කට්ටියට තමයි රස්සා ඔක්කෝම දෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමා කළ ඉතාම හොඳ ව්‍යාපෘතියක් තමයි, මහවැලි කලාපයට අපේ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5ක් එකතු කර ගැනීම. ඒක ඉතාමත්ම හොඳ කටයුත්තක්. මහවැලි "සී" කලාපයට අයත් නොවන බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5ක් ඇතුළත් කිරීම තුළින් විශාල ප්‍රමාණයේ වාරි මාර්ග ඇතුළු සුළු වාරි මාර්ග කටයුතු රාශියක් ඉටු කර දීමට හැකි වෙලා තිබෙනවා. ඒ තුළින් අපට ඉතාමත්ම විශාල වාසියක් සිදු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝරාන වැව පිළිබඳව සහ තල්පිටිගල ව්‍යාපෘතිය පිළිබඳව ගරු ඇමතිතුමාගේ කථාවේදීත් කිව්වා. ඒ තුළින් තවත් අක්කර 4,000ක්, 5,000ක් පමණ නැවත වතාවක් අස්වද්දන්නට අපේ දිස්ත්‍රික්කයේ ජනතාවට අවස්ථාව ලැබීම ඉතාමත්ම අගය කළ යුතුයි. කුමන පක්ෂයක් නියෝජනය කළත් ඒ තුළින් අපේ දිස්ත්‍රික්කයේ ඉන්න ජනතාවට සෙතක් ශාන්තියක් සැලසෙනවා නම් එය ඉතාමත්ම අවංකව මම අගය කරන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ වැඩ කටයුතුවලදී එතුමාට ඉතාමත්ම හොඳ කණ්ඩායමකුත් ලැබී තිබෙනවා. නමුත් ඇමතිතුමාගේ සමහර නිලධාරින් ක්‍රියා කරන විධිය පිළිබඳව තමයි පුංචි ප්‍රශ්නයක් තිබෙන්නේ. පසු ගිය දවසකදී මාපාගල වැව ඉස්මත්තේ කර තිබුණු වගාවේ අස්වැන්න කපා ගන්නවත් ඒ මිනිස්සුන්ට හැකි වුණේ නැහැ. එහෙම වගා කිරීම හරි දෙයක් කියලා මම පෞද්ගලිකව කියන්නේ නැහැ. වැව් තාවුල්ලේ වගා කළ එක වැරැදියි. නමුත් ඒක දුප්පත්කම හා අසරණකම නිසා කළ වගාවක් බැවින්, ඒ වගාවේ අස්වැන්න නෙළන්න විතරක් අවස්ථාව දීලා ඒ ටික අයින් කරලා දාන්න පියවර ගත්තා නම් හොඳ දෙයක් කියලා මම හිතනවා.

එහෙම නැතිව ඒ මිනිස්සු අස්වැන්න බලාගෙන ඉන්නකොට ඇස් ඉදිරිපිට ඒ වගාව විනාශ කිරීම ගැන ඔබතුමා වුණත් එකඟ වන්නේ නැත කියා මම විශ්වාස කරනවා. මා දීර්ඝ වශයෙන් වාරිමාර්ග අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරන්නේ නැහැ. වැඩියෙන් කථා කළොත් එහෙම, ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාට වැඩියෙන් හොඳ කියන නිසා මාත් ඔය පැත්තට එනවාය කියා හිතයි. අපේ දිස්ත්‍රික්කය ගැන කටයුතු කර, දිස්ත්‍රික්කය වෙනුවෙන් -කෘෂිකර්මාන්තය පදනම් කර ගෙන ජීවත් වන අපේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන්- විශාල සේවාවක් අවංකව ඉටු කිරීම ගැන මම එතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ඊළඟ විවේචනය තිබෙන්නේ පරිසර අමාත්‍යාංශය පිළිබඳවයි. අද අපට විශාල ප්‍රශ්න රාශියක් තිබෙන අමාත්‍යාංශයක් තමයි පරිසර අමාත්‍යාංශය. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳවත් විශාල වටිනාකමක් දෙන අමාත්‍යාංශයක් තමයි පරිසර අමාත්‍යාංශය.

හැබැයි මෙම අමාත්‍යාංශයට මුදල් වෙන් කිරීම 2012ට වඩා 2013 දී අඩු කර තිබෙනවා. 2012 දී රුපියල් මිලියන 1868ක් වෙන් කළ අමාත්‍යාංශයට 2013 වර්ෂයේදී වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 1483යි. හැබැයි, පරිසරය වැඩි දියුණු කිරීම සඳහා නව වැඩසටහන් කිහිපයකට වෙනම රුපියල් මිලියන 317ක් වෙන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයේදී රුපියල් මිලියන 546ක් වෙන් කළා. නමුත් 2013 වර්ෂයේදී වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 200යි. ඝන අපද්‍රව්‍ය ඒ තරම් හොඳට මේ රට තුළ කළමනාකරණය වෙනවා ද කියන ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්තවශයෙන්ම රූපවාහිනියෙන් අප දකින විධියට කොළොන්නාව ප්‍රදේශයේ ජනතාවට ජීවත් වීමට අවසරත් නැති වෙනවා; ජීවත් වීමට හැකියාවත් නැති වෙනවා. මේ අවස්ථාවේ මේ සභාවේ ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා ඉන්න නිසා මා මේ කරුණ කියන්න ඕනෑ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා රුපියල් කෝටි 5ක් වෙන් කර, බදුල්ලේ ලොකු ව්‍යාපෘතියක් ආරම්භ කළා. ජනාධිපතිතුමාත් බදුල්ලට එන හැම වතාවෙම හෙලිකොප්ටරයෙන් ඇවිල්ලා බහිද්දී අහන පළමුවන ප්‍රශ්නය තමයි මේ කුණුගොඩ ගැන ප්‍රශ්නය. අද මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සම්පූර්ණ වශයෙන්ම කඩාකප්පල් වෙලා, කිසිම ප්‍රගතියක් නැති, සුදු අලියෙක් බවට පත්වී තිබෙනවා. මේ රුපියල් කෝටි 5ක මුදල් නාස්තිය ගැන බලන විට මේවා කාගේ මුදල්ද? ඒ, මේ රටේ බදු ගෙවන්නන්ගේ මුදල්. එම නිසා මේ නාස්තියට ඉඩ දීම ගැන මම මගේ කනස්සල්ල සහ කනගාටුව ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශාල වශයෙන් කථා කරන්නට ඕනෑ කරන කරුණු රාශියක් තිබෙනවා. නමුත් මා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. පිටු 26ක වාර්තාවක් මා අත තිබෙනවා. එය හැන්සාඩ් ගත කරන්නට මා බලාපොරොත්තු වෙනවා. පරිසර අමාත්‍යාංශයේ නොහැකියාව, අකටයුතුකම් තුළ අද මේ ඉඩම් කොල්ල කෑම්, පරිසර දූෂණය සිදු වන ස්ථාන

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

රාශියක් තිබෙනවා. මම මේවායින් කිහිපයක් පමණක් උදාහරණ වශයෙන් දක්වන්නට බලාපොරොත්තු වෙනවා.

එකක් තමයි අන්දර වැව රක්ෂිතයේ හෝටලයක් ඉදි කිරීම සම්බන්ධ කාරණය. දිස්ත්‍රික්කය - අනුරාධපුරය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය -නොච්චියාගම, ග්‍රාම නිලධාරි වසම අංක 341- අන්දර වැව. මේක 1982 දී මහවැලි "එච්"කලාපය මගින් පාලනය වුණු ආරක්ෂිත ප්‍රදේශයක්. අක්කර 1050කින් සමන්විත මේ අන්දර වැව රක්ෂිතයේ -වන ජීවී ආරක්ෂිත කලාපයේ, ප්‍රධාන අලිමංකඩක් වන ප්‍රදේශයේ- මහා වනය එළිපෙහෙළි කරමින් විශාල ගණයේ හෝටල් ඉදි කිරීමේ ව්‍යාපෘතියක් තිබෙනවා. මේ ව්‍යාපෘතිය එක වතාවක් අතරමගදී නැවැත්වුවා. මේක එක්දහස් නවසිය අනූ ගණන්වල සිට ආ ප්‍රශ්නයක්. මේ ව්‍යාපෘතිය එක වතාවක් නැවතුණා. දැන් ආයෙත් "ෆොරස්ට් රොක් ගාර්ඩන්" කියා අක්කර 48ක් අනුරාධපුරයේ ෆාම් ගාර්ඩන් හෝටලය අයිති චන්ද්‍රසිරි මහත්මයාට දී තිබෙනවා. ඉතාලි ජාතිකයෙක් තමයි මේ ව්‍යාපෘතියේ පළමුවන අදියරට invest කරන්නේ. කෝටි 30ක් ආයෝජනය කර තිබෙනවා. ගොවි සංවිධාන, පරිසර සංවිධාන මේ ව්‍යාපෘතියට සම්පූර්ණයෙන් විරුද්ධ වුණා. ඊට පස්සේ 2010 වර්ෂයේ දී වාරණයක් ගෙනැවිත් මේ ව්‍යාපෘතිය නැවැත්වුවා. නමුත් පරිසර අමාත්‍යාංශය තුළින් පරීක්ෂණයක් කර වාර්තාවක් දුන්නා. එක දවසක නිරීක්ෂණයක් කර වාර්තාවක් දුන්නා. ඒ වාර්තාව ගැන කිසිම වෙලාවක සෑහීමකට පත් වන්නට බැහැ. මේ ප්‍රදේශය අතිවිශාල වෘක්ෂලතාවන් -කළුවර, කළු මැදිරිය, පළු, වීර, බුරුත මේ සියලු ගස්- තිබෙන ප්‍රදේශයක්. අලි ඇතුන්, ඉත්තෑවෝ, තිත් මුවෝ, ගෝන්නු , වල්ඌරෝ, වළිකුකුළෝ මේ සියලු සත්ත්වයෝ ඉන්න ප්‍රදේශයක්. පරිසර අමාත්‍යාංශය විසින් තීරණයක් ගන්න ඕනෑ ප්‍රදේශයක්. ඒ වාගේම තව අක්කර 20ක් ඇක්සස් සමාගමට දී තිබෙනවා. වැඩිය කථා කරන්න බැහැ. වැඩිය කථා කළොත් මේ නම් කියන්නත් වෙනවා. ඇක්සස් සමාගමට ගල් කොරියක් දාන්න දීලා තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න නියෝජ්‍ය අමාත්‍යවරයෙකුගේ ප්‍රාදේශීය සභාවක් නියෝජනය කරන පුතෙකුට දීලා තිබෙන්නේ.

මේවා වැරදි වැඩ. මේ සම්බන්ධයෙන් දේශපාලන හස්තයක් ක්‍රියාත්මක වෙනවා. පරිසර අමාත්‍යාංශය මේ කටයුතු සිදු වෙනකම් අමු අමුවේ බලා ගෙන ඉන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද, නම?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
නම කියන්න පුළුවන්. මේ වාර්තාවේ තිබෙනවා. ඒක කියෙව්වාම ඔක්කොම නම් ටික ලැබෙනවා.

ඔබතුමා දැන ගන්නට ඕනෑ, ඒ ඉඩම විකුණන්න කටයුතු කරලා තිබෙන්නේ මහවැලි එච් කලාපයේ ඉන්න නිලධාරියෙක්. එතුමාට දේශපාලන රැකවරණ දෙන්නේ මේ පාර්ලිමේන්තුවේම ඉන්න නියෝජ්‍ය ඇමතිවරයෙක්. ඒ වාගේම අනුරාධපුර, ශ්‍රී මහා බෝධියේ උඩමළුවේ මහා නාහිමියන්ටත් අක්කර 20ක ඉඩම් කෑල්ලක් වෙන් කරලා දීලා ඒ පැත්තත් "ෂේප්" කර ගෙන තිබෙනවා. පරිසර අමාත්‍යාංශය විසින් ඒ පිළිබඳව කිසිම පියවරක් අරගෙන නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් ව්‍යාපෘතියක් ගැන මා කියන්නම්. ඊට අදාළ දිස්ත්‍රික්කය - පුත්තලම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වනාතවිල්ලුව, ග්‍රාම නිලධාරි වසම - රාල්මඩුව. මෙහි අක්කර 335ක වනාන්තර ප්‍රදේශයක එච්.වී.ජී. ෆාම් කියලා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා. මේ ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යාලය තිබෙන්නේ අංක 39/ඒ, ලින්ටන් පාර, කඳාන කියන ස්ථානයේ. මේ ව්‍යාපෘතියේ අයිතිකරු රජයේ ප්‍රධාන ඇමතිවරයෙකුගේ බෑණනුවන්. මේවා ගැන කියන විට පරිසර අමාත්‍යාංශය භාර ඇමතිවරයාත් සභාවේ නැහැ. එච්.වී.ජී. ෆාම් එක රොහාන් ප්‍රනාන්දු කියන කෙනෙකුට - ඇමතිවරයෙකුගේ බෑණා කෙනෙකුට- අයිතියි. ඒ කාගේ බෑණාද කියලා සොයා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ අකටයුතුකම් රාශියක් සම්බන්ධ පැමිණිලි තිබෙන අමාත්‍යාංශයක් තමයි මේක. මේ ව්‍යාපෘති නිසා පරිසරට හානි වුණ අවස්ථා කියන්න ගියොත් විශාල කාලයක් ගත වෙනවා. එම නිසා පිටු 23කින් යුත් මෙම වාර්තාව මා **හැන්සාඩ්ගත*** කරනවා.

මේ වාර්තාව තුළ මේ ව්‍යාපෘතිවලින් සිදු වන විනාශය පිළිබඳව, ව්‍යාපෘතියේ වාණිජ මුහුණුවර පිළිබඳව, ව්‍යාපෘතියෙන් සිදු වන හානිකර බලපෑම් පිළිබඳව, ඒ ව්‍යාපෘතිවලින් උල්ලංඝනය කරන අණ පනත් පිළිබඳව සියලු විස්තර එකින් එක සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම මා තවත් මේ වාගේ පරිසරයට හානි කරන ව්‍යාපෘති කිහිපයක් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට තිබෙනවා, කල්පිටිය මහා පරිමාණ සංචාරක ව්‍යාපෘතිය. දිස්ත්‍රික්කය - පුත්තලම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කල්පිටිය, අදාළ ග්‍රාම නිලධාරි වසම් - පල්ලියවත්ත, ඕලන්ද ඇළ, ආනවාසල, සින්නකුඩිරිප්පුව, වන්නිමුන්දල්, පෙරයකුරිරුප්පු සහ මණ්ඩලකුඩාව. මේ කියන ග්‍රාම නිලධාරි වසම්වල තිබෙන ව්‍යාපෘතියක් ඒක. එම ව්‍යාපෘතිය තුළින් මොන තරම් පරිසර හානියක් සිදු වෙනවාද කියන සියලු විස්තර මේ වාර්තාවේ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් එක තමයි ලුණුගම්වෙහෙර තිබෙන මහා පරිමාණ කෙසෙල් වගා ව්‍යාපෘතිය. එහි පිහිටීම මෙසේයි. දිස්ත්‍රික්කය - මොණරාගල, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ලුණුගම්වෙහෙර, ග්‍රාම නිලධාරි වසම - දෙමලිය, වන්දම. ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය මායිමේ හඳපානගල සිට ලුණුගම්වෙහෙර දක්වා අලි - ඇතුන් සංක්‍රමණය වන ප්‍රධාන අලිමංකඩේ අක්කර 1,000ක වනාන්තර ප්‍රදේශයක් ඩෝල් ලංකා පුද්ගලික සමාගමට ලබා දීලා තිබෙනවා. මේ නිසා පරිසරයට සිදු වුණ හානි පිළිබඳ සියලු විස්තර මේ වාර්තාවේ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි පානම ඉඩම් නාවික හමුදාවෙන් හා විශේෂ කාර්යය බලකායෙන් අත් පත් කර ගැනීම. එහි පිහිටීම මෙසේයි. දිස්ත්‍රික්කය - අම්පාර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ලාහුගල, ග්‍රාම නිලධාරි වසම - ශාස්ත්‍රවෙල. මා පෞද්ගලිකව මෙම ප්‍රදේශයට ගියා පසු ගිය මැතිවරණ කාලයේ. ඒ ප්‍රදේශවල ජීවත් වුණු, කුඹුරු ගොවි තැන් කර ගෙන හිටිය අතිවිශාල පිරිසක් අද අවතැන් වෙලා සිටිනවා. ඒ වාගේම ඒ ප්‍රදේශයේ ඉපැරණි සංස්කෘතික වටිනාකමකින් යුතු දේවල් තිබෙනවා. ඒ පන්සලේ නායක හාමුදුරුවෝ සම්පූර්ණයෙන්ම ඒ ව්‍යාපෘතියට විරුද්ධයි. ඒ ගැන පරිසර

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සංවිධානවලට කියලා තිබෙනවා. ඒ ව්‍යාපෘතිය නිසා සිදු වන පරිසර දූෂණය ගැන කියලා තිබෙනවා. නමුත් ඒ පිළිබඳ කිසිම පියවරක්, තීන්දුවක්, තීරණයක් අරගෙන නැහැ. එවැනි ව්‍යාපෘතියක් ඒක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි පුත්තලම කළපුවේ ලුණු නිෂ්පාදන ව්‍යාපෘතිය. එහි පිහිටීම මෙසේයි. දිස්ත්‍රික්කය - පුත්තලම. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කල්පිටිය, ග්‍රාම නිලධාරි වසම - දළුව. මේ ව්‍යාපෘතියට සම්බන්ධ වෙලා ඉන්නේ ඔබතුමන්ලාගේම ඇමතිවරයෙක්. ඒ ඇමතිතුමාගේ නමත් සමඟ සියලු විස්තර මේ වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා. මේ ව්‍යාපෘතියෙන් පරිසරයට වන හානිය ගැන සඳහන් කරලා තිබෙනවා. මේ සියලු දේ මා සභාගත කරලා තිබෙනවා. මේ සභාව තුළ ඒ අයගේ නම් ප්‍රකාශ කරන්න මා කැමැති නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි සලපෙආරු කළපුවේ ලුණු නිෂ්පාදන ව්‍යාපෘතිය. එහි පිහිටීම මෙසේයි. දිස්ත්‍රික්කය -ත්‍රිකුණාමලය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය- කුච්චවේලි, ග්‍රාම නිලධාරි වසම - සලපෙආරු. ලංකාවේ විශාලතම කළපුව වන සලපෙආරු කළපුවේ අක්කර 1,805ක ප්‍රදේශයක් රයිගම්, ඊස්ටන් සෝල්ට් පුද්ගලික සමාගමට "නැඟෙනහිර නවෝදය" වැඩ සටහන යටතේ මහා පරිමාණ ලුණුනිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා ලබා දී ඇත. මේ ව්‍යාපෘතිය නිසා සිදු වන පරිසර හානිය පිළිබඳව සම්පූර්ණ කරුණු කාරණා ඇතිව සියලු විස්තර මේ වාර්තාවේ තිබෙනවා. නමුත් අද වනතුරුත් පරිසර සංවිධාන හෝ පරිසර අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් කටයුතු නොකිරීම ගැන අපි කනගාටු වෙනවා. මේ ව්‍යාපෘති තුළින් උල්ලංඝනය වන සියලු අණ පනත් ගැන සඳහන් කරලා තිබෙනවා. මෙම සියලුම ව්‍යාපෘති ගැන කියන්න ගියොත් විශාල කාලයක් ගත වන නිසා මා ඒ විස්තර සභාගත කළා.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මුත්තූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති සාම්පූර් ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සහ කර්මාන්ත පුර ව්‍යාපෘතිය තුළින් වෙන්නා වූ විනාශය ගැනත් මා සඳහන් කර තියෙනවා. ඒ සියලු විස්තර මේ වාර්තාවේ තිබෙනවා.

මා වාරිමාර්ග අමාත්‍යාංශයේ වැඩ ගැන හොඳයි කිව්වා. ඒ වාගේම පරිසර අමාත්‍යාංශයේ ඉන්න ඒ ඇමතිතුමාත් දක්ෂයෙක්. ඒ ඇමතිතුමා අවංකයි කියලා අපි විශ්වාස කරනවා. නමුත් යටින් ගහන්නේ නිලධාරින්මයි. මා කියපු ව්‍යාපෘති සඳහා approval අරගෙන දෙන්නේ ඒ නිලධාරින්; ඒවාට පිඹුරුපත් සකස් කරන්නේ ඒ නිලධාරින්; අන්තිමට මේ දේපොළ විකුණන්නේත් ඒ නිලධාරින්. අවශ්‍ය වුණොත් ඒ අය මේ කටයුතුවලට ප්‍රාදේශීය දේශපාලනඥයන්ගේ සහයෝගයත් ගන්නවා. ඒ අයටත් අක්කර විස්සක් තිහක් දීලා game එක balance කරලා වැඩේ කර ගන්නවා. මේ අකටයුතු මැඩ පවත්වන්න ඇමතිතුමාගේ සම්පූර්ණ කැප කිරීම අවශ්‍ය වෙනවා. ශ්‍රී ලංකාවේ පරිසරවේදීන්ගේ නිර්දේශ පවා මේ මා ඉදිරිපත් කළ වාර්තාවට ඇතුළත් කර තිබෙනවා. මේ සමහර ව්‍යාපෘති නිසා ඉදිරි කාලයේදී අපේ කාලගුණයට පවා ඇති වෙන්නා වූ බලපෑම්, අපට සිදු වෙන්නා වූ මහත් විනාශ පිළිබඳව මේ වාර්තාවේ සඳහන් වෙනවා.

ඇත්ත වශයෙන්ම මේ අවස්ථාවේ අපේ වන සම්පතේ විශාල නාස්ති වීමක් සිදු වෙනවා. මා ඉදිරිපත් කළ ඒ වාර්තාවේ කොපියක් ඇමතිතුමාට මා ලබා දෙන්නම්. මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ සියලු කරුණු හොඳින් අධ්‍යයනය කරලා සාධාරණත්වයක් ඉටු කරන්න කියලා.

අවසාන වශයෙන් පරිසර ඇමතිතුමාටත්, නිමල් සිරිපාල ඇමතිතුමාටත් තවත් ශක්තිමත්ව වැඩ කරන්න හැකියාව ලැබේවායි පතනවා. හැබැයි, බදුල්ලේ UNPකාරයන්ට වැඩිපුර රැකියා දෙන්න එපා. ඒ ඡන්ද ටිකක් අපට ඉතුරු කරන්න. නැත්නම් ලබන වතාවේ අපට පාර්ලිමේන්තුවට එන්න අමාරු වෙනවා. බදුල්ලේ සියලු දෙනාට රැකියා දෙන්න ගියොත් ලොකු ප්‍රශ්නයක් එනවා. නමුත් මා සම්පූර්ණ වශයෙන් රැකියා දෙන එකට එකඟයි, කාට හෝ රැකියාවක් ලැබෙනවා නම් ඒක හොඳ නිසා. ඒ නිසා තෝරලා බේරලා මටත් jobs ටිකක් දෙන්න. එතකොට මාත් කිහිප දෙනෙකුට රැකියා දෙන්නම්. එතකොට සාමූහිකව අපට මේ වැඩේ කර ගෙන යන්න පුළුවන්. ඒ කාරණයත් මතක් කරමින්,ඔබ සියලු දෙනාටම සුබ ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.39]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ රටේ වැදගත් අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා වෙන අවස්ථාවේ අදහස් කිහිපයක් ප්‍රකාශ කිරීමට ලැබීම ගැන සතුටු වෙනවා.

ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය යටතේ අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක වෙනවා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මතු කළා, පසු ගිය වර්ෂ කිහිපයේ සිට වකුගඩු උවදුර පවතින ප්‍රදේශයක් වන අපේ ප්‍රදේශය ගැන අපේ රජය අවධානය යොමු කර නැහැ කියලා. එතුමා ඒ ප්‍රකාශය කිරීම ගැන මා කනගාටු වෙනවා. අපේ රජය, අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත, ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාගේ මෙහෙයවීම යටතේ වැදගත් ව්‍යාපෘති රාශියක් ඒ සම්බන්ධයෙන් මේ වන විට ක්‍රියාත්මක කරනවා. සමහර ඒවායේ වැඩ මේ වන විට අවසාන කර තිබෙනවා.

එතුමා දැයට කිරුළ සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙනුත් කථා කළා. මා ඉතාම සතුටෙන් කියනවා, අපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 23ම ආවරණය වන ආකාරයට දැයට කිරුළ හරහා ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වුණ බව. ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 23ම ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවලට අමතරව, ඔයාමඩුව ජල යෝජනා ක්‍රමය, තන්තිරිමලේ ජල යෝජනා ක්‍රමය, විහාර ගම්මාන ජල යෝජනා ක්‍රමය මූලික වුණා. ඒ වාගේම තන්තිරිමලේ ජල යෝජනා ක්‍රමයේ දෙවන අදියර දැන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මේ සඳහා යන වියදම රුපියල් මිලියන 830යි. ඒ ව්‍යාපෘතියේ ජල ප්‍රතිලාභීන් සංඛ්‍යාව හරියටම ලක්ෂයක් හැටියට ගණන් බලා තිබෙනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීවත් වෙන වැඩි ජනතාවක් වකුගඩු උවදුරට ගොදුරු වී සිටිනවා. ඒකට නිශ්චිතම හේතුව ජලය නොවුණාට, ජලය එක හේතුවක් වෙනවා.

අනුරාධපුර උතුර ජල යෝජනා ක්‍රමය ලබන වර්ෂයේදී ආරම්භ කරනවා. ඒ ආරම්භ කිරීමත් සමඟම රඹෑව, මැදවච්චිය, කහටගස්දිගිලිය, හොරොව්පතාන, පදවිය, කැබිතිගොල්ලෑව සහ දැනට මිහින්තලා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පානීය ජලය නොලැබෙන කොටස ආවරණය වෙනවා.

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

අනුරාධපුර උතුර ජල යෝජනා ක්‍රමය ආරම්භ වීමත් සමඟම ඒ තුළින් අපේ දිස්ත්‍රික්කයේ ජලය නොලැබෙන ප්‍රධාන ප්‍රදේශ සියල්ලම පාහේ ආවරණය කිරීමේ හැකියාව අපට ලැබෙනවා. ඊට අමතරව දැනට අපේ ජල ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක වෙනවා. නුවර වැව, තිසා වැව සහ තුරුවිල. මේ ජල යෝජන ක්‍රම තුන වැඩි දියුණු කරලා, වැඩි පාරිභෝගික සංඛ්‍යාවකට ජල සම්බන්ධතා ලබා දෙන්න අවශ්‍ය කටයුතු මේ වන විට සකස් වෙමින් තිබෙනවා. ඉදිරි වර්ෂ කිහිපය තුළදී ඒවා ක්‍රියාත්මක කරනවා. එක්සත් ජාතික පක්ෂය එදා කිව්වේ ඔවුන් බලයට පත් වුණාට පස්සේ පැය 24ක් ඇතුළත තුරුවිල වාගේ ජල යෝජනා ක්‍රම නවත්වනවා කියලායි. හැබැයි, අද මේ රජය නිවැරදිව ක්‍රියාත්මක වෙලා කටයුතු කිරීම තුළ 150,000කට වඩා ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට පිරිසිදු පානීය ජලය සම්පාදනය වෙනවා. තඹුත්තේගම ජල යෝජනා ක්‍රමය, ගලෙන්බිඳුණුවැව ජල යෝජනා ක්‍රමය වාගේ ව්‍යාපෘති කිහිපය ක්‍රියාත්මක වීමත් සමඟම අපේ දිස්ත්‍රික්කයේ දළ වශයෙන් ලක්ෂ හතක ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට -අපි ගණන් හදලා බැලුවා- පිරිසිදු පානීය ජලය සැපයීමේ හැකියාව ලැබෙනවා. මේවා දීර්ඝ කාලීන ව්‍යාපෘති; වර්ෂ කිහිපයක් ක්‍රියාත්මක වන ව්‍යාපෘති.

දැනට drinking and cooking requirement එකට ජනතාවට අවශ්‍ය ජලය ලබා දීම සඳහා ජංගම වැඩ පිළිවෙළක් අපේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගත්තොත් දැනට පිරිසිදු කළ ජලය -බීමට සහ ආහාර පිසීමට අවශ්‍ය ජල පහසුකම - ජනතාවට ලැබෙනවා. ඒ ජලය පිරිසිදු කරලා ටැංකිවලින් අරගෙන ගිහිල්ලා පාරිභෝගිකයන්ට බෙදා දීම කරනවා. ඊට අමතරව අපේ ප්‍රදේශයේ නියමු ව්‍යාපෘතියක් හැටියට ජල පෙරනයන් උපයෝගී කර ගෙන පිරිසිදු ජලය සැපයීම කරනවා. මූලික ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හැටියට මැදවච්චිය, හොරොව්පතාන සහ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුන මේ වන විට ඒ නියමු ව්‍යාපෘතියට ඇතුළත් කරලා ජල පෙරනයන් පාවිච්චි කරලා පිරිසිදු කරන ලද ජලය ජනතාවට බෙදා හැරීම කරනවා.

ඉතින් මම කනගාටු වන්නේ, රජය මේ ආකාරයට ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දෙන්න දීර්ඝ කාලීන වැඩසටහන් ක්‍රියාත්මක කරලා කටයුතු කරද්දී, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා, ශක්‍යතා වාර්තා හදලා අවශ්‍ය කටයුතු කරද්දී, ඒ දීර්ඝ කාලීන ව්‍යාපෘති ක්‍රියාත්මක වන තෙක් drinking and cooking requirement එකට ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දෙන්න ජංගම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරද්දී, ඒ වාගේම මේ විධියේ ජංගම සේවා පවත්වලා බවුසර් මඟින් ජනතාවට අවශ්‍ය ජලය බෙදා දෙන්න කටයුතු කරද්දී, මේ රජය විසින් අපේ ප්‍රදේශවල ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දෙන්න කිසිම උත්සාහයක් දරන්නේ නැහැයි කියලා සමහර කණ්ඩායම් පවසන එක ගැනයි. මම ඉතාමත්ම සතුටින් කියනවා, ලබන අවුරුද්දේ ඉඳලා මේ ව්‍යාපෘතිය ආරම්භ කරන බව. ඒ වාගේම මහනෙළුවැව ව්‍යාපෘතිය ආරම්භ වෙලා ක්‍රියාත්මක වෙනවා. ඉදිරි මාස කිහිපය තුළ දී අපි ඒ ව්‍යාපෘතිය විවෘත කරනවා; ජනතා අයිතියට පත් කරනවා.

මේ විධියට වැඩි අවධානයක් යොමු කරලා ජනතාවට අත්‍යවශ්‍ය පිරිසිදු පානීය ජලය ලබා දෙන්න අතිගරු ජනාධිපතිතුමා ඒ මැදිහත්වීම කරනවා. විශේෂයෙන්ම ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා නිතරම අපේ ප්‍රදේශවලට ඇවිල්ලා ඒ අවශ්‍යතා සොයා බලනවා. මෙන්න මේ ආකාරයට තමයි අපි අපේ ප්‍රදේශවල ජනතාවට සහන ලබා දෙන්නේ.

ගරු අමාත්‍යතුමනි, අනුරාධපුර උතුර ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී මහකනදරාව ජලාශය ආශ්‍රිතව තමයි එය ක්‍රියාත්මක වන්නේ. අපි නිතරම ඉල්ලීම් කරලා, එකඟතාව පළ වෙලා තිබෙනවා, මොරගහකන්ද ජලාශය හරහා මහකනදරාවට ජලය ගෙනැවිත් ජනතාවට අවශ්‍ය ජල පහසුකම ලබා දෙන්න. ගොවිතැනටත් බාධාවක් නොවී ඒ පහසුකම ජනතාවට බුක්ති විඳින්න හැකියාව ලැබේවිය කියලා අපි බලාපොරොත්තු වෙනවා.

පසු ගිය සති දෙක තුළ පැවැති රැස්වීම්වලදීත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඒ අවශ්‍ය සංවර්ධන කටයුතු කරන්න එකඟතාව පළ කිරීම ගැන අපි සතුටු වෙනවා. 2016 වර්ෂය වෙද්දී මේ පහසුකම් උපරිම වශයෙන් ලබා දීලා අපේ දිස්ත්‍රික්කයේ අපට ආවරණය කරන්න පුළුවන් සියලුම ප්‍රදේශ ආවරණය කිරීමට අවශ්‍ය ශක්තිය ලැබේවි කියලා අපි බලාපොරොත්තු වනවා. මේ වාගේ ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා ජල සම්බන්ධතා ලබා දීලා, අපේ ප්‍රදේශවල ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් වීමත් සමඟම ඔවුන් අලුත් නිවාස හදලා ඒවාට පදිංචියට යද්දී කෙටි දුර ජල සම්බන්ධතා දීර්ඝ කිරීම සඳහා අපට වෙනම ප්‍රතිපාදන ලබා දෙන්න කියලා පාර්ලිමේන්තුවේදී මා ගරු ඇමතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී තිබෙන කාලය අවසන් වෙ‍ගෙනයි යන්නේ. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාටත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමිය ප්‍රමුඛ අමාත්‍යාංශයේ සියලුම නිලධාරින්ටත් ඒ වාගේම අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉන්න ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සියලුම නිලධාරින්ටත් අපේ ස්තුතිය සහ ගෞරවය පුද කරනවා, පිරිසිදු පානීය ජලය ලබා දීමට ඔවුන් අපට ලබා දෙන සහයෝගය සම්බන්ධයෙන්. ඒ වාගේම ඉදිරි කාලය තුළත් ඒ කටයුතු ඉතාමත් ශක්තිමත්ව සහ ඉක්මනින් ඉටු කිරීමට සියලු දෙනාටම ශක්තිය හා ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු දිළුම් අමුණුගම මන්ත්‍රීතුමා.

[අ.භා. 2.49]

**ගරු දිළුම් අමුණුගම මහතා**
**(மாண்புமிகு திலும் அமுனுகம)**
(The Hon. Dilum Amunugama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මහනුවර තිබුණු ප්‍රධානතම ගැටලුව විසඳීම සම්බන්ධයෙන්, මහනුවර දිස්ත්‍රික්කයෙන් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මා විශේෂයෙන් ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත්, මේ රජයටත් ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසය දිහා බලපුවාම අපට පෙනෙනවා, මහනුවර දිස්ත්‍රික්කය විශාල ජල ව්‍යාපෘති හරහා ජලය සපයපු දිස්ත්‍රික්කයක් නොවන බව. අද මෙම වැය ශීර්ෂය පිළිබඳව කථා කෙරෙන්නේත් පරිසර අමාත්‍යාංශයත් ඒකාබද්ධ කර ගෙනයි. ජලයත්, පරිසරයත් කියන දෙක එකට බද්ධව ක්‍රියාත්මක වන කාරණා දෙකක්. ඉතිහාසයේදී මහනුවර ප්‍රදේශයේ ජල මූලාශ්‍ර වුණේ, තමන්ගේ ගම් පළාත්වල පාවිච්චි කරපු ළිං; නළ ළිං. ඒ කාලයේ අපට මතකයි, පිරී ඉතිරී ගිය ඇළ මාර්ගවලින්, ජලාශවලින් තමයි මහනුවර ජනතාව ජලය ලබා ගත්තේ. හැබැයි පරිසරයත් එක්ක ජනතාවගේ යම් ආකාරයක ගැටීම් නිසාම මෑත ඉතිහාසය වන කොට ඒ තත්ත්වය

සම්පූර්ණයෙන් වෙනස් වෙලා අපි ඒ දැකපු දිය පාරවල් සියල්ල මේ වන කොට සිඳී ගොස් ළිංවල ජල මට්ටම පහළට බැහැලා තිබෙනවා.

මහනුවර නගරය ලංකාවේ දෙවැනි නගරය වුණත් පසු ගිය කාල සීමාව තුළ කාන්තාරයක් බවට පත් වුණු තත්ත්වයක් දකින්න ලැබුණා. බවුසර්වලින්, ඒ වාගේම ත්‍රීරෝද රථවලින් කෑන් අරගෙන ඇවිත් නාන්න, බොන්න මහවැලි ගඟෙන් වතුර අරගෙන යන තත්ත්වයට පත් වුණා. මහනුවර නගරය හැරුණු කොට අනෙක් කලාපවල ජනතාවට ඒ කැප කිරීම කරන්න සිද්ධ වුණා. මහනුවර නගර සීමාව තුළ නගර සභාව හරහා ජලය බෙදා හැරියා. ඒ ජල මූලාශ්‍රවලත් ජල මට්ටම් පහළ බැසීම නිසා නොයෙක්වර ජලය විසන්ධි කරන්නත්; රාත්‍රී කාලයට එක පැත්තකටත්, දහවල් කාලයට තව පැත්තකටත් ජලය දෙන්නත් සිද්ධ වුණා. ඒ කාලය තුළ අපට මතකයි, මේ සඳහා ජපන් ආධාර ඉල්ලන්න සැලසුමක් සකස් වුණා.

එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ මහනුවරට ජලය සපයන්න reservoirs 17ක් එහෙම නැත්නම් විශාල ජල ටැංකි 17කින් සමන්විත සැලැස්මක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිරිපත් කළා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ නොයෙකුත් වතාවල මේ යෝජනාව ඉදිරියට ආවත්, විශාල වාර ගණනක් මේ වැඩසටහන පස්සට දමන්න එක්සත් ජාතික පක්ෂය කටයුතු කළා.

අවුරුදු 58ක් එක්සත් ජාතික පක්ෂය මහනුවර මහ නගර සභාව පාලනය කළත් නගර සීමාව තුළවත් පිරිසිදු ජලය බෙදා හැරීමට බැරි තත්ත්වයක් ඇති වීම කනගාටුවට කාරණයක්. හැබැයි අප ආඩම්බර වෙනවා, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා මේ ඇමති ධුරය භාර ගත්තාට පසුව මෙම ප්‍රදේශයේ දැවැන්ත ජල ව්‍යාපෘති දෙකක් ආරම්භ කර තිබීම ගැන. ඉන් එකක් තමයි Greater Kandy කියන ව්‍යාපෘතිය. එහි පළමුවෙනි අදියර සඳහා රුපියල් මිලියන 6,000ක් වියදම් කෙරුවා. ඒ වාගේම එහි දෙවැනි අදියර සඳහා රුපියල් මිලියන 6,500ක් වැය කළා. එයින් මහනුවර නගර සීමාව ඇතුළුව ඒ තදාසන්න ප්‍රදේශත්, හාරිස්පත්තුව ප්‍රදේශයත් ආවරණය වෙනවා. එහි දෙවැනි අදියරේත් වැඩ කටයුතු අවසන් කරලා පසු ගිය මාසය තුළ එතුමාගේම සුරතින් මේ ව්‍යාපෘතිය විවෘත කරලා ජනතාව අතට පත් කරන්න හැකියාව ලැබුණා. ගරු ඇමතිතුමනි, මේක මහනුවර ජනතාවට ඔබතුමා ලබා දුන්න විශාල තෑග්ගක්. මේ ව්‍යාපෘතියේ මුල් අදියර තුළින් මුළු ජනගහනයෙන් ලක්ෂ 5කට ජලය සපයන්න කටයුතු කෙරුණා. එහි දෙවැනි අදියර යටතේ ලක්ෂ 4ක ජනතාවකට ජලය ලබා දෙන්න හැකියාව ලැබුණා. ඒ වාගේම මහනුවර දකුණු ප්‍රදේශය ආවරණය කරන්න තවත් රුපියල් මිලියන 8,000ක ජල ව්‍යාපෘතියක් එතුමා මහනුවරට ලබා දුන්නා. ඒ ගැන අප විශේෂයෙන් එතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ ඇමතිතුමන්ලා වුණත්, ඒ අය තමන්ගේ දිස්ත්‍රික්කයට බෙදන ආකාරය තමයි අප හුඟක් වෙලාවට දැකලා තිබෙන්නේ. නමුත් පළමුවෙනි වතාවට අප මේ දෙය දැක්කා. තමන්ගේ දිස්ත්‍රික්කයට පිටින් මේ වාගේ දැවැන්ත ව්‍යාපෘතියක් ගෙනැල්ලා ඒ පළාතේ ජනතාවට සහාය දීපු අපේ ගරු ඇමතිතුමාට මේ අවස්ථාවේ අපේ ගෞරවය පුද කරනවා. මහනුවර දකුණ ජල ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 8,480ක් වෙන් කරලා මහවැලි ගඟ හරහා වේල්ලක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කළා. 2010 ජනවාරි මාසය වෙන කොට එහි ඉදි කිරීම් කටයුතු අවසන් කළා. එමඟින් උඩුනුවර, යටිනුවර, ගඟවට කෝරළය, බෝලවත්ත, මහකන්ද, හිඳගල, ගඟඉහළ කෝරළය, උඩ පළාත, ගම්පොළ, පිළිමතලාව, පේරාදෙණිය, කඩුගන්නාව, මුරුතලාව, වෙලම්බඩ කියන සියලුම ප්‍රදේශ ආවරණය කරන්න හැකියාව ලැබුණා. අලුත් ජල සම්බන්ධතා 35,000ක් ඇති කළා. ඒ වාගේම පැරණි සම්බන්ධතා 58,000ක් වැඩිදියුණු කළා. මහනුවර දකුණ ජල ව්‍යාපෘතිය හරහාත් එවැනි විශාල සේවයක් අපට ලබා දෙන්න කටයුතු කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම නැවත වාරයක් එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, මහනුවර දිස්ත්‍රික්කයේ තව ඉතුරු වෙලා තිබෙන ප්‍රදේශ ලබන වර්ෂයේ සැලසුම්වලට ඇතුළත් කරලා ජල සැපයුම් ලබා දෙන්න ඔබතුමා කටයුතු කරයි කියලා අප හිතනවා. විශේෂයෙන් ගලගෙදර ව්‍යාපෘතිය, Kandy North Integrated Project එක හරහා මහනුවර උතුරු ප්‍රදේශයට ජලය ලබා දෙන්නත්, දැඩි දුෂ්කර ප්‍රදේශයක් වන හසලක ප්‍රදේශයටත්, ගලහ -දෙල්තොට ප්‍රදේශයටත් ජලය ලබා දීම සඳහා ඒ ව්‍යාපෘතිවලට ඇතුළත් කිරීම පිළිබඳව ඔබතුමාට අපේ හදපිරි ස්තුතිය පුද කරනවා. ඒ වාගේම හැකි ඉක්මනින් ඒ ව්‍යාපෘතිවල වැඩ කටයුතු අවසන් කරලා අපට ඒවා භාර දෙන්න ඔබතුමාට ශක්තිය හා ධෛර්ය ලැබේවායි කියලා අප ප්‍රාර්ථනා කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේ කථාව අප අහගෙන හිටියා. මේ අමාත්‍යාංශය මේ රටේ ජනතාවට පිරිසිදු ජලය ලබා දෙන්න මුදල් වෙන් කළේ නැති හෝ නැත්නම් අඩුවෙන් මුදල් වෙන් කරපු බවක් තමයි එතුමා සඳහන් කළේ. ඔබතුමන්ලා මහනුවරට ඇවිල්ලා බලන්න, මේ වෙන කොට ඒ ප්‍රදේශවල මාර්ග පද්ධතියේ කටයුතු සියයට සියයක් අවසාන වෙමින් පවතිනවා. අප විශ්වාස කරනවා ඔබතුමාගේ ආශිර්වාදය ඇතිව 2013 සහ 2014 වර්ෂ අවසාන වන විට මහනුවර ප්‍රදේශයට පිරිසිදු පානීය ජලය ලබා දීමේ කටයුත්ත සියයට සියයක් සාර්ථකව කර ගන්න පුළුවන් වෙයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා අදට විතරක් හරියන විධියට හදපු ව්‍යාපෘති නොවෙයි.

අතිගරු ජනාධිපතිතුමා ගිහිල්ලා මෑත කාලයේ ඒ ව්‍යාපෘති අධීක්ෂණය කෙරුවා. ඒවා තාක්ෂණය අතින් ඉතාම ඉහළයි. GSM තාක්ෂණය හරහා තමයි ඒ සියලුම ජලාශවල ජල මට්ටම් පාලනය කරන්නේ; ඉහළ පහළ දැමෙන්නේ. මේ නඩත්තු කටයුතු කෙරෙන්නේ GSM තාක්ෂණය හරහා, ඒ ඉංජිනේරුවන් හා ජලසම්පත් මණ්ඩලයේ ප්‍රධාන මෙහෙයුම් කාර්යය සඳහායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප බෙහෙවින් සතුටු වෙනවා. අවුරුදු 58ක් තිස්සේ එක්සත් ජාතික පක්ෂයේ බල කොටුවක්ව තිබුණු මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයේ ජනතාවට බොන්න වතුර ටිකක් දීගන්න ඔවුන්ට බැරි වුණා. අවුරුදු 58කට පස්සේ - පසු ගිය වතාවේ- අප ඒ නගර සභාව අත්පත් කර ගත්තා. ඉතාම කෙටි කලක් ඇතුළත ඒ සියලුම දේ සම්පූර්ණ කරන්න අපට හැකියාව ලැබිලා තිබෙනවාය කියන කාරණයත් මතක් කරන්න අවශ්‍යයි. විශේෂයෙන්ම "දැයට කිරුළ" වැඩසටහන මුදල් නාස්තියක් කියන කාරණය, නගර අලංකරණය කියන දේ මුදල් නාස්තියක් කියන කාරණයත් අපේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා සඳහන් කෙරුවා.

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමාත් එක කාලයක් UDA එක භාර ඇමතිවරයා හැටියට කටයුතු කෙරුවා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට අප ආරාධනා කරන්න කැමැතියි, අද හවසට මේ පාර්ලිමේන්තුව එහා පැත්තේ තිබෙන ඒ ප්‍රදේශයට එන්න කියලා. අද වේලාවක් නැත්නම් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඕනෑම දවසක ඒ පැත්තට ගිහිල්ලා බලන්න.

අද උදේ අපි රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට ගිහිල්ලා කථා කෙරුවා. ගරු ඇමතිතුමනි, ඒ නගර අලංකරණය යටතේ ඒ හදපු ව්‍යායාම තීරුවල, ඒ ක්‍රීඩාංගණවල

[ගරු දිළුම් අමුණුගම මහතා]

අද හවස් වෙන කොට ඇඟිල්ලක් ගහන්න ඉඩ නැහැ. මේවායේ ඇවිදින්න එන්නේ තරු පහේ හෝටල්වල ජීම්වලට යන අය නොවෙයි. මේ වායේ ඇවිදින්නේ මේ රටේ ඉන්න අහිංසක දුප්පත් ජනතාවයි. මේ නගර අලංකරණය කියන කාරණය ගැන කථා කරනවා. පසු ගිය වතාවේ වැස්ස ගමන් අපේ පාර්ලිමේන්තුවත් යට වුණා. ස්කැමල්වල තමයි අපේ මන්ත්‍රීතුමන්ලාට පාර්ලිමේන්තුවට එන්න වුණේ. ඒ ප්‍රශ්නය විසඳන අතරේ මේ පළාත පරිසරය පැත්තෙන් ඉතාම සුන්දර තත්ත්වයකට පත් කරලා තිබෙනවා. ඒ වාගේම මේක දුප්පත් ජනතාව වෙනුවෙන් කරපු නගර අලංකරණයක් කියන කාරණයත් මතක් කරන්න අවශ්‍යයි.

"දැයට කිරුළ" ගැන ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා දොස් කිව්වා. හැබැයි ඒ ප්‍රදේශ සංවර්ධනය කරලා ඒ හරහා යම් කිසි සැණකෙළියක ස්වරූපයක් ගන්න එක අපි නැහැය කියන්නේ නැහැ. ඒක අවශ්‍යයි කියන කාරණයත් අපි විශ්වාස කරනවා. හැබැයි මේක ආරම්භ කළේ කවුද කියන එක එතුමාට අද අමතක වෙලා තිබෙන බව පේනවා. මොකද එතුමාගේ පියා තමයි මේ රටේ හිටපු ජනාධිපතිතුමා. "ගම්උදාව" වැඩ පිළිවෙළ නරකයි කියන්නේ නැහැ. ඒක හොඳ වැඩ පිළිවෙළක්. ඒ හරහා තමයි ඒ සැණකෙළි ස්වරූපයෙන් ඒ කටයුතු කරන්න යෙදුණේ. ඒ නිසා මම හිතනවා, බිලියන ගණනක සංවර්ධනයක් කරලා, එක දවසක් සැණකෙළියක් පවත්වන එක ඒ හැටි නරක කාරණයක් නොවෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. ජල සම්පත් මණ්ඩලය ගැන යමක් මතක් කරන්න අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, ඒ අයත් එක්ක කටයුතු කරන කොට අපට හිතෙනවා, රජයේ අංශයක් නොවෙයි, පෞද්ගලික අංශයත් එක්ක තමයි අපි කටයුතු කරන්නේ කියලා. මොකද ඒ තරමටම කාර්යක්ෂමව ඒ සේවය ජනතාවට සපයනවා. ඒ සම්බන්ධව ජල සම්පත් මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු සියලු දෙනාටමත් ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.59]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் பிரதி அமைச்சர்)

(The Hon. S.M. Chandrasena - Deputy Minister of Agrarian Services and Wildlife)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ, වාරි මාර්ග විෂය පිළිබඳවයි. මෙම අය වැයේදී අතිගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට වාරි මාර්ග කටයුතු සඳහා බිලියන 40ක පමණ විශාල මුදලක් වෙන් කරලා දීලා තිබෙනවා. මේ මුදල විශාල ආයෝජනයක් හැටියට තමයි එතුමා ලබා දීලා තිබෙන්නේ. අපේ රට කෘෂිකාර්මික රටක් හැටියට සංවර්ධනය කොට කෘෂිකර්මය දියුණු කරන්න නම් ගොවිතැන දියුණු කරන්න වෙනවා. ගොවිතැනට අවශ්‍ය කරන ප්‍රධාන සාධකය තමයි ජලය. ඒ නිසා මේ ජලය ආරක්ෂා කරන්න වැව්, අමුණු හදන්න, මුහුදට ගලාගෙන යන ජලය රට මැද නවත්වා ගන්න අවශ්‍ය ඒ ව්‍යාපෘති සඳහා තමයි මේ මුදල වෙන් කරලා තිබෙන්නේ. අපි දන්නවා, අපේ අතිගරු ජනාධිපතිතුමා මේ රටේ රාජ්‍ය නායකයා හැටියට පත් වුණාට පස්සේ විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් කරලා තිබෙනවා කියා. ඔක්කෝම ගැන මට කථා කරන්න වේලාවක් නැහැ. විශේෂයෙන්ම රජරට සහ උතුර සඳහා කරලා තිබෙන ව්‍යාපෘති කිහිපයක් පිළිබඳව පළමුවෙන්ම කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මොරගහකන්ද ජලාශය ගැන නොයෙකුත් විවේචන කළා. මොරගහකන්ද ජලාශය හදන එක 1970 සමඟි පෙරමුණු ආණ්ඩුව කාලයේ තමයි යෝජනා කළේ.

එදා හිටපු මෛත්‍රිපාල සේනානායක ගරු ඇමතිතුමාගේ කාලයේ තමයි ඒ යෝජනාව ගෙනාවේ. මහවැලියේ හයවැනි මහා ජලාශය හැටියට මෙම කටයුත්ත කරන්න අවුරුදු ගණනාවක් අපි බලාපොරොත්තුවෙන් හිටියා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ අවුරුදු 18 තුළත් ඒ කටයුත්ත කරන්න බැරි වුණා. ඒ වාගේම අපේම ආණ්ඩුව යටතේත් අවුරුදු 11ක් තුළත් අපට ඒ කටයුත්ත කරන්න බැරි වුණා. නමුත් අපේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රට භාර ගත්තාට පස්සේ ඒ දැවැන්ත ව්‍යාපෘතිය පටන් ගත්තා. මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය කාටවත් කරන්න බැරුව තිබුණු එකක්. අත ගහන්න භයෙයි හිටියේ. නමුත් අද උතුරුමැදට විතරක් නොවෙයි, නැඟෙනහිරටත් පානීය ජල පහසුකම් දෙන්න මේ ව්‍යාපෘතියෙන් කටයුතු කරනවා. ඒ වාගේම උතුරුමැද මහ ඇළෙන් ඉරණමඩු වැව දක්වා ජලය ගෙන යන්න සියලුම කටයුතු දැනට සැලසුම් කරගෙන යනවා.

තමුන්නාන්සේලා දන්නවා, එදා ප්‍රභාකරන්ට යට වෙලා තිබුණු කිලිනොච්චි ප්‍රදේශය ගැන. උතුරුමැද මහ ඇළෙන් කිලිනොච්චිය ප්‍රදේශයේ ඉරණමඩු වැව දක්වා ජලය අරගෙන යන්න සැලසුම් කරගෙන යනවා. අපේ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කිව්වා, මේ සඳහා වන ජීවී සහ පාරිසරික ප්‍රශ්න තිබෙනවා කියලා.

මම එතුමාට කිව්වා ඒ ඇළ හරහා උතුරු මැදට ජලය අරගෙන යනවා නම් ඊට යට වන, වනජීවී දෙපාර්තමේන්තුවට අයිති සියලු ඉඩම් නිදහස් කරලා දෙන්න මම කටයුතු කරනවාය කියලා. මොකද, ඒ ව්‍යාපෘතිය ඒ තරම් වැදගත්. එය ඉරණමඩු වැවෙන් නවතින්නේ නැහැ. ඉරණමඩු වැවේ ඉඳලා යාපනය දක්වා ජල පහසුකම් ලබා දෙන්නත් අපේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ අමාත්‍යාංශය මඟින් මේ හරහා කටයුතු කරනවා. මේවා තමයි රටේ ජාතික ආයෝජන කියන්නේ. මේවා ආවාට ගියාට පොඩි පොඩි සිල්ලර වැඩ කරනවා වාගේ නොවෙයි. මේවා දැවැන්ත ව්‍යාපෘති. මේවා, ත්‍රස්තවාදයට යට වෙලා හිටපු උතුරේ ජනතාව වෙනුවෙනුයි කරන්නේ. උතුරේ සමහර මන්ත්‍රීවරු කියනවා වැඩක් කෙරුණේ නැහැ කියලා. මේ දීර්ඝ කාලීන ව්‍යාපෘති අපේ සියලු ජනතාව වෙනුවෙනුයි. සිංහලද, දෙමළද, මුස්ලිම්ද, මොන පළාතද, මොන ජාතියද කියලා නොසලකා එකම ජාතියක් හැටියට සලකා එකම රටක් හැටියට සංවර්ධනය කරන කොට ඒ වාගේ ව්‍යාපෘති කරන්න ඕනෑ. ඒ නිසා අපි දැන් ඒ කටයුතු කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ දැඩි නියඟයකට ගොදුරු වුණා මහවැලියෙන් පෝෂණය වන අපේ කලා වැව ඇතුළු ප්‍රදේශ. ඒ වන කොට මොරගහකන්ද ජලාශය හදලා තිබුණා නම් ඒ වාගේ නියඟයකින් අප පීඩා විඳින්නේ නැහැ කියන එක අපි ස්ථිරවම දන්නවා. ඒ ගැටලුවට විසඳුම් හැටියට තමයි අද මේ ව්‍යාපෘති කරගෙන යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අතිගරු ජනාධිපතිතුමා ඉතිහාසගත වෙනවා. අපේ ඉතිහාසය ගත්තාම, අපේ රටේ රජවරුන් එකසිය ගණනක් -එකසිය අසූදෙදෙනෙක් පමණ- රජකම් කර තිබෙනවා. ඒ අතරින් අදත් අපේ ජනතාවගේ හදවත්වල ඉන්නේ මහා පරාක්‍රමබාහු රජතුමා, මහසෙන් රජතුමා, අග්බෝ රජතුමා, ධාතුසේන රජතුමා, වසභ රජතුමා වාගේ රජවරුන් හතර පස් දෙනෙක් පමණයි. ඒ අය තමයි විශාල වැව් අමුණු සංඛ්‍යාවක් හදලා කෘෂිකර්මය දියුණු කළේ. ඒ රජ පෙළපත

දිහා බැලුවාම, අපේ ඉතිහාසයේ රාජ්‍ය නායකයන් දිහා බැලුවාම ජනතාවගේ හදවත් තුළ අදත් ජීවත් වන්නේ මේ රජවරුන් ටික දෙනායි. ඒකට හේතුව එතුමන්ලා කෘෂිකර්මය දියුණු කරන්න කටයුතු කිරීමයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේ ගරු මොහාන් පී. ද සිල්වා මන්ත්‍රීතුමා මූලසුනට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு,* மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா அவர்கள் *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. UDITH LOKUBANDARA *left the Chair, and* THE HON. MOHAN PRIYADARSHANA DE SILVA *took the Chair.*

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් කෘෂිකර්මය දියුණු කරන්න මහා වැව්, වාරි මාර්ග හදපු, මුහුදට ගලා ගෙන යන සෑම ජල කඳක්ම හරවලා මුහුද වාගේ විශාල වැව් හදපු රජවරුන් තමයි අපේ ජනතාවගේ හදවත්වල අදත් ජීවත් වන්නේ. ඒ වාගේම අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් ඉතිහාසයට එකතු වෙනවා. වැඩිම වැව් සංඛ්‍යාවක්, ඔයවල් සංඛ්‍යාවක් අද හදලා තිබෙනවා. අපේ ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමාගේ වයඹ පළාතටත් දැදුරු ඔය හරවනවා. ඒක හොඳයි නේද ගරු මන්ත්‍රීතුමනි?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

හොඳයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

මම හිතුවා උදේ ඔබතුමාගේ කථාවේදී ඒ ගැන කියාවි කියලා. නමුත් කිව්වේ නම් නැහැ. දැදුරු ඔය ව්‍යාපෘතිය හීනයක් වෙලායි තිබුණේ. දැන් ඒ කටයුත්ත කරනවා. ඒ වාගේම අනුරාධපුරයේ යාන් ඔය-

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු ඇමතිතුමා,-

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

මට සුළු කාලයක් තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මම හිටියා නම් මෙලහකට ඒක හදලා ඉවරයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

එහෙම කරන්නේ ඔබතුමා හිටියා නම් නේ. හිටපු නැති එකයි ප්‍රශ්නය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යාන් ඔය ව්‍යාපෘතිය මඟින් ඇල්ලපොතානෙන් යාන් ඔය හරවලා පදවිය දක්වා වතුර ගෙන යන්න කටයුතු කරනවා. පදවිය ප්‍රදේශයේ ජනතාව නියඟයෙන් සැහෙන්න පීඩා විඳිනවා. හුරුලු වැවේ ඉඳන් කිලෝමීටර් 72ක් දක්වා විශාල ජල කඳක් පුල්මුඩෙන් මුහුදට ගියා. මම වාරිමාර්ග නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේයි ඒ ව්‍යාපෘතිය පටන් ගත්තේ. 2013 වන කොට ඒ වැඩ අවසන් කරන්න මුදල් වෙන් කර තිබෙනවා මම දැක්කා. අපේ ගරු ඩබ්ලිව්.බී. ඒකනායක නියෝජ්‍ය ඇමතිතුමාත්, මමත් ගිහින් දෙවන කොටසෙහි වැඩ පටන් ගත්තා. අපි පදවියට -පදවිය වැවට- වතුර දෙනවා 2013 දී. ඒ වාගේම, අතිගරු ජනාධිපතිතුමා ගිහින් මුල් ගල් තැබීමෙන් පසු පහළ යාන් ඔය ව්‍යාපෘතියේ වැඩ පටන් ගෙන තිබෙනවා. මැදවච්චිය ආසනයට විතරක් නොවෙයි, සිරිපුරට, ඊට එහා පැත්තෙන් තිබෙන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කොටසකට පහළ යාන් ඔය ව්‍යාපෘතියෙන් ජලය ලබා දෙනවා. මේ වාගේ විශාල ව්‍යාපෘති කරනවා. රට පුරාම කෙරෙන සංවර්ධන කටයුතු ගැන කියන්න මට වෙලාවක් නැහැ. මේ විධියට විශාල සංවර්ධනයක්, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මඟින් කරනවා. ඒකයි මා කිව්වේ අර කලින් කියපු රජවරුන් වාගේම අපේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් ඉතිහාසගත වෙනවා කියලා. ඒ ව්‍යාපෘති කළ යුතුයි. මොකද, ඒවා තමයි අපේ අනාගත පරම්පරාවට කරන ආයෝජන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන් තවත් කාරණයක් කියන්න ඕනෑ. ඒ කාරණය, වැව්වල රොන් මඩ ඉවත් කිරීම ගැනයි.

අතිගරු ජනාධිපතිතුමා, වාරි මාර්ග කටයුතුවලට සම්බන්ධ ඇමතිවරුනුත් -නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා, ඩබ්ලිව් බී. ඒකනායක නියෝජ්‍ය ඇමතිතුමා, මම- ගොවි නායකනුත් කැඳවූ වෙලාවේ ගොවි නායකයෝ කිව්වා, "අවුරුදු ගණනක් තිස්සේ මේ වැව්වල බැම්ම - bund එක- හදනවා, නමුත් වැව් හැරුවේ නැහැ, ජලය රඳවා ගන්න බැහැ, ජලය ගබඩා කිරීම අඩුයි, ඒ නිසා රොන් මඩ ටික ඉවත් කරලා වැව් ටික හාරලා දෙන්න" කියලා. එතුමා ඒක පිළි අරගෙන පසුවදාම අපිට උපදෙස් දුන්නා, මේ නියඟය වෙලාවේ වැව්වල රොන් මඩ ඉවත් කරන්න, කලා වැවේ ඉඳලා වැව් ටික හාරන්න පටන් ගන්න කියලා. කලා වැව වාගේ මහා ජලාශ, මධ්‍යම පරිමාණයේ වැව් සහ සුළු වාරි මාර්ග සියල්ලේම අද ඒ වැඩ කටයුත්ත ආරම්භ කරලා තිබෙනවා. එය ඉතාම සාර්ථකයි. ජනතාව ඉතාම කැමැත්තෙන් මේ වැඩ පිළිවෙළ වැළඳ ගෙන ඉන්නවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

තත්පරයක් දෙන්න.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
**(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)**
(The Hon. S.M. Chandrasena)

අනේ! විනාඩි දහයයි තිබෙන්නේ, ගරු ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා. අපි මේ වැව් හැරිල්ල පටන් ගත්තා. සමහර අපේ ඉංජිනේරුවරු අපිත් මුළා කළා. Hardpan එක යනවා කිව්වා, සිවිය විනාශ වනවාය කිව්වා, වැව් පතුල කැඩෙනවාය කිව්වා. නමුත් අපි මේ වන කොට රොන් මඩ ඉවත් කරනවා. ඒක ඉතාම සාර්ථකයි. එහෙම මොනවත් ප්‍රශ්නයක් වෙලා නැහැ. අපේ රටේ මහා වැව්, මධ්‍යම පරිමාණයේ වැව් හා සුළු වැව් 30,000ක් විතර තිබෙනවා. 2014 අවුරුද්දේ අපි බලාපොරොත්තු වනවා, මේ සියල්ලේම රොන් මඩ ඉවත් කරලා, විශාල ජල ප්‍රමාණයක් ගබඩා කරන්න. අපි අලුතින් වැව් හැදුවත් නැතත් මේ වැව්වල ජල ධාරිතාව සියයට 15කින් වැඩි කරන්නයි කටයුතු කරන්නේ. අද අපිට තිබෙන වැව් සංඛ්‍යාව අනුව විශාල ජල ධාරිතාවක් මේ මාර්ගයෙන් අපට ගබඩා කරන්න පුළුවන් වෙනවා. රොන් මඩ ඉවත් කිරීම ඉතාම හොඳ වැඩක්. ඒක අනාගත පරපුරට කරන ආයෝජනයක් හැටියට අපි දකිනවා.

ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, අපේ වැව්වල රක්ෂිත විනාශ වෙලා ගිහිල්ලා තිබෙනවාය කියන කාරණය. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් අපට පැළ වර්ග ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. මහා වැව්වල, මධ්‍යම පරිමාණයේ වැව්වල වාගේම සුළු වාරි මාර්ග සියල්ලේ රක්ෂිතවල ගස් සිටුවලා පැරැණි විධියට ඒ සංස්කෘතිය රැක ගනිමින්, ඒ ගමේ වැව ආරක්ෂා කරන්න කටයුතු කරනවාය කියන එක මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
**(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)**
(The Hon. S.M. Chandrasena)

ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාට, අපේ ඩබ්ලිව්.බී. ඒකනායක නියෝජ්‍ය ඇමතිතුමාට, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමාට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මේ රටේ රාජ්‍ය නිලධාරියෙක් හැටියට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා විශාල වැඩ කොටසක් කරනවාය කියන කාරණයත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)

ඊළඟට ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 55ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.10]

**ගරු බුද්ධික පතිරණ මහතා**
**(மாண்புமிகு புத்திக பதிரண)**
(The Hon. Buddhika Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳවත්, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය පිළිබඳවත්, පරිසර අමාත්‍යාංශය පිළිබඳවත් වැය ශීර්ෂ විවාදයට ගන්නා අද දවසේදී මගේ අදහස් ස්වල්පයක් එයට එක්කාසු කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමෙරිකා එක්සත් ජනපදයේ ටෙනසි මිටියාවත පිළිබඳව ලියවුණු සටහනක සඳහන් වෙලා තිබෙනවා, "එකිනෙකා සමඟත් ජලය, එළිය, බලය හා පස සමඟත් වැඩ කිරීමෙන් මානවයාට යම් කිසි මිටියාවතක මුහුණුවරත්, එහි ජීවිතයත් වෙනස් කළ හැකියි" කියලා. මේ කියන කාරණය අද අපි කථා කරන සන්දර්භය ඇතුළේ හරි වැදගත් කියලා මම විශ්වාස කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අර්ථයෙනුයි මම අද දවසේ අය වැය කාරක සභා අවස්ථාවට මගේ අදහස් ඉදිරිපත් කරන්නේ.

මෙදා අය වැය කථාවේ 21 වැනි පිටුවේ 14(1) යටතේ වාරිමාර්ග සංවර්ධනය පිළිබඳව සඳහන් වෙලා තිබෙනවා. ඒ කොටස ගැන මගේ අවධානය යොමු කරන්න කැමැතියි. එහි සඳහන් වෙලා තිබෙනවා, නිල්වලා ගඟ හැරවීම මඟින් දකුණේ ජල සැපයුම වැඩිදියුණු කිරීමටත් අධ්‍යයනය කරනවාය කියලා. අද අපේ මේස උඩ තියලා තිබෙන වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට අදාළ "ප්‍රගතිය - 2012 හා ආයෝජනය - 2013" නමැති පොතේ 88 වැනි පිටුව ගැන මගේ අවධානය මම යොමු කරන්න කැමැතියි.

88 වන පිටුව බැලුවාම එහි සඳහන් වෙලා තිබෙන්නේ මෙහෙමයි:

> " දකුණු පළාතේ ගිං හා නිල්වලා ගංගා ද්‍රෝණි වලට මි.මි. 3,000ක වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනයක් ලැබෙයි. මෙම ජලයෙන් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන මුහුදට ගලා යන අතර ගාල්ල හා මාතර දිස්ත්‍රික්කයන්හි පහත් බිම් වලට ගංවතුර හානින්ද ඇති කරයි. එබැවින් මෙම ද්‍රෝණීන් දෙකෙහි අතිරික්ත ජලය ගිනි කොණ දිග වියලි කලාපය පෝෂණය සඳහා හැරවීමට සැලසුම් කෙරේ. "

අය වැය ලේඛනයේදී නිල්වලා ගඟ ගැන පමණක් සඳහන් කරලා, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රගතිය - 2012 හා ආයෝජනය -2013 නමැති පොතේ නිල්වලා ගඟ හා ගිං ගඟ යන දෙකම ගැන සඳහන් කිරීම තුළින් අපට හිතන්න තිබෙන්නේ අය වැය ඉදිරිපත් කළ මුදල් ඇමතිතුමාට ගාල්ලේ ගිං ගඟ අමතක වුණාද, එහෙම නැත්නම් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමා මේ පොතට වැඩිපුර ගිං ගඟ ඇතුළත් කරලා තිබෙනවාද කියන කාරණයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පවුල් 2,50,000කට මේ තුළින් ප්‍රතිලාභ ලැබෙන බව සඳහන් කරනවා. ගිං ගඟත්, නිල්වලා ගඟත් ගිනිකොන දිගට නැත්නම් හම්බන්තොට දිස්ත්‍රික්කයට හැරවීම, දළ වශයෙන් මිලියනයකට ආසන්න දකුණේ ජනතාවකට සෘජුවම බලපාන මහා දැවැන්ත ව්‍යාපෘතියක් විධියටයි මම දකින්නේ. අපි දන්නා දෙයක් තමයි, අවුරුද්දේ වැඩි කාලයක් හම්බන්තොට දිස්ත්‍රික්කය නියඟයෙන් පීඩා විඳිද්දී, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල අපි, ඔබතුමන්ලා ගංවතුරෙන් පීඩාවට පත් වෙමින් ඉන්න බව. එදා, 1931 අකුරැස්ස, මොරවක ප්‍රදේශ නියෝජනය කළ රාජ්‍ය මන්ත්‍රණ සභා නියෝජිතයා විධියට දොස්තර වික්‍රමසිංහ මැතිතුමා නිල්වලා ගඟ ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි කිරීම ගැන කථා කළා.

එදා අකුරැස්සෙන් පැමිණි දොස්තර වික්‍රමසිංහ මැතිතුමා එවකට තිබුණු රාජ්‍ය මන්ත්‍රණ සභාවේත්, පසුව පාර්ලිමේන්තුවේත්, 1972න් පස්සේ ජාතික රාජ්‍ය සභාව තුළත් මේ නිල්වලා ගඟ ආශ්‍රිතව ජීවත් වන, නිල්වලා ගඟ දෙපැත්තේ පෝෂක ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි කිරීම ගැන කථා කළා. ඒ අකුරැස්ස ප්‍රදේශයම නියෝජනය කරන ජනතා නියෝජිතයා විධියට එදා දොස්තර වික්‍රමසිංහ මැතිතුමාගෙන් පසුව මට මේ ගැන කථා කරන්නට අවස්ථාවක් ලැබීම පිළිබඳව අද මම සන්තෝෂ වනවා. ඒ වාගේම මේ අවස්ථාවේදී ගරු ඩිව් ගුණසේකර මැතිතුමා මේ ගරු සභාව තුළ සිටීමත් මාගේ සතුට වැඩි වන්න කාරණයක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා දොස්තර වික්‍රමසිංහ මැතිතුමා 1955 දී ලියන ලද වැදගත් ග්‍රන්ථයක් මම මේ අවස්ථාවේදී පෙන්නුම් කරන්න කැමැතියි. ගිං ගඟේ ජලය, නිල්වලා ගඟේ ජලය ගිනිකොනදිගට ගෙනියන්නේ කොහොමද කියලා එදා දොස්තර වික්‍රමසිංහ මැතිතුමා "ශ්‍රී ලංකාවට ආර්ථික ප්‍රතිපත්තියක්" සඳහා වූ "ඉදිරි මඟ" නමින් මේ ග්‍රන්ථය සම්පාදනය කරන්නට යෙදුණා. නමුත් මේ ග්‍රන්ථයේ තිබෙන කාරණා පිළිබඳව නිදහසෙන් පස්සේ බලයට පත් වුණු, කොළ පාට ආණ්ඩු වාගේම නිල් පාට ආණ්ඩුත් තැකීමක් නොකිරීමේ ශාපයයි අද නිල්වලා ගං මිටියාවතේ ජනතාව, ගිං ගඟේ මිටියාවතේ ජනතාව, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල ජනතාව අනේකවිධ දුක්ඛ දෝමනස්සයන් මැද්දේ විඳිමින් ඉන්නේ කියන එක මම මේ අවස්ථාවේදී ගරු සභාවට කියන්න අවශ්‍යයි.

වික්‍රමසිංහ මැතිතුමා, ඒ ග්‍රන්ථයේ, 9වන පරිච්ඡේදයේ, 48,49,50,51,52 පිටු පුරාවට කියන්නේ 1931 සිට 1955 මේ පොත ලියන තෙක් ඔහු මේ වෙනුවෙන් ගෙන ගිය අරගලයට අදාළ වැදගත් කාරණායි. අද ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවත්, නිල්වලා ගඟ ආශ්‍රිතව ජීවත් වන මාතර දිස්ත්‍රික්කයේ ජනතාවත්, මේ ගංගා දෙකෙන් බලාපොරොත්තු වන්නේ මොනවාද කියන එක මම මේ අවස්ථාවේදී ඉතා පැහැදිලිව සඳහන් කරන්නට කැමැතියි. පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කර ගන්න, කෘෂි කර්මාන්තයට අවශ්‍ය වාරි ජලය ලබා ගන්න, පුළුවන් නම් ජල විදුලිය නිෂ්පාදනය කර ගන්න, කර්මාන්තශාලා සඳහා අවශ්‍ය ජලය ලබා ගන්න, ගව මහිෂාදී සතුන්ගේ සත්ව පාලන කටයුතු සඳහා අවශ්‍ය ජලය ලබා ගන්න, ඒ වාගේම පානීය නොවන වෙනත් මානව අවශ්‍යතා සඳහා යොදා ගන්න, ශාක හා සත්ව සංහතියේ පැවැත්ම සඳහා අවශ්‍ය ජෛව විවිධත්වයේ ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වා ගෙන යන්නයි මේ ජල මූලාශ්‍ර දෙක අපට වැදගත් වන්නේ කියලා මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන කොට අපි දන්නා දෙයක් තමයි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ -නිරූපමා රාජපක්ෂ මන්ත්‍රීතුමිය නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ- ජනතාවට, අර මම සඳහන් කළ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල ජනතාවට තිබෙන ජල අවශ්‍යතාවට අමතරව තවත් ජල අවශ්‍යතා ගණනාවක් ඇති වෙලා තිබෙන බව.

මත්තල ගුවන් තොටුපොළට, හම්බන්තොට ජාත්‍යන්තර වරායට, ඒ වාගේම ටෙලි සිනමා ගම්මානයට, ගොවි ජනතාවට සහ පානීය ජල අවශ්‍යතාවලට කියන ඒ සියලු ක්ෂේත්‍රවලට හම්බන්තොට ජල අවශ්‍යතාවක් ඇති වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමස්තයක් විධියට බැලුවොත් ඔබතුමා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයට, මා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කයට, ඩිව් ගුණසේකර මැතිතුමා ජන්ම ලාභය ලැබූ මාතර සහ ඥාති මිත්‍රකම් තිබෙන හම්බන්තොට දිස්ත්‍රික්කයට, නිරූපමා රාජපක්ෂ ගරු නියෝජ්‍ය ඇමතිතුමිය නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයට අද බරපතළ විධියට මේ ජලය කළමනාකරණය කර ගැනීමේ අවශ්‍යතාව පැන නැඟිලා තිබෙනවා කියන කාරණය අමතක කරන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපට අවශ්‍ය වෙන්නේ හුදකලාව ජල සම්පාදන මණ්ඩලය, එහෙම නැත්නම් ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය තීන්දු ගැනීමකින් එහා ගිය සමෝධානික වැඩ පිළිවෙළකුයි. ඒ සමෝධානික වැඩ පිළිවෙළේදී අමාත්‍යාංශ ගණනාවක් ඒකාබද්ධ වැඩ පිළිවෙළක් ක්‍රියාවට නඟන්න ඕනෑ කියලා මා කියනවා.

ගාල්ල දිස්ත්‍රික්කයට, මාතර දිස්ත්‍රික්කයට හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාළව ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව කෙරෙහි වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා සහ වනජීවී අමාත්‍යාංශය, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, -අභ්‍යන්තර ජලාශ ඇති කරනවා නම් මිරිදිය මත්ස්‍ය වගාව ගැන අවධානය යොමු කරන්න අවශ්‍ය නිසා- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, -මේ ජලාශ්‍රිත ප්‍රදේශවල විදුලිබලාගාර ඇති කරනවා නම් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට වග කීමක් තිබෙනවා- ඊට අමතරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය කියන සියලු අමාත්‍යාංශවල සමෝධානික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක විය යුතුව තිබෙනවා කියලා මා කියනවා. ඒ නිසා මා විශ්වාස කරන්නේ, ඒ සමෝධානික වැඩ පිළිවෙළ වෙනුවෙන් මා සඳහන් කළ සියලු අමාත්‍යාංශ එකතු වෙලා, දකුණු පළාත වෙනුවෙන් ඒකාබද්ධ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක විය යුතුව තිබෙනවා කියලායි.

ඒ වැඩ පිළිවෙළට මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ජනතා නියෝජිතයන්, මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා හා පතල් කාර්යාංශය, පහත් බිම් සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය නොවන සංවිධාන වාගේම විශේෂයෙන්ම මේ ප්‍රදේශවල හද ගැස්ම, නාඩි වැටෙන රිද්මය ගැන මනා අවබෝධයක් තිබෙන ගොවි සංවිධාන පවා එකතු කර ගත යුතුයි කියලා මා මේ අවස්ථාවේදී අවධාරණය කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත සඳහා එහෙම සමෝධානික වැඩ පිළිවෙළක් අපට ගොඩ නඟන්න පුළුවන් නම්, එය පළාත් මට්ටමින් ක්‍රියාත්මක කරද්දී, දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් සමෝධානික වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක විය යුතුව තිබෙනවා. නැත්නම් පළාත් වැඩ පිළිවෙළ පමණක් තිබීමෙන් මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න බැහැයි කියන කාරණයත් මා අවධාරණය කරන්න කැමැතියි. හැකි නම් දකුණේ ජලාශ්‍රිත ශිෂ්ටාචාරය වඩාත් සවිමත් කිරීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් වැනි ප්‍රබල වැඩ පිළිවෙළක් අර සමෝධානික අමාත්‍යාංශ ඒකාබද්ධ වන ආකාරයට පිහිටුවීම ගැනත් මා මේ ගරු සභාවේ අවධානයට යොමු කරවන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරන එවැනි වැඩ පිළිවෙළකට යන තෙක්, දැනට ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළවල් පිළිබඳව දෙවරක් හිතා බැලිය යුතු අවස්ථාත් පැන නැඟිලා තිබෙනවා කියලා මා කියන්න ඕනෑ. මා එහෙම කියන්නේ මොකද? අතීතයේ කඩිමුඩියේ දඩිබිඩියේ නිල්වලා ගඟ යෝජනා ක්‍රමය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ අහිතකර ප්‍රතිලාභ, අහිතකර ප්‍රතිඵල අද නිල්වලා ගං මිටියාවතේ, දෙනියායේ සිට මාතර තොටමුණ දක්වා නිල්වලා ගඟ දෙපැත්තේ ජීවත්වන ජනතාව කනගාටුදායක අන්දමින් භුක්ති විඳින බව මම මේ ගරු සභාවට මතක් කරන්න කැමැතියි. නිල්වලා ගඟ ව්‍යාපාරය විනාශ කිරීමේ, නැත්නම් නිල්වලා ගං කොමළිය දූෂණය කිරීමේ පාපයෙන් කොළ පාට ආණ්ඩුවලට වාගේම, නිල්

[ගරු බුද්ධික පතිරණ මහතා]

පාට ආණ්ඩුවලට වාගේම, දේශ ප්‍රේමීන්ටත් ගැලවෙන්න බැහැයි කියන කාරණය මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. මා එහෙම කියන්නේ ඇයි?

නිල්වලා ගඟ ව්‍යාපාරය පළමුවැනි අදියර ක්‍රියාත්මක කරන කොට කිරලකැලේ කොටසේ හෙක්ටයාර් 1,990ක් ජල ගැල්මෙන් ආරක්ෂා කර ගන්න බලාපොරොත්තුව තිබුණා. ජල ගැල්ම ඇති වීමට පෙර ඒ පිළිබඳව සංඥා ක්‍රමයක් -flood warning system එකක්- දෙනියාය ප්‍රදේශයේ ඇති කරන්නට යෙදුණා. නමුත් 1987-90 වකවානුවේ සමහර දේශ ප්‍රේමීන් යැයි කියා ගන්නා අය එන්සාල් වත්තේ තිබුණු ඒ ගං වතුර දැන ගැනීමේ සංඥා ක්‍රමය -ඒ flood warning system එක- ගිනි තබා දැමූ බවත් අපි මේ අවස්ථාවේ මතක තබා ගන්න ඕනෑ. ඒ නිසා තමයි මම කිවුවේ, කොළ පාට ආණ්ඩුවලට වාගේම නිල් පාට ආණ්ඩුවලටත්, රතු පාට දේශපාලනය කළ අයටත් මේ නිල්වලා ගඟ විනාශ වීමේ පාපයෙන්, නිල්වලා ගං කොමලිය දූෂණය වීමේ පාපයෙන් ගැලවෙන්නට බැහැයි කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම නිල්වලා ගඟ දෙවැනි අදියරේදී, කඩවැද්දුව කොටසේ හෙක්ටෙයාර් 2120ක් ජල ගැල්මෙන් ආරක්ෂා කිරීම, වාරි පද්ධතිය දියුණු කිරීම, කද්දුව කොටසින් හෙක්ටෙයාර් 580ක් සුළු ජල ගැලීම්වලින් ආරක්ෂා කිරීම, අකුරැස්ස ප්‍රදේශය සුළු ජල ගැලීම්වලින් ආරක්ෂා කිරීම, එම ප්‍රදේශයේ හෙක්ටෙයාර් 2315කට වාරි ජලය සැපයීම, බණ්ඩත්තර පාලම, පාලම් දෙකක් වශයෙන් වැඩිදියුණු කිරීම, මාතර සිට හක්මන දක්වා මහා මාර්ගය වැඩි දියුණු කිරීම කියන කාරණා ඇතුළත් වුණා.

තුන් වන අදියරේදී කිරම ආර පිළිබඳ පූර්ණ ශක්‍යතා අධ්‍යයනයක් කරන්න, දෙදියගල ආශ්‍රිතව ආරම්භ වී අකුරැස්සට එකතු වන දිගිලිඔය පිළිබඳව පූර්ණ ශක්‍යතා අධ්‍යයනයක් කරන්න, ඒ වාගේම මාතර නගරය ජල ගැල්මෙන් ආරක්ෂා කර ගන්නට වැඩ පිළිවෙළක් යෝජනා වෙලා තිබුණා. නමුත් අවාසනාවකට 1988-90 කාලයේ පැවැති භීෂණයත් එක්ක, එහි වැඩ කරපු කොන්ත්‍රාත් සමාගම්වල වාහන ගිනි තියලා කරපු විලෝපනයත් එක්ක නිල්වලා ගඟ ව්‍යාපාරයේ තුන් වන අදියරේ කටයුතු සම්පූර්ණයෙන්ම ඇන හිටියා. නිල්වලා ගඟ ව්‍යාපාරයේ තුන් වන අදියර ඇන හිටීමේ සාපය සහ පාඩුව දකුණේ ජනතාව, විශේෂයෙන්ම මාතර දිස්ත්‍රික්කයේ ජනතාව අදත් අත් විඳිනවාය කියන කාරණය මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිල්වලා ගඟ පමණක් නොවෙයි, මාතර දිස්ත්‍රික්කයේ අපේ අනික් වැදගත්ම ජල මූලාශ්‍රය වන්නේ පොල්වත්ත ගඟයි. පොල්වතුමෝදරින් තමයි පොල්වත්ත ගඟ මුහුදට එකතු වෙන්නේ. මා මේ අවස්ථාවේදී අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්න කැමැතියි, නිල්වලා ගඟ ගැන වැඩි අවධානයක් යොමු කරනවා වාගේම පොල්වත්ත ගඟ ගැනත් වැඩි අවධානයක් යොමු කරන්න කියලා. නමුත් මට නියමිත කාලයෙන් වැඩි කොටසක් ගන්න බලාපොරොත්තු වෙන්නේ නිල්වලා ගඟ පිළිබඳව වැඩි අවධානයක් යොමු කොට කථා කරන්නයි.

නිල්වලා ගඟ ලංකාවේ තිබෙන සුවිශේෂී ගංගාවක්. ලංකාවේ එක දිස්ත්‍රික්කයකින් පටන් ගෙන ඒ දිස්ත්‍රික්කයෙන්ම මුහුදට ගලා ගෙන යන ගංගාවක් තිබෙනවා නම්, ඒ එකම ගංගාව තමයි නිල්වලා ගංගාව. ලංකාවේ අනික් හැම ගංගාවක්ම එක දිස්ත්‍රික්කයකින් පටන් ගෙන තවත් දිස්ත්‍රික්ක එකක් හෝ කිහිපයක් පහු කර ගෙන ගිහිල්ලා තමයි මුහුදට ගලා ගෙන යන්නේ. නමුත් එක දිස්ත්‍රික්කයකින් පටන් ගෙන ඒ දිස්ත්‍රික්කයෙන්ම මුහුදට ගලාගෙන යන, ලංකාවේ තිබෙන එකම ගඟ තමයි නිල්වලා ගඟ. ඒ වාගේම ලංකාවේ ගංගා අතරින් තෙවනුවට දිගම ගංගාව වෙන්නේත් නිල්වලා ගඟයි. නිල්වලා ගඟ දෙනියාය, ගොන්ගල කඳු පන්තියේ, බුළුතොට, රක්වාන හෙල්වලින් පටන් ගෙන කබරගල, අනින්කන්ද, පනින්කන්ද, තිබ්බොටුවාගල, කොහිලගල ආදී ප්‍රදේශ මුල් කර ගෙන පැන නැඟි කිලෝ මීටර් 70ක් ගලා ගෙන ඇවිල්ලා තමයි මුහුදට වැටෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිල්වලා ගඟේ තිබෙන තවත් වැදගත්කමක් ගැන මා කියන්න ඕනෑ. නිල්වලා ගඟ මුහුදු මට්ටමේ සිට මීටර් 1050ක් උස ගොන්ගල කන්දෙන් පටන් ගෙන, අකුරැස්ස, බෝපගොඩට කිලෝ මීටර් 36ක් ඇවිත්, මුහුදු මට්ටමේ සිට උස මීටර් 12ක් දක්වා පහත වැටෙනවා. ගඟේ පළමු කිලෝ මීටර් 36 තිබෙන්නේ දැඩි කඳුකර ප්‍රදේශයක් හරහායි. මුහුදු මට්ටමින් මීටර් 1050ක් ඉහළ සිට එන ගඟේ උස මීටර් 12ක් දක්වා පහළ වැටෙනවා. බෝපගොඩ ඉඳලා ගඟ ඉතිරි කිලෝ මීටර් 34 ගලා ගෙන යන්නේ වංගු ගනිමින්, ගඟක වෘද්ධ අවස්ථාව ගත කරමින්. ඒ නිසා තමයි ගඟේ අවසාන කොටසේ කිලෝ මීටර් 34 ඇතුළත වැඩි ගංවතුරක් ඇති වෙන්නේ. නිල්වලා ගඟට ආවේණික ප්‍රදේශයේ පිහිටා තිබෙන භූ විෂමතාව සහ ගඟේ ස්වභාවය, දිගින් දිගටම ජල ගැලීම් ඇති වෙන්න හේතුවක් වන බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම නිල්වලා ගඟේ ජල පෝෂක ප්‍රදේශය වර්ග කිලෝ මීටර් 1000ක් පමණ වෙනවා. වාර්ෂික ජල ධාරිතාව ඝන මීටර් 1000ක් පමණ වෙනවා. නිල්වලා ගඟ ප්‍රධාන අතු ගංගා හයකින් පෝෂණය වෙනවා. කොටපොල ආර, සියඹලාගොඩ ආර, කිරම ආර, හුලන්දා ඔය, දිගිලි ඔය, කඩවැද්දුව ඔය යන ප්‍රධාන අතු ගංගා හයෙන් තමයි නිල්වලා ගඟ පෝෂණය වෙන්නේ. එහෙම පෝෂණය වෙන නිල්වලා ගඟ නිම්න නවයක් ඔස්සේ ගලා ගෙන තමයි මාතරට එන්නේ. කොටපොල නිම්නය, කිරම නිම්නය, සියඹලාගොඩ නිම්නය, හුලන්දා නිම්නය, දෙදියගල නිම්නය, හිග්ගොඩ නිම්නය, නාගොඩ නිම්නය, හච්පෙ නිම්නය සහ කඩවැද්දුව නිම්නය ඔස්සේ තමයි නිල්වලා ගඟ මාතරට එන්නේ. මේ නිසා මාතර දිස්ත්‍රික්කයේ ඇති ඉතා වැදගත් ජල මූලාශ්‍රයක් විධියටයි නිල්වලා ගඟ සැලකිය හැකි වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිල්වලා ගඟ කියන්නේ අපේ ජීවයයි. නිල්වලා ගඟ කියන්නේ අපේ ආත්මයයි. අපේ හදවත් ගැහෙන්නේ නිල්වලා ගඟ ඇසුරින් ලැබුණු ශක්තිය නිසායි. මගේ පියාගේ පියා නිල්වලා ගඟේ ජලයෙන් වගා කරපු කුඹුරුවලින් ලැබුණු ආදායම නිසායි මගේ පියාට විශ්වවිද්‍යාලයට යන්න පුළුවන් වුණේ.

මගේ සීයා අමුඩය ගහගෙන කුඹුරු කොටපු ගොවියකු විදිහට, මළ පොතේ අකුරක් දන්නේ නැති ගොවියකු විදිහට නිල්වලා ගඟ ආශ්‍රයෙන් ලබපු පෝෂණයත් එක්කයි මගේ පියාට විශ්වවිද්‍යාලයට යන්න පුළුවන් වුණේ. එහෙම නම් අපි වාගේ ජනතා නියෝජිතයන් නිර්මාණය වීමට මේ නිල්වලා ගඟෙන් ඇති වූ බලපෑම මා අඩු වශයෙන් තක්සේරු කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිල්වලා ගඟ යෝජනා ක්‍රමය පිළිබඳව සක්‍රිය වැඩ පිළිවෙළකට මුල පිරුවේ 1977න් පස්සේ පත් වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව 1977 දී නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ආරම්භ කරන්නට යෙදුණත්, ඒ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන වකවානුවේ මාතර දිස්ත්‍රික්කයේ හිටපු අපේම සමහර උදවියගේ නොසැලකිල්ල හා විවිධාකාර මැදිහත්වීම් නිල්වලා ගඟ යෝජනා ක්‍රමය

බේදවාචකයට ලක් වුණාය කියන කාරණයත් මා සඳහන් කරන්න ඕනෑ. මා ඒකයි කිව්වේ අද නිල්වලා ගඟ යෝජනා ක්‍රමය මේ තත්ත්වයට පත්වන්නට අඩු වැඩි වශයෙන් කොළ පාට ආණ්ඩුත් වග කියන්න ඕනෑ කියලා.

1979 දී ශ්‍රී ලංකා රජයේ ඉල්ලීමක් මත, ප්‍රංශයේ ගර්සර් ආයතනය 1981 දී සකස් කරපු උපදේශක වාර්තාවක් අනුවයි නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩ පිළිවෙළ ආරම්භ වුණේ කියන එකත් මා මේ අවස්ථාවේදී මතක් කරන්න අවශ්‍යයි. ජල ගැලීම් නැවැත්වීම විතරක්ම මුල් කර ගනිමින් නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ හානියයි අද දකුණේ ජනතාව -විශේෂයෙන් මාතර අපි- විඳිමින් ඉන්නේ කියන එකත් මා සඳහන් කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා, අද අපට ඉතා වැදගත් වෙලා තිබෙන්නේ නිල්වලා ගඟ යෝජනා ක්‍රමය හුදෙක් ගංවතුර නැවැත්වීමේ ක්‍රියාවලියට පමණක් සීමා නොකර ඊට එහා ගිහිල්ලා, ඒ යෝජනා ක්‍රමයෙන් ඊට වැඩි වැඩ කොටසක් සිදු කර ගන්නේ කොහොමද කියන කාරණයයි.

1982 අගෝස්තු මාසයේ 21 වෙනිදා නිල්වලා ගඟ යෝජනා ක්‍රමයට මුල්ගල තැබුවා. හැබැයි, 1989 අගෝස්තු මාසයේ 11 වෙනිදා වෙන කොට නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ දෙවැනි අදියරේදී ඒ සියලුම කටයුතු ලත් තැනම ලොප් වෙලා ගියා. ඒකට ඒ කාලයේ දකුණේ පැවැති භීෂණය බලපෑ බව දකුණේ සියලු දෙනා දන්නවා. ඒ නිසා අද අවශ්‍ය වෙලා තිබෙන්නේ නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේදී සිද්ධ වුණු වැරැදි අඩු පාඩු නිවැරැදි කර ගැනීමයි.

මා කියපු විධියට කොළ පාට ආණ්ඩුවලින් සිද්ධ වුණා වාගේම, සන්ධාන ආණ්ඩුවෙනුත් ඒ දේවල් වුණු බව සඳහන් කරන්නට අවශ්‍යයි. සන්ධාන ආණ්ඩුව 1994 දී බලයට පත් වෙලා දැනට අවුරුදු 18ක් ගිහිල්ලා තිබෙනවා. හැබැයි, නිල්වලා ගඟ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ඒ අවුරුදු 18 තුළම ගත් ක්‍රියාමාර්ග පිළිබඳව අපේ බලවත් අප්‍රසාදය පළ කරන්න ඕනෑ. අවුරුදු 17ක් පැවැති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් නිල්වලා ගඟ යෝජනා ක්‍රමය සම්බන්ධ වැරැදි යම් සේ සිදු වුණා නම්, ඊට නොදෙවෙනිව, ඒ හා සමානව වර්තමාන ආණ්ඩුවෙනුත් නිල්වලා ගඟ යෝජනා ක්‍රමය සම්බන්ධ අඩු පාඩුකම් හා වැරැදි ගණනාවක් සිද්ධ වෙලා තිබෙනවා කියන කාරණය මා මේ අවස්ථාවේදී මතු කරන්න අවශ්‍යයි.

විශේෂයෙන් තවත් කරුණක් සඳහන් කරන්නට අවශ්‍යයි. නිල්වලා ගඟ යෝජනා ක්‍රමය තුළ අද අපට තිබෙන බරපතළම ප්‍රශ්නය තමයි, පායන කාලයක් ආවොත් මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට පානීය ජලය ලබා ගැනීමේදී ලවණ මිශ්‍ර ජලය ලැබීමේ ප්‍රශ්නය.

එහෙම නම්, පළමුවැනි කාරණය විය යුත්තේ නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේදී සිදු වුණු වැරැදි නිවැරැදි කර ගැනීමයි. දෙවැනි කාරණය විය යුත්තේ නිල්වලා ගඟේ ලවණ බාධකයක් විධිමත්ව ස්ථානගත කරලා ලවණ අර්බුදයෙන් පීඩාවට පත් වන ජනතාවගේ පානීය ජලය පිළිබඳ ගැටලුවට විසඳුම් හොයා ගැනීමයි. ඒ වාගේම ඉතාම වැදගත් තුන්වෙනි අවශ්‍යතාව තමයි, නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ ඉහළ ජලාධාර ප්‍රදේශයේ ජලය ගිනිකොන දිග ප්‍රදේශයට ගිං ගඟේ ජලයත් එක්ක ගෙන යන්නේ කොහොමද කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කනගාටුවට කාරණය මෙයයි. මාතර දිස්ත්‍රික්කයේ ලක්ෂ තුනකට ආසන්න පවුල් සංඛ්‍යාවකට, එනම් ලක්ෂ අටකට වැඩි ජනතාවකට ජලය ඇතුළු පහසුකම් සපයන නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ගැන විවිධ වකවානු තුළ විවිධ විශේෂඥයෝ අට්ටි ගණන් වාර්තා හැදුවා. 1990 දශකයෙන් පස්සේ බුළුමුල්ල කමිටුවේ වාර්තාව හා ක්‍රියාකාරි සැලැස්ම හැදුණා. සෙල්වරාජා තාක්ෂණික කමිටු වාර්තාව හැදුණා. නිල්වලා ප්‍රතිනිර්මාණ කමිටු වාර්තාව හැදුණා. ඊ.ඒ. සමරසිංහ කමිටු වාර්තාව හැදුණා. මහාචාර්ය ගාමිණී සේනානායක වාර්තාව හැදුණා. ඒ 1990 දශකයෙන් පස්සේයි. 1960-1970 දශකයේ චීන රජය සහ ඇමෙරිකා උපදේශක ආයතනය වන ඊසීඅයි ආයතනය මඟින් කළ අධ්‍යයන වාර්තාවක් 1968 දී එළි දැක්කා. 1979 දී ශ්‍රී ලංකා රජයේ ඉල්ලීමක් මත ප්‍රංශයේ ගර්සර් ආයතනය සකස් කළ වාර්තාව ගැන මා මීට කලින් සඳහන් කරන්නට යෙදුණා. ඒ වාගේම 1930 සහ 1950 දශකවලදී දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාගේ යෝජනා, ඒ වාගේම 1924 දී වාර මාර්ග අධ්‍යක්ෂ ඊ.සී. ගිල්මන් මහත්තයා ඉදිරිපත් කරපු යෝජනා, 1939 දී වාරිමාර්ග ඉන්ජිනේරු බර්න්ස් මහත්තයා ඉදිරිපත් කරපු යෝජනා මේ අතර කැපී පෙනෙනවා.

හැබැයි, මේ සියල්ලටම එහා ගිය නිල්වලා ගඟේ ඉහළ ජලාධාර ප්‍රදේශයේ ජලය හම්බන්තොට දිස්ත්‍රික්කයට ගෙන යන්න මුලින්ම කටයුතු කළේ ලාංකික පුද්ගලයෝ නොවෙයි. ඕලන්ද මිනින්දෝරු පීටර් පොනැන්ඩර් කියන මහත්මයා විශේෂයෙන්ම ඌරුබොක්කේදී ඕමල්පේ ඔය හරස් කරලා 1787 දී නිල්වලා ගඟේ වතුර ගෙන ගිය වාරි මාර්ග අදටත් තිබෙනවා. ඒ ජල මාර්ග යළි පිළිසකර කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. 1937 ගංවතුරෙන් එම ජල මාර්ග කැඩිලා ගියාම එදා හිටපු ඉංග්‍රීසි ජාතිකයන් පීටර් පොනැන්ඩර් මහත්මයාගේ යෝජනාව අනුව ක්‍රියාත්මක වෙලා ඒ වාරි මාර්ග පද්ධතිය යළි සකස් කළා. එහෙම නම් අදත් ඒ වාරි මාර්ග පද්ධතිය හරහා ජලය ඉදිරියට ගෙන යන්නට -හම්බන්තොට දිස්ත්‍රික්කයට ගෙන යන්නට- පුළුවන් ක්‍රමවේදයන් ගැනත් සිතා බැලිය යුතුයි කියලා මම සඳහන් කරන්නට ඕනෑ.

2012 පෙබරවාරි මස 26 වැනිදා -මීට මාස කිහිපයකට කලින් - අරලියගහ මන්දිරයේදී මේ පිළිබඳව සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ සාකච්ඡාවේදී ජනාධිපතිතුමා කිව්වා, "තිස් අවුරුදු යුද්ධය නිමා කරපු මට අවුරුදු 28ක් එක තැන පල් වන නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ ප්‍රශ්න විසඳන එක කජ්ජක් නෙමෙයි" කියලා. එහෙම කියලා මේ වන විට මාස ගණනක් ගත වෙලා තිබෙනවා. ජනාධිපතිතුමා පරිසර ඇමතිතුමාට කිව්වා, දිගිලි ඔයට අදාළව ඉඩම් නිදහස් කිරීමේ කටයුතු මාස තුනකින් අවසන් කරන්න කියලා. දැන් මාස තුනේ ඒවා දෙකක් ගිහිල්ලා, මාස තුනේ ඒවා තුනක් බවට පත් වන කාලයත් ඇවිල්ලා තිබෙනවා.

හැබැයි, තවම දිගිලි ඔයට අදාළ ඉඩම් නිදහස් කිරීම සම්බන්ධයෙන් පරිසර ඇමතිතුමාගේ සක්‍රිය මැදිහත් වීම සිද්ධ වෙලා නැහැ. අවුරුදු 30ක යුද්ධය නිමා කරලා, අවුරුදු 28ක් එක තැන පල් වුණු නිල්වලා ගඟ යෝජනා ක්‍රමය පිළිබඳ ප්‍රශ්නය විසඳන එක ප්‍රශ්නයක් නොවෙයි කියපු ජනාධිපතිතුමාට සහාය දක්වන අනෙක් ඇමතිතුමන්ලා අවුරුදු 28ක් නොවෙයි අවුරුදු 30ක් කල් ගත වන තෙක් ඉඳලාද ඒ ප්‍රශ්නයත් විසඳන්න හදන්නේ කියන ප්‍රශ්නයයි අපට තිබෙන්නේ.

ඒ අතරම මේ කාරණයත් සඳහන් කරන්නට අවශ්‍යයි. ඒ සාකච්ඡාවේදී සඳහන් වුණා, සිංගප්පූරුවේ මරීනා බරාජ් ජල ව්‍යාපෘතියට අනුව නිල්වලා ගඟ ව්‍යාපාරයේ ප්‍රශ්න ටික විසඳන්න ජනාධිපතිතුමාට මැදිහත් වෙන්න පුළුවන් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංගප්පූරුවේ මරීනා බරාජ් ජල ව්‍යාපෘතිය සහ නිල්වලා ගඟ ව්‍යාපෘතිය අතර වෙනස් ප්‍රශ්න දෙකක් තිබෙනවා. මට එය සඳහන් කරන්න අවශ්‍යයි. සිංගප්පූරු උදාහරණය අපට

[ගරු බුද්ධික පතිරණ මහතා]

ගන්න බැහැ. ජනාධිපතිතුමාට කවුරු හරි වැරැදි වාර්තා දීලා තිබෙනවා නම්, නොමඟ යැවීමක් කරන්න හදනවා නම් එය නිවැරදි කළ යුතුව තිබෙනවා. ඒ මොකද? සිංගප්පූරුව කියන්නේ වර්ග කිලෝමීටර් 965ක රටක්. ගංවතුර පාලනයත්, පානීය ජලය සැපයීමත්, සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීමත් තමයි සිංගප්පූරුවේ මරීනා බැරාජ් ජල ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වුණේ.

හැබැයි අපට තිබෙන ප්‍රශ්නය, ගංවතුර පාලනය කරන්න මේ ක්‍රමය යොදා ගන්න පුළුවන් වුණත් සිංගප්පූරුවේ පාවිච්චි කරපු පොම්පාගාර මඟින් ගඟේ ඉහළ ජලාධාර ප්‍රදේශවලින් වතුර ඉවත් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කරන්න බැරි තරම් මිල අධික ක්‍රමයක් වීමයි. තිබෙන පොම්ප ටිකවත් නඩත්තු කර ගන්න බැරි අපට - මාගල්ලාගොඩ, තුඩාවේ තිබෙන පොම්ප ටික නඩත්තු කර ගන්න බැරි අපට- මරීනා බැරාජ් ජල ව්‍යාපෘතියේ ආදර්ශය ගන්න ගියොත් අපි කබලෙන් ලිපට වැටෙනවා කියලා මම මේ අවස්ථාවේ සඳහන් කරන්නට අවශ්‍යයි.

මරීනා බැරාජ් ජල ව්‍යාපෘතියේ ප්‍රධානම අරමුණ මුහුදු රළින් නගරය බේරා ගැනීමයි. හැබැයි, අපට තිබෙන ප්‍රශ්නය අවුරුදු 10න් 10ට එන ගංවතුර. 2003 දී මාරාන්තික ගංවතුරක් ආවා. දැන් 2013 අවුරුද්දයි ලබන්නේ. ආපහු සැරයක් මාරාන්තික ගංවතුරක් එයි කියන බිය නිල්වලා ගඟ දෙපැත්තේ ගොවීන්ට තිබෙනවා.

මොකද, නිල්වලා ගඟේ ඉතිහාසය අනුව අවුරුදු 10න් 10ට නිල්වලා ගඟ දෙපැත්තේ මනුස්සයෝ මාරාන්තික ගංවතුරෙන් පීඩා වින්දා. අන්තිමට ගංවතුර ආවේ 2003 දීයි. ලබන අවුරුද්ද 2013. මීට කලින් 1982 දී ගංවතුරක් ආවා, 1993 දී ගංවතුරක් ආවා, 1969 දී ගංවතුරක් ආවා. ඒ නිසා 2013 දී ගංවතුරක් ආවොත් ඒ ගංවතුර පිංවතුර බවට පත් කර ගෙන සහනාධාර බෙදන්න යනවාට වඩා දැන්ම ඉඳලා නිල්වලා ගඟ ව්‍යාපෘතිය පිළිබඳව කටයුතු කිරීම අපේ වගකීමක් බවට පත් වෙලා තිබෙනවාය කියන කාරණය මම මේ ගරු සභාවට මතක් කර දෙන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කියපු කාරණා තුන එකින් එක අරගෙන, මට කථා කරන්න තිබෙන කාලය තුළ තව දුරටත් ඒ ගැන කථා කරන්න මා කැමැතියි. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ නිල්වලා ගඟ ව්‍යාපාරය ක්‍රියාත්මක කරද්දී -එවකට ඒ රජය එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නට යාමේදී- සිදු වූ යම් යම් අඩු පාඩු පිළිබඳව, ඒ වකවානුවේ දේශප්‍රේමීන්ගේ භීෂණය නිල්වලා ගඟට බලපෑ ආකාරය පිළිබඳව මම සඳහන් කළා. මේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉහළ ජලාධාරයට වඩා පහළ ජලාධාරයේ අද සිද්ධ වෙලා තිබෙන පරිහානිය සහ කනගාටුදායක තත්ත්වය පිළිබඳව සඳහන් කරන්නට අවශ්‍යයි.

විශේෂයෙන්ම කිරල කැලේ ව්‍යාපාරය ගැන සඳහන් කරන්නට අවශ්‍යයි. 1983 නිල්වලා ගඟ ව්‍යාපාරය ක්‍රියාත්මක වන්නට කලින් අක්කර 5,000ක් මේ ප්‍රදේශය තුළ තිබුණා. ගොවීන් ඒ අක්කර 5,000න් අක්කර 2,000ක් අහස් ජලයෙන් කැකුළුන් ක්‍රමයට යල සහ මහ කන්න වගා කළා. තවත් අක්කර 1,000ක් හැල් කුඹුරු විධියට, එක කන්නයක් මා වී වගා කළා. නිල්වලා ගඟ ව්‍යාපාරය යටතේ කිරල කැලේ, කිරල සහ කෙටලවලින් යුත් තෙත් බිම් සංරක්ෂණ භූමියක් විධියට - තෙත් බිමක්, වගුරු බිමක් විධියට- තවත් අක්කර 1,000ක් තිබුණා.

1983න් පස්සේ මොකද වුණේ? 1983න් පස්සේ මේ ප්‍රදේශයේ ලවණතාවය ඉහළ ගියා. එයට හේතුව මෙයයි. මේ ආපු විශේෂඥයෝ. -දැන් මේ විශේෂඥයෝ ඇවිල්ලා ඔළුවට අත තියාගෙන බැලුවාට බොහෝ දෙනෙක් නොදන්නා දෙයක් තිබෙනවා. මීට අවුරුදු දහස් ගණනකට කලින් නිල්වලා ගඟේ පහළ ජලාධාර ප්‍රදේශය, විශාල මුහුදු ගැල්මකින් මුහුදු ජලය ඇවිල්ලා ලවණ කළපුවක් බවට පත් වෙලා තිබුණා කියා ඉතිහාස සාධකවල තිබෙනවා. එය අමතක කරලායි මේ විදේශ විශේෂඥයෝ වැඩ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුඩාව ප්‍රදේශයේ, රාහුල පාර ප්‍රදේශයේ, හිත්තැටිය ප්‍රදේශයේ වගුරු බිමක් හෑරුවොත් පොළොව යටින් මුහුදු වැලිත්, සිප්පිකටුත් මතු වෙනවා. මුහුදේ සිට කිලෝමීටර් දෙකක් තුනක් ඈත පොළොවෙන් මුහුදු වැලියි, සිප්පි කටුයි මතු වන්නේ මොකද? අතීතයේ මේ ප්‍රදේශය මුහුදු කළපුවක් බවට පත් වී තිබුණු නිසා යි. හැබැයි මේ කාරණය මේ සියලු විශේෂඥයෝ අමතක කර තිබෙනවා. දැන් මොකද වෙන්නේ? ටික කාලයක් පායනකොට කේශාකර්ෂණය හරහා පස අභ්‍යන්තරයේ තිබෙන ලවණ ඉහළට මතු වන තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. එම නිසා අද කිරල කැලේ ප්‍රදේශයේ තිබෙන සියලු විපරීත තත්ත්වයන්ගෙන් එම ප්‍රදේශය ගොඩ ගන්නට නම් නියත වශයෙන්ම දිගිලි ඔය ජලාශය හදලා කද්දුවට පහළින් නිල්වලා ගංගාව හරහා ඉදිවන අමුණකින් හොරගොඩ, නාපේ අතු ගඟට ජලය ලබා ගෙන අගවත්ත අමුණ හරහා කිරල කැලේ ව්‍යාපාරයට ජලය ලබා දීමෙන් තමයි මේ ලවණ යම්තාක් දුරට අඩු කර ගන්නට පුළුවන් වන්නේ.

දැනට ගොඩ නඟා තිබෙන අමුණු දොළහ ඔස්සේ ජලය කළමනාකරණය කරන්නට පුළුවන් වන විධියට මේ අමුණු තුළ තිබෙන අපද්‍රව්‍ය ඉවත් කර, ඒ අමුණු විධිමත් කිරීම වැදගත් වෙනවා. කිරල කැලේ ඉහළ ප්‍රදේශවලට වාරි ජලය ලබා දෙන්නට සුල්තානගොඩ, බිබුල, කනංකෙදෙනිය හා දිගදෙනිය මුල් කර ගත් කුඩා වැව් තුනක් ගොඩ නැඟීමේ අවශ්‍යතාව තිබෙනවා. එක්දහස් නවසිය අසූවේ දශකයේ ක්‍රියාත්මක කළ සංවර්ධනය නිසා ඇතිවෙලා තිබෙන තත්ත්වයන්ගෙන් මිදෙන්නට අප ගත යුතු ක්‍රියාමාර්ගය මේ කඩවැද්දුව ව්‍යාපාරයයි. මෙයත් 1977න් පස්සේ ක්‍රියාත්මක කළ තවත් කොටසක්. මේ කොටස තුළ -නිල්වලා ගඟ ව්‍යාපාරය තුළ- එදා එක්සත් ජාතික පක්ෂය ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළේ යම් කිසි සාධනීය ප්‍රතිඵලයක් ලැබුණා නම් ලැබුණේ කඩවැද්දුව ව්‍යාපාරය තුළ විතරයි කියන කාරණයත් මා සඳහන් කරන්න අවශ්‍යයි. ඒ තුළ මා විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. කඩවැද්දුව යාය, මාගල්ලාගොඩ යාය, වැලිකන්ද යාය කියන ප්‍රදේශවල කුඹුරු අක්කර විශාල ප්‍රමාණයක් මේ යටතේ වගා කරන්නට පුළුවන්කම ලැබී තිබීම ලොකු ජයග්‍රහණයක් විධියට දකින්නට පුළුවන්. එය තමයි අපට දකින්නට තිබෙන යම් කිසි මට්ටමක ජයග්‍රහණය. නමුත් ඒ ප්‍රදේශයේ ඇනිකට් අටක් මේ වනකොට අක්‍රිය වෙලා තිබෙනවාය කියන කාරණයත් මා සඳහන් කරන්න අවශ්‍යයි. එම නිසා ඒ ඇළ මාර්ගවල ජලජ පැළෑටි ඉවත් කර, ඒ ඇනිකට් ප්‍රතිසංස්කරණය කර, තව අක්කර 500ක් වගා කරන්නට පුළුවන්කම තිබෙනවා. මාගල්ලාගොඩ පොම්පාගාරයෙන් ඉහළ හිස් කරන ජලයත් හූ ගත ජලය ඉස්මතු වීමෙන් වගා කළ නොහැකි තත්ත්වයට පත් වෙලා තිබෙන ඒ ලවණ තත්ත්වයත් මඟ හරින්නට කටයුතු කළ යුතුව තිබෙනවා. එපමණයි ඒ ප්‍රදේශයේ තිබෙන ගැටලුව.

කද්දුව ව්‍යාපාරය තුළ ඇති වෙලා තිබෙන ගැටලු සහගත තත්ත්වයන්ට තවම හරි විසඳුමක් ලැබිලා නැහැ. හොරගොඩ නාපේ ඔය පිටාර ගැලීමෙන් සිදු වන හානි පිළිබඳ ප්‍රශ්නය - නිල්වලා ගඟේ අතු ගංගාවක් වුණු හොරගොඩ නාපේ ඔය පිටාර ගැලීමෙන් සිදු වන ගැටලු- විසඳන්නට යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. ඒ ක්‍රියාමාර්ගය සඳහා දැනට හොරගොඩ නාපේ අතු

ගහ හරහා තිබෙන අමුණු හත -ජල හිහයක් තිබෙන ප්‍රදේශවලට ජලය ලබා දෙන අමුණු හත- ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කිරීම වැදගත් වෙනවා.

නාපේ උඩවතුර අමුණ සකස් කිරීම කළ යුතුව තිබුණේ ඒ ස්ථානයට වඩා පහළින්; කඩුකන්න ප්‍රදේශයෙන්. නමුත් විවිධ දේශපාලන බලපෑම් නිසා, විවිධ පළාත් පාලන මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් මත මේ කඩුකන්න ප්‍රදේශයේ සකස් කළ යුතු ජලාශය නාපේ උඩවතුර අමුණ විධියට ඉහළට ගෙන යාම තුළ බරපතළ තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවාය කියන කාරණයත්, මේ වියදම් කළ මුදලෙන් ලබා ගත හැකි නියම ප්‍රතිලාභය ලබා ගන්නට නොහැකි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවාය කියන කාරණයත් මම මේ අවස්ථාවේදී මතක් කර දෙන්නට අවශ්‍යයි.

නිල්වලා ගඟ යෝජනා ක්‍රමය හරහා අද වෙනකොට හෙක්ටයාර් 2,800ක් නැත්නම් අක්කර 7,000ක් අනාරක්ෂිත ප්‍රදේශ බවට පත් කර තිබෙනවා. අනාරක්ෂිත ප්‍රදේශ බවට පත් වෙලා තිබෙන ඒ ප්‍රදේශවල ජීවත් වන ජනතාවට බරපතළ ගැටලුවලට මුහුණ දෙන්නට සිදු වෙලා තිබෙන බවත් මම මේ ගරු සභාවේදී සඳහන් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම ඉතා ගෞරවයෙන් ඉල්ලනවා මේ අනාරක්ෂිත ප්‍රදේශයේ තිබෙන හෙක්ටයාර් 2,800 පිළිබඳව නැත්නම් අක්කර 7,000 පිළිබඳව විකල්ප යෝජනා ගැන අවධානය යොමු කරන්න කියලා. බණ්ඩත්තර පාලමට පහළින් නිල්වලා ගංගාවේ වංගුව කෙළින් කරලා, ඉවුරු පළල් කරලා ජල බැස්මේ වේගය වැඩි කරන්න පුළුවන් නම්, නාඳුගල හන්දියේ ඉඳන් බණ්ඩත්තර පාලම දක්වා හක්මන පාරේ පෙට්ටි බෝක්කු කිහිපයක් දාලා උතුරා යන ගංගාවේ වැඩි වතුර යොමු කරන්න පුළුවන් නම්, පිළදූව ඇළ ප්‍රතිසංස්කරණය කරලා ඉතා කෙටි මාර්ගයකින් ජලය නැවත නිල්වලා ගඟටම එකතු වෙන්නට සකස් කරන්නට පුළුවන් නම්, නාවිමන සිට වැල්ලමඩම දක්වා ලන්දේසි යුගයේ කපා තිබූ වේරදූව ඇළ නැවත ප්‍රතිසංස්කරණය කරන්න පුළුවන් නම්, ඉහළ නිම්නයේ ජලාශ තනලා අකුරැස්සෙන් පහළට එන ජල ප්‍රමාණය අවම කරන්නට විධිමත් සමෝධානික වැඩ පිළිවෙළක්, -මම කලින් සඳහන් කළ ආකාරයට- ක්‍රියාත්මක කරන්නට පුළුවන් නම් මෙන්න මේ ප්‍රදේශවල ජනතාවට වැඩි ප්‍රතිලාභයක් ලබා දෙන්න පුළුවන් කියන කාරණය මම සඳහන් කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාට ස්තුතිවන්ත වන්නට කැමැතියි. පසු ගිය කාලයේ තුඩාව පොම්පාගාරයේ පොම්ප අලුත්වැඩියා කරන්නට එතුමා යම් කිසි ක්‍රියා මාර්ගයක් ගත්තා. ඒ වාගේම අලුත් පොම්ප සවි කිරීමට කටයුතු කළා. අපි දන්නවා අවුරුදු 25ක් තිබුණු පොම්ප තමයි මේ ඉවත් කරන්නට සිදු වුණේ. මේ කටයුත්ත අඛණ්ඩව ක්‍රියාත්මක කර ගෙන යන්න. අලුත් පොම්ප සවි කිරීම හොඳයි. නමුත් දිගින් දිගටම, අඛණ්ඩව මේ කාරණය ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව සැලකිලිමත් වන්න. ඒ වාගේම, ඩීසල් පිළිබඳ ප්‍රශ්නය ඔබතුමාට තේරෙනවා ඇති. දළ වශයෙන් අවුරුද්දකට රුපියල් කෝටියකට ආසන්න මුදලක් වැය වෙන ඒ ගැටලුවට විසඳුම් සොයා ගන්නට අවශ්‍ය වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කිරළකැලේ තෙත් බිම සම්බන්ධ ප්‍රශ්නය. පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන මේ මොහොතේදී කිරළකැලේ තෙත් බිම විනාශ වන්නට නොදී රැක ගන්නට පුළුවන් වැඩ පිළිවෙළක්, ඒ වාගේම මාතර නගරය අනාගතයේ ඇති විය හැකි ජල ගැල්මකින් බේරා ගන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවත් මම පෙන්නුම් කරන්නට කැමැතියි.

1969 ගංවතුර මුල් කර ගෙන, 1969 ගංවතුර වාගේ ගංවතුරක් ආවොත් ආපසු සැරයක් මාතර නගරය යට වෙන්න දෙන්නේ නැහැ කියන පදනම උඩයි එක්සත් ජාතික පක්ෂය නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළේ. නමුත් අපි දැක්කා, 2003 ගංවතුර ආපුවාම සමහර තැන්වල වේලි කැඩිලා ගියා. සමහර තැන්වල වේලි වුවමනාවෙන් කඩලා දැම්මා. සමහර තැන්වල දේශපාලනඥයෝ මැදිහත් වුණා. සමහර තැන්වල ජනතාව මැදිහත් වුණා. වේලි කඩලා දැම්මා. ආපහු සැරයක් මාතර නගරය යට වුණා. එහෙම නම් අනාගතයේ මාතර නගරය යට නොවෙන්නට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ අවධානය යොමු කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ගිං - නිල්වලා අන්තර් නිම්න යෝජනා ක්‍රමය. මේක තමයි ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන්නට කල්පනා කරලා තිබෙන්නේ. 2003 ගංවතුර අපි කාටවත් අමතක කරන්නට බැහැ. පවුල් 47,642ක්, ජීවිත හානි 83ක්, පූර්ණ හා අර්ධ නිවාස හානි 10,003ක් සහ කුඹුරු අක්කර 8,912ක් විනාශ වෙමින් මේ ගංවතුර අපට බල පෑවා. ඒ වාගේම 2008 ගංවතුර, 1982 ගංවතුර, 1969 ගංවතුර, 1947 ගංවතුර, 1940 ගංවතුර වාගේ තත්ත්වයන් හමුවේ නිල්වලා ගඟ දෙපැත්තේ ජීවත් වන ජනතාව අනේක විධ දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දුන්නා. කල් ගත වෙලා හෝ නිල්වලා ගඟේ ඉහළ ජලාධාර ප්‍රදේශයේ ජලය ගිනිකොන දිග වියළි කලාපයට ගෙන යන්නට සැලසුම් සකස් කරමින් තිබෙනවා. ඒවා සැලසුම්වලට විතරක් සීමා කරන්නේ නැතිව ක්‍රියාත්මක කරන්නට යෑම පිළිබඳව අපි සතුටු වනවා. නමුත් ප්‍රශ්නයක් තිබෙනවා.

1998 මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය නිල්වලා ගඟේ ඉහළ ජලාධාරයේ වතුර හම්බන්තොටට ගෙන යන්නට සැලසුමක් හැදුවා. ඒ සැලැස්ම සුළු වෙනස්කම් සහිතව 2011 අප්‍රේල් මාසයේ 26 වෙනි දා චීනයේ කැම්සී කියන ආයතනය ලංකාවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් සමඟ දැන් විකල්ප යෝජනාවලියක් විධියට බාර දීලා තිබෙනවා. බලපුවාම මේ දෙකේ ලොකු වෙනසක් නැහැ. මේක හරියට ලංකාවේ ගල් අරක්කු බෝතලයකට චීන වයින් ටිකක් දාලා වාගේයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බෝතලේ ලංකාවේ ගල් අරක්කු බෝතලය. නමුත් දාලා තිබෙන්නේ චීන වයින්. ඒ වාගේ තමයි තිබෙන්නේ. ඒ නිසා මම ඉතා පැහැදිලිව සඳහන් කරන්නට අවශ්‍යයි මේ ගෙන යන්න හදන වැඩ පිළිවෙළ කොහොමද ගෙන යන්න හදන්නේ කියලා. දෙණියාය මැතිවරණ කොට්ඨාසයේ මෙදේරිපිටිය, පිටදෙණිය අමුණක් ගොඩ නඟලා ගිං ගඟේ ජලය කිලෝමීටර් 12.65ක උමඟකින් ගෙන යන අතරේ ජල විදුලිය මෙගාවොට් 12ක් නිෂ්පාදනය කරන්නයි.

කොටපොළ ඔයට ඒ ජලය එකතු කරලා එතැනින් කිලෝමීටර් 6.44ක උමඟක් හරහා අම්පනාගල ජලාශයක් ගොඩ නඟන්නයි. අම්පනාගලින් කිලෝමීටර් 7.94ක උමඟක් ඔස්සේ කිරම වැවට ජලය එකතු කරන්නයි. එතැනින් ආපහු කිලෝමීටර් 5.2ක් දිග උමඟක් ඔස්සේ මුරුතවෙළ ජලාශයට වතුර ගෙන ගිහින් මුරුතවෙළ ජලාශයෙන් චන්ද්‍රිකා වැවට කිලෝමීටර් 26ක් දිග ඇළ මාර්ගයක් ඔස්සේ ජලය ගෙන යන්නයි. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාළ කිරම වැව තිබෙන්නේ ඊට කලින් තිබෙන මේ සඳහන් කළ අම්පනාගල ජලාශයට වඩා ඉහළින්. එහෙම නම් අම්පනාගල ජලාශය පහළින් තිබෙන්නේ. කිරම වැව ඉහළින් තිබෙන්නේ. වතුර කොහොමද පහළ ඉඳලා උඩට ගෙන යන්නේ? එහෙනම් ලොකු බැම්මක් බඳින්න වෙනවා. හැබැයි, මේ ප්‍රදේශය ගැන දන්නා ගොවියෝ, මේ ප්‍රදේශ ගැන දන්නා ගොවි සංවිධාන නියෝජිතයෝ කියන්නේ ඒ ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ එදිනෙදා ජීවන මාර්ගවලට හානියක් නොවන ආකාරයට

[ගරු බුද්ධික පතිරණ මහතා]

දෙන්කන්දලිය තුළින් රම්මලේ කන්ද හරහා හැරවුමක් අරගෙන මීට වඩා වියදම අඩුවෙන් මේ ජලය ගෙන යන්න පුළුවන්ද කියා පරීක්ෂා කර බලන්න ඕනෑ කියා.

1977-1989 දක්වා නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරද්දි දේශීය විදේශීය විශේෂඥයෝ ගොවි ජනතාව තඹ දොයිතුවකට සලකන්නේ නැතුව ක්‍රියාත්මක වුණා. ඒකේ ප්‍රතිඵල අද භුක්ති විඳිනවා. ඒ නිසා මේ කියන ක්‍රමවේදය ගැන අවධානය යොමු කරන්න අවශ්‍යතාවයක් තිබෙනවා. විශේෂයෙන්ම - [බාධා කිරීමක්] ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමනි, මට සුළු කාලයයි තිබෙන්නේ. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී උත්තර දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමරදෙනිය ජලාශය ගැන සඳහන් කරන්න අවශ්‍යයි. සමරදෙනිය ජලාශයෙන් අපට ලබා ගන්න තිබෙන ප්‍රතිලාභ ප්‍රමාණය මදි. ඒ නිසා මම කියන්නේ සමරදෙනිය ජලාශයේ ප්‍රතිලාභ ලබා ගන්න ලැබෙන ප්‍රමාණය අඩු වෙන නිසා වැඩි ප්‍රතිලාභ ප්‍රමාණයක් ලැබෙන ආකාරයට ඒ ප්‍රදේශයේ සංවර්ධන ක්‍රියා දාමය දියත් වෙන්න අවශ්‍යයි. ඒ වාගේම තව ගොඩ නැඟිය යුතු කුඩා වැව් ගොඩ නඟන්නට අවශ්‍යයි. එහෙම නැත්නම් සමරදෙනිය ජලාශයෙන් පමණක් අපරක්ක ප්‍රදේශයේ ජලය කළමනාකරණය කරන්න බැහැයි කියන කාරණය මම මේ අවස්ථාවේදී සිහිපත් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කරදිය ප්‍රශ්නය නැත්නම් ලවණ බාධකය මම සඳහන් කරන්න අවශ්‍යයි. ලවණ බාධකය අදාළ වන්නේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ අමාත්‍යාංශයට. ලංකාවේ කරදිය ප්‍රශ්නය බොහෝ ගංගාවලට බලපානවා. ලංකාවේ සියලුම ගංගාවලට කරදිය ප්‍රශ්නය බලපානවා. මෙතෙක් වෙලා ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාට අදාළව සඳහන් කරපු කාරණාවලට අමතරව තවත් දේවල් කියන්න තිබෙනවා. ලවණ බාධකය ඉදි කිරීම පිළිබඳව අද ලොකු අවධානයක් යොමු වෙලා තිබෙනවා. මේ ලවණ බාධකය ඉදි කරන්නට යද්දි ස්වාභාවිකව ලවණ නිල්වලා ගඟ දිගේ උඩට ගලා ගෙන යනවා. උදම් මට්ටම වෙනස් වීම නිසා, ජල තරංග ප්‍රවාහනය නිසා, සුළඟේ වේගය නිසා, ජල මට්ටමේ වෙනස්කම් නිසා, ස්වාභාවිකව පහළ නිම්නයේ සිට ඉහළ නිම්නය දක්වා ගලා ගෙන යන ඒ ක්‍රියාවලියට අමතරව නිල්වලා ගඟේ සුවිශේෂී තත්ත්වයක් තමයි නිල්වලා ගඟේ බෝපගොඩින් මුහුද දක්වා කිලෝමීටර් 34න් වැඩි කොටසක් තිබෙන්නේ මුහුදු මට්ටමේ මීටර් බිංදුවට වඩා පහළින්. ඒ නිසා සාමාන්‍ය පැවුමකදී වුණත් නිල්වලා ගඟ ලංකාවේ අනෙක් ගංගාවලට වඩා කරදිය ඉහළට ගමන් කිරීමේ වැඩි ප්‍රවණතාවක් තිබෙනවා. මේ තත්ත්වය නැති වෙන්නට නම් නියත වශයෙන්ම නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේදී සිදු වුණු ආකාරයේ හානි සිදු නොවන්නට ලවණ බාධකයක් නිර්මාණය කර ගත යුතුව තිබෙනවා.

විශේෂයෙන්ම මම සඳහන් කරන්න අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ නිලධාරින්, දේශපාලනඥයෝ පමණක් නොවෙයි නිල්වලා ගඟේ ලවණ ජලය -මුහුදේ සිට පැමිණෙන ලවණ ජලය- ඉහළට ගමන් කරන්න සමහර පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම් අඩු වැඩි වශයෙන් බලපා තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ගඟේ කිඹුලන්ගේ ප්‍රශ්නයකුත් තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම ඒකත් කියනවා. ගංගා පෝෂක ප්‍රදේශයේ වන වැස්ම ඉවත් කිරීම, ජල උල්පත් සිඳී යන ආකාරයට ගස් කැපීම, ගඟේ වැලි ගොඩ දැමීම, ඉවුරු කැපීම, මැණික් හෑරීම, ගඩොල් කැපීම, ඇළ මාර්ග -නිල්වලා ගඟ යෝජනා ක්‍රමය සහ වෙනත් ක්‍රම ඔස්සේ ඇළ මාර්ග- ගැඹුරු කිරීම, ඉවුරු හා පහත් බිම් කුණු දමා ගොඩ කිරීම සඳහා නිලධාරින් හා සමහර දේශපාලනඥයින්ගේ මැදිහත් වීම නිසා මේ ලවණ ජලය ගමන් කිරීම වාගේම ගඟේ පහළ ජලාධාරා ප්‍රදේශවල හිටපු කිඹුලන් ගඟේ ඉහළට ගමන් කිරීම දක්වා මේ ප්‍රශ්නය බලපා තිබෙනවා. පසු ගිය කාලයේ පාසල් දරුවෝ, වතුර ගන්න ආ ගමේ අහිංසක මනුෂ්‍යයෝ මේ සියලු දෙනා ඒකේ පීඩාව ලක් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කරදිය නිසා අද මොනවාද ඇති වෙලා තිබෙන ගැටලු. කුඹුරු පුරන් වෙලා තිබෙනවා. පානීය ජල -නළ ජලය සහ ළිං ජල- ගැටලු ඇති වෙලා තිබෙනවා.

තෘණ වගාව සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ගව මහිෂාදීන්ට ආහාරය සඳහා අවශ්‍ය තෘණ පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ටිකියා වැනි ආක්‍රමණික ශාක වර්ධනය වෙලා තිබෙනවා. මේ නිසාම සත්ව පාලනය බිඳ වැටිලා තිබෙනවා. මිරිදිය මත්ස්‍ය ප්‍රජාව සම්පූර්ණයෙන්ම විනාශ වී යාමේ තර්ජනයක් ඇති වෙලා තිබෙනවා. කරදියට ඔරොත්තු නොදෙන සියලු ජෛව ඒකක මේ මොහොත වන විට බිඳ වැටෙමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා දොස්තර වික්‍රමසිංහ මැතිතුමා යෝජනා කළේ මාතරට ගැළපෙන පොම්පාගාරය හදන්න ඕනෑ දිගිලිඹය ඉස්මත්තේ කියලායි. ඇයි, එතුමා ඒ යෝජනාව කළේ? දිගිලිඹයට අදාළ ප්‍රදේශය පිහිටා තිබෙන්නේ මාතර මුහුදු මට්ටමේ ඉඳලා අඩි 100ක් උඩින්. එතැන හැදුවා නම් පොම්ප ඕනෑ නැහැ. ගුරුත්වය ඔස්සේ මාතරට ජලය ගෙන එන්න පුළුවන්කම තිබුණා. නමුත් ඒක අහන්නේ නැතිව 1963 නාදුගල පොම්පාගාරය හැදුවා.

එදා වික්‍රමසිංහ මැතිතුමා පාර්ලිමේන්තුවේ දී කියපු දේ අහන්නේ නැතිව නාදුගල පොම්පාගාරය හැදුවා. මොකක්ද ප්‍රතිඵලය? මේ කරදිය ප්‍රශ්නය නිසා අවුරුද්දට මාස තුනක් නාදුගල පොම්පාගාරය වහලා තියන්න සිද්ධ වෙලා තිබෙනවා. ඝන මීටර් 7,000ක් ගඟෙන් වතුර ගන්න පුළුවන් පොම්පාගාරයෙන් අවුරුද්දෙන් මාස තුනක් වැඩ ගන්න බැහැ. ඒ විතරක් නොවෙයි. ඉවක් බවක් නැතිව ගඟ හෑරීමේ ප්‍රතිඵලයක් හැටියට 1985 හදපු කද්දුව පොම්පාගාරය සමහර කාලවලට ප්‍රයෝජනයක් ගන්න බැරි තැනට වැඩ සිද්ධ වී තිබෙනවා. තුන්වැනි වරට 1995දී බලකාවල පොම්පාගාරය හැදුවා. බලකාවල පොම්පාගාරයෙනුත් සමහර වෙලාවට ඝන මීටර් 15,000ක ජල ප්‍රමාණයක් තමයි ලැබෙන්නේ. වැඩ ගන්න බැරි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා මම යෝජනාවක් කරන්න කැමැතියි. දෙදියගල මුල් කර ගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා ඒ ප්‍රදේශය තුළ තවත් පොම්පාගාරයක් නිර්මාණය කරන්න, ගරු වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමා දැන් බලාපොරොත්තු වෙනවා නම් ඇත්තටම නාදුගල පොම්පාගාරය ක්‍රියාත්මක කරන්න බැරි කාලවලදී අපට පානීය ජලය ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා.

ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ අවධානයට කාරණා කිහිපයක් යොමු කරනවා. ඒ ප්‍රදේශයේ ගොවීන්ගේ අදහස තමයි ගඟ හරහා වේල්ලක් බැඳීමට

වඩා ගේට්ටු සහිත regulator එකක් ඇති ලවණ බාධකයක් ඉදි කිරීම වඩා උචිත බව. මොකද, ලවණ නැතිව බීමට ජලය ගන්න නම් ගඟ සාමාන්‍යයෙන් සන මීටර් 11ක වේගයෙන් ගලා යා යුතුව තිබෙනවා. හැබැයි, පායන කාලයේදී නිල්වලා ගඟ ගලා ගෙන යන්නේ සන මීටර් 4ක වේගයෙන්. ඒ නිසා මම ඉතාමත් වගකීමකින් සහ ගෞරවයෙන් සඳහන් කරන්නට කැමැතියි, ජල සම්පාදන හා ජලාපවහන ඇමතිතුමනි, ගේට්ටු සහිත regulator එකක් ඇති ලවණ බාධකයක් ඉදි කිරීම ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියා. ඒ වාගේම ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, නාවිමන ප්‍රදේශය මුල් කර ගෙන පොම්පාගාර තුනටම ලවණ සහිත ජලය ගමන් කිරීම නවත්වන්නට ලවණ බාධකය ඉදි කිරීම ගැනයි ඔබතුමාගේ අවධානය යොමු වෙලා තිබෙන්නේ. නමුත් ඒ ප්‍රදේශය ගැන දන්නා ගොවි ජනතාවගේ අදහස නම් ඒක නොවෙයි.

ඒ අය කියන්නේ නාදුගල පොම්පාගාරය මාස තුනක් වැහුවත් කමක් නැහැ -ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් යෝජනා කරන ස්ථානයට වඩා- ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයත්, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයත්, පරිසර අමාත්‍යාංශයත් එක්ව මීට වඩා ඉහළින් දිගිලි ඔයට අදාළව ජල පොම්පාගාරයක් හදන්න පුළුවන් නම් හොඳයි කියන එකයි. ඒ ගැන කල්පනා කරලා නාදුගල මාස තුනක් අතහැරලාත් දෙදියගල දිගිලි ඔයට අදාළව පොම්පාගාරයක් හදලා එයින් නියම ප්‍රයෝජනය ගන්න නම් මේ ලවණ බාධකය ඉදි කරන්න අවශ්‍ය වන්නේ කද්දුව සහ නාදුගල අතරයි කියලා ඒ ප්‍රදේශය ගැන අවබෝධයක් තිබෙන ගොවි ජනතාව කියනවා. ඒ නිසා මම ගරු වාරිමාර්ග හා ජල කළමනාකරණ ඇමතිතුමාගෙනුත් ගරු ජල සම්පාදන හා ජලාපවහන ඇමතිතුමාගෙනුත් ඉල්ලන්න කැමැතියි, ඔබතුමන්ලාගේ අමාත්‍යාංශ දෙකම මේ ගැන කථා කරලා, දෙකේම නිලධාරින් ඒකාබද්ධ වෙලා මේ ඉදි කරන්නට හදන ලවණ බාධකය කරුණාකරලා නාවිමන ප්‍රදේශයේ නැතිව හැකියාවක් තිබෙනවා නම් කද්දුව සහ නාදුගල අතර ඉදි කරන්නය කියා.

එතැන ඉදි කිරීමෙන් එක පැත්තකින් පානීය ජලයට කරදිය මිශ්‍ර වීම නවතිනවාට අමතරව වාරිමාර්ග හා ජල කළමනාකරණ ඇමතිතුමාටත් ප්‍රයෝජනවත් වන කරුණු ගණනාවක් ඒ තුළින් සිද්ධ වෙනවා. ප්‍රධාන වශයෙන් කරුණු හතරක් සිදු වෙනවා. පළමුවැනි කාරණය පානීය මෙන්ම කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබා ගන්නට පුළුවන් වීමයි. දෙවැනි කාරණය කද්දුවෙන් ඉහළ ගඟේ පතුල තරමක් ගොඩ වීම මේ හරහා සිද්ධ වෙනවා. ඒ නිසා භූගත ජල මට්ටම ඉහළ නංවා ගන්න පුළුවන්. අද නිල්වලා ගඟේ තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි භූගත ජල මට්ටම විශාල වශයෙන් අඩු වීම. මම කලිනුත් කිව්ව විධියට මේක අතීතයේ මුහුදු කලපුවක් විධියට තිබුණු නිසා භූගත ජල මට්ටම විශාල වශයෙන් අඩු වන කොට ලවණතාව වැඩි වෙනවා.

අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ නිල්වලා ගඟේ පහළ ද්‍රෝණියේ භූගත ජල මට්ටම ඉහළ නංවා ගන්නයි. ඒකට මේ යෝජනාව වැදගත් වෙනවා. තුන්වැනි කාරණය ළිංවල ලවණතාව පිළිබඳ කාරණයයි. නිල්වලා ගඟේ පහළ ද්‍රෝණියට අදාළ තිහගොඩ, කඩවැද්දුව, නාදුගල, බන්ඩත්තර, නායිම්බල වැනි ප්‍රදේශ ගණනාවක වාගේම මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රදේශ ගණනාවක ළිං ජලය පානය කරන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගඟෙන් ගන්නා ජලය වාගේම ළිං ජලයත් වඩාත් සාර්ථක මට්ටමෙන් පාවිච්චි කරන්න පුළුවන් වෙන්න මේ ලවණ බාධකය කද්දුව සහ නාදුගල අතර සවි කිරීමේ ප්‍රයෝජනයක් තිබෙනවා.

හතරවැනි කාරණය අනාරක්ෂිත ප්‍රදේශවලට ජලය පැමිණීමෙන් එම ප්‍රදේශවල ජනතාව මුහුණ පා ඇති තත්ත්වයයි. මම කලින් සඳහන් කළ පරිදි හෙක්ටයාර් 2,800ක් නිල්වලා ගඟ යෝජනා ක්‍රමයෙන් අනාරක්ෂිත තත්ත්වයට පත් කරලා එහි ජීවත් වන ජනතාවගේ මානව අයිතිවාසිකම් අහිමි කරලායි තිබෙන්නේ. ඒ අයට වන්දි දීලා නැහැ. ඒ අය අනාරක්ෂිත ප්‍රදේශවලමයි ජීවත් වෙන්නේ. ඒ නිසා ඒ ප්‍රදේශවල ජීවත් වන ජනතාවට මේ තුළින් සාධාරණයක් ඉෂ්ට කරන්න අපට පුළුවන්කම ලැබෙනවා.

මොකද, මේ ජලය අගවත්ත අමුණ හරහා කිරල කැලේට ගෙනැල්ලා ඒ ආශ්‍රිත ගොවි බිම්වල තිබෙන ලවණ සෝදා හරිමින් ආපසු වතාවක් තුඩාව පොම්පාගාරය සහ තුඩාව අවට තිබෙන ගුරුත්වයෙන් පහළට ගලා ගෙන යන ක්‍රමවේදය ඔස්සේ ලවණ ඉවත් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් කාරණයක් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න මා කැමැතියි. දැන් මේ නිල්වලා ගඟේ පෝෂක ප්‍රදේශය හරහා මහා පරිමාණ ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක වනවා. පළමු වැනි ව්‍යාපෘතිය මාතර - කතරගම දුම්රිය මාර්ගයයි. දෙවැනි ව්‍යාපෘතිය මාතර - කොළඹ අධිවේගී මාර්ගයේ මාතර සිට ගණන් හැදීමේදී පළමුවැනි කිලෝ මීටර් 20 සැකසීමයි. තුන්වන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමට නියමිත මාතර සිට හම්බන්තොට දක්වා වූ අධිවේගී මාර්ගයයි. මෙම මාතර - හම්බන්තොට අධිවේගී මාර්ගය ගමන් කරන්න හදන්නේ තුඩාව, කිරල කැලේ ආශ්‍රිත ජල මූලාශ්‍ර සහ ජලාශ්‍රිත පරිසරය මුල් කර ගනිමිනුයි. ඒ නිසා ඒ ප්‍රදේශයේ ජලවහන රටාවට හානියක් නොවන ආකාරයට කොහොමද මේ මහා පරිමාණයේ ව්‍යාපෘති සංවර්ධනය කරන්නේ කියන කාරණය පිළිබඳව දැඩි අවධානය යොමු කළ යුතුයි කියා මා කියනවා. එහෙම නොවුණොත් ආපසු වතාවක් විශාල මුදලක් වියදම් කිරීම ප්‍රයෝජනයක් නොවෙන්න පුළුවන්.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය නිල්වලා ගඟ ව්‍යාපෘතියේ වෙලා තිබෙන අඩු පාඩුකම් පහළ ජලාධාර ප්‍රදේශයේ නිවැරදි කළත්, ඉහළ ජලාධාර ප්‍රදේශයේ වැඩි ජලය හම්බන්තොට දිස්ත්‍රික්කයට සහ ගිනිකොණ දිග ප්‍රදේශයට මුදා හරින්නට කටයුතු කළත්, නිල්වලා ගඟ යෝජනා ක්‍රමය යටතේ ලවණ බාධකයක් ඇති කරලා ලවණ ගලා ගෙන ඒම යම් මට්ටමකට අවම කළත්, -ලවණ ගලා ගෙන එන එක සම්පූර්ණයෙන් නවත්වන්න බැහැ. නැවැත්විය යුතුත් නැහැ. මොකද, ලවණ අවශ්‍යයි සමහර පරිසර පද්ධති ක්‍රියාත්මක වෙන්න- අවසානයේදී මාතර - කොළඹ අධිවේගී මාර්ගයේ පළමුවැනි කිලෝ මීටර් 20න් ජලවහන රටාවට වන ප්‍රශ්නයත්, ඒ වාගේම මාතර - කතරගම දුම්රිය මාර්ගයෙන් ජලවහන රටාවට වන හානියත් -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 05ක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
හොඳයි. ඒ වාගේම යෝජිත මාතර - හම්බන්තොට අධිවේගී මාර්ගය තුළ ඇති වෙලා තිබෙන ප්‍රශ්නයත්, ඇති වෙන්න පුළුවන් ප්‍රශ්න ගැනත් අවධානය යොමු වෙන්න ඕනෑ. නැත්නම් ඔබතුමන්ලා වියදම් කරන මේ මුදල් සියල්ල ගඟට කැපූ ඉනි සේ

[ගරු බුද්ධික පතිරණ මහතා]

විනාශ වනවාය කියන කාරණය මා පෙන්වා දෙන්න කැමැතියි. ඒ නිසා මෙන්න මේ කියන ප්‍රධාන කාරණා පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විනාඩි 51කට ආසන්න කාලයක් තුළ මම පෙන්වා දුන්නා, නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරද්දී ඇති වුණු ප්‍රධාන ප්‍රශ්න තුනක් පිළිබඳව. 1979දී ප්‍රංශයෙන් කරපු අධ්‍යයනකට අනුව 1989 දක්වා ක්‍රියාත්මක වුණු නිල්වලා ගඟ පහළ ජලාධාර ප්‍රදේශයේ කිලෝමීටර් දහතුනහමාරක වේලි හැදුවා. තව කිලෝමීටර් දහතුනක විතර වේලි හදන්න තිබෙනවා. නිල්වලා ගඟ තුන්වැනි අදියරේ ඒ අත හැර ගිය කොටස් ටික අවසන් කිරීමත්, අතරමඟ ඇණ හිටපු වැඩ කටයුතු සම්පූර්ණ කිරීමත්, ඇති වෙලා තිබෙන ගැටලු නිවැරදි කිරීමත් අද කාලීන අවශ්‍යතාවක් බවට පත් වෙලා තිබෙනවා. ඒක පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය මේකයි. පායන කාලයේදී නිල්වලා ගඟේ ඉහත්තාව දක්වා නිල්වලා ගඟේ පිහිටීම සහ විවිධ මානව ක්‍රියාකාරකම් වාගේම, නිල්වලා ගඟ යෝජනා ක්‍රමයෙන් සිද්ධ වුණු ඇදකුද නිසා ඉහළට ගලාගෙන යන කරදිය නැවැත්වීම සඳහා ලවණ බාධකය නාවිමන වාගේ ප්‍රදේශ ඉලක්ක කරන්නේ නැතිව මම කලින් සඳහන් කළ කද්දුව සහ නාදුගල අතරමඟ ප්‍රදේශයක ස්ථානගත කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව තිබෙනවා. ඒ ලවණ බාධකය තුළින් පිරිසිදු පානීය ජලය වාගේම කෘෂි බිම්වලට ජලය ලබා ගන්නටත් පුළුවන් ක්‍රමවේදයක් සකස් කළ යුතුව තිබෙනවා. ඒක තමයි දෙවැනි කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුන්වැනි කාරණය මේකයි. ගිං ගඟේ වැඩිපුර තිබෙන ජලයත්, නිල්වලා ගඟේ වැඩිපුර තිබෙන ජලයත් ඉහළ ජලාධාර ප්‍රදේශයේ ඇති කරන ක්‍රමවත් වැඩ පිළිවෙළක් හරහා නැඟෙනහිර ගිනිකොනදිග ප්‍රදේශවලට ගෙන යන්නට, හම්බන්තොට දිස්ත්‍රික්කයට ගෙන යන්නට වඩා විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මෙන්න මේ කියන ප්‍රධාන කරුණු තුන වෙනුවෙන් මම මුලින් සඳහන් කළ සියලුම අමාත්‍යාංශ එක්කාසු වෙලා කටයුතු කළ යුතු වෙනවා. මේ සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය පමණක් මුල් වෙලා හරි යන්නේ නැහැ. ඒ අමාත්‍යාංශ සියල්ල මුල් වෙලා ඒකාබද්ධ, සමෝධානික වැඩ පිළිවෙළක් මේ වෙනුවෙන් ක්‍රියාත්මක කළ යුතුව තිබෙනවා. ඒ ගැන සියලු පාර්ශ්ව සමඟ කථා කළ යුතුව තිබෙනවා. මේ තුළින් යම් කිසි ප්‍රජාවකට යම් හානියක් වෙනවා නම් ඒක අසාධාරණයි. විශේෂයෙන්ම අම්පනාගල ජලාශය ඉදි කරන්න යන්නේ ඓතිහාසික පනාකඩුව තඹ සන්නසට මුල් වුණු ප්‍රදේශයේයි. මේවා එදා පළමුවෙනි විජයබාහු රජ්ජුරුවෝ කීර්ති කුමාරයා විධියට රම්මලේ කන්ද මුල් කරගෙන සේනා සංවිධානය කරමින් කටයුතු කළ ඓතිහාසික උරුමයන් තිබෙන ප්‍රදේශයි. ඒ උරුමයන් තිබෙන ප්‍රදේශවල තිබෙන ඒ ඓතිහාසික උරුමයන් නොනැසෙන විධියට, ඒ වාගේම ඒ ප්‍රදේශවල පරම්පරාගතව ජීවත් වන ජනතාවට සාධාරණයක් ඉෂ්ට වෙන විධියට විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ මේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම මම මේ අවස්ථාවේදී පෙන්වා දෙන්න කැමැතියි. ඒ නිසා මෙන්න මේ කියන සියලු කරුණු සලකා බලමින් අමාත්‍යාංශවල මනා සම්බන්ධීකරණයක් ඔස්සේ මේ කටයුතු ක්‍රියාත්මක කළ යුතුයි.

ජාත්‍යන්තර උපදේශකයෝ, දැන් චීනයෙන් එන්න හදන චීන සමාගම් -මේ සියලු දෙනා- එක්කාසු කර ගත්තාට වරදක් නැහැ. හැබැයි ගමේ ගොවියා, ගමේ ගොවි සංවිධානය, මේ ගැන අවබෝධයක් තිබෙන ඒ පාරම්පරික සම්ප්‍රදායික උරුමයන් සහිත ජනතාව -ඒ ප්‍රජාව- අමතක කරලා මේ වැඩේ කරන්න යන්න එපා.

එහෙම වුණොත් කබලෙන් ළිපට වැටීමකුයි සිද්ධ වන්නේ. ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලන්නේ අන්න ඒ සියලු කාරණා සලකා බලමින් ඒ සියලු කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ කටයුතු නිමා කරන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අවසාන විනාඩියේදී නිල්වලා නිම්න ගොවි සංවිධානයේ ලේකම් ජයතිස්ස කුලතුංග මහත්මයා නිල්වලා ගඟ ගැන ලියා තිබෙන නිසඳැසකින් මගේ අදහස් දැක්වීම අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. මේ නිසඳැස මේ ගරු සභාවේ සියලු දෙනාගේ -විශේෂයෙන් ගරු ඇමතිතුමන්ලාගේත්, ඒ වාගේම මෙයට අදාළ සියලු නිලධාරින්ගේත්- චිත්ත සන්තානයේ ගැඹුරින්ම සටහන් වෙයි කියලා මා හිතනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
විනාඩියකින් මම මේක කියලා අවසන් කරනවා. මට තලතා මන්ත්‍රීතුමියගෙන් ඒකට විනාඩියක් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේක තමයි අද නිල්වලා ගඟ මිටියාවතේ ජීවත් වන ජනතාවගේ සැබෑ ඛේදනීය තත්ත්වය.

"හෝ හෝ හඬ නඟන
මහ සයුරට ඇදෙන
නිල්වලා මහ නදිය
මහ වැසි ඇද හැලෙන කල
ගලයි ගම් බිම් යට කර
සිදු වන මහ විපත් වළක්වන්නට ගොසින්
සිදු කළේ තවත් මහ විපතකි.........

බොන්න දිය බිඳක් නැත
ජලය මලකඩ වී ඇත
මලකඩ බොර දියෙන්
ඇළවල් පිරී ඇත...

අටු කොටු පිරී ඉතිරී ගිය
ගොවි බිම් පුරන් වී ඇත
මීමුන් කුඹුරෙ නැත
කුඹුරෙ ගොවියාද නැත....

ගොවි බිම් හැර දමා
උදලු දැකැති දඬුමැසි උඩ දමා
බඩ වියත රැක ගන්න
හොයා යයි රැකියාවක්.....

ගොවි දියණී කලාපේ
ගොවි පුතා අයාලේ
ජීවිතය රැක ගන්න
කරන්නේ මහ සටනකි...... "

මෙන්න මේ කාරණය අපේ චිත්ත සන්තානයේ ගැඹුරින්ම සටහන්ව තිබෙන තාක් කල් නිල්වලා මිටියාවතේ ජනතාවට අසාධාරණයක් නොවෙන්නට සියලු බලධාරින් කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.06]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)

(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේත්, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේත්, පරිසර අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ සම්බන්ධව කථා කරන අවස්ථාවේදී-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

ගරු ඇමතිතුමනි, මදක් නිහඬ වෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව* ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා *මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* නියෝජ්‍ය කාරක සභාපතිතුමා *මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு,* மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,*

குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MOHAN PRIYADARSHANA DE SILVA *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වෙනුවෙන් පළමු කොට අපේ නියෝජ්‍ය අමාත්‍යතුමිය විස්තර රාශියක් ඉදිරිපත් කළා.

මම පළමුවෙන්ම සඳහන් කරන්නට කැමැතියි, අපේ රට සිව් මහා ගංගාවලින් පෝෂණය වෙන, තවත් ගංගාවල් 103කින් පෝෂණය වෙන ඒ වාගේම වැව්, ඇළවේළි, පොකුණු ආදියෙන් පෝෂණය වෙන මහා ජල සම්පතක උරුමය භුක්ති විඳින බව. ශ්‍රී ලංකාවේ උරුමය වාරි කර්මාන්තයේ ප්‍රාතිහාර්ය බව සැම දෙනාම පිළිගන්නවා. ඒ මත ජීවත් වුණු ශිෂ්ඨාචාරයක් වෙනස් වී එයට වඩා බටහිර අනුකරණවාදී සමාජයක් බවට පරිවර්තනය වෙමින් තිබෙන අර්බුදයක අපි ගමන් කළද, අපට ස්වභාව ධර්මයා ලබා දී තිබෙන ජල වස්තුව නිසා මහා ජල අර්බුදයකින් තොරව තවමත් කටයුතු කරන්නට පුළුවන්කම ලැබී තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ජාතික ජල සම්පාදන මණ්ඩලය මඟින් සියයට 43කට පමණ පානීය ජලය නළ මාර්ගයෙන් ලබා දෙනවා. ඒ වාගේම අපේ රටේ ග්‍රාමීය ජනතාවගෙන් තිස් ලක්ෂයකට පමණ 3,500ක් පමණ වූ ප්‍රජා ජල ව්‍යාපෘති මහින්ද එම ඉලක්ක සපුරාලන්නට අපට පුළුවන්කම ලැබී තිබෙනවා. මේ ව්‍යාපෘතියේ අවසානයත් සමඟ ප්‍රජා ජල ව්‍යාපෘතියට නව ගමන් මාර්ගයක් ඇති කරන්න අපට පසු ගිය වසරේ සහ මේ වසරේ පුළුවන් වුණා. ජාතික ප්‍රජා ජල භාරය ඇති කිරීමෙන් 3,500ක් පමණ වූ මේ ප්‍රජා ජල සංවිධානවලට එම කාර්යයට එක් වන්නට අවස්ථාව සලසා දී තිබෙනවා. අපේ රටේ ජල ක්ෂේත්‍රයේ -ජල කර්මාන්තයේ- ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා වූ ක්‍රියා මාර්ගයේ නව ප්‍රවේශයක් "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව ඇති කර තිබෙනවා.

මෙම භාරය දෙපාර්තමේන්තුවක් නොවේ. මෙය සංස්ථාවක් නොවේ. මෙය පෞද්ගලික සමාගමක්ද නොවේ. මෙය ප්‍රජාව, ජල සම්පාදන මණ්ඩලයේ හා රාජ්‍ය අමාත්‍යාංශද එකමුතුවක් - සහභාගිත්වය- ඇති නව කළමනාකාරිත්වයක් ඇති ක්‍රියා මාර්ගයක්. මේ භාරය ඇති කිරීම තුළින් අපි බලාපොරොත්තු වෙනවා, දැනට පවතින ප්‍රජා ජල ව්‍යාපෘති සියල්ල ආරක්ෂා කරගෙන ඒ වාගේම ඒවා පුනරුත්ථාපනය කරන්න අවශ්‍ය පහසුකම්, ගුණාත්මක තත්ත්වයන් නඟා සිටුවීමට අවශ්‍ය සම්පත්, සේවාවන් ලබා දීම තුළින් වඩාත් ප්‍රයෝජනවත් ආකාරයට මේ ලක්ෂ තිහක් වූ ජනතාවට පානීය ජලය ලබා දීමේ ඉලක්කයට ගෙන යන්න. අතිගරු ජනාධිපතිතුමා අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් මෙම ප්‍රජාජල භාරය ගැන සඳහන් කරමින් වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන ගැන මම මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරන්නට කැමැතියි. ඒ මන්ද? නව ප්‍රවේශයක් අවශ්‍ය වී තිබෙන්නේ අපේ රටේත්, ලෝකය පුරාත් ප්‍රජාවගේ සහභාගිත්වය ඇති කර ගනිමින් මේ ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීමටයි. ප්‍රජාවගේ උනන්දුව ඇති කරගැනීම තුළින් මෙවැනි ව්‍යාපෘති හරහා ගම් මට්ටමේ තිබෙන කුඩා ජල මූලාශ්‍ර ආරක්ෂා කර දීමේ කාර්ය භාරයටද මැදිහත් වෙන්නට පුළුවන්කම ලැබෙනවා. වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා සඳහන් කළ විධියටම අපේ රටට කියුබික් මීටර් බිලියන 100ක් පමණ වැසි ජලය ඇද හැලෙනවා.

මෙයින් සියයට 40ක් අප ප්‍රයෝජනයට ගන්නේ නැහැ. මෙම ජලය කියුබික් මීටර බිලියන 40 ප්‍රයෝජනයට ගත හැකි වන සේ ජාතික අහස් ජල ප්‍රතිපත්තියක් ආරම්භ කරලා, නාගරික සංවර්ධන නීතිය යටතේ ඒ පිළිබඳ රෙගුලාසි සකස් කරලා ක්‍රියාත්මක කිරීම අපි ආරම්භ කළා. අප දැන් ඒ හා සමාන ප්‍රතිපත්තියක් ජාතික ජල සම්පාදන පනත් කෙටුම්පත යටතේ ඇති කරමින්, සැම නිවසකම ජලය ඉතිරි කිරීම සඳහා වන නව රෙගුලාසි සකස් කරමින් යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම, අපවිත්‍ර ජලය පවිත්‍ර කොට යළි ප්‍රයෝජනයට ගැනීමට අදාළව නව රෙගුලාසි සකස් කිරීම සඳහා වූ කමිටු වාර්තාවත් දැන් ලැබී තිබෙනවා. අපේ රටේ අප ප්‍රයෝජනයට ගන්නා ජලය යළිත් පවිත්‍ර කොට දෙතුන් වතාවක් ප්‍රයෝජනයට ගැනීමට පුළුවන් බව අප අමතක කළ යුතු නැහැ. එම ජලය බීමට නොගත්තත්, පවිත්‍ර කොට වෙනත් කටයුතු සඳහා යොදාගැනීමේ හැකියාව අප තවම ප්‍රයෝජනයට අරගෙන නැහැ. නව තාක්ෂණය යටතේ ඒ සඳහා වූ නව ක්‍රියා මාර්ගයක් අපි ආරම්භ කර තිබෙනවා. එය ස්ථාන කීපයක දැනුදු සාර්ථකව ක්‍රියාත්මක වන බව මා සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යළිත් වරක් මා මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරන්න කැමැතියි, පිරිසිදු පානීය ජලය මහ පොළොව සෝදන්න ගැනීම මහා අපරාධයක් බව. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමනි, ඔබතුමාට කියන්න අමතක වූ දෙයක් එය. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ සහයෝගය දෙන්න මා මේ කියන කාරණයට. කොළඹ හතේ ලස්සණ ගෙවල්වල ලස්සණ මල් පැළවලට පිරිසිදු පානීය ජලය දැමීම අපරාධයක්. ඒ ජලය දුප්පත් පැල්පත්වල ඉන්න අයට දෙන්න පුළුවන් ක්‍රමවේදයක් අපි හදන්න ඕනෑ. පාවිච්චි කරන ජලය පවිත්‍ර කොට යළිත් පාවිච්චි කරන නව ක්‍රමවේදයක් අපි යෝජනා කරනවා. අද ඉදි වන සැම හෝටලයකටම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් කොන්දේසි පනවමින්, පාවිච්චි කරන ජලය පවිත්‍ර කොට යළි ප්‍රයෝජනයට ගැනීම සඳහා උපදෙස් ලබා දී තිබෙනවා. ඒ පවිත්‍ර කරන ජල ප්‍රමාණය වෙනුවෙන් අප ලබා දෙන පවිත්‍ර කරන ලද ජලය වෙනත් පාරිභෝගිකයකුට පාවිච්චි කිරීමට ඇති හැකියාව අපි බරපතළ ලෙස සැලකිල්ලට ගෙන තිබෙනවා.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පිළිතුරක් දිය යුතුයි ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා වකුගඩු රෝගය පිළිබඳ සඳහන් කළ කරුණු සම්බන්ධයෙන්. එතුමා බොහොම හොඳ දීර්ඝ කථාවක් ඒ සම්බන්ධයෙන් කළා. අපේ අමාත්‍යාංශය මට්ටමින් මේ ප්‍රශ්නය හඳුනා ගෙන රජ රට, මහවැලි කලාපවල සහ දකුණු පළාතේත්, අම්පාර දිස්ත්‍රික්කයේ කීප තැනකත් පවිත්‍ර ජලය ලබා දීමේ වැඩ සටහනකට අප ප්‍රමුඛත්වය ලබා දී තිබෙනවා. පවිත්‍ර ජල ව්‍යාපෘතියක් ඇති කිරීමට ගත වන කාලය අපි තමුන්නාන්සේලා දන්නවා.

අපේ ඉලක්කය රජ රටටත්, ඒ වාගේම අනෙකුත් ප්‍රදේශවලටත් පිරිසිදු පානීය ජලය හැකි ඉක්මණින් ලබා දීමේ ක්‍රියා මාර්ගය සාර්ථක කිරීමයි. ඇයි ඒ? අනුරාධපුරයේ කරන ලද සමීක්ෂණයකින් අපට දැන ගන්න ලැබුණා පිරිසිදු පානීය ජලය ලබා දෙන ප්‍රදේශවල වකුගඩු රෝගයෙන් පෙළෙන ප්‍රමාණය ඉතාම අඩුයි කියලා. අනෙක් පැත්තෙන්, වකුගඩු රෝගයට ගොදුරු වන තත්ත්වය ඇති කරන, පළිබෝධ නාශක, රසායනික පොහොර ආදිය ගැන ස්ථිර පියවරක් ගැනීමේ ක්‍රියා මාර්ගවලටද අවතීර්ණ වීමේ අවශ්‍යතාව අප අතර නිරන්තරයෙන් සාකච්ඡාවට භාජන වන කාරණාවක්. මේ පිළිබඳවද ස්ථිර ප්‍රතිපත්තියක් ඇති කර ගැනීම වැදගත්. මේ වන විට රජ රට හුදකලා වූ ගම්මානවලට පානීය ජලය බෙදා හැරීමේ ජංගම සේවාවක් ඇති කිරීම අප සිදු කර තිබෙනවා. අපේ ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාත් මේ ගැන සඳහන් කළා.

අපි බලාපොරොත්තු වෙනවා, ප්‍රධාන ව්‍යාපෘති හමාර කිරීම සිදු වන තුරු පවිත්‍ර කරන ලද ජලය කුඩා ටැංකි මඟින් ගම්මානවලට ලබා දීමේ කටයුතු කරන්න. ඒ වාගේම මා මේ අවස්ථාවේ දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ඇති වෙලා තිබෙනවා, මේ රටේ පවිත්‍රාගාර ඇති කරන්න; පවිත්‍රාගාරවල ධාරිතාවය වැඩි කරන්න. ඔයාමඩුවේ, තන්තිරිමලේ වාගේම තව ප්‍රදේශ කීපයක ඇති කළ ඒ පවිත්‍රාගාර මේ වන කොටත් අප ප්‍රයෝජනයට ගන්නවා. ඒ වාගේම අපේ කාර්මිකයන්, ඉංජිනේරුවන් සම්බන්ධ කරගෙන මේ රටේ පවිත්‍රාගාර ඇති කිරීමේ හැකියාව වර්ධනය කරන්න කටයුතු කරනවා. වෙනදාට වඩා දෙගුණයකින්, අවුරුද්දකට පවිත්‍රාගාර 12ක් පමණ ඇති කිරීමේ ඉලක්කයකට අද අප ගමන් කරනවා. මා විශේෂයෙන් ඒ කරුණ සඳහන් කරනවා.

මේ වැඩසටහන් වාගේම, දැයට කිරුළට සමගාමීව ශ්‍රී ලංකාවේ Fundalmental Studies ආයතනය මඟින් අනුමත කරන ලද කුඩා ජල පිරිපහදුකාරකයක් Spectra ආයතනය නිෂ්පාදනය කරලා තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ඇතුළු තවත් ප්‍රදේශ කීපයකත්, වව්නියාව දිස්ත්‍රික්කයේත් මේ උපකරණ සවි කිරීමෙන් වකුගඩු රෝගයට මුහුණ දෙන ජනතාවට ගම් මට්ටමින් පවිත්‍ර ජලය ලබා දීමට හැකි වෙනවා. දේශීය ආයතනයක් සහභාගි කරගෙන ජල පිරිපහදුකාරක යන්ත්‍රයක් නිෂ්පාදනය කරලා, ඒ ව්‍යාපෘතියේ අත් හදා බැලීම් ආරම්භ කරලා තිබෙනවා. ඒ අනුව, ඉතා නිශ්චිතව මේ පිළිබඳව අප මැදිහත් වී කටයුතු කරනවා වාගේම, ඉටු කර දිය හැකි කටයුතු අපේ ක්ෂේත්‍රය මඟින් ඉටු කිරීමේ කාර්යය අප කරගෙන යනවා.

ජල කළමනාකරණයත්, පානීය ජලයත් එකට සම්බන්ධ වෙන ප්‍රශ්නයකට අද අප මුහුණ දෙනවා. ගොවිතැනට අවශ්‍ය ජලය සැපයීමත්, විදුලි බලය නිෂ්පාදනය කරන විදුලි බලාගාර සඳහා ජලය සැපයීමත්, පානීය ජලය සැපයීමත් අතර ඒකාබද්ධ අන්‍යෝන්‍ය වැඩපිළිවෙළක අවශ්‍යතාව තිබෙනවා. මා අය වැය විවාදයේ දී සඳහන් කළා වාගේ යළිත් ඒ කාරණය සඳහන් කරන්නට කැමැතියි. නමුත් වේලාව නොමැති වීම නිසා දීර්ඝ වශයෙන් ඒ ගැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. "Sri Lanka State of the Economy 2012" published by the Institute of Policy Studies of Sri Lanka. මෙම වාර්තාව දෙපාර්තමේන්තුවකින් නොවෙයි, සකස් කරලා තිබෙන්නේ. මෙය ස්වාධීන සමීක්ෂණවලින් සමන්විත වූ වාර්තාවක්. එහි 66වැනි පිටුවේ තිබෙනවා, අපේ රටේ වන සම්පත අඩුවීමේ තර්ජනය ජල පෝෂක ප්‍රදේශවලට බලපාන අන්දම සහ එහි භයානකකම ගැන අනතුරු හඟවලා තිබෙනවා. ඒ කෙරෙහි අපගේ දැඩි අවධානය යොමු කිරීමට සිදු වනවා. ඒ නිසා අපි ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වශයෙන් ඒ සඳහා මැදිහත් වෙන්න අවශ්‍ය කරන ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වෙලා තිබෙනවා. මෙහි සඳහන් කරන කාරණයක් තිබෙනවා - the level of water scarcity by districts in 1991 and projections for 2025.

මෙහි භයානකකම පිළිබිඹු වන දිස්ත්‍රික්ක කීපයක අනාගතය ගැන මේ පර්යේෂණය වාර්තා කරනවා. කිලිනොච්චිය, කුරුණෑගල, මන්නාරම සහ මහනුවර යන දිස්ත්‍රික්ක ඉදිරි කාලයේදී කාලගුණ විපර්යාසය සමඟ ඇති වන හානිකර තත්ත්වයන්ට ගොදුරු වන දිස්ත්‍රික්ක ලෙස හඳුනාගෙන තිබෙන අතර, එම දිස්ත්‍රික්කවල ඇති වන ජල හිඟය පිළිබඳව අනතුරු හඟවනවා.

මේ අනුව අපේ රටට ජල කොමිසමක් අවශ්‍යයි කියලා අමාත්‍යාවරයා ලෙස මා විශ්වාස කරනවා. මෙය තනි කාර්ය භාරයක් ලෙස සැලකිය නොහැකියි. අද මුළු මහත් ජාතියක පැවැත්ම පානීය ජලය මත පවතිනවා. අපි වගා කරන්න ඉස්සෙල්ලා, මහජනයාට ජීවත් වන්න පානීය ජලය අවශ්‍යයි. ඒ පානීය ජලයට ප්‍රමුඛත්වය දීම ජාත්‍යන්තරව පිළිගෙන තිබෙන දෙයක්. ඒ මත අපට ලැබෙන ජලයේ කළමනාකරණය හා පරිහරණය පිළිබඳව සහ පානීය, කෘෂි හා කර්මාන්ත සඳහා පාවිච්චි කිරීම පිළිබඳව ඒකාබද්ධතාවක් ඇති කිරීම සඳහා ඒ අංශ සියල්ල හරියාකාරව පිළිවෙතකට පාලනය වන කොමිසමක අවශ්‍යතාව ශ්‍රී ලංකාව හමුවේ පවතින බව අපි විශ්වාස කරනවා.

I would like to draw your attention to the studies conducted in the Nuwara Eliya and Ratnapura Districts by Professor Shanthi de Silva attached to the Agricultural Engineering Department of the Open University of Sri Lanka. මේ අධ්‍යයනයෙන් එහි තිබෙන අනතුරුදායක තත්ත්වයන් ගැන සඳහන් කරනවා.

ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතියට යෑමට මත්තෙන් අපි උතුරු පළාත අරගෙන බලමු. අමාත්‍යාංශය හැටියට අපි උතුරු පළාතේ ව්‍යාපෘති රාශියක් හමාර කරන්නට අද කටයුතු කරලා තිබෙනවා. මේ අවස්ථාවේදී උතුරේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ සභා ගර්භයේ නැහැ. නමුත් මම සඳහන් කරන්නට කැමැතියි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සහ ආසියානු සංවර්ධන බැංකුවේත්, JICA ආධාර ඇතිවත් අපට Nedunkerny, Vidataltivu, Thevanpiddy, Adampan,Valvettithurai, Maruthankerny, Pandiyankulam, Mallavi, Oddusuddan යන ජලසම්පාදන ක්‍රම ක්‍රියාත්මක කරන්නට හැකි වෙලා තිබෙන බව.

ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ සිටියා නම් මම කැමැතියි. එතුමා කිලිනොච්චි ජල යෝජනා ක්‍රමය ගැන කථා කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිලිනොච්චියේ ජල තටාකය පොළොවට හෙළපු එක ගැන එක වචනයකින්වත් කනගාටුව ප්‍රකාශ කරලා නැහැ. මන්නාරම පොළොවට හෙළන

ලද විශාල ජල තටාකය -giant tank tower එක- ගැන වචනයක්වත් කිව්වේ නැහැ. එය අද සම්පූර්ණයෙන් අලුතින් ඉදි කිරීමට කටයුතු යොදා ති බෙනවා. කිලිනොච්චි ජල ව්‍යාපෘතියට අතිගරු ජනාධිපතිතුමාගේ ආශිර්වාදය සහ අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම නිසා එය ආරම්භ වෙනවා.

මඩු පූජා භූමිය සඳහා වූ ජල යෝජනා ක්‍රමය අපි ආරම්භ කරලා තිබෙනවා. වවුනියා ජල යෝජනා ක්‍රමය ආරම්භ කිරීමට අවශ්‍ය පියවර සම්පූර්ණ කරලා භූමිය නිදහස් කර ගෙන වැඩ කටයුතු ආරම්භ වෙනවා. ප්‍රධානතම ව්‍යාපෘතියක් වූ යාපනය-කිලිනොච්චි දැවැන්ත ජල යෝජනා ක්‍රමය සහ සනීපාරක්ෂක ව්‍යාපෘතියට අවශ්‍ය අනුමැතිය අද ලැබී තිබෙනවා. ඒ සඳහා වූ වැඩ පිළිවෙළ අපි ආරම්භ කරනවා.

අද උතුරේ මන්ත්‍රීතුමන්ලා කථා කළ ආකාරය ගැන මට බොහොම කනගාටුයි. එදා ආරුමුගම් ඉන්ජිනේරු මහතා ඉදිරිපත් කරපු වැඩසටහන හා සමාන වැඩසටහනක් අවුරුදු 60කට පස්සේ ඉදිරිපත් කරමින් අද යාපනය අර්ධද්වීපයට හා ඒ මහ තිබෙන නගරවලට ජලය සැපයීමට සහ සනීපාරක්ෂක පහසුකම් ලබා දෙන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා; ඒ ව්‍යාපෘති ආරම්භ වෙලා තිබෙනවා. අපේ අමාත්‍යාංශය, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයත් සමඟ එකතු වෙලා තොණ්ඩමානාරු ඇතුළු ප්‍රදේශවල භූගත ජලයේ ඇති ලවණතාවත් දුරු කරලා, වැසි ජලය රැස් කිරීමෙන්, පිරිසිදු ජලය එකතු කිරීමෙන්, අවුරුදු කීපයක් තුළ ඒ ජලය වඩාත් ප්‍රයෝජනවත් ජලය බවට පරිවර්තනය කිරීමට ඒ ව්‍යාපෘතියේම කොටසක් හැටියට අන්තර්ගත කර තිබීම මා හිතන්නේ තවත් වැදගත් කාරණාවක්. ඒ බව මා ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා ඇතුළු සියලු දෙනාට ප්‍රකාශ කරන්න ඕනෑ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේත් ව්‍යාපෘති රාශියකට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ප්‍රංශ රජයෙන් ගත් ණය යටතේ මහ ත්‍රිකුණාමල වැඩසටහන තව මාස දෙකක් ඇතුළත නිම කර, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයම ආවරණය වන මහා ජල යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු අපට අවසන් කරන්න පුළුවන්කම ලැබෙනවා. අපි මඩකලපුවේ ජල යෝජනා ක්‍රමයේ වැඩ අවසන් කළා. ගරු නියෝජ්‍ය ඇමතිතුමියත්, මමත්, විනායගමූර්ති මුරලිදරන් මැතිතුමාත්, අතිගරු ජනාධිපතිතුමා සමඟ මෑත කාලයේ ඇති කරපු විශාලම ජල යෝජනා ක්‍රමය එයයි. අපි තුන්වැනි අදියර යටතේ අම්පාර දිස්ත්‍රික්කයත්, මඩකලපුව දිස්ත්‍රික්කයත් ආවරණය කරන පානීය ජල ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කරනවා. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රජය පසු ගිය අය වැයෙන් වෙන් කර තිබුණා. මෙවර අය වැයෙන් අතිගරු ජනාධිපතිතුමා ඉදිරි අවුරුදු 3 තුළ ඉටු වන පානීය ජලසම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් බිලියන 125ක් -මේ වසරට බිලියන 33ක්- වෙන් කර තිබෙනවා. පානීය ජල ව්‍යාපෘතිය යටතේ, අපවිත්‍ර මළ මූත්‍ර පද්ධති ගෙන යෑම සඳහා වූ ව්‍යාපෘතියත් අන්තර්ගත කරමින් ඉතා පැහැදිලි වැඩ පිළිවෙළකට මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු අපි සංවිධානය කර තිබෙනවා.

නගරයට පමණක් නොව, ගමටද පානීය ජල අයිතිවාසිකම ලබා දීමේ ක්‍රියාමාර්ග අපි ඇති කරලා තිබෙන බව මා මිත්‍ර සජිත් ප්‍රේමදාස මැතිතුමාට ඉතාම ගෞරවයෙන් සඳහන් කරන්න කැමැතියි. අපි ඉතා පැහැදිලි වැඩ පිළිවෙළකට අනුව ඒ කටයුතු සිදු කරනවා. කන්ද උඩරට, මහනුවර උතුර, මහනුවර දකුණ සහ තදාසන්න ප්‍රදේශවල මහනුවර ජල ව්‍යාපෘතිය, විශාල ආයෝජනයක් කර නිම කරන්නට පුළුවන්කමක් ලැබුණා. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේත් විශේෂ සහයෝගයෙන් බදුල්ල, හාලිඇළ සහ ඇල්ල ප්‍රධාන ජල යෝජනා ක්‍රමය, බණ්ඩාරවෙල, වැලිමඩ, ඌවපරණගම හා ඔහිය ජල යෝජනා ක්‍රම ආරම්භ කරලා දැන් ඒවා නිම වෙමින් පවතිනවා. අනෙක් යෝජනා ක්‍රම ආරම්භ කරන්න පුළුවන් 2013 වසරටයි අපි පිවිසෙන්නේ. සබරගමුව පළාතේ සහ දකුණු පළාතේ වතුකරයේ ජනතාවට නළ මාර්ගවලින් පානීය ජලය ලබා දීමේදී ප්‍රශ්න තිබෙන තැන් හඳුනා ගනිමින්, ඒ ස්ථානවලට ප්‍රජා ජල ව්‍යාපෘති ඇති කිරීමේ වැඩ පිළිවෙළ ගැන වතුකර ජනතාවගේ සංවිධාන සමඟ අපි කරන සාකච්ඡාවලින් ඒ කටයුතු සාර්ථක කර ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

අද දින ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද කරුණු මගේ අමාත්‍යාංශයේ නිලධාරීන්ට මා යොමු කරනවා. මමත්, නියෝජ්‍ය ඇමතිතුමියත් ඒවාට ලිඛිතව පිළිතුරු ලබා දෙන්නට බලාපොරොත්තු වනවා.

ගම්පහ දිස්ත්‍රික්කයේත්, කොළඹ දිස්ත්‍රික්කයේත් ආවරණය නොවුණු පානීය ජල ප්‍රදේශ සම්පූර්ණයෙන්ම ආවරණය කරන්න අපට ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ තවත් ආයෝජන යටතේ ලැබෙන ණය මුදල්වලින් අවස්ථාව සැලසෙනවා. ඒ නිසා බස්නාහිර පළාත මුහුණ දෙන පානීය ජල ප්‍රශ්නයත් විසඳා ගැනීමට අපට හැකි වෙන බව සඳහන් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම වයඹ පළාතේ කුරුණෑගල, මාවතගම පසු ගිය දා ආරම්භ කළ හිරියාල, ගිරිඋල්ල ආදී ජල යෝජනා ක්‍රම මඟිනුත්, දැනට හමාර වෙන මීගමුව සහ අලුතින් ආරම්භ වෙන පුත්තලම හා හලාවත ජල යෝජනා ක්‍රම මඟිනුත් 2013 වසරේ විශාල ප්‍රදේශ ගණනාවක පානීය ජලය නළ මාර්ගයෙන් සැපයීම සහ සනීපාරක්ෂක ව්‍යාපෘති සඳහා වූ ක්‍රියා මාර්ගයකට අවතීර්ණ වෙනවා.

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී සභාවේ සිටියා නම් මම බොහොම කැමැතියි. එතුමා හොඳ කාරණාවක් මතු කළා. එතුමාට වෙලාව දුන්නේ අපේ ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමියයි. කෙසේ වෙතත්, අපි මුහුණ දෙන එක ප්‍රශ්නයක් තමයි ගංගාවල වැලි හෑරීම. පරිසර අමාත්‍යාංශය මඟින් ඒ ක්‍රියාව පාලනය නොකළොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට බරපතළ අර්බුදයකට මුහුණ දෙන්නට වෙනවා. දැනටමත් නිල්වලා ගඟේ ලුණු වතුර ඉහළට යන ප්‍රශ්නය, ඊට මෙහා ගිංතොට ගිං ගඟේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය, අම්බලන්තොට වලවේ ගඟේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය, කොළඹ කැළණි ගඟේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය, කළුතර කළු ගඟේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය යන මේවා පාලනය කර ගත හැකි, පාලනය කළ යුතු ප්‍රශ්න ලෙස සලකා කටයුතු කිරීම අපේ බලාපොරොත්තුවයි. එහෙම නොවුණොත් ජල යෝජනා ක්‍රමවලට අතිරේකව අපට ආරක්ෂක වේලි සඳහා විටින් විට තවත් විශාල ආයෝජනයන් කරන්නට සිද්ධ වේවි. ඒ නිසා මෙය බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසයි මම කලින් කිව්වේ, ජල කොමිසමක් අවශ්‍යයි කියා. පරිසර අමාත්‍යාංශයත් මේකට සම්බන්ධ වෙන්න ඕනෑ. අපේ වෘක්ෂ ලතා ආරක්ෂා කරනවා වාගේම, ගංගාවන් ඕනෑවට වැඩිය හෑරීමෙන් ආරක්ෂා කර ගන්න, ගංගා ද්‍රෝණි දෙපැත්ත ආරක්ෂා කර ගන්න කටයුතු කළොත් මේ ජල යෝජනා ක්‍රම සඳහා අතිරේක වැය ශීර්ෂ දරන්න සිදුවීම වළක්වා ගන්නට පුළුවන්ය කියා අපි විශ්වාස කරනවා. එසේ වළක්වා ගත හැකි දේ වළක්වා ගන්නේ නැතිව ඒ සඳහා වියදම් කරන්නට ඕනෑය කියන ක්‍රියා මාර්ගය අමාත්‍යාංශයක් හැටියට නිවැරදි යයි අප පිළිගන්නේ නැහැ කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම කනගාටුවෙන් වුණත් මේ කාරණයත් කියන්න ඕනෑ. චුන්නාකම් ජල යෝජනා ක්‍රමයට පසුගිය දා අපවිත්‍ර ද්‍රව්‍ය මුසු වෙන්නට පටන් ගත්තා. ගරු

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාත් ඒ ගැන දන්නවා ඇති. තෙල් අපද්‍රව්‍ය තමයි එහෙම එකතු වුණේ. තෙල් අපද්‍රව්‍ය ගලා යාමේ තර්ජනයට මුහුණ දීම නිසා මහා පරිමාණ ආයෝජනයන් කරපු තවත් අපේ වටිනා ජල යෝජනා ක්‍රම සමහර දවස්වලට වහන්න සිද්ධ වෙනවා. ඒ නිසා පරිසර අමාත්‍යාංශය අපට උදව් කරන්න ඕනෑ. මට කිව හැක්කේ එපමණයි. මෙය බරපතළ ප්‍රශ්නයක්. මහා පරිමාණයේ ණය අරගෙන, මහා පරිමාණ ආයෝජනයන් කරලා, ඒ මඟින් ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් පානීය ජලය බුක්ති විඳින වෙලාවේ මෙවැනි දෙයක් සිදු වීමට ඉඩ දීම සුදුසු නැහැ. මේ කාරණයේදී නිලධාරින්ගේ සහයෝගය අපට අවශ්‍යයි. නිලධාරින්ගේ සහයෝගය නොලැබුණොත් අපට මුහුණ දෙන්නට සිදුවන්නේ ඊට වඩා බරපතළ ගැටලුවකටයි. අපට තිබෙන වේලාව සීමා සහිත නිසා මීට වඩා කාලය ලබා ගන්න මම උත්සාහ දරන්නේ නැහැ. පසු ගිය දවස්වල මා කියවූ පොතකින් කොටසක් මේ අවස්ථාවේදී මා කියවන්න කැමැතියි.

In the book titled, "Towards Water Wisdom - Limits, Justice, Harmony" written by an outstanding Indian scholar, Ramaswamy R. Iyer, he draws our attention to the following. On page 225, under "A Declaration on Water" he states, I quote:

"1.Water is primarily a life-supporting substance and only secondarily anything else. (That is 'water for life'.) Next comes 'water as social good' (e.g., water for firefighting, hospital use, use in schools and public institutions, etc). We then have 'water as commodity' ('economic good'), i.e., water for irrigation, industry, recreation, etc."

Again I quote:

"2.'Water for life' is a basic need and right and cannot be denied to anyone. It must take precedence over the other two categories. Economic or other uses of water must not jeopardize 'water for life'."

Then, I would also like to quote from another section. On page 227, it states, I quote:

"11.There can be use rights but not property rights in relation to water. Use rights can be made tradable only to a very limited extent."

මේ ප්‍රශ්නයට අප අද මුහුණ දෙනවා. ජලය පොදු වස්තුවක්. ජලය පොදු වස්තුවක් නිසා එය ආරක්ෂා කර ගැනීමට රජයට වග කීමක්, බැඳීමක් හා නීතිමය වශයෙන් ආරක්ෂාවක් ද තිබිය යුතුයි. මූලික මිනිස් අයිතිවාසිකම් ලෙස එය ප්‍රයෝජනයට ගැනීමේදී ප්‍රමුඛත්වය දීමට අවශ්‍ය සියලු පියවර අප ගත යුතුයි.

තව කාරණාවක් මම පෙන්වන්නට කැමැතියි. පවිත්‍ර නොකරනලද ජලය විශාල ප්‍රමාණයක් අපි ගොවිතැනට පාවිච්චි කරනවා. ඒ පවිත්‍ර කර ප්‍රයෝජනයට හැකි ජලයයි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Minister, you have only one more minute.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Yes, I will conclude.

ගොවිතැනට පාවිච්චි කිරීමට වෙනම සකසා ඇති ජලයෙන් සියයට 30ක් අපි පාවිච්චි කරන්නේ නැහැ කියලා කියනවා.

I quote from "The Sunday Times" of 18th March, 2012. It states:

"... 30% of the food produced worldwide is never eaten and water used to produce it is definitely lost!"

මෙවැනි ගැඹුරු කරුණු ගැන සොයා බැලිය හැකි ආයතන බිහි කිරීම අපගේ යුතුකමයි. Food circle එකත් වැදගත්.

It further states:

"It takes about 1500 litres of water to produce 1 kg of wheat, but it takes 10 times more to produce 1 kg of beef!"

මේවා ගැන මම සඳහන් කළේ පානීය ජලය ජනතාවට ලබා දීම අපේ ප්‍රමුඛතාවක් වන නිසායි. අපි වෙනත් දේ සඳහා පාවිච්චි කරන ජලය හොඳාකාර කළමනාකරණය කිරීම වැදගත් අවශ්‍යතාවක්.

පස සංරක්ෂණය කිරීම පිළිබඳව අප හදන ලද නීතිරීති පැරැණියි. ජලය සුරක්ෂිත කළ හැකි ක්‍රියා මාර්ගයට පස ද අවශ්‍යයි. එම නිසා ඒ නීති සංශෝධනය කළ යුතුය කියා මා ඉල්ලීමක් කරනවා.

මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරින්ටත්, ජල සම්පාදන මණ්ඩලයේ සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සියලු නිලධාරින්ටත්, ගරු මන්ත්‍රීතුමන්ලාටත්, අපට සහයෝගය දෙන ජාත්‍යන්තර ආයතනවලටත්, අනෙක් සියලු ආයතනවලටත් අපේ කටයුතු කර ගෙන යාමට ලබා දෙන සහයෝගයට අපි මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වනවා. මට අනෙක් ප්‍රදේශ ගැන සඳහන් කරන්න බැරි වුණාට, මගේ මිත්‍ර මාතලේ මන්ත්‍රීතුමා ඉන්නවා. මාතලේ ජල යෝජනා ක්‍රමය 2013 දී ආරම්භ කරන්න පුළුවන්ය කියන තීරණයට අපි දැන් පැමිණ තිබෙනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
රත්නපුරය?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
රත්නපුරයේත් ජල යෝජනා ක්‍රම ආරම්භ කරලා තිබෙනවා. ඔබතුමිය කථා නොකරන නිසා මම හිතුවා, සතුටු නිසා ඔබතුමිය නිහඬව ඉන්නවා කියලා. කොළොන්න, බලංගොඩ, රත්නපුර, වලවේ ජල යෝජනා ක්‍රමවල කටයුතු අද හමාර වෙලා තිබෙනවා. අපේ ඇඹිලිපිටියේ මන්ත්‍රීතුමා ඉන්නවා.

2012 වර්ෂයේදී ජල සම්පාදන මණ්ඩලය විසින් නව ජල සම්බන්ධතා 1,18,367ක් ලබා දී තිබෙනවා. ජල සම්පාදන මණ්ඩලය වියදම් වැඩිවීම නිසා ගාස්තු වැඩි කළා විනා, සියලු ක්ෂේත්‍රවල වියදම් වැඩි වෙද්දි අවුරුදු තුනක් තිස්සේ ජල සම්පාදන මණ්ඩලය -අපි- ගාස්තු වැඩි කළේ නැහැ. ජල සම්පාදන මණ්ඩලය පවතින්න ඕනෑ ආයතනයක් නිසාත්, එය බංකොලොත්භාවයට පරිවර්තනය කරන්න ඉඩ දෙන්න බැරි නිසාත් සුළු ප්‍රමාණයකින් ගාස්තු වැඩි කිරීමෙන් අඛණ්ඩව මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න අප බලාපොරොත්තු වනවා.

අපට ලබා දිය හැකි ජල යෝජනා ක්‍රම සෑම දිස්ත්‍රික්කයකටමත් ලබා දීමේ වැඩසටහන මගේත්, මගේ නියෝජ්‍ය ඇමතිතුමියගේත් නායකත්වයෙන් ඉදිරියට ගෙන යාමට අතිගරු ජනාධිපතිතුමාගේ ආශිර්වාදය අපට ලැබී තිබෙනවා. ඒ අනුව මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 4.43]

**ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍යාංශ තුනක වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී ඊට සහභාගි වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මගේ සතුට ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම අපට තවත් සතුටට කරුණක් තමයි අදාළ ගරු අමාත්‍යවරුන් තුන්දෙනාම මේ අවුරුද්දේ අපේ දිස්ත්‍රික්කයට ඇවිල්ලා, අපේ ආසනවලට ඇවිල්ලා, අපේ අඩු පාඩු සොයා බලා කටයුතු කිරීම. ඒ පිළිබඳවත් එතුමන්ලා තුන්දෙනාටත්, ඒ වාගේම නියෝජ්‍ය අමාත්‍යතුමන්ලාටත් අපේ ස්තුතිය පුද කරනවා. වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට අදාළ ව්‍යාපෘති විතරක් නොවෙයි, අනෙකුත් අමාත්‍යාංශ දෙකටත් අදාළ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක වන දිස්ත්‍රික්කයක් තමයි මාතලේ දිස්ත්‍රික්කය.

ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය යටතේ අද ඉන්දියන් සමාගමක් සමඟ එකතුව මහ දඹුල්ල ජල යෝජනා ක්‍රමය ඉතාම සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වනවා. ඒ වාගේම අපි ගරු අමාත්‍යතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්නට ඕනෑ, ප්‍රංශ රජයේ ආධාර යටතේ රුපියල් මිලියන 8,000ක පමණ මුදලකින් ග්‍රේටර් මාතලේ ජල යෝජනා ක්‍රමයේ කටයුතු කිරීම සම්බන්ධව. එතුමා මීට මාස තුනකට වගේ ඉහතදී ඇවිල්ලා ඒ සම්බන්ධයෙන් අපිත් එක්ක සාකච්ඡා කරලා අනිවාර්යයෙන්ම එය ක්‍රියාත්මක කරන බවට අපට පොරොන්දුවක් දීලා ගියා. ඒ පොරොන්දුව ඉටු කරන බව එතුමා අද අපට සහතික වුණා. ඒක මාතලේ ජනතාවට විශේෂ කාරණයක් වේවි. මහ දඹුල්ල ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් දඹුල්ල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරකටත් ඒ වාගේම, කැකිරාව, ඉපලෝගම, අනුරාධපුරය දක්වාත් පවුල් 174,000කට පමණ සෙතක් සැලසෙනවා. ඒ වාගේම ග්‍රේටර් මාතලේ ජල යෝජනා ක්‍රමය මඟින් මාතලේ නගරය හා අවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනාවක ජල ප්‍රශ්නයට විසඳුම් ලැබෙනවා. ඒ නිසා මේක මාතලේ ජනතාවට ඉතාම සුබ ආරංචියක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම ඉතාම දුෂ්කර ප්‍රදේශවලට ජලය සපයන ජල යෝජනා ක්‍රමයක් වශයෙන් ප්‍රජා මූල ජල යෝජනා ක්‍රමය ශක්තිමත් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳවත් අවධානය යොමු කළොත් වඩාත්ම කාලෝචිතයි කියන කරුණ අපි මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා. මාතලේ ජල මූලාශයේ සිට එම ගම්මානවලට ජලය ගෙන යැමේදී එම ගම්මානවල තිබෙන දුරස්ථභාවය නිසා අපට විශාල වියදමක් දරන්න සිදු වනවා. ඒ නිසා ගම්මාන මට්ටමින්, කොට්ඨාස මට්ටමින් අදාළ ජල මූලාශ්‍ර හඳුනා ගෙන ගම් මට්ටමින් ඒවා පරිභෝජනය සඳහා අවස්ථාව ලබා දුන්නොත් ඒක ජනතාවට කරන ලොකු සේවයක් කියලා අපි හිතනවා. ඒ වාගේම විශාල වියදමක් අඩු කර ගැනීමේ පියවරක් හැටියටත් එම ක්‍රමය දක්වන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය ගත්තාම, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා හතර සැරයක්, පස් සැරයක් ඇවිල්ලා අපේ ප්‍රදේශයේ ජනතාවගේ ගැටලු විවිධ ආකාරයෙන් විසඳා තිබෙනවා. අද විපක්ෂය මේ පාර්ලිමේන්තුවේදී කිව්වේ, මොරගහකන්ද ව්‍යාපාරය කියන්නේ බොරුවක්, ඒක ක්‍රියාත්මක වන්නේ නැහැ, ඒකට මුදල් නැහැ කියායි. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාත් අද උදේ ප්‍රකාශ කළා, මොරගහකන්ද ජලාශ යෝජනා ක්‍රමය අසාර්ථක යෝජනා ක්‍රමයක් නිසා විදේශ මුදල් ලබා දීමක් සිදු කිරීමට එම සමාගම් ඉදිරිපත් වෙන්නේ නැහැ කියලා. නමුත් ඒක මිථ්‍යාවක්. Cino-Hydro සමාගමත් එක්ක ඒකාබද්ධ වෙලා මේ වන කොටත් මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කරලා ඉවරයි. එහි වැව් 7ක් ඉදි කරලා ඉවරයි, පාරවල් ටික හදලා ඉවරයි, quarters ටික හදලා ඉවරයි, ග්‍රාම නිලධාරි වසම් 14ක ජනතාව පදිංචි කිරීම සඳහා අවශ්‍ය ඔප්පු ප්‍රදානය කිරීම ගරු ඇමතිතුමා අතින් සිදු කරලා ඉවරයි, ග්‍රාම නිලධාරි වසම් ගණනාවක ජනතාවට වන්දි ලබා දීලා ඉවරයි. ඒ නිසා අද වන කොට යම් කිසි ක්‍රමවේදයක් අනුව මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් හැටියට අපට සතුටු වෙන්නට පුළුවන්. මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය 1970 ඉඳලාම මහවැලි යෝජනා ක්‍රමයේ විශේෂ ව්‍යාපෘතීන් යටතේ ඇතුළත්ව තිබුණු මහා පරිමාණයේ ව්‍යාපෘතියක්. කළු ගඟ හා මොරගහකන්ද ජලාශය එකතු වුණාම මහා පරාක්‍රම සමුද්‍රය වගේ හතර ගුණයක් විශාල ජලාශයක් තමයි මාතලේ දිස්ත්‍රික්කයේ ඉදි වෙන්නේ. ඒ මඟින් ඉරණමඩුව දක්වා වතුර ගෙන යන්නත්, ඒ වාගේම ගිරිතලේ සහ කන්තලේ වැව් සාරවත් කරන්නත් විශාල රුකුලක් ලැබෙනවා.

මහින්ද චින්තනය තුළින් ගෙනා මෙම ව්‍යාපෘති මේ රටේ ජනතාවගේ ශුභ සිද්ධිය සඳහා තිබෙන ව්‍යාපෘති හැටියට අපට හඳුන්වා දෙන්නට පුළුවන්. 380,000ක් පමණ පිරිසකට මෙයින් සෙත සැලසෙනවා. හෙක්ටයාර් 80,000ක් වාගේ ප්‍රමාණයක් අස්වද්දන්න හැකි වෙනවා. එම නිසා මෙයින් ජනතාවට සිදු වන සේවය, මේ රටේ ගොවිතැනට සිදු වන සේවය අතිවිශාලයි. අප දන්නවා, මොණරාගල ජලාශය අවට ප්‍රදේශයේ ජනතාව යම් යම් උසි ගැන්වීම්වලට යොමු කරන්න විවිධ පුද්ගලයින් කටයුතු කරන බව. නමුත් මේවායින් ඔවුන් සැලෙන්නේ නැහැ. අප නිතරම ජනතාවත් එක්ක ඉන්නේ. ජනතාව දැනුවත් කර, ජනතාවට කරුණු පහදා දී ජනතාවත් එක්ක ඉන්න මන්ත්‍රීවරුන් වශයෙන් අප මේ ව්‍යාපෘතියේ තිබෙන සාර්ථකත්වය අද හෙළිදරව් කර තිබෙනවා. අපේ ගරු මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා පාරම්පරික ගම්මාන මේකෙන් විනාශ වන නිසා ඒක වළක්වා දෙන්න කියා. ලග්ගල ආසනයේ ග්‍රාම නිලධාරි වසම් 152ක් තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4ක් තිබෙනවා. මේ ග්‍රාම නිලධාරි වසම් 152න් 100කට අධික ප්‍රමාණයක් සාම්ප්‍රදායික ගම්මාන. එම සාම්ප්‍රදායික ගම්මානවල තත්ත්වය අප ඒ ආකාරයෙන්ම ආරක්ෂා කර තිබෙනවා. ඒවාට කිසිම රජයේ බලධාරියකු ගිහින් ඒවා බලයෙන් අත් පත් කර ගැනීම සිදු කරන්නේ නැහැ. ජලයෙන් යට වන ප්‍රදේශ සාම්ප්‍රදායික ගම්මාන සංකල්පය ආරක්ෂා වන පරිදි නැවත වරක් එසේම ස්ථාපිත කිරීමේ වගකීම රජයක් හැටියට අප භාර අරගෙන තිබෙනවා. ගරු ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පරිසර අමාත්‍යාංශය අපේ ප්‍රදේශයට විශේෂ වැදගත්කමක් තිබෙන අමාත්‍යාංශයක්. මැණික් ටික, වැලි ටික ඒ වාගේම වනාන්තර විශාල වශයෙන් අයත් වන ආසනයක් ලග්ගල ආසනය. ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීමකදී අප තීන්දු කළා, මැණික් කර්මාන්තය සඳහා දුගී දුප්පත් ජනතාවට යම් සහන ක්‍රමයකට රුපියල් දාහක් වැනි මුදලකට බලපත්‍රයක් ලබා දීමට. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා, ව්‍යාපාරිකයන්ට විතරයි බලපත්‍ර අර ගෙන මේ ව්‍යාපාරය කරන්නට පුළුවන් වන්නේ කියා. අද මැණික් ව්‍යාපාරය කරන පුද්ගලයන්ට සහන ක්‍රමයකට ඒ සඳහා අවශ්‍ය ඉඩකඩ සලසා තිබෙනවා.

[ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා]

මේ විධියට විශාල වැව් පද්ධතියක්, ජල සම්පාදන යෝජනා ක්‍රමයක්, පරිසරය ආරක්ෂා කිරීමේ පරිසර සංරක්ෂණ වැඩ පිළිවෙළවල් මාතලේ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මෙම අමාත්‍යාංශ තුළින් ඉටු කිරීම පිළිබඳව අපේ ගෞරවය හා ප්‍රණාමය අමාත්‍යතුමන්ලා තුන් දෙනාටම මේ අවස්ථාවේදී පුද කරන්නට කැමැතියි.

මැණික් කර්මාන්තය ගැන අපේ ගරු මන්ත්‍රීතුමාට විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. මොරගහකන්ද ජලාශයට යට වන ප්‍රදේශයේ මහා පරිමාණයේ සම්පත් තිබෙනවා, මැණික් ඉල්ලම් විශාල වශයෙන් තිබෙනවා. මේ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කර, පරිසර අමාත්‍යතුමාගේත් අවධානය යොමු කර, මේ මැණික් සම්පත ජාතික නිෂ්පාදනය සඳහා ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සූදානම් කරන ලෙස ඉල්ලා සිටිමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.51]

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැදගත් අමාත්‍යතුමන්ලා තුන් දෙනෙක් භාරව සිටින ඉතාම වැදගත් අමාත්‍යාංශ තුනක වැය ශීර්ෂ යටතේ අද කථා කරන්නට ලැබීම ගැන සතුටු වෙනවා. අපට ලැබී තිබෙන කාල සීමාවත් එක්ක කථා කරන්නට වෙන්නේ බොහොම කෙටියෙනුයි. කෙසේ වෙතත්, යමක් කරන්නට උත්සාහ කරන, නියත වශයෙන්ම යමක් කරන අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් හැටියට අප ඔබතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා වාගේ වාරි කර්මාන්තය නම් තිබෙන්නේ බදුල්ලට විතරක් වාගෙයි පෙනෙන්නේ. [බාධා කිරීමක්] දෙන්නා වූ රක්ෂාවල් අනෙක් පළාත්වලටත් දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මා නියෝජනය කරන නිවිතිගල මැතිවරණ කොට්ඨාසයටත් ජල යෝජනා ක්‍රමයක් සඳහා 1999 වර්ෂයේ මුදල් වෙන් කර තිබුණා. හරියාකාරව නම් එම ජල යෝජනා ක්‍රමය අවසන් විය යුත්තේ 2012 වර්ෂයේදීයි. නමුත් එහි ප්‍රගතිය සියයට 48යි ඇමතිතුමනි. නිවිතිගල කියන්නේ ඉතාම දුෂ්කර ප්‍රදේශයක්. බොහොම පොඩි නගරයක් තමයි තිබෙන්නේ. එම නිසා මේ ජල යෝජනා ක්‍රමයේ කටයුතු කඩිනමින් අවසන් කරන්නට කටයුතු කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා. ඒ මුදල් ප්‍රමාණයෙන් සියයට 71ක් පමණ වැය වී තිබෙනවා. 2012 වර්ෂය නම් දැන් අවසානයි. මෙම ජල යෝජනා ක්‍රමයේ ඉතිරි කොටස ඉතා ඉක්මනින් අවසන් කර දේවිය කියා මම විශ්වාස කරනවා. ඒ වාගේම ඔබතුමා රත්නපුර දිස්ත්‍රික්කයට පුංචි සහයෝගයක් ලබා දී තිබෙනවා. ඒ ගැනත් මම ඉතා කාරුණිකව ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අපේ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමා පසු ගිය දවස්වල කළු ගඟ යෝජනා ක්‍රමය ගැන කථා කළා. මෙවර ප්‍රගති වාර්තාවේ තිබෙනවා ඔබතුමා, කළු ගඟ නිම්නයේ ජල සම්පත් සංවර්ධනය හා ජල ගැලීම් පාලනය පිළිබඳව 2011 අගොස්තු මාසයේදී ව්‍යාපෘති කාර්යයක් සඳහා අමාත්‍යාංශය සහ ඊශ්‍රායල් තහල් ඉංජිනියරින් සමාගම අතර ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා කියලා. මෙම ගිවිසුම යටතේ එම සමාගමේ විශේෂඥයින් විසින් පහත සඳහන් අධ්‍යයනයන් සිදු කරලා තිබෙනවා. රත්නපුර ජලාශය පිළිබඳව සම්පූර්ණ ශක්‍යතා අධ්‍යයනයක් සහ ගංවතුර පාලනයද ඇතුළුව මුළු ගංගා නිම්නයේම ජල සම්පත් පිළිබඳව සම්පූර්ණ ශක්‍යතා අධ්‍යයනයක් කර තිබෙනවා. අවසානයේ රත්නපුරය ජලාශය වෙනුවෙන් මධ්‍යම ප්‍රමාණයේ ජලාශ කිහිපයක් ඉදි කිරීම කෙරෙහි අධ්‍යයනයක් කරන ලෙස එම විශේෂඥයින්ගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේක ලොකු මතභේදයකට තුඩු දුන්න කාරණයක්. විශේෂයෙන්ම අපි දන්නවා රත්නපුරය කිව්වාම ඉස්සර ඉඳලාම ප්‍රසිද්ධ මැණික්වලටයි, ගංවතුරටයි කියලා. නමුත් මේ ප්‍රදේශය ඉතාම හොඳින් තේ වගාව කරන ප්‍රදේශයක්. ඒ පිළිබඳව ඒ ප්‍රදේශයේ ජනතාව ඉතාමත් කුතුහලයකින්, පොඩි අවිනිශ්චිතකමකින් තමයි ජීවත් වන්නේ. ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් විවාද කරන මේ කාරක සභා අවස්ථාවේදී, ඒ පිළිබඳව ගන්නා වූ පියවර මොකක්ද කියන එක සම්බන්ධයෙන් අඩුම තරමින් මේ සභාව දැනුවත් කරන්න පුළුවන් නම් ඉතාමත් වටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා බදුල්ල දිස්ත්‍රික්කයේ කරලා තිබෙන වැඩ කටයුතු සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුති කළා. අපට එහෙම ස්තුති කරන්නට අමාරුයි. අපේ දිස්ත්‍රික්කවල ගොඩක් ඇළ වේලි වාගේම මහවැලි අමාත්‍යාංශය යටතට එන උඩවලව කලාපයත් තිබෙනවා. ඒ ප්‍රදේශවල මේ දවස්වල කෙරී ගෙන යන වැඩ කටයුතු දිහා බැලුවාම අපට එතරම්ම සන්තෝෂ වන්නට බැහැ. රත්නපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් ඒ පිළිබඳව ඔබතුමාගේ සහයෝගය ලබා දෙයි කියලා මා විශ්වාස කරනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඔය ප්‍රශ්නය මම දන්නවා. කළු ගඟේ ගංවතුර පාලනයේදී තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මෙයයි. අප ඉහළ ජලාශ හදන්නේ නැතිව පහළ ගංවතුර පාලනය කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අවශ්‍ය වන්නේ තේ ඉඩම් ටික ආරක්ෂා කර ගැනීමද, ගංවතුර වළක්වා ගැනීමද? තේ ඉඩම් සියල්ලම ආරක්ෂා වන පරිදි මේ ව්‍යාපෘතිය නොකර ඉන්න පුළුවන්. එහෙම වුණොත් පහළ ගංවතුර නවත්වන්නට ක්‍රමයක් නැහැ. අපි දැන් ශක්‍යතා අධ්‍යයනය විශේෂඥයන්ට බාර දීලා තිබෙනවා. ඒකේදී අපට මේක කරන්න පුළුවන් විවිධ ක්‍රමවේදයන් -options-පිළිබඳව විශේෂඥයෝ වාර්තාවක් දෙනවා. එම වාර්තාව අපි ජනතාවට ඉදිරිපත් කරනවා. අපට ජනතාව කියනවා නම් ජලාශ හදන්න එපා, අපට මේ ව්‍යාපෘතිය ඕනෑ නැහැ කියලා ඒ වගකීම ජනතාව බාර ගන්න ඕනෑ. නමුත් රජයක් වශයෙන් අපි මේ වැඩ කටයුත්ත කරන්නට ඕනෑ. නමුත් ජනතාව එපා කියන දේවල් බලෙන් පටවන්නේත් නැහැ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. තේ ඉඩම් ගැන නොවෙයි මම කථා කළේ. තේ ඉඩම් හිමියොත් ඉන්නවා. තේ කියන්නේ ඒ අයගේ ආර්ථිකයයි. ඒ ප්‍රදේශයේ ජීවත් වන උදවිය පාරම්පරික කුඩා තේ වතු හිමියෝයි. ඒ අයට යම් කිසි සහනදායක වැඩ පිළිවෙළක් වාගේම ගංවතුර මැඩ පැවැත්වීමත් අවශ්‍යයි. ගංවතුර වැළැක්වීම සඳහා ඔය ජලාශය හැදීමට වඩා වැඩ පිළිවෙළ ඕනෑ තරම් තිබෙනවා කියලා මම විශ්වස කරනවා.

මෙතැන අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ඉන්නවා නේ. ඔබතුමාටත් පුළුවන් මේ වතුර ටික පානීය ජල ව්‍යාපෘතිවලට යොදා ගැනීම සඳහා හොඳ වැඩ පිළිවෙළක් සකස් කරන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු මන්ත්‍රීතුමිය, ගංවතුර එන්නේ විශාල වශයෙන් වහින අවස්ථාවල නේ. ඒ වෙලාවට ඒවා පානීය ජලයට ගන්න බැහැ. ඒ නිසා ඉහළින් වතුර ගබඩා කිරීමේ වැඩ පිළිවෙළක් යොදන්නට ඕනෑ. අපි බලමු ඊශ්‍රායල් විශේෂඥයින්ගේ වාර්තාව ආවාම public comments වශයෙන් අපි ජනතාවගේ අදහස් ගන්නවා. ඒ වාර්තාව ඉදිරිපත් කරනවා. ඉන් පසුව ජනතාව අකමැති නම් අපි ඒක කරන්නේ නැහැ. අපි ජනතාවට බාර දෙනවා තීන්දුව දෙන්න කියලා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

බොහොම ස්තුතියි ඇමතිතුමනි. කෙසේ වෙතත් ගංවතුර හැම දාම තිබෙන දෙයක් නොවෙයි නේ. ගංවතුර කාලයට ගංවතුර පාලනය කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන්. නමුත් ඒ එක්කම ඒ අයට සහනදායී වැඩ පිළිවෙලක්, -ආර්ථිකය හා වන්දි වෙනුවෙන්- අද පවතින තත්ත්වය තුළ-[බාධා කිරීමක්] බොහොම ස්තුතියි. දැන් තමයි අපේ පරිසර අමාත්‍යතුමා ආවේ. ඒ ගැන අපි බොහොම සන්තෝෂ වෙනවා. එතුමා ගැන තමයි අපිට වැඩිපුර කථා කරන්න වෙලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, අපේ දිස්ත්‍රික්කයට ඉතාම වැදගත් වෙන පරිසර අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, අධිකාරි විශාල ප්‍රමාණයක් තිබෙනවා. අද වන විට ලෝකයේ කාලගුණික විපර්යාසයක් බොහොම තදබල ලෙස පවතිමින් තිබෙන නිසා පරිසරය පිළිබඳව මීට වැඩිය ප්‍රමුඛ ස්ථානයක් ලබා දිය යුතුයි. ගංගාවල වැලි හෑරීමෙන් ඇති වන ප්‍රශ්නය පිළිබඳව ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා විස්තර කළා. අපිත් ඒ පිළිබඳව ඉල්ලීමක් කරනවා. අද වන විට පවතින රටාව, ජනගහනය වැඩි වීම, ගොඩනැඟිලි ඉදි වීම, නිවාස ඉදි වීම මේ හැම එකකටම අපි සංවර්ධනය කියලා කියනවා. සංවර්ධනය එක්ක බලන විට විශාල වශයෙන් ගහකොළ කැපීම අවශ්‍ය වෙනවා. ඒ වෙනුවෙන් නැවත ගස් සිටුවීමක් සිදු කෙරෙනවාද? පවතින වනයත් ඒ විධියට ආරක්ෂා වෙනවාද? එහෙම නැත්නම් ගං ඉවුරුවල අවුරුදු සිය දෙසිය ගණන් පැරණි කුඹුක් ගස් එහෙමම පවතිනවාද කියන එක සම්බන්ධයෙන් දැඩි අවධානයක් විශේෂයෙන්ම ඔබතුමන්ලා පරිසර අධිකාරිය තුළින් -

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

වාරිමාර්ග දෙපාර්තමේන්තුව කියන ආකාරයට මිසක් අපිට ඕනෑ ආකාරයට ගස් කපන්නේ නැහැ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ඔබතුමන්ලා කපන්නේ නැති බව අපි පිළිගන්නවා. නමුත් ගරු ඇමතිතුමනි, කවුරුත් කියන්නේ නැතුව නේ, කවුරුත් දන්නේ නැතුව නේ මේවා සිදු වන්නේ. අපේ පැත්තේ ප්‍රාදේශීය දේශපාලනඥයෝ සිටිනවා. ඒ ගොල්ලන්ගේ ව්‍යාපාරය වටිනා ගස් කැපීම. වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගැන නොවෙයි මම කථා කරන්නේ. අපේ දිස්ත්‍රික්කයේ විශාල ගංගාවල් කිහිපයක් ගලාගෙන යනවා. ගංගා දෙපැත්තේ තිබෙන වටිනා ගස් කැපුවාම ගංවතුර බහුලව පවතින ප්‍රදේශයක් හැටියට පාංශු ඛාදනය ඉතාමත් ඉක්මනින් සිදු වෙනවා. කුඹුක් වාගේ ගස් ගැන වැඩි අවධානයක් යොමු කරලා ගංගා මායිම් ආරක්ෂා කරන්න කටයුතු කරන්න ඕනෑ. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමා කිව්ව කාරණය සම්බන්ධයෙන් අපි ඔබතුමාත් සමඟ එකඟ වෙනවා.

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ පුංචි රටේ ප්‍රධාන ගංගාවල් හයක් විතර තිබෙන නිසා, වැලි ගොඩ දැමීම නිසා තව ටික කාලයක් යන විට මේ හැම එකකින්ම මුහුදු ජලය උඩට එනවා. එම නිසා මේවාට ඒකාබද්ධ වුණු යම් කිසි වැඩ පිළිවෙළක් ඕනෑ කියා අපි කියනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වර්තමානයේ මහා මාර්ග විශාල ප්‍රමාණයක් සංවර්ධනය වීගෙන යන බව අපි දන්නවා. මහා මාර්ග සකස් කිරීමේදී ඒ අවට තිබෙන ගස් වැල් කපනවා. ආදි කාලයේ ඉඳලා තිබුණු මහා දැවැන්ත රුක්ෂ බිම හෙළනවා. හැබැයි, මේවා වෙනුවෙන් නැවත පැළයක් සිටුවන්නේ කොහේද?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

අතිගරු ජනාධිපතිතුමාත් කැබිනට් මණ්ඩලයත් අපට උපදෙස් දීලා තිබෙනවා, අලුතෙන් හදන පාරවල් දෙපැත්තේ ගස් සිටුවීමේ ව්‍යාපාරයක් පටන් ගන්න කියා. ඒ ශීර්ෂයේදීම ඒ සඳහා වැය ශීර්ෂයක් වෙන් කරන්න කියාත් එතුමා අණ කර තිබෙනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු ඇමතිතුමනි, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මෙවර පරිසර අමාත්‍යාංශයට වෙන් කර තිබෙන මුදල අඩු කර තිබෙන්නේ ඒ නිසාද දන්නේ නැහැ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ඒක අපට ප්‍රශ්නයක් නැහැ. අපට වෙනත් මාර්ගවලින් ලැබෙනවා. මේ වතාවේ නැවත වන වගාව සඳහා රුපියල් මිලියන 500ක් ලැබෙනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

හොඳයි. ඔබතුමා ගැන ලොකු විශ්වාසයක් ඇතුව, ඒ වාගේම විශ්වාසයක් තියන්න පුළුවන් කෙනෙක් හැටියට අපි ඒ වචනය විශ්වාස කරනවා. ඒ කෙසේ වෙතත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගස් -වන සම්පත- රැක ගැනීමේ අවශ්‍යතාව ඉතාම තදින් දැනෙන්නේ වෙන මොකුත් නිසා නොවෙයි, මේ කාලගුණ විපර්යාසය නිසායි. සමහර වෙලාවට දවස් ගණන් වහිනවා. වතුර ටික කොහේ යනවාද කියා හොයා ගන්න බැහැ. ඒ තරමට පොළොව හේදෙනවා. මේ වාගේ තත්ත්වයක් තමයි අද ඇති වෙලා තිබෙන්නේ. තවත් පරම්පරා ගණනාවකට මනුෂ්‍යාගේ පැවැත්ම තියෙන තුරු මේවා තියා ගන්න නම් අද අපට මේ වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කරන්න වෙනවා.

අපි දන්නවා, පසු ගිය දවස්වල උපන් දින සමරන්න නම් පැළ සිටුවීමේ ලොකු ව්‍යාපාරයක් කළ බව. ඒ වාගේම ඇමතිතුමාගේ උපන් දිනයට, නියෝජ්‍ය ඇමතිතුමාගේ උපන් දිනයට ඒ වාගේම

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

කරන්න. අපිත් ඒවාට දායක වෙන්නම් කියා මේ වෙලාවේ මතක් කරනවා. මොනවා කළත් පැළ සිටෙව්වා වාගේ නොවෙයි. එක ගහක් කපන විට අඩු ගණනේ පැළ දහයක්වත් සිටුවන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා ඊයේ පෙරේදා දකුණු ඉන්දියාවේ කුඩන්කුලම් න්‍යෂ්ටික බලාගාරය ගැන මහා ලොකු ඝෝෂාවක්, ආන්දෝලනයක් ඇති වුණ බව. ඒ පිළිබඳව ඉන්දියාවේත් මත භේද ඇති වෙලා තිබෙනවා. අපේ රජය හැටියට ඒ සම්බන්ධයෙන් අර ගෙන තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා පරිසර ඇමතිතුමාගේ කථාවේදී අපි දැන ගන්න කැමැතියි. න්‍යෂ්ටික බලාගාර ගැන අපට හොඳ අත්දැකීමක් තිබෙනවා. පසු ගිය දවස්වල ඇති වූ භූමිකම්පාවලදී ජපානයේ ෆුකුෂිමා න්‍යෂ්ටික බලාගාරවල පිපිරීමෙන් ඇති වුණ විනාශය අපි දන්නවා. ඒ වාගේම මේ කලාපය තුළත් නිතරම භූමිකම්පා ඇති වෙනවා; ස්වාභාවික විපත් ඇති වෙනවා. ඒවායේ ප්‍රතිඵල හැටියට දකුණු ඉන්දියාවේ ඒ න්‍යෂ්ටික බලාගාරය තුළත් මොකක් හරි නරක තත්ත්වයක් ඇති වුණොත් අපි ගන්නා වූ ක්‍රියා මාර්ග මොනවාද? යාපනයේ ඉඳලා මඩකළපුව අම්පාර දෙසටත්, අනෙක් පැත්තෙන් මන්නාරම පුත්තලම දෙසටත් ඒ බලාගාරය නිසා විශාල බලපෑමක් ඇති වෙන්න පුළුවන්. එවැනි අවදානමක් පිළිබඳව අඩු ගණනේ ඉන්දියානු ආණ්ඩුවත් එක්ක ශ්‍රී ලංකා රජය කුමන කථා බහක් හෝ කරලා තිබෙනවාද කියන එක අපි දැන ගන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පරිසර අමාත්‍යාංශය යටතේ කථා කරන කොට, අද වන විට අප කාටවත් කථා නොකර ඉන්න බැරි දෙයක් තමයි කසළ බැහැර කිරීමේ ගැටලුව. අද මේ සම්බන්ධයෙන් රටේ හැම තැනකම ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ලෙඩක් හැදෙන කොට, වසංගතයක් බෝවන කොට, ලෙඩ රෝග පාලනය කර ගන්න බැරි වෙන කොට විතරක්, කොහොමද ඒ ලෙඩ රෝග හැදිලා තිබෙන්නේ කියන එක ගැන කල්පනා කරනවා.

හැබැයි, අද අපි ආසියාවේ ආශ්චර්යය කරා ගමන් කළත්, අඩුම තරමින් අපේ රටේ කුණු ටික බැහැර කරන්නේ කොහොමද කියන එක පිළිබඳව නිසි වැඩ පිළිවෙළක් ඇති කර ගෙන නැහැ. ප්‍රාදේශීය සභාවලත්, නගර සභාවලත්, මහ නගර සභාවලත් මේ වෙන කොට යම්කිසි කසළ ප්‍රතිචක්‍රීයකරණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පටන් ගෙන තිබෙනවාද? දැන් අවුරුදු 25ක 30ක විතර ඉඳලා මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර නගරයේ ඉඳලා කිලෝමීටර් එකහමාරක් විතර ඇතුළත තිබෙන, රජයට අයිති ඉඩමකට කුණු බැහැර කරනවා. එතැනට තමයි මුළු රත්නපුර නගරයේම කුණු දමන්නේ.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
You have two more minutes, please.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
They took about four minutes from my time.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
You allowed their interventions.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
No, I did not.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
You should have objected to them at that time.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
The Hon. Nimal Siripala de Silva and the Hon. Anura Priyadharshana Yapa will give me four minutes. -[*Interruption.*] No, you have to give me time.

ඒ නිසා දැන් එතැන ලොකු කුණු කන්දක් ඇති වෙලා තිබෙනවා. රත්නපුර නගරයේ ඉඳලා කිලෝමීටර් දෙකයි එතැනට දුර.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Please wind up now.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඒ නිසා දැන් වැස්සක් එනකොට ඒ කුණු ගොඩ සේදිලා ඒ සියලුම අපද්‍රව්‍ය පහළින් තිබෙන කුඹුරුවලට එනවා. කහවත්ත ගත්තත්, නිවිතිගල ගත්තත් පෞද්ගලිකව මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාස ඒවායි. මුළු රටේම ගත්තත් ඔය තත්ත්වය තමයි තිබෙන්නේ. ඉතින් ආසියාවේ ආශ්චර්යයට යද්දී, ඔබතුමන්ලා වරායවල්, ගුවන් තොටුපොළවල් ආදී මේ ඔක්කොම හදන වෙලාවක, කරුණාකරලා මේ කුණු ටික බැහැර කරන්න පුළුවන් හරි විධියේ වැඩ පිළිවෙළක් මුළු රටේම ක්‍රියාත්මක කරන්න. අඩු ගණනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතර පහක් එකට සම්බන්ධ කර ගෙන ඒ කටයුත්ත කරන්න කියන ඉල්ලීම කරනවා.

කථා කරන්න ගොඩක් දේවල් තිබුණත් මෙතුමා හැම දාම මගේ වෙලාව අඩු කරනවා. මා ඒ ගැන කනගාටු වන ගමන්, ඔබතුමන්ලාට මේ කටයුතු කර ගෙන යන්න තවත් ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 5.07]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ජන ජීවිතයට බෙහෙවින් ඉවහල් වන ඉතා වැදගත් අමාත්‍යාංශ තුනක වැය ශීර්ෂ අද මේ උත්තරීතර සභාවේ සාකච්ඡාවට ගන්නා අවස්ථාවේ දී අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත්, අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් මගේ ගෞරවය සහ ස්තුතිය පුද කරන්නට ඕනෑ.

විශේෂයෙන්ම මේ අමාත්‍යාංශ එකින් එක බැඳී පවතින අමාත්‍යාංශ තුනක්. ඒ වාගේම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළේ දැක්වෙන ආකාරයට 2016 අවුරුද්ද වන කොට ශක්තිමත් ආර්ථිකයකින් හෙබි ගමක් නිර්මාණය කරන්න ඉතා විශාල පිටුවහලක් වන අමාත්‍යාංශ තුනක් ගැන තමයි අද අපි සාකච්ඡා කරන්නේ. පළමුවෙන්ම මේ අමාත්‍යාංශ තුන භාරව කටයුතු කරන ගරු අමාත්‍යතුමන්ලාටත්, සියලුම නිලධාරින්ටත් මගේ ගෞරවය සහ ස්තුතිය පුද කරන්න ඕනෑ, එතුමන්ලාගේ නායකත්වයෙන් මේ කරගෙන යන්නා වූ වැඩ පිළිවෙළ වෙනුවෙන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මිනිසුන්ට කෑම නැතිව ඉන්න පුළුවන්කම තිබුණත් හොඳ වතුර ටිකක් නැතිව ඉන්න පුළුවන්කමක් නැහැ. එක්සත් ජාතීන්ගේ සංවිධානය කරපු පරීක්ෂණයකට අනුව, එහෙම නැත්නම් පුරෝකථනයකට අනුව, 2050 අවුරුද්ද වන කොට රටවල් 66ක උග්‍ර පානීය ජල ප්‍රශ්නයක් ඇති වන බව දැන ගන්න තිබෙනවා. ඒ වාගේම ලෝක සෞඛ්‍ය සංවිධානය කරන ලද පරීක්ෂණයකදී හෙළි වී තිබෙනවා, 2020 වන කොට ලෝකයට බලපාන බරපතළ ගැටලුවක් වන්නේ, පානීය ජලය ආශ්‍රයෙන් ඇති වන රෝගාබාධ බව. ඒ නිසා ලෝකයේ පැවැත්ම බෙහෙවින්ම අඩාළ වන බවට සඳහනක් තිබෙනවා. කෙසේ නමුත්, අද වන විට අපේ රටේ ජල සම්පාදන විෂය භාරව කටයුතු කරන ගරු ඇමතිතුමා ප්‍රමුඛ අමාත්‍යාංශය කරගෙන යන්නා වූ වැඩ පිළිවෙළ අපි බෙහෙවින්ම අගය කරනවා. විශේෂයෙන්ම මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳන්න මේ වන කොට අතිවිශාල වැඩ කොටසක් අපේ ගරු ඇමතිතුමා ප්‍රමුඛ අමාත්‍යාංශය ඉටු කර තිබෙනවාය කියන එක ගරු ඇමතිතුමා ඇතුළු එම අමාත්‍යාංශයේ නිලධාරින්ට කරන ගෞරවයක් හැටියට මා කියන්න ඕනෑ. බරපතළ ගැටලුවක් වෙලා තිබුණු බෙන්තොට පානීය ජල ප්‍රශ්නය විසඳීමට සහ ගෝනාපීනුවල පානීය ජල යෝජනා ක්‍රමයට ආරම්භ කිරීමට මේ වන කොට මුදල් වෙන් කර තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඉතා ඉක්මනින් ඒ වැඩ කටයුත්ත ඉටු කරාවි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ තව ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. මේ වන කොට ගාල්ල නගරයේ මලාපවහන පද්ධතියක් නැහැ ගරු ඇමතිතුමනි. ඒකත් ඉක්මනින් සකස් කර දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ගාල්ල නගරය ආශ්‍රිතව අලුතින් ජල නළ එළීමක් කරන්නට තිබෙනවා. මිලියන 60ක ඇස්තමේන්තුවක් ඒ වෙනුවෙන් සකස් කර තිබෙනවාය කියන එක තමයි ආරංචි වෙන්නේ. ඒ සම්බන්ධයෙනුත් ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම ගරු ඇමතිතුමනි, බද්දේගම සහ ගාල්ලේ ජල පොම්පාගාරවලට විදුලි ජෙනරේටර් දෙකක අවශ්‍යතාවක් තිබෙනවා. ඔබතුමා අපේ ඉල්ලීම්වලට ඇහුම්කන් දෙන නායකයකු හැටියට අපේ දැඩි විශ්වාසයක් තිබෙනවා ඔබතුමා ඒ උදව්ව අපට කරාවි කියලා. ඔබතුමාගේ අනුග්‍රහය තුළින් මේ වන විට අපට පුළුවන්කම ලැබී තිබෙනවා, අපේ ආසනයේ පානීය ජල ගැටලුව සියයට 90කට වඩා විසඳන්න. රත්ගම ආසනය නියෝජනය කරන මහජන නියෝජිතයා හැටියට ඒ පිළිබඳව මා ඔබතුමාට නැවත නැවත ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපේ ආසනය මුහුද ආශ්‍රිත ප්‍රදේශයක තිබෙන ආසනයක්. ඔබතුමා කීප වතාවක් ඒ ප්‍රදේශයට ඇවිල්ලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඔබතුමාට අද අපේ ප්‍රදේශයේ ජනතාව පිං දෙනවා මේ සම්බන්ධව. අපේ ආසනයේ මිනිසුන්ට බොන්න වතුර ටිකක් තිබුණේ නැහැ. ඔවුන් කරිජ්ජ බිව්වේ. ඒ වාගේම අපි සුනාමියෙන් විනාශ වෙලා අනාථ වෙලා හිටපු මිනිස්සු.

අද වන කොට අපි සුනාමියෙන් අනාථ වුණු ජනතාවට විශාල අනුග්‍රහයක් දක්වා තිබෙනවා. ඒ නිසා ඔබතුමාටත්, ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගරු සභාපතිතුමා, සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු ඒ සියලු නිලධාරින්ටත්, විශේෂයෙන් මාතර ප්‍රදේශය භාරව කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිතුමා, අතිරේක සාමාන්‍යාධිකාරි සුමිත් පෙරේරා මැතිතුමා ඇතුළු ඒ හැම දෙනාටත්, ගාල්ල සහ අම්බලන්ගොඩ, හික්කඩුව භාරව කටයුතු කරන ඒ සියලු නිලධාරින්ටත් මගේ ගෞරවය සහ ස්තුතිය පුද කළ යුතු වෙනවා මේ අවස්ථාවේදී.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අපේ ගරු පරිසර ඇමතිතුමා මේ සභාවේ ඉන්න නිසා එතුමාගෙනුත් පොඩි ඉල්ලීමක් කරන්න ඕනෑ. ගරු තලතා අතුකෝරල මැතිනිය කථා කරන ගමන් කිව්වා, කුණු කසළ ඉවත් කරන්න මේ ආණ්ඩුවට කිසිම වැඩ පිළිවෙළක් නැහැ කියලා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දන්නවා මේ වන කොට අපේ රජය පිළිසරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා ඉතාම ශක්තිමත් ආකාරයට කුණු කසළ ඉවත් කිරීමේ ක්‍රමවේදයක් සකස් කර තිබෙන බව.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
කොහේද තිබෙන්නේ?

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
මගේ ආසනයේ ක්‍රියාත්මක කරලා තිබෙනවා. ගරු ඇමතිතුමා ගියා රත්ගම ආසනයට. රත්ගම ආසනයේ අක්කර 20ක ප්‍රමාණයක් ඒ සඳහා ලබා දීලා අද මේ වන කොට ඉතාම හොඳින් ඒ කටයුත්ත ක්‍රියාත්මක වනවා. ඒ ප්‍රදේශයේ තවත් පළාත් පාලන ආයතන 7ක කුණු කසළ එතැනට ගෙනෙනවා. නමුත් පොඩි ගැටලුවක් තිබෙනවා.ඒ කටයුතු සඳහා නවීන යන්ත්‍රෝපකරණවල අඩුවක් තිබෙනවා. ඒ වාගේම මිනිස් ශ්‍රමය තව ටිකක් ලබා දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා ඒ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියා මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. එහෙම කළොත් මා හිතන්නේ විපක්ෂය අපට මේ කරන චෝදනාවලට අපට හොඳ උත්තරයක් දෙන්න පුළුවන් වෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප කනගාටු වෙනවා, විපක්ෂය අප කරන කිසිම දෙයක අගයක් දකින්නේ නැති එක ගැන. ඇමතිතුමා පැළ ඉන්දුවා. ඒකට මෙතුමන්ලා පැත්තෙන් කැල්ලක් දමනවා උපන් දිනයට පැළ ඉන්දනවා කියලා. ඔවුන් දකින්නේ නැහැ මෙයින් පරිසරයට ඇති වන යහපත මොකක්ද කියලා. මම ඇත්තටම කනගාටු වෙනවා, අපේ විපක්ෂය අප කරන කිසිම දෙයක හොඳක් දකින්නේ නැති එක ගැන. ඒ නිසා අපේ පරිසර ඇමතිතුමාට මා කියන්න ඕනෑ, විපක්ෂය මොන තරම් නිර්දය විවේචන ඉදිරිපත් කළත් ඔබතුමන්ලාගේ ශක්තිමත්භාවය තුළින් අපේ රටට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්නය කියලා.

අපේ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්න නිසා අප එතුමාට කියන්න ඕනෑ එතුමා ඉතාම ප්‍රශස්ත කාර්යයක් කරන බව. නමුත් මට පොඩි ගැටලුවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප මධ්‍යම ආණ්ඩුව තුළින් ජල කළමනාකරණයට මොන තරම් පහසුකම්

[ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා]

ලබා දුන්නත්, පළාත් සභාව හරහා කෙරෙන වැඩවලදී අපට යම් ගැටලුවක් තිබෙනවා. අප මධ්‍යම රජයේ මුදල් අරගෙන පළාතේ තිබෙන ඇළ මාර්ග ශුද්ධ කරලා දුන්නත් නඩත්තු කිරීමේ ක්‍රමවේදයක් නැහැ. මේ කාරණය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්නට මා කැමැතියි. කැබිනට් මණ්ඩලයේදී හෝ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා විධිමත් සම්බන්ධීකරණයක් තුළින් මේ ඇළ මාර්ග නඩත්තු කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන්නය කියා මා ඉල්ලීමක් කරනවා. එහෙම නොවුණොත් මුදල් අපතේ යාමක් විතරයි සිදු වන්නේ. මධ්‍යම ආණ්ඩුව මුදල් දෙනවා. මට මතකයි, ගිය අවුරුද්දේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ මූලිකත්වයෙන් ප්‍රදේශයේ වාරිමාර්ග පද්ධතිය සකස් කරන්න අපට රුපියල් ලක්ෂ 100ක පමණ මුදලක් ලබා දුන්නා. නමුත් කාලයක් ගියාට පස්සේ ඒවා නඩත්තු වන්නේ නැහැ. මට ලැබී තිබෙන කාලය අවසානද, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි?

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

කාලය අවසානයි. ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වන අතර, මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ අපේ රජය ගෙන යන්නා වූ මේ සංවර්ධන ක්‍රියාදාමයන් අපේ රටේ ජනතාව සියයට සියයක්ම අනුමත කර තිබෙනවාය කියන කාරණයත් ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තුතියි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

මීළඟට ගරු තාරානාත් බස්නායක මහතා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 9ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 5.15]

**ගරු තාරානාත් බස්නායක මහතා**
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க )
(The Hon. Tharanath Basnayaka)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැදගත් අමාත්‍යාංශ තුනක් වන වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ, ජල සම්පාදන හා ජලාපවහන සහ පරිසර යන අමාත්‍යාංශවල වැය ශීර්ෂ අද දින සාකච්ඡාවට භාජනය වනවා. ඒ යටතේ මට කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මෙහිදී මා පළමුවෙන්ම සඳහන් කරන්න ඕනෑ, රජයක් හැටියට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ පසු ගිය ඉතිහාසය තුළ මේ රටේ තිබුණු දැවැන්ත, කුරිරු ත්‍රස්තවාදය අවසන් කරලා සියලුම ජාතීන්ට නිදහසේ ජීවත් වන්නට පුළුවන් පරිසරයක් ඇති කරලා කඩිනම් සංවර්ධනයක් මේ රට තුළ ක්‍රියාත්මක කර තිබෙන බව. එවන් දැවැන්ත වූ සංවර්ධනයක් අද මේ රට තුළ ක්‍රියාත්මක කර තිබෙන වෙලාවක, ග්‍රාමීය ජනතාවට අවශ්‍ය පහසුකම් සියල්ල එකින් එක ලබා දීමේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක වනවාය කියන එක අප කවුරුත් දන්නා කාරණයක්. අපේ රට කෘෂිකාර්මික රටක්. විශේෂයෙන්ම අපේ ආර්ථිකය කෘෂිකර්මාන්තයත් එක්ක බද්ධ වෙලායි තිබෙන්නේ. අප රටේ වැඩිපුරම ඉන්නේ ගොවි ජනතාව. පුරාණයේ සිට ගොවිතැනින් දිවි ගෙවපු අපේ මුතුන් මිත්තන්, රජවරු කරපු ඒ වාරි කර්මාන්ත දෙස බලන විට අපට පේනවා ඔවුන් දැවැන්ත වූ වාරි සංවර්ධන සංග්‍රාමයක් ක්‍රියාත්මක කර තිබෙන බව. එදා ඒ රජවරු, මුතුන්මිත්තන් වාරි සංවර්ධනය වෙනුවෙන් කටයුතු කළා හා සමානවම මෑත කාලයේදී මේ වාරි ක්ෂේත්‍රයේ දැවැන්ත සංවර්ධන ක්‍රියාදාමයක් ඇරඹුවේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාය කියන කාරණය අප කවුරුත් දන්නවා. අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන ක්‍රියාදාමයන් දෙස, ගොවි ජනතාව වෙනුවෙන් කළ සේවය දෙස ආපසු හැරී බැලුවොත් ඒ ගැන අප කාටවත් කිසිවක් කියන්නට බැහැ. ඒ පිළිබඳව විපක්ෂය යම් යම් අදහස්, යෝජනා, චෝදනා, විවේචන ඉදිරිපත් කළා. ග්‍රාමීය ජනතාව මේ මහින්ද රාජපක්ෂ කියන චරිතය පිළිබඳව, ඒ ග්‍රාමීය නායකයා පිළිබඳව ඉතාම හොඳ අවබෝධයකින් යුතුව කටයුතු කරනවාය කියන කාරණය අප විශ්වාසයෙන් යුතුව කියනවා.

විශේෂයෙන්ම උමා ඔය, යාන් ඔය, දැදුරු ඔය, මොරගහකන්ද ආදී වශයෙන් මහා වාරි ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන්න වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. අපි ඉතිහාසයට පොඩ්ඩකට ගියොත් මට මතක් වෙනවා, දැදුරු ඔය ව්‍යාපෘතිය. දැදුරු ඔය ව්‍යාපෘතිය ගැන කථා කරන කොට මට මේ කාරණය කියන්නම වෙනවා. අපේ වර්තමාන කථානායකතුමා තමයි ඒ කාලයේ විෂයභාර අමාත්‍යවරයා හැටියට කටයුතු කළේ. මේ ව්‍යාපෘතිය ගැන රජයට විශාල වශයෙන් චෝදනා එල්ල වුණා; විශාල වශයෙන් අප්‍රසාද පළ කළා. දේශපාලන කුමන්ත්‍රණවාදීන් අපේ අහිංසක ගොවි ජනතාව අල්ලාගෙන ඒ අයගේ ඔළුවලට විෂ බීජ දාලා, ඒ අයට එක එක දේවල් කියලා මේ වැඩසටහන අක්‍රිය කරන්න හැදුවා. නමුත් ඒ සියලු අභියෝග ජය ගෙන අපි දැදුරු ඔය ව්‍යාපෘතිය විශාල ගොවි ජනතාවකට සෙත සැලසෙන ආකාරයෙන් ජනතා අයිතියට පත් කරන්න අවශ්‍ය කටයුතු යොදලා තිබෙනවා. ඒ ගැන අප සන්තෝෂ වනවා. ඒ ගැන අපට වඩා අද සන්තෝෂ වන්නේ ඒ ගොවි ජනතාවයි. ඔවුන් එදා මංමුලා වුණාය කියලා ඒ ජනතාව කියනවා. දේශපාලන පළිගැනීම්වලට, දේශපාලන කුමන්ත්‍රණවලට මේ ජනතාව අල්ලා ගන්න හැදුවාට එය ඉෂ්ට වුණේ නැහැ.

මා නියෝජනය කරන, වයඹ පළාතේ ගල්ගමුව මැතිවරණ කොට්ඨාසය මහා වාරි යෝජනා ක්‍රම හතක් ක්‍රියාත්මක වන මැතිවරණ කොට්ඨාසයක්.වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ විශාලතම මැතිවරණය කොට්ඨාසය හැටියට ගල්ගමුව මැතිවරණ කොට්ඨාසයේ වාරි යෝජනා ක්‍රියාත්මක වෙන කොට ලබන වර්ෂයේදී අලුත් සංවර්ධන යෝජනාවක් හැටියට වාරි යෝජනාවක් ක්‍රියාත්මක කරන්න හැකියාව ලැබී තිබෙනවා. ඒ තමයි, මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ ඒ ප්‍රදේශවලට ජලය ලබා දීම. ඒ නිසා මම සන්තෝෂ වෙනවා, යාපහුව මැතිවරණ කොට්ඨාසයේ ජීවත් වෙන ගොවි ජනතාවගේ සිහිනයක් සැබෑ වීම පිළිබඳව. වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හරහා ලබන වර්ෂයේ අප්‍රේල් මාසය වන කොට එහි පළමු අදියර ආරම්භ කරනවා.

මොරගහකන්ද ව්‍යාපෘතිය හරහා ඒ ජල යෝජනා ක්‍රමය ගෙනෙන කොට මහකිරුළ සහ මහකිතුල කියන ප්‍රධාන ජලාශ දෙක ඉදි කරන්න කටයුතු යොදලා තිබෙනවා. ඒ නිසා මම ගොඩාක්ම සන්තෝෂ වෙනවා. මොකද මේක ජනතාවගේ ඉල්ලීමක් ඉෂ්ට වීමක් නිසා. ජනතාව මහා දේවල් ඉල්ලුවේ නැහැ.

ගොවි ජනතාවක් හැටියට ඒ ප්‍රදේශවල ජීවත් වන්නේ අහිංසක ජනතාවක්. ඒ අය මහා ලොකු ඉල්ලීමක් ඉෂ්ට කර දෙන්න කියලා අපට කිව්වේ නැහැ. ඒ අය කිව්වේ, ඔවුන්ට ජීවත් වන්නට කුඹුරු ටික කර ගන්න වතුර ටික ලබා දෙන්න කියලායි. මම මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ, ඒ වාගේම ස්තුති කරන්න ඕනෑ, නාමල් රාජපක්ෂ අපේ තරුණ නායක මන්ත්‍රීතුමාට. එතුමා ඒ පිළිබඳව උනන්දු වෙලා අතිගරු ජනාධිපතිතුමාට ඒ ගැන කරුණු පැහැදිලි කරලා පස්සට ගිහිල්ලා තිබුණු යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරවන්න අවශ්‍ය කටයුතු කළා. අපිත් අතිගරු ජනාධිපතිතුමාට මේ පිළිබඳව සඳහන් කළාට පස්සේ එතුමා ලබන වර්ෂයේ ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ පිළිබඳව එතුමාටත් ස්තුති කරන්න ඕනෑ. වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා හැටියට ගරු නිමල් සිරිපාල සිල්වා මැතිතුමා ඒ ප්‍රදේශයට ඇවිල්ලා ඒ ජනතාව කියන දේවල් අහගෙන හිටියා. එතුමා අහගෙන ඉඳලා අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු ඒ සියලු නිලධාරීන් දැනුවත් කරලා ඒ වාරි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන්න කටයුතු යොදලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව වයඹ ගොවි ජනතාවගේ ගෞරවනීය ප්‍රණාමය,  අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාටත්, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා හැටියට ගරු නිමල් සිරිපාල සිල්වා ඇමතිතුමාටත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරීන්ටත් පුද කරනවා. ඒ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ඒ නිලධාරීන් ඒ ප්‍රදේශවලට ගිහිල්ලා ඒ කටයුතු කරන කොට ජනතාවට බොහොම උනන්දුවක් ඇති වුණා; ඔවුන්ගේ සිත් සතන් තුළ බොහොම ආශාවක් ඇති වුණා. දිස්ත්‍රික්කයේ අපේ අනෙකුත් අමාත්‍යවරුන්ටත් මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා, මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න හැකියාව ලබා දීම පිළිබඳව.

විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ, මගේ මැතිවරණ කොට්ඨාසයේ සියයට 90ක්ම සිටින්නේ ගොවි ජනතාවයි කියන කාරණය. අපේ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා පසු ගිය කාලයේ අපේ ප්‍රදේශයට ආවා. අපේ ප්‍රදේශයේ මහා වාරි යෝජනා ක්‍රම හතක් ක්‍රියාත්මක වෙනවා. උස්ගල සියඹලන්ගම ව්‍යාපාරය ඉන් එකක්. වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ ලක්ෂ 1,200කට ආසන්න විශාල මුදල් ප්‍රමාණයක් වැය කරලා ඒ වේලි පද්ධතිය සකස් කරගෙන යනවා. ලබන වර්ෂයේදී නැවත සැරයක් රුපියල් මිලියන 500ක් වියදම් කරලා ඒ උස්ගල සියඹලන්ගම ඔය හරස් කරලා මහා ගල්ගමුව කියන ජලාශයට වතුර ගෙනැල්ලා එක්තරා ප්‍රදේශයකට ඒ ජලය ගෙනැත් දෙන්න කටයුතු යොදා තිබෙනවා. ගොවි ජනතාව වෙනුවෙන් ඒ අවශ්‍ය සියලු දේවල් ලබා දීලා, ගොවි තැනට අවශ්‍ය කරන පරිසරය නිර්මාණය කරන්න අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයට හැකියාව ලැබී තිබෙනවා.  ඒ පිළිබඳව ජනතාව දන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට නියමිත කාලය බොහෝ සෙයින් ගෙවී ගිහින් තිබෙනවා. ඒ නිසා මම මගේ කථාවේ ඉතිරි කොටස **සභාගත*** කරනවා.

අවසාන වශයෙන්, මේ අවස්ථාවේ මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. කවුරු මොනවා කිව්වත්, විපක්ෂය කොයි තරම් දේ කිව්වත් අද අප ජීවත් වන පළාත්වල ජනතාව දන්නවා, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ, මේ ආණ්ඩුව මඟින් ජනතාවට සෙත සැලසී තිබෙන බව, විවිධ වරප්‍රසාද ලැබී තිබෙන බව, වරප්‍රසාද ලැබෙමින් පවතින බව. ඒ සියල්ල ජනතාව දන්නවා කියා සඳහන් කරමින් මේ අවස්ථාව ලබා දුන් ඔබ සියලුදෙනාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

---

***  පුස්තකාලයේ තබා ඇත.**

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

*  *Placed in the Library.*

[5.24 p.m.]

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Thank you, Hon. Deputy Chairman, for giving me time to speak on the Votes of three very important Ministries. Three very important Ministers are handling these three Ministries, and as such, it is a pleasure to speak on these Votes. When I entered the Chamber this afternoon, the Hon. Dinesh Gunawardena was speaking. He  spoke with hurt because some Opposition Members had only criticized him and not praised him. But, I am sure his heart has now been soothened because my Colleague, the Hon. (Mrs.) Thalatha Atukorale, praised all three Ministers so much that you all must be feeling very happy now.

Hon. Minister of Water Supply and Drainage, I have been speaking to many people in this Parliament and outside. All the people feel that you are doing a great job. Your Ministry is limited to water supply and drainage. However, the projects you are handling are so large that I am sure you must be feeling happy and satisfied that you are doing something worthwhile in this country today. We are grateful to you for developing water supply schemes not only in the South but in the North and East as well because the Members of Parliament from the North and East are also  full of praise for you. We, in the up-country are also grateful to you for bringing water supply schemes to the urban areas in the up-country.

However, in the plantations, it is taken for granted that there is water and people are happily enjoying the water. But, there is no proper management of water inside these estates.  There are naturally flowing streams from which they tap the water by putting a small bund somewhere. But, from that bund,  you could see about 100 pipes being drawn to each household. There is no system of managing water in these estates and a lot of water is going waste. A lot of money is also being wasted for providing these pipes from the original source right to their houses.  So, this has to be looked into. They should have the know-how and support to create their own community-based water supply systems in the estates. So, in this regard, you have a duty to look after these people. Through such a system, a water source could be tapped and water could be brought to the area where the houses are located and then distributed in a manner that wastage will be less and water would be readily available.

We believe that natural streams are clean and the water that flows is hygienic. It is not always so. Especially today, with the use of chemicals, with the use

of pesticides and water being exploited at different stages, water is somewhat polluted. There is no scheme or no system to check whether the water is hygienic. There is no know-how given to those people who manage water in the plantations as to how the water could be made hygienic for consumption by the people. So, this is a very important aspect where the Hon. Minister and the Water Supply and Drainage Board should take some action. These people could be educated; they could be given the know-how; they could be given the support to tap clean water to their homes. Today, even the people in the plantations do not want to go to the stream and fetch water. They are expecting the water not only by the line-rooms, but they also wish to have the water inside their houses, into their kitchens, so that they can use water for their day-to-day purposes in the manner that all others in urban areas, or even in villages, are able to utilize water. So, in this regard, please devote some attention to the needs of these plantation people so that their water situation, the way they use water is improved. Though they have water, they are not using it in a scientific way. In this regard, I wish to point out, Hon. Minister, that the World Bank has done a study on water and sanitation issues in the plantation areas. I am sure that is available to you and I understand that the World Bank is willing to support any scheme that is going to address this issue. You must exploit this situation when they are willing to support you; make use of it to supply good water to the people in the plantations.

Talking about plantations, the watersheds are mostly in the hills. There was a scheme under the Ministry of Environment for watershed management. It was an ADB-supported project, but this project has now been abandoned. I think it was in operation for about four years and I remember when the Hon. A.H.M. Fowzie was the Minister for Environment, I met him. We had discussions and we were asked to persuade the people in the plantations not to exploit their watersheds in a manner that the water supply itself would be affected. But, today, I do not know whether there is any other project to protect the watersheds in the up-country. So, I request the Minister of Water Supply and Drainage, which is connected to environment and also to irrigation, to look into the situation of the watersheds, which have to be preserved by us to preserve the ecology and the availability of water without creating drought situations in the country. As most of the rivers are emanating from the up-country and are flowing down, preservation of watersheds is important for these streams and rivers to flourish and be available for the future.

We are grateful to the Minister of Water Supply and Drainage for issuing a statement that no groundwater will be taxed. Hon. Minister, that is a very positive statement that you have made. I do not know from where it emanated but some official or somebody in the Government thought that water that is available underground and tapped by people who dig their own wells be taxed. This would have been a very unfortunate situation. About 25 years ago, when the Water Supply and Drainage Board started taxing water, there was a big ha-ho. We thought, "Why should we pay for water?" But, the Water Supply and Drainage Board is bringing the water to our house, delivering it and they incur a cost. They charge for that and we are willing to pay. But, when somebody digs his own well and exploits that water, to tax that water will be unacceptable. Hon. Minister, we are grateful that you would stand up for this policy of not taxing the water. Otherwise, soon we would see even the air that we breathe may be taxed. We may have to carry a meter around our neck, which will be measuring how much of air we are using to breathe, so that you could tax it, because this Government is taxing everything.

The Environment Ministry at one time said, all electronic waste is creating pollution and that they would collect it and destroy them. They said the mobile phones were creating the biggest electronic pollution in the country and they imposed a tax of 12.5 per cent on all telephone bills. But, today, it is not a tax for the Environment Ministry, it is a tax for the Government.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
A tax of 20 per cent is imposed on all telephone bills. But, today this money is used not for the protection of the environment but it has become a further revenue measure for the Government and nothing else.

Today, this Government imposes taxes on everything. Taxes are levied on things like milk food, milk powder, flour, sugar, potatoes, all these. This again, is a revenue measure. But, normally you say that you are levying these taxesto to protect the potato farmer, to protect the local sugar industry. We also have an export cess on tea. We have an export cess on rubber. But, how much of these taxes are used for the benefit of these industries? If you are taxing flour, you must support the rice farmer with that revenue. If you are taxing export of tea, at least a part of that tax must be used for the welfare of the

people who grow that tea. But, that is not happening. Otherwise, at least, you support the industry. I know that Rs.1,750 million is collected as export cess on tea. But, only Rs. 200 million is given per year to the Sri Lanka Tea Board for their recurrent expenditure. If this Rs.1,500 can be given back to the tea industry for the development of the tea industry, I am sure we would reap much more benefits in the future by the development of the industry. So, all these taxes should not be merely revenue measures but they should have a deeper motive. It should go back to develop that particular industry against which you are collecting this revenue.

Talking about milk powder, milk powder without the tax would be about Rs. 200. A litre of milk from that milk powder will be about Rs. 60. Today, you buy a litre of milk from the farmer at Rs. 50. But, this tax that comes in should go back to the dairy farmer so that he is able to increase the production of milk and we can become self-sufficient in milk, at least, at some future date.

My Colleague, the Hon. (Mrs.) Thalatha Atukorale spoke about solid waste management. We have been talking about solid waste management for years. You had announced that there are schemes that are coming up to collect urban solid waste and to process it. But, we see on TV every other day, there are two places where dirt is being dumped in the City. That is in Maligawatta and in Kolonnawa. Those people are suffering everyday. This type of dumping is taking place in every Pradeshiya Sabha, every Urban Council and every Municipal Council. Those areas are being polluted. We are using our solid waste only as filler to fill low lying areas and marshy lands. That should not be the way. You should have a positive plan of action to deal with this issue.

Hon. Minister, I request you to please look into this matter. Thank you.

[අ.භා. 5.38]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන් කරුණු කීපයක් සම්බන්ධයෙන් අදහස් දක්වන්න මගේ කාලය ගත්තොත් හොඳයි කියලා මම හිතනවා. විශේෂයෙන්ම හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා පිළිසරු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය පිළිබඳව විශාල චෝදනාවක් කළා. මේ කසළ ව්‍යාපෘතිය පටන් අරගෙන තිබෙන්නේ 2008 සිට 2013 දක්වා කාලය සඳහායි. රජය වියදම් කරන්න බලාපොරොත්තු වෙලා තිබෙන්නේ කෝටි 5ක් නොවෙයි, රුපියල් මිලියන 5,675ක්. මේ වැඩ පිළිවෙළ සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේත්, පරිසර අමාත්‍යාංශයේත් ලේකම්වරුන්ගේ සම සභාපතිත්වය යටතේ පිළිසරු ජාතික මඬුල්ලක් පිහිටුවා තිබෙනවා. අපි ක්‍රම ගණනාවකට ඒකට සහාය දෙනවා. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවල, නගර සභාවල, මහ නගර සභාවල කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා අපි කටයුතු කරනවා.

අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමා කොලොන්නාවේ එකතු වන කසළ ගැන සඳහන් කළා. Now, we are putting up a building for a compost project in Kolonnawa. But, we have to do a lot of new projects in Colombo and other areas. So, we are going ahead with that. කුඩා පරිමාණයේ කොම්පෝස්ට් ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් ප්‍රාදේශීය සභා මට්ටමින් ආරම්භ කරන්න අපිට පුළුවන් වෙලා තිබෙනවා. සමහර ප්‍රාදේශීය සභාවන් ඉතාම විශිෂ්ට විධියට මේක කරනවා. රත්ගමත් අපි ව්‍යාපෘතියක් කළා. අපි කළුතර විශාල ව්‍යාපෘතියක් කළා. බලංගොඩ ප්‍රාදේශීය සභාව මම හිතන්නේ ජාත්‍යන්තර තලයට පත් වන විධියේ විශාල වැඩ කොටසක් කරනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා 17ක් තිබෙනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
අපට ඉඩමක් සපයා ගන්න පුළුවන් නම් දැන් වුණත් රත්නපුර මහ නගර සභාවටත්, රත්නපුර දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය සභාවලටත් අපට ඒක දෙන්න පුළුවන්. කොයිකා මූල්‍යාධාර සපයන සනීපාරක්ෂක කසළ බිම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම මැදිරිගිරිය, අනුරාධපුරය, හික්කඩුව, මානමුල්ල, ගම්පොළ, උඩුනුවර මේ සනීපාරක්ෂක කසළ රඳවන ඇති කිරීම සඳහා අපට මේ අවුරුද්දේ සිට කොයිකා ආධාර ලැබෙනවා. කොරියානු ආධාර යටතේ රුපියල් මිලියන 450ක මූල්‍ය ආධාර සැපයීමකින් දොම්පේ ප්‍රදේශයේ අපි ප්‍රථම ව්‍යාපෘතිය ආරම්භ කරන්න පටන් අරගෙන තිබෙනවා. දැනට ඒක ඉදි වෙමින් යනවා. ඒක ඉදි කළාට පස්සේ ලංකාවේ පළමු සනීපාරක්ෂක කසළ බිම් පිරවුම් ව්‍යාපෘතිය ආරම්භ වනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඔක්කොම දොම්පේට ගේනවාද?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
නැහැ, දොම්පේට ඔක්කොම ගෙනෙන්න නොවෙයි. අපි දැනට එවැන්නක් ඉදි කරන්න තීන්දු කර තිබෙන්නේ දොම්පේ ප්‍රාදේශීය සභාවට පමණයි. ඊට පසුව අපි තවත් ප්‍රාදේශීය සභා ගණනාවකුත් එයට සම්බන්ධ කරනවා. ජීව වායු ඒකක ඉදි කිරීම සඳහා අපි විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. කොම්පෝස්ට් බඳුන් බෙදලා දීලා තිබෙනවා. කසළ වෙන් කිරීම් වැඩසටහන් කරලා තිබෙනවා. මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් කරලා තිබෙනවා. මේ ආදී වශයෙන් අපි සෑහෙන වැඩ කොටසක් කරලා තිබෙනවා. විශේෂයෙන්ම බදුල්ල ප්‍රදේශයේ යම් සිද්ධියක් ඇති වුණා. මේක පළාත් පාලන අමාත්‍යාංශය තමයි කරලා තිබෙන්නේ. මා හිතන්නේ මිලියන 25ක මූල්‍ය ආධාරයක් පිළිසරු ව්‍යාපෘතියෙන් දීලා තිබෙනවා. නමුත් ඒකේ සියලුම ක්‍රියාවලිය භාර වෙලා තිබෙන්නේ ඒ අමාත්‍යාංශයටයි. අපි ඒකේ අධීක්ෂණ කටයුතුවල නොමැති වුණත්, ඒකේ යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් සොයලා බලලා, තව මුදල් දෙන්න තිබෙනවා නම් අපි ඒ කටයුතු කරනවා. ඒ වාගේම කුරුණෑගල සම්පූර්ණ කසළ ව්‍යාපෘතියක් ආරම්භ කරලා තිබෙනවා. මම හිතන්නේ ඒක තව මාස කීපයකින් අවසාන වෙනවා.

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කරුණු ගණනාවක් අපිට කිව්වා. මේ එක ඉඩමක්වත් අපිට අයිති ඉඩම් නොවෙයි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති කිසිම ඉඩමක් අපි "ඩෝල්" සමාගමට දීලා නැහැ. විශේෂයෙන් පුත්තලම HVA Farm එකට අපි මේක ලබා දීලා තිබෙනවා. ඒකට අපි එකඟතාව පළ කළා. ඒක අපි ලබා දීලා තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මතයි. ඒ වාගේම අනුරාධපුරයේ ඉඩම සම්බන්ධයෙන් ගත්තොත් මහවැලි අධිකාරියෙනුත් අවසර ලැබුණාට පස්සේ අපි ශක්‍යතා වාර්තාවක් කැඳවලා ඒ අනුව තමයි ඒ ඉඩම් නිදහස් කරලා තිබෙන්නේ. ඔය කියන විධියේ පලු ගස්, වීර ගස් කැපිල්ලක් කොහේවත් වෙලා නැහැ. ඉතා හොඳින් ඒ කටයුත්ත කරගෙන යනවා. මා හිතන්නේ ඔය චෝදනා කරන අය මේ තොරතුරු ලබා ගන්න කොට අඩු ගණනේ ඒ ප්‍රදේශයට ගිහිල්ලා ෆොටෝ එකක්වත් අරගෙන එනවා නම් හොඳයි. එතකොට මොකද වෙලා තිබෙන්නේ කියලා හොයා ගන්න පුළුවන්. මම ඔබතුමියට නොවෙයි මේ කියන්නේ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු සභාපතිතුමනි, පුත්තලම දිස්ත්‍රික්කයේ ලුණු නිෂ්පාදන ව්‍යාපෘති සඳහා අවසර දීලා තිබෙන්නේ වයඹ පළාත් පරිසර අධිකාරියයි. ඒ නිසා ඒ පිළිබඳ විස්තර මා සතුව නැති බව මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ. ඒ අනුව අද අපි මේ හැම අංශයකම විශාල වෙනස්කම් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය ගැන අද කථා කළා. ඇත්ත වශයෙන් අද මෙය ලාභ ලබන ආයතනයක්. වෙනදා වාගේ නොවෙයි, අපි මේ වන කොට සෑහෙන පමණ ඉහළ මට්ටමින් මේ ආයතනය කරගෙන යනවා. [බාධා කිරීමක්] ඒක මා කියන්නම්. අපි දැනට බලපත්‍ර 9,604ක් දීලා තිබෙනවා. ඒ කියන්නේ, කැණීම් බලපත්‍ර ඇතුළු බලපත්‍ර සංඛ්‍යාවයි. මේ බලපත්‍ර සංඛ්‍යාවෙන් බැකෝ සඳහා අපි දීලා තිබෙන්නේ බලපත්‍ර 140යි. ඒවා ලබා දීමේදීත් අපි ප්‍රදේශයේ දේශපාලන අධිකාරියත්, ඒ වාගේම අනෙකුත් උදවියත් එක්ක සාකච්ඡා කරලා ක්‍රමවේදයක් හැදුවා. [බාධා කිරීමක්] ඔබතුමියට ඕනෑ නම් මම ඒක දෙන්නම්. ඒ ක්‍රමවේදය ගැන මා කියන්නම්. සාමාන්‍ය ක්‍රමයට පතල් හාරන්න බැරි, ඒ වාගේම ප්‍රදේශයේ මහ ජනතාවගෙන් හිරිහැරයක් නැති ක්‍රමවේදයක් හදලා අපි ඒක බාර දීලා තිබෙනවා. ඒ සෑම බැකෝ බලපත්‍රයකටම අපි අධීක්ෂණ නිලධාරියකු පත් කරලා කටයුතු කරනවා. බැකෝ යන්ත්‍ර පාවිච්චි කළාට පස්සේ ඒ වළවල් වහලා ගස් හිටෙව්වාට පස්සේ තමයි අපි අප ළඟ තියාගෙන ඉන්න සම්පූර්ණ මුදල නිදහස් කරන්නේ. දැනටත් එහෙමයි කෙරෙන්නේ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
අධීක්ෂණ නිලධාරින් දැම්මේ කුරුණෑගලින්ද?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
කොහෙන් හරි දැම්මාම හොඳයි නේ. ඇයි, ඔබතුමිය තරහාද? තරහා වෙන්න එපා. ඒකට අපි ආණ්ඩුවෙන් සල්ලි ගෙවන්නේ නැහැ නේ. හුඟක් සාම්ප්‍රදායික කර්මාන්තවලයි යෙදෙන්නේ. පසු ගිය කාලයේ අපට කිව්වා අප ලොකු මුදලක් අය කරනවා කියලා. 2006 ඉඳලා දෙවරක් බලපත්‍ර ගාස්තු සංශෝධනය වෙලා තිබෙනවා. මේ අවුරුදු හයක කාලය තිස්සේ වැඩි වෙලා තිබෙන්නේ රුපියල් 3,000ක ප්‍රමාණයකුයි. වැඩිම ප්‍රමාණයක් තිබෙන්නේ සාමාන්‍ය කැණීම් බලපත්‍රයි. බලපත්‍ර නවදහස් ගණනකින් අපට තිබෙන්නේ බැකෝ බලපත්‍ර 140ක් විතරයි. අපි ඒ කැණීම්වලට සම්බන්ධ වට ප්‍රමාණය ඇතුළු සියල්ල පරීක්ෂා කරනවා. එහි අඩු පාඩුවක් තිබෙනවා නම් අපට දන්වන්න ගරු මන්ත්‍රීතුමියනි. අඩු පාඩුවක් සිදු වෙලා තිබෙනවා නම් ඒක සම්පූර්ණයෙන් නැති කරන්න අපි කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම යම් කිසි නිලධාරින් සංඛ්‍යාවක් හසු වුණා කියලා කිව්වා. Spot fine එකකට ගිහිල්ලා ඒ නිලධාරියා අත් අඩංගුවට ගනු ලැබුවා. ඊට පස්සේ මම ඒ ක්‍රමවේදය සම්පූර්ණයෙන් වෙනස් කළා. නමුත් මේ දක්වා ඒ නිලධාරියාගේ වැඩ තහනම් වෙලා නැහැ කියලායි මට කිව්වේ. මම අද කිව්වා ඒ අයගේ වැඩ තහනම් කරන්න කියලා. පරීක්ෂණයක් පවත්වලා, ඒ තීන්දුව අනුව අපට ආපසු ඒ කටයුත්තට එන්න පුළුවන්. මම අද ඒ උපදේශය දුන්නා. අපෙන් අඩුපාඩුවක් වෙලා තිබෙනවා. ඒ අඩු පාඩුව පිළිගනිමින් ඒ සඳහා කටයුතු කරන්න කියලා මම ඒ අවස්ථාවේ කිව්වා. ඒ වාගේම අපි සමහර තැන්වලට -විශේෂයෙන් ඇලහැර වාගේ තැන්වලට- ගිහිල්ලා ඒ ඒ ස්ථානවල තිබෙන ගොඩ ඉල්ලම් අඩු බලපත්‍ර ගාස්තුවක් යටතේ ලබාගැනීමට අවශ්‍ය අවසරය දීලා තිබෙනවා. ඒ අනුව ඒ ඉල්ලීම් කරන ඕනෑම කෙනකුට ඒ සඳහා අවශ්‍ය කටයුතු සලස්වන්න කියලා අප කියා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මගේ අමාත්‍යාංශය ගැන කථා කරනවා නම් අපේ අමාත්‍යාංශයේ තිබෙන සෑම ආයතනයක්ම ඉතාම ඉහළ මට්ටමේ කළමනාකරණයක් පවත්වාගෙන යනවා. භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, රාජ්‍ය දැව සංස්ථාව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ඒ වාගේම මධ්‍යම පරිසර අධිකාරිය කියන මේ සියලු ආයතන ඉතාම හොඳින් ක්‍රියාත්මක වෙනවා.

ප්‍රධාන වශයෙන් තිබෙන අපේ වාණිජ ආයතන සියල්ලම ලාබ ලබනවා. සමහර ආයතන පසු ගිය වසරවලට වඩා වැඩි ලාභයක් අද ලබා ගනිමින් ඉන්නවා. ඒ නිසා ඇත්තටම අපි භාණ්ඩාගාරයට බරක් නොවන අමාත්‍යාංශයක්.

මෙවර අපට විශාල වග කීමක් තිබෙනවා, අපේ වනගහනය සියයට 35ක් දක්වා වැඩි කරන්න. අපි මෙතෙක් කල්, උතුරු නැඟෙනහිර ප්‍රදේශවල සහ අනෙකුත් ප්‍රදේශවල තිබුණු රක්ෂිත - සංරක්ෂිත- ගණයට අයිති නොවූ වනාන්තර ගණනාවක්, රක්ෂිත වනාන්තර බවට පත් කරලා තිබෙනවා. එසේ පත් කරලා තිබෙන්නේ ඒවා ආරක්ෂා කරන්නයි. විශේෂයෙන්ම මේ ආරක්ෂා කිරීම ඔස්සේ අපට අපේ රටේ දැවැන්ත වෙනසක් කරන්න පුළුවන් වනවා. අපේ නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කිව්වා, එතුමාගේ ව්‍යාපෘතිවලට සමහර වෙලාවට අපි ඉඩකඩම් ලබා දෙන්නෙත් නැහැයි කියලා. අපි එහෙම කරන්නේ නැහැ. නමුත් අපි හැම වෙලාවේම පිළිගන්න ඕනෑ, කඩිනම් මහවැලි ව්‍යාපාරය හරහා ලංකාවේ පරිසරයට විශාල හානියක් සිද්ධ වුණු බව. සමහර වෙලාවට තවමත් ඒ පරිසර හානිය කළමනාකරණය කර ගන්න අපට බැරි වෙලා තිබෙනවා. කඩිනම් මහවැලි ව්‍යාපාරය හරහා එක් වරකදී ලක්ෂ ගණනක කැලෑ කපලා දැම්මා. ඒ නිසා ඒ කැලෑවල ජීවත් වුණු වන සතුන්ට සමහර වෙලාවට යන්න එන්න අතක් නැති වුණු අවස්ථා තිබුණා. තවමත් ඒ තත්ත්වය තිබෙනවා. ඒ නිසා අපි වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයත් සමඟ සාකච්ඡා කරලා තිබෙනවා, අපි මේ සෑම අංශයක්ම කළමනාකරණය වන විධියට, එතුමා වාරිමාර්ග සකස් කරන කොට පරිසරයත්, වාරි කර්මාන්තයත් කියන දෙකම ආරක්ෂා වන විධියට වැඩ කරන්න ඕනෑ කියලා. මොකද, ඇත්තටම අපි දන්නවා, අපේ අද තිබෙන කැලෑ ප්‍රමාණය ඉතා අඩු බව.

සියයට 23ක් සියයට 25ක් පමණ කැලෑ ප්‍රමාණයක් තමයි අපට අද තිබෙන්නේ. ඒ ප්‍රමාණය තවදුරටත් අඩු කර ගන්න අපට බැහැ. එහෙම වුණොත් විශාල පාරිසරික ප්‍රශ්න ඇති වනවා. ඒ නිසා ඇමතිවරයා හැටියට මට පරිසරය ගැනත්, සංවර්ධනය ගැනත් එක සමානව හිතන්න වෙනවා. ඒ නිසා ඒ අවස්ථාවේදී අපි අපේ අමාත්‍යාංශයෙන්, -විශේෂයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - උපදෙස් දීලා තිබෙනවා, යම් කිසි වාර්තාවක් කවුරු හැදුවත් ඒ වාර්තාව මුල සිට අගට කියවලා ඒකේ යම් කිසි අඩුපාඩු තිබෙනවා නම් අපේ අමාත්‍යාංශ මට්ටමෙන් සාකච්ඡා කරන්න කියලා.

ගරු සභාපතිතුමනි, ඇත්තටම නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කියන්නේ ඉතා වේගයෙන් වැඩ කරන කෙනෙක්. එසේ වේගයෙන් වැඩ කරන කොට අපට පොඩි ප්‍රශ්න කීපයක් ඇති වනවා. එතුමාත් එක්ක අපි එය කළමනාකරණය කර ගන්න වෙනවා. ඇත්ත වශයෙන්ම මහ කැලෑවක් මැදින් ඇළක් කැපුවාම ඒවායේ ඉන්න සතුන්ට එහාට මෙහාට පනින්න බැරිව යනවා. මේ පිළිබඳව ඊශ්‍රායල් රටේ විශාල තාක්ෂණික දියුණුවක් ඇති කරලා තිබෙනවා. ඒ කියන්නේ සතුන් යන මාර්ගය දිහා බලලා, ජලාශවලට උඩින් සතුන්ට යා හැකි වන පරිදි, කොන්ක්‍රීට් පාවිච්චි කරලා වෙනම මාර්ග හදලා තිබෙනවා. අපේ රටේ තවම ඒක වෙලා නැහැ. එසේ නොවීම ලොකු ප්‍රශ්නයක්. ඒ නිසා සතුන් ජලයට වැටිලා, එහෙමත් නැත්නම් ඇළවල්වලට වැටිලා නිරපරාදේ මිය යන අවස්ථා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ පිළිබඳව අපි නැවත හිතන්න ඕනෑ. ඒ නිසා අපි එතුමාත් එක්ක එකඟ වෙලා තිබෙනවා, "යම් කිසි වාරි කර්මාන්තයක් කරන කොට ඒ වාරි කර්මාන්තයත් පරිසරයත් දෙකම ගැන කල්පනා කර බලා අපි එකට තීන්දු කරමු; ඒ තීන්දු කිරීමේදී හැම දාටම පරිසරයත් රැකෙන, ඒ වාගේම අපේ ජනතාවත් රැකෙන ක්‍රියා මාර්ගයකට අපි යා යුතුයි" කියලා. මේ මත ගැටුම නම් අපේ අමාත්‍යාංශ දෙකේ තිබෙනවා. එතුමා හොඳ ජ්‍යෙෂ්ඨ මිත්‍ර අමාත්‍යවරයෙක් හැටියට එතුමාත් එක්ක අපට ඒක කළමනාකරණය කර ගන්න පුළුවන්. ඒකේ ප්‍රශ්නයක් වෙන බවක් මට පෙනෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මෙවර අය වැය ගත්තොත් අනෙක් අය වැයවලට වඩා ලොකු වෙනසක් මට මේ අය වැයේ පෙනෙනවා. විශේෂයෙන්ම කාබනික පොහොර නිෂ්පාදනය, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය, දේශීය පර්යේෂණාගාර තුළ පරීක්ෂණ මෙහෙයවන්නට බදු සහන ලබා දීම, හරිත විශ්වවිද්‍යාලයක් ඇති කිරීම, වන වගාකරුවන්ට බදු සහන ලබා දීම මේ අය වැය යෝජනාවල තිබෙන පරිසර හිතකාමී තත්ත්වයන් වනවා. සමස්තයක් ලෙස බලන කොට මෙම අය වැය වඩාත් පරිසර හිතකාමී බව අපට පෙනෙනවා.

ගරු සභාපතිතුමනි, අප සියලු දෙනාම දන්නවා, අද ලෝකයේ තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි මිහිතත උණුසුම් වීම කියලා. මේ තත්ත්වය ලෝකයේ කිසිම රටකට බේරෙන්න බැරි තත්ත්වයක්. විශේෂයෙන් දියුණු රටවල, කාර්මික විප්ලවයෙන් පස්සේ කාබන් ඩයොක්සයිඩ් වායුව විශාල ප්‍රමාණයක් පිට කිරීම නිසා අපට ලොකු දේශගුණ විපර්යාසවලට ලක් වෙන්නට ඉඩ තිබෙනවා. අද හිමාලයේ හිම දිය වෙන්න පටන් ගෙන තිබෙනවා. අද එය හිමාලය ආසන්නයේ තිබෙන රටවලට තදින් බලපානවා. සමහර විට ජලයෙන් ඉතාම පොහොසත් රටවලට තව දශක කීපයකින් එහෙම නැත්නම් මේ ශත වර්ෂයේ මැද භාගයේ ජලය නැති වන්න පුළුවන්. ඒ වාගේම අපි අද පිළිගන්නවා, නියඟ, ගංවතුර, භූමි කම්පා වාගේ විවිධ කාලගුණ විපර්යාස සියල්ලම අද ලෝකයේ විවිධ රටවලට ඇති වන බව.

විශේෂයෙන්ම ඊයේ පෙරේදා ඇමෙරිකාවට හැමූ "Sandy" කියන කුණාටුව දිහා බැලුවාම, ඒක මුළු නිව්යෝර්ක් නුවරත්, ඒ අවට ප්‍රදේශ ගණනාවකුත් විනාශ කළා. ඇමෙරිකාවේ ජනතාවට තමන්ගේ ජීවිත කාලයේ නැවත කවදාකවත් මුහුණ දෙන්න බැරි තරමට ඒක බියකරු වෙලා තිබෙනවා. අපි සංවර්ධනය ගැන කටයුතු කරද්දී, පරිසරය සමබර කර ගත්තේ නැත්නම් ඒ නිසා සිදු වන මිහිතලය උණුසුම්වීම අපට බලපානවා. විශේෂයෙන්ම අපේ රටට බලපානවා. මේ දවස්වල කටාර් රාජ්‍යයේ මිහිකත උණුසුම පිළිබඳ සාකච්ඡාවක් පැවැත්වෙනවා. ඒ සාකච්ඡාවේදී මිහිකත උණුසුම් වීම නිසා විවිධ රටවල්වල ඇති වන පාරිසරික විපර්යාස ගැන කථා කරනවා. අපේ ලංකාවටත් ඒ කරුණු බලපානවා. අපි විශාල වශයෙන් වී වගාව කරන රටක්. මිහිකත උණුසුමේ බලපෑමෙන් අපේ වගා බිම්වලින් සමහර ප්‍රමාණයක් අපට නැති වෙන්න ඉඩකඩ තිබෙනවා. ඒ නිසා අපි පරිසරය ආරක්ෂා කරන්න ඕනෑ. ඒ විධියට පරිසරය සුදානම් කිරීමට අපට සැම දෙනෙකුගේම කැපවීම අවශ්‍ය වෙනවා. ඇත්ත වශයෙන්ම "සරල දිවි පෙවෙතක්" කියන අදහස අපේ ජනතාවට ඇතුළු කිරීමට අපේ ආගමේ පෙන්වා දෙන මාර්ග ඔස්සේ අපි ගමන් කරන්න ඕනෑ.

විශේෂයෙන් මේ රටේ පරිසරය පිළිබඳ කථා කරන කොට, අන්තර්ජාතික සම්මුති ගණනාවක කොටස්කරුවන් හැටියට අපේ අමාත්‍යාංශය ක්‍රියා කරනවා. ඕසෝන් වියන ආරක්ෂා කිරීම, පරිසරය ආරක්ෂා කිරීම වැනි අන්තර්ජාතික සම්මුති ගණනාවක් සම්බන්ධයෙන් අපි ක්‍රියාත්මක වෙනවා. ඒ සම්බන්ධයෙන් අපි වැඩ කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා සැම අවස්ථාවකම සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කරන්න. අද අපට ලොකුම ප්‍රශ්නයක් තිබෙනවා. අපේ සංවර්ධන වේගය වැඩියි; එය විශාල වශයෙන් කෙරෙනවා. ඒ කටයුතුවලට අවශ්‍ය කරන වැලි, කළු ගල්, ගඩොල් වාගේ දේවල්වල විශාල වුවමනාවක් තිබෙනවා. අපේ ගංගාවලින් තමයි තවමත් අපේ වැලි අවශ්‍යතාව සපුරා ගන්නේ. ඒ නිසා අපි කැබිනට් මණ්ඩලයට යෝජනා කරලා තිබෙනවා, මුහුදු වැලි අරගෙන සෝදලා භාවිතයට ගන්න පුළුවන් මාර්ග වැඩි කරන්න කියලා. ඒක තමයි අපිට දෙන්න තිබෙන එකම උපදෙස.

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඔබතුමා නිල්වලා ගඟ ගැන කිව්වා. නිල්වලා ගඟේ ඉහළට මුහුදු ජලය ඒම ගැන අපි දන්නවා. ඒ නිසා දැන් ඒ ගංගාවේ වැලි කැණීම සඳහා කිසිම බලපත්‍රයක් අපි නිකුත් කරන්නේ නැහැ. ඒක අපි තීන්දු කරලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය අපට උපදේශයක් දීලා තිබෙනවා, නියෝගයක් දීලා තිබෙනවා, විශේෂයෙන්ම දැදුරු ඔයේත් වැලි කැණීම් නවත්වන්න කියලා. අපි ඒකත් කරලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, ලංකාවේ රක්ෂිත-

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඒ සම්බන්ධයෙන් අපි කථා කළා. ඔබතුමා කියන රක්ෂිත ලංකාවේ ජෛව විවිධත්වයෙන් අනූන රක්ෂිත කීපයක්. ඒ රක්ෂිත නිදහස් කිරීම පිළිබඳව අපි කැමැත්තක් දක්වන්නේ නැහැ. මගේ නිලධාරින් කියන හැටියට ඒ කැලෑව තුළ, ඒ කැලෑවටම අයිති ජීවීන් ඉන්නවා. ඒ නිසා ඒවා ආරක්ෂා කරන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ ප්‍රදේශයේ තිබෙන ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට අපි බැඳී සිටිනවා. ඒ නිසා ඒ රක්ෂිතයෙන් කොටසක් දෙන්න අපි එකඟතාව පළ කළේ නැහැ.

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

ජනාධිපතිතුමාත් ඒක පිළිගත්තා. එතුමා කිව්වා, වෙන ස්ථානයකින් අවශ්‍ය ඉඩම් ගන්න කියලා. මතක තියා ගන්න, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් කොයි වෙලාවකවත්, කාටවත් දෙන්න බලයක් අපට නැති බව. විශේෂයෙන්ම අපට ඉඩම් දෙන්න පුළුවන් වෙන්නේ, නිදහස් කරන්න පුළුවන් වෙන්නේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට පමණයි. අපේ අමාත්‍යාංශය ඉඩම් බෙදා දෙන අමාත්‍යාංශයක් නොවෙයි; ඉඩම් රකින අමාත්‍යාංශයක්. මේ වෙනස තේරුම් ගන්න කියලා තමුන්නාන්සේලාගෙන් අප ඉල්ලා සිටිනවා.

අපි වන වගාව සඳහා මහජනයා උනන්දු කරවනවා. සමහර දිස්ත්‍රික්කවල, විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කයේ වන වගාව සඳහා ගැමියන් සමඟ අපි එකතු වෙලා වැඩ කරනවා. අපේ කැලෑ තුළ ඒ අයට වගා කරන්න අවශ්‍ය කරන ඉඩකඩ දෙන්නත්, ඊට පසුව ඒ එළ නෙළා ගන්නත් කටයුතු සලසනවා. ඒ වාගේම අපි රබර් වගාවටත් ඉඩ දීලා තිබෙනවා. ඒ කටයුත්ත සඳහා මේ අවුරුද්දේ ඕස්ට්‍රේලියානු ආධාරයකුත් -ණය මුදලකුත්- අපට ලැබිලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපට තිබෙන ඉතා වැදගත් ආයතනයක් තමයි මධ්‍යම පරිසර අධිකාරිය. ඒකේ ප්‍රධානම කාර්ය තමයි, ජාතික පරිසර ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සහ පරිසර ආරක්ෂක බලපත්‍ර නිකුත් කිරීම. අපේ නිලධාරින් ඒ බලපත්‍ර නිකුත් කිරීමේදී ඉතාම හොඳ ක්‍රමවේදයක් අනුගමනය කරනවා. ඒ සඳහා කාගේවත් බලපෑමක් කවදාවත් ඇති වෙන්නේ නැහැ. මා දන්නවා අපේ අමාත්‍යාංශයේ කිසිම කෙනෙකු, කිසිම අවස්ථාවක ඒ කාර්ය වෙනුවෙන් බලපෑමක් ඇති කරලා නැහැ කියලා. ඒ අය බොහොම ස්වාධීනව වැඩ කරනවා. ඒ නිසා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ හොඳ වාර්තාවක් අපි ළඟ තිබෙනවා. බොහෝ විට පුද්ගලයන් විවිධාකාර ප්‍රකාශ නිකුත් කරන්න පුළුවන්. නමුත් අපි ඒ කටයුත්ත කරන්නේ යම් කිසි තාක්ෂණික ක්‍රමවේදයක් පාවිච්චි කරලා නිසා ඉතාම සාධනීය ලෙසයි.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අවුරුද්දක් පාසා හරිත සම්මාන දෙන වැඩ පිළිවෙළක් අපි ආරම්භ කර තිබෙනවා. අද දවසේත් අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් ඒ කටයුත්ත කෙරෙනවා.

මේ කටයුතුවලදී මට සහාය දුන් මා නියෝජනය කරන අමාත්‍යාංශයේ සියලුම නිලධාරින්ට, සභාපතිතුමන්ලා ඇතුළු සියලු දෙනාට මගේ ගෞරවනීය ස්තුතිය පළ කරනවා. ගරු සභාපතිතුමාගේ අවසරය ඇතිව මගේ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the speech tabled:*

**ගරු කථානායකතුමනි,**

**අය වැය 2013 තෙවන වර කියවීමේ කාරක සභා අවස්ථාවේදී පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡාව පවත්වන අද දින 2013 වසරේදී අතිගරු ජනාධිපතිතුමාගේ රජය විසින් යෝජිත ජනතාවාදී අය වැයට සමගාමීව පරිසර ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය සහ ඉදිරි දිශානතිය ඔබ තමුන්නාන්සේලා ඉදිරියේ තැබීමට අවස්ථාව ලැබීම භාග්‍යක් කොට මා සලකනවා. අපේ රටේ ආර්ථික වර්ධනය ඉදිරි කාලයන්හිදීද සියයට අටට ඔබ්බෙන් වර්ධනය විය හැකි බව දෙස් විදෙස් ආර්ථික විද්වතුන්ගේ මතය වී තිබෙනවා. මේ සඳහා අවශ්‍යවන්නා වූ ප්‍රතිපත්ති, ව්‍යාපෘතීන්, වැඩසටහන් මෙන්ම මාර්ගෝපදේශනයන් ද අතිගරු ජනාධිපති තුමන්ගේ මහින්ද චින්තන ඉදිරි දැක්ම නම් වූ ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවේ පැහැදිලිවම දක්වා තිබෙනවා. එමගින් සීඝ්‍ර ආර්ථික වර්ධන වේගයක් ලඟාකර ගැනීමට අවශ්‍ය මහා ආර්ථික කළමනාකරණයට රජය ප්‍රවිෂ්ඨ වී තිබෙනවා. උද්දමනය අඩු වීම, විරැකියාව අඩුවීම, ඒකපුද්ගල අදායම ඉහළ යාම, විදේශ සංචිත වැඩිවීම මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාව ශ්‍රී ලංකාව කෙරේ දැක්වෙන විශ්වාසය වැඩි දියුණුවීම තුලින් මෙම තත්ත්වය තවදුරටත් තහවුරුවෙනවා.**

ගරු කථානායකතුමනි,

පශ්චාත් යුද සමයේ රටේ ඇතිවන දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියේදී පරිසරය ආරක්ෂා කිරිම සහ කළමනාකරණය කිරීම තුලින් රටේ තිරසාර සංවර්ධනයක් ඇති කිරීමට අප අමාත්‍යාංශය සුවිශේෂ කාර්යභාරයක් ඉටුකරනු ලබනවා. මේ සඳහා අවශ්‍ය පරිසර ප්‍රතිපත්ති රාමුවක් සහ ඊට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන දැනටමත් අප සතුව පවතිනවා. 2013 වසරේ දී මෙම ප්‍රතිපත්ති රාමුවේ අදාළ ක්ෂේත්‍ර අවශ්‍යයතාවයන්ට අනුකූලව තවදුරටත් සංශෝධනය කිරීමට මා බලාපොරොත්තුවෙනවා.එයින් පසුව මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි පරිසර ක්ෂේත්‍රයට ලබාදී ඇති කාර්යභාරයන් නිසිලෙස ඉටුකර, අදාළ කාලවලදී අදාළ ඉලක්ක සපුරා ගැනීමට පරිසර අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතන පෙළ ගස්වා තිබෙනවා.

ගරු කථානායකතුමනි,

මගේ අමාත්‍යාංශයට මෙවර වෙන් වී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 1160.35කි. මෙහි මුල්‍යකරණයෙන් රුපියල් මිලියන 696.85ක් දේශීය මුල්‍යකරණයක් ලෙසද රුපියල් මිලියන 463.5ක් විදේශීය මුල්‍යකරණයක් ලෙසද දැක්වෙනවා. විදේශීය මුල්‍යකරණයෙන් රුපියල් මිලියන 383.5 ක් විදේශීය ප්‍රධානයන් ලෙස ලැබී තිබෙනවා. මෙය විදේශීය ණය මෙන් ආසන්න වශයෙන් පස් ගුණයකි. මෙම විදේශීය ප්‍රධානයන් මුළු මුල්‍යකරණයෙන් 33.05%ක් වෙනවා. මෙයින් අපට පිළිබිඹුවන්නේ අපගේ පරිසර සංරක්ෂණ කටයුතු සඳහා භාණ්ඩාගාරයට අප බරක් නොවෙමින් සිටින බවයි. අප අමාත්‍යාංශය වෙත භාණ්ඩාගාරය විසින් වෙන්කරනු ලබන ප්‍රතිපාදන වලට එරෙහිව භාණ්ඩාගාරය වෙත අප අමාත්‍යාංශය විසින් ලබාදෙන අදායම අතර වෙනස මේ වනවිට අවම වෙමින් පවතී.මෙය මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි සඳහන් භාණ්ඩාගාරයට බරක් නොවී ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස මගේ අමාත්‍යාංශය ගමන් අරඹා ඇති බවට හොඳ සාක්ෂියකි.

ගරු කථානායකතුමනි,

මේ වසරේ අය වැය යෝජනාවලින් මාගේ අමාත්‍යාංශයට වෙන්කර ඇති මුදල ගිය වසරට වඩා මදක් අඩුබව බැලූ බැල්මට පෙනෙනවා. එහෙත් මෙය තාර්කිකව විශ්ලේෂණය කර බැලුවොත් මෙම අය වැය මගින් සිදුවී ඇත්තේ පසුගිය වසරට පමණක් සීමා වූ ව්‍යාපෘති 4කට වෙන් වූ මුදල අඩුවීමකි. ඊට අමතරව මනා වියදම් පාලනයකට සහ ප්‍රායෝගික වැඩ පිළිවෙලකට අවතීර්ණ වෙමින් අප කර ඇති ඉල්ලීම් වලට සාධාරණත්වයක් ලබාදෙමින් , පැවති ව්‍යාපෘති සියල්ලටම වාගේ අපට මුදල් වෙන් වී තිබෙනවා. මීට අමතරව මෙවර අය වැයෙන් මගේ අමාත්‍යාංශයට නව ව්‍යාපෘති 18ක් ලැබී තිබෙනවා. මේ නව ව්‍යාපෘති සියල්ලම වාගේ අප සැලසුම් කර තිබෙන්නේ පරිසර ක්ෂේත්‍රයේ කාලීන අවශ්‍යතා භාජනය කරමින් .අතිගරු ජනාධිපතිතුමන් විසින් මෙවර අය වැය යෝජනාවලදී වනවගාව ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා සහ වන ආවරණය දිවයිනේ භූමි ප්‍රමාණයෙන් 35%කට නැංවීමේ ඉලක්කය ඇතිව වෙන්කළ මිලියන 1500, වන ක්ෂේත්‍රය මෙන්ම සමස්ත පරිසර ක්ෂේත්‍රයටම සිදුකල මා හැඟී ආයෝජනයක්.

මීට අමතරව කාබනික පොහොර නිෂ්පාදනයට, පුනර්ජනනිය බලශක්ති සංවර්ධනයට, දේශීය පර්යේෂණාගාර තුල පරීක්ෂණ මෙහෙයවන්නන්ට බදු සහන ලබාදීම , හරිත විශ්ව විද්‍යාලයක් ඇති කිරීම, වන වගා කරුවන්ට බදු සහන ලබාදීම ආදිය මෙවර අය වැය යෝජනා වල මා දකින පරිසර හිතකාමී යෝජනාවන්ය. සමස්ථයක් ලෙස බැලීමේදී වෙන කවදාටත් වඩා මෙවර අය වැය පරිසර හිතකාමී බවකින් යුක්තබව මා දකිනවා . ඒ පිළිබඳව මගේ අමාත්‍යාංශයේ ප්‍රණාමය අතිගරු ජනාධිපතිතුමන්ටත් මුදල් අමාත්‍යාංශයටත් මා පුදකර සිටිනවා.

ගරු කථානායකතුමනි,

මිහිතලය උණුසුම්වීම තුලින් ඇතිවන දේශගුණ විපර්යාසවල අනිටු බලපෑම් අද ලෝකයේ දුප්පත්, පොහොසත්, කළු සුදු, භේදයක් නොමැතිව දියුණු සහ දියුණුවෙමින් පවතින රටවල් කියා භේදයක් නොමැතිව සැමටම එකසේ බලපාන පාරිසරික ගැටළුවක් වෙලා තිබෙනවා. මෙමගින්, මිනිසා සහ ඔහු ඇතුලත් සමස්ත ජෛව විවිධත්වයටම මහත් ව්‍යසනකාරී ප්‍රතිඵල අත්විඳීමට සිදුවී ඇති අතර එය දේශගුණ විපර්යාසවලට අඩුම දායකත්වයක් දක්වන අප වැනි රටවලට ද මුහුණ පෑමට සිදු වී තිබෙනවා . අදවනවිට මෙම මිහිතලය උණුසුම්වීම, සමස්ථ ලෝක ප්‍රජාවගේම දැඩි අවධානයට ලක්වී තිබෙනවා. මේ දිනවල කටාර් රාජ්‍යයේ දෝහා නුවර පැවැත්වෙන ජගත් දේශගුණ විපර්යාස සමුළුව මීට ඉතා හොඳ උදාහාරණයක්. ලෝක ප්‍රජාව වශයෙන් මෙම ව්‍යසනකාරී තත්ත්වයට මුහුණ දෙන්නේ කුමන ආකාරයට ද, ඉදිරියේදී ඒ ඒ රටවල් කාණ්ඩ මෙම දේශගුණ විපර්යාස අවම කර ගැනීමට ගතයුතු ක්‍රියා මාර්ග මොනවාද යන්න මේ සමුළුවේදී වාද විවාදයන්ට සහ සාකච්ඡාවන්ට ලක්වෙනවා . දේශගුණ විපර්යාස සඳහා මානව සංහතියේ වත්මන් අධි පරිභෝජන රටාව හා ඇඳුනු ඇවතුම් පැවතුම් මූලික වනබව දැන් ලෝකයම තේරුම් ගනිමින් පවතින සත්‍යක් . මේ ගැන බොහෝ විද්වත් මණ්ඩල මෙතෙක් කරනලද සාකච්ඡාවල අවසන් ප්‍රතිඵලය ලෙස ප්‍රකටව පිළිගත් කාරණයක් වන්නේ දේශගුණ විපර්යාස අවම කරගැනීමට කළහැකි වඩාත්ම සුදුසු කාර්යය තම අධි පරිභෝජන දිවිපෙවෙත් වලින් මිදීමයි.මේ කියන්නේ අප ගෞරවනිය බුදු රජාණන් වහන්සේ සත්හට පැහැදූ සරල දිවිපෙවෙත නොවේද? වඩාත් සංකීර්ණ වූ ගෝලීය ප්‍රශ්නයකට අප බුදු දහමේ පෙන්වා ඇති ප්‍රායෝගික මග මේ මුළු සත්ත්ව වර්ගයාගේම පැවැත්මට මග බව මෙයින් මනාව පසක් වෙනවා.

ගරු කථානායකතුමනි,

දේශගුණික විපර්යාස පිළිබඳව ක්‍රියා කිරීමේ මූලික වගකීම මගේ අමාත්‍යාංශය වෙත පැවරී තිබෙනවා. ඒ වගේම ජගත් දේශගුණ විපර්යාස සම්මුතියට ශ්‍රී ලංකාවද පාර්ශවකාරී රටක් ලෙස අත්සන්කර තිබෙනවා. මගේ අමාත්‍යාංශය දේශගුණ විපර්යාසවලින් මේ රටටත් , රටේ ජනතාවටත් එහි සියලු සම්පත් වලටත් සිදුවිය හැකි ව්‍යසනයන් පිළිබඳව මනා අවබෝධයක් ලබා තිබෙනවා.දේශගුණ විපර්යාස වලට මුහුණ දී එමගින් සිදුවන ව්‍යසන අවම කිරීම එක් අමාත්‍යාංශයකට සීමා වූ , එයට පමණක් ක්‍රියාකල හැකි කාර්යයක් නොවේ. ඒ සඳහා සියලුම අමාත්‍යාංශ, දෙපාර්තුමේන්තු සහ වෙනත් විවිධ ආයතනවල සහාය අවශ්‍ය වෙනවා.

ගරු කථානායකතුමනි,

මගේ අමාත්‍යාංශය දේශගුණ විපර්යාස පිළිබඳව වූ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබෙනවා. එම ජාතික ප්‍රතිපත්තිය ඇසුරුකරගෙන එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සහ දේශගුණ විපර්යාස නිසා සිදුවන සෘණාත්මක බලපෑම් අවම කරගනිමින් ඊට අනුවර්තනය වීමට ක්‍රමෝපායන් ද විවිධ ක්ෂේත්‍රයන් පහක් ඔස්සේ සකස් කර ක්‍රියාවට නැංවීමට කටයුතු යොදමින් සිටිනවා. එසේ අනුවර්තනය වීමේදී විවිධ ක්ෂේත්‍ර සඳහා සිදු කරනු ලබන වන තාක්ෂණික අවශ්‍යතා සමාලෝචනය නුදුරු දිනකින්ම සම්පූර්ණ කර ඒ සඳහා පහසුකම් සැලසීමට ක්‍රියාකරගෙන යනවා.

එසේම ලෝක අහාර සහ කෘෂිකර්ම සංවිධානයක් සමග එක වී, දේශගුණ විපර්යාසවලට අනුවර්තනය වීම පිළිබඳව නියමු ව්‍යාපෘතියක් නැගෙනහිර පළාතේ වර්ෂා පෝෂිත වගාවන් සිදුකරන ප්‍රජාව මූලික කරගෙන සිදුකිරීමට අදාළ ව්‍යාපෘති යෝජනාවක් දේශගුණ විපර්යාසවලට අනුවර්තනය වීමේ අරමුදලටද ඉදිරිපත් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි,

සම්පත් අරපරිස්සමෙන් භාවිතා කරමින් අපට අවශ්‍ය දේ ඉටුකරගෙන එම සම්පත් ඉදිරි පරපුරවලටද භුක්ති විඳිමින් ඔවුන්ගේ අවශ්‍යතා පිරිමසා ගැනීමට සැලසීම අපගේ යුතුකමයි. මෙය තිරසාර සංවර්ධනයේ පදනමයි. මෙමගින් පරිසරයද සුරැකෙනවා. අප රට අවතීර්ණ වී ඇති සීඝ්‍ර සංවර්ධනය මාර්ගයේ ඉදිරියට යාමේදී සිය කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා වාණිජ කටයුතු ආදී විවිධ කටයුතු පරිසර හිතකාමීව පවත්වාගෙන යාම ඉතා වැදගත් වෙනවා . එසේ නොකළහොත් පරිසරයට සිදුවන හානි වැලක්වීමට සහ යථාතත්වයට පත්කිරීමට සිදුකලයුතු වැය, අපට බරක් වෙනවා. පරිසර සංරක්ෂණ ක්‍රියාවලට අනුගත වෙමින් සිය සංවර්ධන කටයුතු මෙහෙය විමේ දී එම පරිසර සංරක්ෂණ කටයුතු සඳහා දරන්නට වන පිරිවැය වැයක් නොවී ආයෝජනයක් වෙනවා.ඒ නිසා තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගනිමේදී රාජ්‍ය සහ පෞද්ගලික අංශ පරිසර හිතකාමී ක්‍රමවේදයන් අනුගමනය කරමින් තම කටයුතු මෙහෙයවීම ඉතා වැදගත් වෙනවා. මාගේ අමාත්‍යාංශයේ දිරිගැන්වීම් වලට ප්‍රතිචාර ලෙස දැනටමත් ආයතන හැටකට වැඩි ප්‍රමාණයක් මෙම ක්‍රියා මාර්ගයන්ට අනුගතවෙමින් හරිත වාර්තාකරණයට අනුකූලව මූලික මට්ටම් 5ක් යටතේ සිය කටයුතු කළමනාකරණය කරමින් මෙහෙයවනවා.

ගරු කථානායකතුමනි,

පරිසර අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් වන මධ්‍යම පරිසර අධිකාරිය තිරසාර සංවර්ධන මාවතේ පෙරගමන් කරු ලෙස කටයුතු කරනවා. ජාතික පරිසර ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන්නාවූ ජාතික පරිසර පනත තුලින් සිය නියාමන කටයුතුද මෙම අධිකාරිය මගින් සිදුකරනවා.පරිසර ආරක්ෂණ බලපත් නිකුත් කිරීම සහ පරිසර බලපෑම් ඇගයීම් සිදු කිරීම ඔවුන් විසින් ක්‍රියාත්මක කරන වැදගත් පරිසර සංරක්ෂණ වැඩපිළිවෙලවල් වලින් කීපයකි.මෙම කාර්යයේදී නීති රෙගුලාසිවලට අනුකූලව අදාළ සිය යෝජනා සහ සංවර්ධන කටයුතු ද සිදුකරන ආයතන හා පුද්ගලයින් ඇගයීම ඉතාම සාධනීය පියවරක් වෙනවා. මේ ක්‍රියාව සාර්ථකව ඉටුකරමින් අදාළ පුද්ගලයන්ට හරිත සම්මාන පිදීම වසරක් පාසා අතිගරු ජනාධිපතිතුමා ගේ ප්‍රධානත්වයෙන් සිදුකරනුලබනවා. මෙම වැඩසටහන 2012 වසරේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය බලාපොරොත්තුවනවා.

ගරු කථානායකතුමනි,

මිනිසාද ඇතුළු ජෛව විවිධත්වය අපගේ ජීව රුධිරයයි. මෙය ආරක්ෂා කිරීම රටේ සමස්ත ජනතාවම සහ මුළු මහත් මානව සංහතියම ආරක්ෂා කරනවා වගේ වැඩක්. ගහකොළට සතා සිවුපාවාට කරුණාව දක්වමින් උන් රැකබලා ගැනීම ශ්‍රී ලාංකික අප පෙර සිටම දියුණකල සිරිතක්, පුරුද්දක්. ගෝලීය උණුසුම ඉහළයාම , විවිධ සෘණාත්මක මානව ක්‍රියාකාරකම් , වාසස්ථාන ගුණාත්මයෙන් හා ප්‍රමාණයෙන් පිරිහීම, වන විනාශය, ආගන්තුක ආක්‍රමණකාරී ශාක හා සත්ත්ව විශේෂ පැතිරීම, වාණිජ පරමාර්ථයන් සඳහා පරිසරයෙන් පමණ ඉක්මවා ශාක හා සතුන් එකතු කිරීම වැනි ක්‍රියාවන් අපගේ ජෛව විවිධත්වය දැඩි ලෙස විනාශය කරා ගෙනයමින් පවතිනවා. මේවා ගැන අවබෝධයෙන් ක්‍රියා කරමින් රටේ ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා අවශ්‍ය කරන ප්‍රතිපත්ති, නීති, රෙගුලාසි පැනවීම සහ අවශ්‍ය වූ විට ඒවා යවත්කාලීන කිරීමට අප කටයුතු කරනවා. අප රටේ ජෛව විවිධත්වයේ අගය පැහැදිලි ලෙස පිළිබිඹුවන එක ඉසවුවක් වන්නේ ජාන සම්පත්ය. ජානසම්පත් රැකගැනීමටත් ඒවා ලක් ජනතාවට මෙන්ම සමස්ත ලෝක ජනතාවටම වැඩදායි ලෙස යොදා ගැනීමට අවශ්‍ය පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් සිදු කිරීමටත් ඒ සඳහා අවශ්‍ය භෞතික ප්‍රතිපාදන ඇති කිරීමටත් අප කටයුතු අරඹා තිබෙනවා. රටේ ස්වෛරීභාවය ආරක්ෂා කරගනිමින් එම කටයුතු කිරීමට අප සැම විටම වගවෙනවා.වගබලාගන්නවා.

ගරු කථානායකතුමනි,

වල්ලපට්ට ශාකයෙන් ලබාගන්නාවූ ලොවේ ඉතා මිල අධික අගාවුඩ් වැනි මැලියම් (Resin) වර්ග ලබාගත හැකි බව පර්යේෂණ හා අධ්‍යන වලින් සොයාගෙන ඇත. මේවා ප්‍රංශය වැනි රටවල නිපදවන ඉතා මිල අධික සුවඳ විලවුන් නිෂ්පාදනය සඳහා යොදාගන්නා බවත් එම මැලියම්වල (Resin) කිලෝ ග්‍රෑමයක් ඇමරිකානු ඩොලර් 25000 වත් වඩා මිල වනබවට තොරතුරු අප රැස්කරගෙන තිබෙනවා. මෙම මිල අධික කමම අධික ලෙස මේ ශාක වනාන්තරවලින් නෙලා ගැනීමටත් එමගින් ඒවා වඳවී යාමටත් හේතු වී තිබෙනවා. මෙසේ මේ ශාක විනාශ කරන්නන් නීතිය අබියසට පැමිණවීමට අප කටයුතු කර තිබෙනවා. මෙය ඉදිරියටත් කරගෙන යනවා. ඒ අතරම මෙම ශාකය විද්‍යානුකූලව වගාකර ඉහල අදායම් ලබාගන්න ක්‍රම වේදයන් සකස්කර එය මහජනයාට හඳුන්වාදීමට අවශ්‍ය කටයුතුද අප සපුරමින් සිටිනවා. මේ වගේම අධික වටිනාකම් ඇති විවිධ ජෛව සම්පත් වලින් අපේ රට අනූනයි. ඉදිරියේදී මේ සියල්ල හඳුනාගනිමින් එමගින් ජාතික අදායම ඉහල නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මාගේ අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය සහ වනසංරක්ෂණ දෙපාර්තුමේන්තුව කටයුතුකරගෙන යනවා.

ගරු කථානායකතුමනි,

ජෛව විවිධත්වය නම් වූ විෂයය වගේම එය සංරක්ෂණයද පරිසරය මෙන්ම ක්ෂේත්‍ර ගණනාවක් පුරා පැතිර පවතිනවා. එනිසා මේ රටේ ජෛව විවිධත්ව සංරක්ෂණය සාක්ෂාත් කරගැනීමට මා විවිධ අමාත්‍යාංශය , දෙපාර්තුමේන්තු හා ආයතන රැසක් සමග අත්වැල් බැඳගනිමින් වැඩසටහන් රාශියක් ක්‍රියාවට නංවනවා . සහයෝගයෙන් කටයුතුකරනවා .ආගන්තුක ආක්‍රමණකාරී ශාක සහ සත්ත්ව විශේෂ විවිධ මාර්ගවලින් අප රට තුලට පැමිණ අපගේ දේශීය ජෛව විවිධත්වයට හානිකර අයුරින් පැතිරීමේ ප්‍රවණතාවයක් තිබෙනවා. මේවා රට තුලට ඒම වැලැක්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා නෛතික ප්‍රතිපාදන දැනටමත් අප කෙටුම්පත් කර අවසානයි. ආගන්තුක ශාක හා සත්ත්ව විශේෂ රටට ගෙන ඒමේදී ඒ සඳහා ඉටුකළයුතු පූර්ව හා පසු අවදානම් ඇගයීමේ ක්‍රියාවලියක්ද අප විසින් සම්පාදනය කර ඇත. නුදුරු අනාගතයේදීම මේවා ක්‍රියාවට නැංවීම මාගේ අරමුණයි . ඒ සඳහා මේ උතුම් සභාවේ සියලු දෙනාගේම සහයෝගය මා මෙහිදී ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි,

ජෛව තාක්ෂණය අද ලෝකප්‍රකට තාක්ෂණයකි. මේ මගින් ජනතාවට විවිධ ප්‍රතිලාභ අත්කරදෙමින් ඇතිබව පෙනෙනවා. ඒ වගේම මේ තාක්ෂණයේ යම් යම් අහිතකර බලපෑම් ඇතිවනබවටත් තර්ක ගොඩනැගී තිබෙනවා.එබැවින් මෙවැනි අවස්ථාවකදී අප පූර්ව ආරක්ෂක මූලධර්ම (precautionary principle ) යටතේ කටයුතු කිරීමට තෝරාගෙන තිබෙනවා. එබැවින් අප ජාතික ජෛව සුරක්ෂිතතා ප්‍රතිපත්තිය සම්පාදනය කර තිබෙන අතර එහි ප්‍රතිපාදන ක්‍රියාවට නැංවීමට කටයුතු කිරීමට බලාපොරොත්තුවෙනවා. මේ සඳහා ද සියලු ක්ෂේත්‍ර වල සහයෝගය මා බලාපොරොත්තුවෙනවා .

ගරු කථානායකතුමනි,

රටේ මධ්‍යම හා කඳුකර පළාත් අපගේ හදවත බඳුයි. මේ ප්‍රදේශවල ඇතිවී ඇති කණගාටුදායක තත්ත්වය වන්නේ භූමි හායනයයි. සෝදා පාළුව වැඩි වී සරු පස හානිවීම තුලින් එම ප්‍රදේශවල කෘෂි නිෂ්පාදකතාවය අඩුවෙනවා.මේ නිසා මෙම පලාත්වල ගොවීන්ගේ අදායම් තත්වය අඩුවී ඔවුන් දරිද්‍රතාවයට ඇද වැටෙනවා.

මේ සඳහා අප අමාත්‍යාංශයේ ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය කටයුතුකරමින් භූමි හායනය වැලැක්වීම සඳහා ජාතික ක්‍රියාත්මක වැඩසටහනක් විවිධ අමාත්‍යාංශ, දෙපාර්තුමේන්තු හා ආයතන එක් රැස්කරගනිමින් සම්පාදනය කර ක්‍රියාවට නැංවීමට කටයුතු කරගෙනයනවා. මෙහිදී කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවේ ස්වාභාවිකසම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය තුලින් පාංශු සංරක්ෂණ පනත සංශෝධනය කිරීම අගය කරනවා. එසේම මෙම ක්‍රියාව අපගේ කටයුතුවලට මහත් සහයෝගයක් වෙනවා .

ගරු කථානායකතුමනි,

ස්වාභාවික සම්පත් කළමනාකරණයේ දී හා සංරක්ෂණයේ දී වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය සුවිශේෂ තැනක් ගන්නවා.අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි අඩි 5000 වඩා ඉහල ප්‍රදේශවල දේශීය විශේෂවලින් වන ගහනය වැඩිකිරීමටත් අප දැනටමත් ප්‍රවිෂ්ඨ වී තිබෙනවා.එසේම අනෙකුත් ප්‍රදේශවල වන රෝපණය මගින් වන ගහනය වැඩි කිරීමටත් , සුවිශේෂ වැදගත්කම් වලින් යුතු වූ අනෙකුත් කැලෑ ඉඩම් අක්කර 250,000 ක් පමණ මැන වෙන්කරමින් ඒවායේ සංරක්ෂණ තත්ත්වය ඉහල දමමින් සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ වන වැස්ම 35% දක්වා වැඩිකිරීම මගින් මහින්ද චින්තන ඉලක්ක සපුරාගැනීමට අප කටයුතු අරඹා තිබෙනවා. මේ කටයුත්තේදී සිය අය වැය කතාවෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් මගේ අමාත්‍යාංශයට වෙන්කළ රුපියල් මිලියන 1500 ක මුදල මහත් පිටුවහලක් වෙනවා. මෙම මුදල ඵලදායිව යොදාගනිමින් එහි උපරිම ප්‍රතිඵල රටට ලබාදීමට විශේෂ ක්‍රියාත්මක සැලැස්මක් නිර්මාණය කරගෙන මනා මෙහෙයුමක් මත එම ක්‍රියාවන් ඉටුකිරීමටම මම ක්‍රියාත්මක වෙනවා. මහජනතාවගේ සුභසිද්ධියට මුල්තැන දෙමින් ජනහිතකාමී ආයතනයක් ලෙස කටයුතුකිරීමේ අරමුණක් ලෙස වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විවිධ දැව වර්ග හා ගෘහ භාණ්ඩ ප්‍රවාහන බලපත් දෙන ආකාරය සංශෝධනය කළා. එසේම ජනතාව පෙලන නීති රීති තවදුරටත් ලිහිල් කර ජනතාවට වැඩි පහසුකමක් ලබාදීමට ක්‍රියාකිරීමට වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවට මා උපදෙස් දී තිබෙනවා.

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

ගරු කථානායකතුමනි,

වසර තිහක කුරිරු යුද්ධය හේතුවෙන් උතුරේ දිස්ත්‍රික්ක පහේම බොහෝම ආයතනවල දෛනික රාජකාරීන් බොහොමයක් අඩපණවී හෝ නැත්තටම නැතිවී තිබුනා. වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව ඇතුළු මාගේ අමාත්‍යාංශය යටතේ ඇති සියලු ආයතන වල ශාඛා දැන් එම ප්‍රදේශවල ප්‍රතිස්ථාපනය කර තිබෙනවා.මේ මගින් උතුරු ප්‍රදේශයේ ජනතාවට විශාල ලෙස පහසුකම් ලැබී තිබෙනවා. මේ ප්‍රදේශවල ආයතන ප්‍රතිස්ථාපනය කිරීමේදී දෙමළ භාෂාව කතාකරන අයහට විශේෂ ස්ථානයක් හිමිකරදී තිබෙනවා. එසේම එම ආයතන වලට එමගින් දෙමල භාෂාවෙන් ජනතා සේවය ලබාදීමට කටයුතු සැලසී තිබෙනවා . මේ ආයතනවල පහසුකම් තවදුරටත් වැඩිදියුණු කිරීමටත් එම ප්‍රදේශවල විවිධ සංවර්ධන වැඩ පිලිවෙළවල් ක්‍රියාත්මක කිරීමටත් අපට මෙවර අය වැයෙන් ප්‍රතිපාදන සැලසී තිබෙනවා. මෙම ප්‍රදේශ වල පරිසරය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතිනවා . එහිදී වන රක්ෂිත හා සංරක්ෂිත ප්‍රදේශ හඳුනා ගැනීම හා ඒවා ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු අවසන් වෙමින් පවතිනවා. එමෙන්ම ඒ ප්‍රදේශවලට අදාළ සංවර්ධන කටයුතු කිරීම සඳහා අවශ්‍ය භූමිය හඳුනා ගැනීම තුලින් එම සංවර්ධන කටයුතු වේගවත් කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම පරිසර අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබනවා.

ගරු කථානායකතුමනි,

කඳුකර ප්‍රදේශවල සිදුවන විශාල පරිසර හානියක් තමයි කැලෑ ගිනි ඇතිවීම. මේවා අවම කර ගැනීමට වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව පෞද්ගලික අංශයද සහභාගී කරගෙන වැඩසටහන් දියත් කිරීමට කටයුතු කරගෙන යනවා.

ගරු කථානායකතුමනි,

වනාන්තර තුලින් සොබා සෞන්දර්ය රස විඳීමට අකමැති කිසිම කෙනෙක් ඇතැයි මා විශ්වාස කරන්නේ නැහැ . අපගේ වන සම්පතෙහි මෙම වටිනාකම මත පරිසර සංචාරක කර්මාන්තය වනසංරක්ෂණ දෙපාර්තුමේන්තුව තුල ස්ථාපනය කර, එමගින් ජාතික අදායම ඉහල නැංවීමටත් දැනටමත් අප ක්‍රියාකරගෙන යනවා. එමගින් ලබාගන්නා අදායමින් කොටසක් නැවතත් මෙවැනි වන සංරක්ෂණ කටයුතු සඳහා යොදා ගැනීමටද අප බලාපොරොත්තුවෙනවා. මුදල් අමාත්‍යාංශයෙන් අපට ඒ සඳහා සහයෝගය බලාපොරොත්තුවෙනවා. තවද නිසි ආරක්ෂක ප්‍රමිතීන් සහ පියවරයන් ගනිමින් වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ දැඩි අධීක්ෂණය යටතේ පෞද්ගලික අංශද මේ සඳහා සහභාගිකරගත හැකිදැයි අප සොයා බලනවා.

ගරු කථානායකතුමනි,

පසුගිය කාලයේ අපගේ රාජ්‍ය දැව සංස්ථාව පෞද්ගලීකරණයට ලැයිස්තුගත කර තිබුණා. එහෙත් ප්‍රශස්තව මෙහෙයුම් හා කළමනාකරණය ප්‍රතිව්‍යුහගත කරමින් එහි කටයුතු උපාය මාර්ගික කළමනාකරණයකට යොමුකිරිම තුලින් රාජ්‍ය දැව සංස්ථාව කාර්යක්ෂම රාජ්‍ය වාණිජමය ආයතනයක් ලෙස නව ප්‍රවේශයකට දැන් යොමු වී තිබෙනවා. මේ අනුව රාජ්‍ය වාණිජ ආයතන තවදුරටත් පෞද්ගලිකරණය කිරිම නොකරන බවට අතිගරු ජනාධිපතිතුමා විසින් මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩසටහනේ සඳහන් කරනලද ප්‍රතිපත්තිමය තීරණයට අපට ශක්තියක් විමට පුළුවන් උනා.

නවීන තාක්ෂණය සිය මෙහෙයුම් හා කළමනාකරණ කටයුතුවලට අනුගත කරමින් සිය නිෂ්පාදන මධ්‍යස්ථානයන් නවීකරණය කරමින්, ක්ෂේත්‍ර මෙහෙයුම් සඳහා නවීන යන්ත්‍රෝපකරණ යොදවමින් රාජ්‍ය දැව සංස්ථාව නවලොව දැව තාක්ෂණය මෙරටට හඳුන්වාදෙමින් ශ්‍රී ලංකාවේ දැව ක්ෂේත්‍රයේ විශාල පියවරක් පෙරට තබා තිබෙනවා. නව තාක්ෂණයට අනුව දැව ඉරුම්හල් සහ ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීමෙන් සිය කටයුතුවල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහල දමා තිබෙනවා. මේ නිසා දැව නිෂ්පාදනයේදී අපතේ යන දැව ප්‍රමාණය විශාල ලෙස අඩු කිරීමට ඉඩකඩ ලැබෙනවා.

ගරු කථානායකතුමනි,

කසළ තැන තැන අපහරණය කිරීම අප සියලුදෙනා ලජ්ජා විය යුතු කරුණක්. කසළ අපහරණය විධිමත්ව සිදු නොවිම තුලින් පාරිසරික ප්‍රශ්න පමණක් නොව සමාජ ප්‍රශ්න වගේම දේශපාලනික ප්‍රශ්නද ඇතිවී තිබෙනවා.එසේම මහජන පීඩා රාශියක් උද්ගතවී තිබෙනවා. මේ ගැටලුව මග හැරීමට මගේ අමාත්‍යාංශය මධ්‍යම පරිසර අධිකාරිය හරහා පිළිසරු ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා එමගින් කසල නිසිලෙස බැහැර කර කළමනාකරණය කිරීමේ වගකීම පැවරී ඇති පළාත් පාලන ආයතනවල ඒ සඳහා හැකියාව සහ ධාරිතාවය වැඩිකිරීමට කටයුතු කර තිබෙනවා. පිළිසරු ව්‍යාපෘතිය මගින් ලංකාවේ ඕනෑම පලාතක ඇති පළාත් පාලන ආයතනයකට සිය කසල කළමනාකරණ කටයුතු ද නිසිලෙස ඉටු කිරීමට අවශ්‍ය මුල්‍ය සහ තාක්ෂණික දැනුම ලබාදෙනවා.මෙම ව්‍යාපෘතිය මගින් දැනටමත් පළාත් පාලන ආයතන 125කට අධික ප්‍රමාණයක කොම්පෝස්ට් අංගන ඇති කිරීමට පහසුකම් සලසා තිබෙනවා. මේවයේ නිපදවෙන කාබනික පොහොර අලෙවි ගැටළු පවතිනවා. නමුත් මෙවර අය වැයෙන් කාබනික පොහොර නිෂ්පාදනයට හා අලෙවියට ලබාදුන් ප්‍රමුඛතාවය පිළිසරු ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වයට ධනාත්මකව බලපානවා. අතිගරු ජනාධිපතිතුමන් විසින් කාබනික පොහොර භාවිතය සඳහා දුන් පිටුබලය පරිසර සංරක්ෂණ ක්‍රියාවලියටද ඉතා හිතකරලෙස බලපානවා.

කසළ බැහැර කිරීමේදී සනීපාරක්ෂක කසල රඳවන සුවිශේෂී කාර්යයක් ඉටුකරනවා. මීට පෙර මෙවන් කසල රඳවන අපරටේ නොතිබුනත් කොරියානු රජයේ ආධාර සහ ණය යෝජනා කිහිපයක් මත දොම්පේ, ගම්පොල, අනුරාධපුර, පානදුර හා හික්කඩුව යන ප්‍රදේශවල මෙම කසල රඳවන ඉදිකිරීමට අවශ්‍ය කටයුතු දැන් ලහි ලහියේ ඉටුවෙනවා. දොම්පේ කසල රඳවනය ඉදිකිරිම දැනටමත් අරඹා තිබෙනවා. ඒ තුලින් නුදුරු අනාගතයේදීම කැලි කසල කළමනාකරණය කිරිමේන් දැනට ඇතිවී තිබෙන කැලි කසල ඉවත් කිරීමේ අර්බුදයට ඉතා හොඳ විසඳුමක් ලැබෙනවා.

ගරු කථානායකතුමනි,

අපරටේ කසළ කළමනාකරණය නිසිලෙස සිදුවීම ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමටත් මහඟු පිටු බලයක් වෙනවා .

ගරු කථානායකතුමනි,

කසළ බැහැරකිරීම ගැන කථා කිරීමේදී ඉලෙක්ට්‍රොනික කසළ බැහැර කිරීම ගැන ද කථා යුතුවෙනවා . මේ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ මධ්‍යම පරිසර අධිකාරිය මගින් නිකුත්කර එය මෙහෙයුමකට භාජනය කරනවා. ප්ලෝරසන්ට් හා CFL බල්බ භාවිතය බලශක්තිය ඉතුරුකරමින් ක්‍රියාත්මක වුවත් ඒවා අක්‍රිය වීමේදී වගකීමකින් තොරව කසල ගොඩවල්වලට විසිකිරීම ලංකාවේ ප්‍රකටව සිදුවන දෙයක් . මේ මගින් පරිසරය භූගත ජලයද අපිරිසිදු වී මිනිසුන්ට ලෙඩරෝග ඇතිකරනවා. මේ නිසා CFL බල්බ ප්‍රතිචක්‍රීකරණය කර ඉන් රසදිය එකතුකර පිටරට යැවීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබාගැනීමට මධ්‍යම පරිසර අධිකාරිය සමත් වි තිබෙනවා..

ගරු කථානායකතුමනි,

වෙරළ කලාපය සහ මුහුදු ජලය පිළිබඳව ඇති තොරතුරු ප්‍රමාණය ඉතා අල්ප නිසා ශ්‍රී ලංකාවේ සමුද්‍රිය පරිසරයට සිදුවන යම් හානියක් වෙතොත් එය නිසි ලෙස තක්සේරු කර ගැනීමේ අපහසුවක් අපට තිබුනා. මේ නිසා මෙම අඩුව සපුරා ගැනීමට සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ අදාළ අංශ ශක්තිමත් කිරීම අරඹා තිබෙනවා. ඒ අනුව එම ආයතනයේ පර්යේෂණ අංශයේ සහ විද්‍යාගාර වල පහසුකම් වැඩි දියුණු කෙරෙනවා. ශ්‍රී ලංකාව නව යුගයක් කරා ඔසොවා තැබීමට හැකි මන්නාරම් බොක්කේ සිදුවන ඛණිජ තෙල් ගවේෂණ කටයුතුවලදී පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලියේ වැඩි කාර්යභාරයක් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට පැවරී තිබෙන අතර දැනට ඛණිජ තෙල් ගවේෂණයට අදාළ රෙගුලාසි එමගින් සම්මත කරගෙන තිබෙනවා. මිට අමතරව බංකරින් සහ හදිසිතෙල් විසිරීම් පාලන සැලැස්මට අදාළ රෙගුලාසි ඉතා ඉක්මනින් ගැසට් කිරීමට කටයුතු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි,

ශ්‍රී ලංකාවේ සමුද්‍ර කලාපය තුල සිදුවන නෞකා ක්‍රියාකාරකම් මෙන්ම දැනට අප රටේ සිදු කරන තෙල් ගවේෂණ කටයුතු වැනි ක්‍රියා කලාපයන් හරහා අපගේ සමුද්‍ර මෙන්ම වෙරළ කලාපය නෞකා අනතුරු මගින් සිදුවිය හැකි තෙල් සහ රසායනික ද්‍රව්‍ය විසිරීම් ආදි ව්‍යසනවලට භාජනය වීමේ අවදානමට මුහුණ දීම සඳහා දැනට ක්‍රියාත්මක ජාතික හදිස්සි තෙල් විසිරීම් පාලන සැලැස්ම තවදුරටත් ශක්තිමත් කිරීමට මා උපදෙස් ලබාදී තියෙනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව නාවුක කේන්ද්‍රස්ථානයක් බවට පත්වද්දී මෙම අවශ්‍යතාවය වඩ වඩාත් වැදගත් වෙනවා. හදිසි නාවුක අනතුරකදී සිදුවිය හැකි තෙල් හා රසායනික ද්‍රව්‍ය විසිරීම් කඩිනමින් පාලනය කරමින් ප්‍රතිචාර දැක්වීම සඳහා අත්‍යවශ්‍ය උපාංග වලින් හා මනා පුහුණුවකින් හෙබි පිරිසකගෙන් සමන්විත හදිසි ප්‍රතිචාර දැක්වීමේ යාත්‍රා 3ක් මේ සඳහා නැගෙනහිර, දකුණ සහ බස්නාහිර වෙරල කලාපයන් ආවරණය කරමින් ස්ථානගත කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව මා මේ අවස්ථාවේදී මෙම ගරු සභාවටද යෝජනා කරමින් දන්වා සිටිනවා.

ගරු කථානායකතුමනි,

මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය , මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය රටතුල ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය සහ විදිමත් කිරීම යන කාර්යයන් මෙහෙය වීමේ ප්‍රධාන රාජ්‍ය යාන්ත්‍රණය ලෙස ක්‍රියා කරනවා. මෙය දැනට ලාබ ලබන ආයතනයක් ලෙස ක්‍රියාකරනබව ඔබ සැමට සතුටින් දන්වා සිටීමට මා කැමතියි.

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තවල නියැලෙන සුළු හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයාගේ සිට මහා පරිමාණ නිෂ්පාදකයා දක්වා සිය නිෂ්පාදන අලෙවි කර ගැනීමට අවශ්‍ය දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොල අවස්ථා පුළුල් කිරීමට මෙම අධිකාරිය කටයුතු කර ඇති අතර දේශීය හා විදේශීය වශයෙන් ප්‍රදර්ශන රැසකට සහභාගිවීමට මෙම නිෂ්පාදකයන් හට මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය කටයුතු සලස්වා දී තිබෙනවා. එමෙන්ම දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් සිදු කරන ලද අලෙවි හා වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් මගින් රටට විශාල වශයෙන් විදේශ විනිමය ලබාදීමටද මෙම ආයතනය කටයුතු කර තිබෙනවා. අධිකාරියේ ප්‍රධාන අදායම් මාර්ගයක් වන මැණික් ඉඩම් වෙන්දේසිය වැඩි වැඩියෙන් පරිසර හිතකාමී මානයක් ඔස්සේ සිදුකිරිමෙන්ද, මැණික් ව්‍යාපාරයෙන් සිදුවන මහජන පරිසර දූෂණ ක්‍රියාවලින් අවම කිරීමට උත්සුක වීමෙන්ද , අත්හැර දමන ලද මැණික් පතල් විධිමත්ව ගොඩ කිරීමෙන්ද මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වැඩි අදායමක් හා මහජන විශ්වාසයක් ගොඩනගාගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි,

රත්නපුර දිස්ත්‍රික්කයේ පතල් වලින් හමුවන මැණික් වලට සාධාරණ මිලක් ලබා දීම අධිකාරියේ බලපත්‍ර ලබාගෙන වෙන්දේසි සිදුකරන විකුණුම් කරුවන් හට අද්දයම් බදු සහන ලබා දීම සහ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ මැදිහත් වීමෙන් විකුණුම් කරුවන් හා ගැනුම් කරුවන් එකම ස්ථානයකට රැස් කර ඔවුන් අතර විශ්වාසනීයත්වය ගොඩනැගීම යනාදිය මෙහි මූලික අරමුණ වුනා.

සාම්ප්‍රදායික ස්වර්ණාභරණ ගම්මාන ලෙස හඳුනාගෙන ඇති පාරම්පරික ශිල්ප ගම්මානවල ආභරණ කර්මාන්තයේ නියුතු වූවන්ගේ ශිල්පඥානය සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට එම ශිල්පීන් සංවිධාන ගතකර සංගම් පිහිටුවා එම සංගම් හරහා ඔවුන්ට නවීන උපකරණ සහ මෙවලම් සපයාදීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය දැනටමත් කටයුතු අරඹා තිබෙන අතර ඉදිරි වසරේදී මෙය වඩා පුළුල්ව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා.

එසේම, සංචාරකයින් වැඩිපුර ගැවසෙන ප්‍රධාන පෙළේ හෝටල් ආශ්‍රිත නගරයන් හි ප්‍රදර්ශනාගාර විවෘත කර මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ නියැලෙන කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකරගැනීමට සහාය දෙනු පිණිස ඇතිකරගත් වැඩපිළිවෙලක් දැනට සකසා ඇත. එහි පළමු අදියර ලෙස අධිකාරිය මගින් කොළඹ ලෝක වෙළඳපොල මධ්‍යස්ථානයේ එහි අධීක්ෂණය යටතේ පවත්වා ගෙනයනු ලබන ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ හුවමාරු මාධ්‍යස්ථානයේ ප්‍රදර්ශනාගාරයක් නුදුරේදීම විවෘත කිරීමට කටයුතු සූදානම් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි,

ශ්‍රී ලංකාවේ මැණික්, අලංකරණය අතින් අනූනය. දුර්ලභයි. ඒවගේම උසස් ගුණාත්මයකින් යුක්තයි. මේ නිසාම අපගේ මැණික් වලට හොඳ ඉල්ලුමක් තියෙනවා. එහෙත් පසුගිය කාලයේ ශ්‍රී ලංකාවේ මැණික් වෙළඳාම කීපදෙනෙකු අතර සීමාවී තිබුණු බව අප දැක්කා.එබැවින් ජාත්‍යන්තරයට මැණික් ලඟා වුයේද මොවුන් අතලොස්ස මගින් පමණි.සාමාන්‍ය මැණික් ගරන්නන්ට හා වෙළඳුන්ට මේ මගින් බලවත් අසාධාරණයක් වී ඇති බව මා දුටුවා. ඒ නිසා මෙම ඒකාධිකාරය බිඳ දමා බහුතරයකට ජාත්‍යන්තර මැණික් වෙළඳපොල විවර කර දීමට අවශ්‍ය කටයුතු දීමට මා උපදෙස් දුන්නා. ඒ අනුව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ සංවර්ධනය සඳහා මූලිකව කටයුතු කරන මගේ අමාත්‍යාංශයට අනුබද්ධ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් නගා සිටුවීම සඳහා පතල්පොලේ සහ ආභරණ වැඩ බංකුවේ සිට දේශීය හා විදේශීය වෙළඳ පොළ දක්වා කැඳවා ගෙන ඒමේ විශාල වැඩපිළිවෙලක් දැන් අරඹල තිබෙනවා.මේ සඳහා "ජුවෙල්ස් ශ්‍රී ලංකා 2012" නම් වූ ජාත්‍යන්තර මැණික් ප්‍රදර්ශනයක් මේ දෙසැම්බර් 7 වනදා සිට 9 වනදා දක්වා සිරිමාවෝ බණ්ඩාරනායක සමරු කේන්ද්‍රයේදී පැවැත්වීමට කටයුතු කර තිබෙනවා. ඇමරිකාව , කැනඩාව , චීනය , එංගලන්තය , රුසියාව, සිංගප්පූරුව , ඉතාලිය හා මැදපෙරදිග රටවල් වලින් ගැනුම් කරුවන් 250 කට අධික පිරිසක් මේ ප්‍රදර්ශනයට සහභාගීවීමට නියමිතයි.
මීට අමතරව මිණි කිරුළ වැඩසටහනකින්ද කුඩා පරිමාණ මැණික් ගරන්නන්ට විශාල සහන රැසක් ලබා දීමට නියමිතයි.

ගරු කථානායකතුමනි,

මාගේ අමාත්‍යාංශය යටතේ පවතින මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මගින් ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුකිරීමේ ව්‍යාපෘතියන් මගින් මැණික් සම්පත් පිලිබඳ තොරතුරු ගොනුකිරීමක් අරඹා තිබෙනවා.ඒ වගේම මෙම ආයතනය මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාලව එම ක්ෂේත්‍රයන්ගේ කටයුතු කරන ශිල්පින් සහ ආධුනිකයින්ට ගෙවුඩ තාප පිරියම් කිරීම , මැණික් ඔපමට්ටම් කිරිම සහ ස්වර්ණාභරණ නිෂ්පාදනය ආදී ක්ෂේත්‍රය යටතේ වෘත්තීය පුහුණු වැඩසටහන් පවත්වා තිබෙනවා.

ගරු කථානායකතුමනි,

පරිසර අමාත්‍යාංශය යටතේ පවතින භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය ප්‍රධාන ක්ෂේත්‍ර කීපයක් ඔස්සේ සිය කාර්යයන් මෙහෙය වීමෙන් රටේ සංවර්ධන ක්‍රියාවලියට විශාල ශක්තියක් ලබාදෙනවා මෙම ආයතනය මෙම වසර තුල ප්‍රථමවරට මහා භාණ්ඩාගාරයට රුපියල් බිලියනයක අදායමක් ලබාදී තිබෙනවා. ඒ වගේම රටේ ගොඩනැගිලි කර්මාන්තයට අත්‍යාවශ්‍ය වැලි ස්ථාවර සාධාරණ මිලකට ලබාදීමට අවශ්‍ය කටයුතු එහි තාක්ෂණික සේවක ආයතනය සමග එක වී කටයුතු කර තිබෙනවා. සාමාන්‍ය ජනතාවට වැලි, පස්, බොරළු වැනි ද්‍රව්‍ය තමාගේ සාමාන්‍ය කටයුතු සඳහා අවශ්‍ය වෙනවා. පෙර තිබු නීති රීති නිසා මේ අයට එම අවශ්‍යතා සපුරා ගැනීමේදී විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිදුවුනා.මේ නිසා මෙම තත්ත්වය මගහැරීමට හා මහජනයාට පහසුව සැලසීමට වැලි, පස් හා බොරළු සුළු ප්‍රමාණවලින් මසකට සැරයක් බල පත්‍ර රහිතව ලබාගැනීමට හා ප්‍රවාහනයට ඉඩ ලබාදුන්නා.

එසේම මෙම ආයතනය ශ්‍රී ලංකාවේ සිමෙන්ති, හුණුගල් , පිහන් මැටි, වැලි නිධි සහ කළුගල් පිළිබඳව අංගසම්පූර්ණ ගවේෂණයක් සිදුකර තිබෙනවා, ඒ වගේම අදාළ අන්තර් ජාතික ආයතන සමග සම්බන්ධවී මෙම කාර්යාංශය භූ චලන සහ සුනාමි පූර්ව ඇඟවීමේ මධ්‍යස්ථාන 3ක් මහකනදරාව, පල්ලේකැලේ, හක්මන යන ප්‍රදේශවල ස්ථාපනය කර තිබෙනවා. මේ මගින් මුළු මහත් ජාතියටම සුනාමි ආදී ව්‍යසනවලින් ගැලවීමට පූර්ව දැනුම්දීමේ මගක් ඇතිකර දී තිබෙනවා .ඒ අතරම මෙම කාර්යාංශය සීගිරි පර්වතයේ බුරුල්වීතිබෙන ගල් පතුරු ස්ථායි කොට පුනුරුත්ථාපන කටයුතුද සම්පූර්ණ කරදී තිබෙනවා.

ගරු කථානායකතුමනි,

අතිගරු ජනාධිපතිතුමන්ගේ ජන්ම දිනය නිමිත්තෙන් සහ ජාතික රුක්රෝපණ වැඩසටහන නිමිත්තෙන් තෙවන වරටත් මාගේ අමාත්‍යාංශය මගින් දීප ව්‍යාප්ත රුක්රෝපණ වැඩසටහනක් දියත් කරනු ලැබූ වගයි. මුළු රටම ආවරණය වන පරිදි සියලු පළාත්සභා සහ දිස්ත්‍රික් මට්ටමින් මෙම වැඩසටහන අති සාර්ථකව ක්‍රියාත්මක වුනා. මේ වැඩසටහනට පළාත් සභා, ප්‍රධාන අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය , පළාත් පාලන ආයතන, පොලිසිය, හමුදාව සහ පෞද්ගලික අංශය නොමසුරුව සහයෝගය ලබාදුන්නා. ඔවුන්ගේ එම සහයෝගයට මාගේ හෘදයාංගම ස්තුතිය මේ අවස්ථාවේදී පලකරනවා.එසේම ලබන වසරේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ඔබ සැමගේ සහාය මා බලාපොරොත්තුවෙනවා. මෙවර වැඩසටහනේ දී සිටුවන සැම පැළයක්ම බලා හඳුනාගැනීමට ප්‍රමුඛතාවය ලබාදුන්නා.ඒ වැඩසටහනේ පසු විපරම් වැඩසටහන දැන් අප සකස්කරමින් සිටිනවා. මෙම දීප ව්‍යාප්ත වැඩසටහන පසුගිය මස 15 වනදා අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් විවෘත වුනා. එසේම පසුගිය වසරේ රුක්රෝපණ වැඩසටහන තුලින් ඇරඹි හරිත උයනේ සංවර්ධන කටයුතුද පමණක් සෙමෙන් වුවත් සාර්ථකව ඉදිරියට ගමන් කරනවා.

ගරු කථානායකතුමනි,

බල ශක්ති සම්පාදනයේදී වැඩි ප්‍රමුඛතාවයක් පුනර්ජනනීය බල ශක්තිය සඳහා ලබාදීම මෙවර අය වැයේ මා දකින තවත් සාධනීය පියවරක්. පුනර්ජනනීය බල ශක්ති සම්පාදනයේදී ජෛව ස්කන්ධ බලශක්ති සම්පාදනය අප රටේ ප්‍රචලිත කිරීම වැදගත් වෙනවා. එමගින් බලශක්ති සම්පාදනය පෝෂණය වනගමන්ම එම ජෛව ස්කන්ධ ලබාගැනීමෙන් ඉතිරිවන ශාකපත්‍ර පසට හොඳ පොහොරක් ලෙස යොදාගන්න පුළුවන්. විශේෂයෙන්ම ග්ලිරිසීඩියා, ඉපිල් ඉපිල් වැනි ශාක මේ සඳහා වැවීමේදී ගව සහ එළු පාලනයද මේ සමගම බද්ධ කරගන්න පුළුවන්. එසේ නැතිනම් කොම්පෝස්ට් පොහොර හදාගැනීමට යොදාගන්න පුළුවන්. මේ නිසා ග්‍රාමීය මෙන්ම වතුහිමි ජනතාවට අමතර ලාභ රැසක් අත් කරගන්න පුළුවන්. සාමාන්‍යයෙන් අවුරුදු 20 -25 වූ පොල් ඉඩමක භූමියෙන් 75% පමණ මේවගේ වැඩවලට යොදාගන්න පුළුවන්.එමගින් වැඩි ඉඩම් ප්‍රයෝජ්‍යතාවයක් හා ඵලදාවක් ලබාගන්න පුළුවන්. සාමාන්‍යයෙන් මේවගේ ව්‍යාපාරයක් ගැමි කාන්තාවන්ට පහසුවෙන් කරන්න පුළුවන්. එමගින් කාන්තා පක්ෂය ආර්ථිකයෙන් සවිබල ගැන්වීමට හැකියාවක් ලැබෙනවා. ජගත් පාරිසරික පහසුකම (GEF ) යටතේ ජෛව ස්කන්ධ බලශක්ති සංවර්ධනය ව්‍යාපෘතියක් මගේ අමාත්‍යාංශය මගින් ලබන වසරේ ඇරඹීමට කටයුතු යොදා ඇත . මේ සඳහා සුනිත්‍ය බල අධිකාරියේ පූර්ණ සහයෝගය මගේ අමාත්‍යාංශයට ලැබෙනවා. ජෛව ස්කන්ධ බලශක්තිය නිපදවී උපකරණ සඳහා මෙවර අය වැයෙන් බදු සහන ලබාදීමද ඉතා සාධනීය පරිසර හිතකාමී පියවරක් ලෙස මා දකිනවා. ඒ වගේම වන වගා කරුවන්ට මෙවර ඇය වැය යෝජනා වලින් බදු සහන ලබාදීමද මගේ අමාත්‍යාංශය පැත්තෙන් බලන කොට ඉතාම සාධනීය යෝජනාවක්.

ගරු කථානායකතුමනි,

රටේ සිදුවන සීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලිය තිරසාර සංවර්ධන මාවත ඔස්සේ ඉදිරියට ගෙනයාමට සහ මහින්ද චින්තන ඉදිරි දැක්මේ ඉලක්ක සපුරා මේ රටේ ජනතාවට සුඛිත මුදිත සුබ අනාගතයක් ලඟාකර දිමට මාගේ අමාත්‍යාංශය නිරතුරුවම දායකවීමට කටයුතු කරනවා. මැණික් හා ස්වර්ණාභරණ මෙන්ම විවිධ ඛනිජ ද්‍රව්‍යයන් වැනි ස්වභාවික සම්පත්ද අගය එකතු කරමින් ජාත්‍යන්තර වෙළඳ පොලට යොමු කර රටේ අපනයන ක්ෂේත්‍රයේ ප්‍රගමනයට දායක වීමටද මා බලාපොරොත්තු වෙනවා.රටේ වනසම්පත සංචාරක ක්ෂේත්‍රයට වැඩිමනත් වශයෙන් දායක කරමින් එමගින් විදේශ විනිමය ඉපයීම ඉහල තලයකට ගෙන ඒමටද මා බලාපොරොත්තුවෙනවා. එමගින් සංවර්ධනයට මෙන්ම පරිසර සංරක්ෂණයටද නිසි තැන ලබාදීමට පහසුකම් සැලසීමේ වගකීම මා අකුරටම ඉටුකිරීමට බලාපොරොත්තුවෙනවා.

ගරු කථානායකතුමනි,

පරිසරය විනාශ කරමින් ලබන සංවර්ධනයෙන් පලක් නොවන බව අතිගරු ජනාධිපතිතුමාද අවධාරණය කල බව මෙම ගරු සභාවේ සිටින ඔබ සියලු දෙනාට මතක ඇති. සංවර්ධන ක්‍රියාවලියේ විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන ඔබතුමන්ලා සියලු දෙනාගේ සහයෝගය පරිසට සංරක්ෂණ විෂයය ක්‍රියාවට නංවන මාහට නොමඳව ලැබේයැයි මා බලාපොරොත්තුවෙනවා. එවිට අප සියල්ලන්ටම එක්වී අපගේ මේ රට තිරසාර සංවර්ධන මාවතේ ගමන් කරවීමට හැකියාව ලැබේවි . මා මෙතෙක් වේලා ඔබලාට විස්තර කලේ පරිසර අමාත්‍යාංශය පරිසර සංරක්ෂණ ක්ෂේත්‍රයේ මෙතෙක් ආ මග සහ ඉදිරි ක්‍රියාමර්ගයන්ය . මෙම ගමන සාර්ථකව යාම සඳහා පක්ෂ විපක්ෂ ඔබ සියලු දෙනාගේම සහයෝගය මා හටත්, මාගේ අමාත්‍යාංශයටත් , ඊට අනුබද්ධ සියලු ආයතනවලටත් නොමඳව ලැබේයයි මා ගෞරවයෙන් අපේක්ෂා කරනවා.

පරිසරය සුරැකිමින් අපි රැකෙමු .

"166 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 116,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

166 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 6,800,000

"166 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 6,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

166 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 64,000,000

"166 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 64,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

166 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 116,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 6,800,000

"தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 6,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 64,000,000

"தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 64,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 116,000,000, for Head 166, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 166, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 6,800,000

Question, "That the sum of Rs. 6,800,000, for Head 166, Programme 01, Capital Expenditure, be inserted in the Schedule " put and agreed to.

Head 166, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 64,000,000

Question, "That the sum of Rs. 64,000,000, for Head 166, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 166, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

**02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 34,514,200,000**

**நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் மூலதனச் செலவு ரூபா 34,514,200,000**

PROGRAMME 02. - DEVELOPMENT ACTIVITIES - CAPITAL EXPENDITURE, RS. 34,514,200,000

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත 2013 කාරක සභා අවස්ථාවේදී 166 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

වැඩ සටහන 02 - සංවර්ධන වැඩ සටහන - මූලධන වියදම් සඳහා ප්‍රතිපාදනය රු. 34,764,200,000 දක්වා වැඩි කිරීමෙන් සංශෝධනය කළ යුතු ය.

(ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගේ මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ මෙම වැඩසටහනේ මූලධන වියදම් සඳහා ප්‍රතිපාදනය රුපියල් 250,000,000 කින් වැඩි කිරීමය.)

ව්‍යාපෘතිය 03 - ජල සැපයුම් අංශයේ ප්‍රජා පහසුකම් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි මූලධන වියදම් වැඩි කළ යුතුය. (අය වැය යෝජනාව):-

උප ව්‍යාපෘතිය 16 - ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම.
වැය විෂයය 2502 - ආයෝජන රු. 250,000,000

ශීර්ෂ 166, වැඩ සටහන 02, සංවර්ධන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 34,764,200,000ක වැඩි කරන ලද මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ශීර්ෂ 166, වැඩ සටහන 02, සංවර්ධන වැඩ සටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபா 34,764,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப் பட்டது.

"தலைப்பு 166, நிகழ்ச்சித்திட்டம் 02, அபிவிருத்திச் செயற்பாடுகள் திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கவேண்டுமென கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 34,764,200,000, for Head 166, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 166, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"152 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 108,770,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

152 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 16,025,000

"152 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 16,025,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

152 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 2,054,980,000

"152 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,054,980,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

152 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 30,918,320,000

"152 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 30,918,320,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

152 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**282 වන ශීර්ෂය.- වාරිමාර්ගදෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 372,350,000

"282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 372,350,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 41,625,000

"282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 41,625,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,063,900,000

"282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,063,900,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 5,924,030,000

"282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 5,924,030,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“தலைப்பு 152, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 108,770,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 152, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 16,025,000

“தலைப்பு 152, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 16,025,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 152, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 2,054,980,000

“தலைப்பு 152, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 2,054,980,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 152, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 30,918,320,000

“தலைப்பு 152, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 30,918,320,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 152, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 282.- நீர்ப்பாசனத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 372,350,000

"தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 372,350,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 41,625,000

"தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 41,625,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 1,063,900,000

"தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,063,900,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 5,924,030,000

"தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 5,924,030,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 108,770,000, for Head 152, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 152, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 16,025,000

Question, "That the sum of Rs. 16,025,000, for Head 152, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 152, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 2,054,980,000

Question, "That the sum of Rs. 2,054,980,000, for Head 152, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 152, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 30,918,320,000

Question, "That the sum of Rs. 30,918,320,000, for Head 152, Programme 02, Capital Expenditure, be inserted in the Schedule " put and agreed to.

Head 152, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**HEAD 282. - DEPARTMENT OF IRRIGATION**

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 372,350,000

Question, "That the sum of Rs. 372,350,000, for Head 282, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 282, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 41,625,000

Question, "That the sum of Rs. 41,625,000, for Head 282, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 282 Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 1,063,900,000

Question, "That the sum of Rs. 1,063,900,000, for Head 282, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 282, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 5,924,030,000

Question, "That the sum of Rs. 5,924,030,000, for Head 282, Programme 02, Capital Expenditure, be inserted in the Schedule " put and agreed to.

Head 282, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

"160 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 186,930,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

160 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 25,750,000

"160 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.25,750,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

160 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 407,000,000

"160 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 407,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

160 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 1,320,350,000

"160 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,320,350,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

160 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**283 වන ශීර්ෂය.- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 906,070,000

"283 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 906,070,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

283 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 453,900,000

"283 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.453,900,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

283 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 186,930,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 25,750,000

"தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 25,750,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 407,000,000

"தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 407,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,320,350,000

"தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 1,320,350,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 283.- வனவளத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 906,070,000

"தலைப்பு 283, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 906,070,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 283, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 453,900,000

"தலைப்பு 283, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 453,900,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 283, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 186,930,000, for Head 160, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 160, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 25,750,000

Question, "That the sum of Rs. 25,750,000, for Head 160, Programme 01, Capital Expenditure, be inserted in the Schedule " put and agreed to.

Head 160, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 407,000,000

Question, "That the sum of Rs. 407,000,000, for Head 160, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 160, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure, Rs. 1,320,350,000

Question, "That the sum of Rs. 1,320,350,000, for Head 160, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 160, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**HEAD 283. - DEPARTMENT OF FORESTS**

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 906,070,000

Question, "That the sum of Rs. 906,070,000, for Head 283, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 283, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 453,900,000

Question, "That the sum of Rs. 453,900,000, for Head 283, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 283, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

***එකල්හි වේලාව අ. භා. 6.00 වූයෙන්, පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.***

***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2012 දෙසැම්බර් මස 04වන අඟහරුවාදා.***

*அப்பொழுது நேரம் பி.ப. 6.00 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2012 டிசம்பர் 04, செவ்வாய்க்கிழமை.*

*It being 6.00 p.m., the Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Tuesday, 04th December, 2012.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගරු විජිත බේරුගොඩ මහතා.

Order, please! Will an Hon. Member propose the Hon. (Mrs.) Sriyani Wijewickrama to take the Chair.

**ගරු මහින්ද සමරසිංහ මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Plantation Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා *මූලාසනයෙන් ඉවත් වූයෙන්,* ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය *මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு,* பிரதிச் சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம *அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

## විනාශ වූ ගොවිජන සේවා මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම
## அழிவடைந்த கமநல சேவை நிலையங்களின் அபிவிருத்தி
## DEVELOPMENT OF DESTROYED AGRARIAN SERVICES CENTRES

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

> "වසර 30ක් පුරා පැවති ත්‍රස්තවාදී අරගලයත්, 1980 දසකයේ අග භාගයේදී ඇති වූ සිවිල් අගලයත්, සුනාමි ව්‍යසනයත් නිසා මේ රටේ තිබූ ගොවිජන සේවා මධ්‍යස්ථාන ඇතුළු රජයේ ගොඩනැගිලි විශාල සංඛ්‍යාවක් විනාශයට පත් විය.
>
> එම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමට හෝ නැවත ගොඩ නැගීමට පියවර ගෙන ඇතත්, සමහර ස්ථානවලට අවධානය යොමු වී නැති බවත් දක්නට ලැබේ.
>
> මෙසේ විනාශ වූ ගොඩනැගිලි යළි සංවර්ධනය කර ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් සපයා දීම සඳහා පියවර ගන්නා මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වර්තමානයේ අපේ රට ආර්ථික වශයෙන් සතුටුදායක මට්ටමකට පැමිණ තිබෙනවා. විශේෂයෙන් අපේ රට මැදි ආදායම් ලබන රටක් විධියට ඒක පුද්ගල ආදායම වැඩි වෙලා, ජාතික නිෂ්පාදනය වැඩි වෙලා, ආසියාවේ වැදගත් තැනක ඉන්න පුළුවන් රටක් විධියට ඉදිරි ගමනක් යන මොහොතක් තමයි මේ.

අපි දන්නවා, රටක් සංවර්ධනය කිරීමේදී ඒ සඳහා විශේෂ වූ දර්ශක තිබෙන බව. මානව දර්ශක තිබෙනවා, සමාජ දර්ශක තිබෙනවා. භෞතික ජීවන තත්ත්ව දර්ශකය ඉහළම රටක් විධියට අපේ රට දකින්න පුළුවන්. සමාජ හා මානව දර්ශක අතිනුත් අපේ රටේ සතුටුදායක මට්ටමක් තිබෙනවා. එක පැත්තකින් අපේ රටේ

ඒක පුද්ගල ආදායම වැඩියි. ඒක නිසා අපේ රටේ ආර්ථිකය ශක්තිමත් මට්ටමක තිබෙනවා. නමුත් එහෙම තිබුණාට, 1948 දී අපි නිදහස ලබන කොට අපේ රටේ තිබුණු තත්ත්වය වෙනත් රටවල් සමඟ සන්සන්දනය කරලා බලන කොට කොරියාව වාගේ රටවල් අපේ රටට වඩා බොහොම පිටුපසින් හිටියේ. නමුත් අද වෙන කොට කොරියාව ඇතුළු ආසියාවේ රටවල් ගණනාවක් අපේ රට පසු කර ගෙන ආර්ථික හා සමාජ මට්ටමෙන් ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා. වර්තමානයේදී තමයි අපේ රටේ ඒක පුද්ගල ආදායම වැඩි වෙලා, දරිද්‍රතාව අඩු වෙලා, ජීවන තත්ත්වය වර්ධනය වෙලා මේ සංවර්ධන ස්වභාවය ඉස්සරහට යන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ගෙන යන්නේ. නමුත් පසු ගිය දශක දෙක, තුන දිහා හැරිලා බැලුවාම ඒ අවධියේ මේ රටට වැටිලා තිබුණු ඒ අඳුරු සෙවණැලි නොතිබෙන්නට අපේ රටට මීට වඩා ඉස්සරහට යන්න පුළුවන්කම තිබුණා.

අපට අමතක කරන්න බැහැ, 1971 තිබුණු අරගලය. පළමු වතාවට ප්‍රජාතන්ත්‍රවාදී රටක් විධියට මහ ජනතාවගේ ඡන්දයෙන් බලයට පත් වුණු රටක් අවි බලයෙන් පෙරළා දමන්න ගත් අසාර්ථක උත්සාහයක් ඒ අවධියේ තිබුණා. ඒ අවධියේ තිබුණු මේ රටේ සිවිල් අරගලයත් එක්ක අපේ රටේ ජන සංඛ්‍යාවෙන් යම් ප්‍රමාණයක් විනාශයට පත් වුණා. ඒ එක්කම 1987 දී ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කිරීමත් සමඟ, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟම මේ රටේ සිවිල් අරගලයක් ඇති වුණා. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ තරුණ පිරිස් මේ රටේ ජන ජීවිතය අඩාළ කරමින්, රජය පවත්වා ගෙන යෑමට අභියෝග එල්ල කරමින් ජන සංහාරයක් කළා; ගොඩනැඟිලි ඇතුළු දේපළ විනාශයට පත් කළා. ඒ නුදුරු අතීතය පිළිබඳව අපි හොඳට දන්නවා. ඒ විනාශයේ දෝංකාරය, ලක්‍මෝනිය ජනතාවගේ සිත් සතන් තුළත්, කඳු, ගංගා අතරත් මේ ආර්ථික මට්ටමත් එක්ක බලන කොට තවම රැව් පිළිරැව් දෙනවා.

කොහොම වුණත් ඒ අවධියේ ඒ අන්තවාදී කණ්ඩායම් අපේ රටේ තිබෙන සම්පත් විශාල ප්‍රමාණයක් විනාශ කළ බව අපි දැක්කා. වඩාත්ම වටිනා සම්පත තමයි මිනිස් සම්පත. තරුණයෝ 60,000ක් පමණ විනාශයට පත් වුණා. ආරක්ෂක හමුදාවේ අය විනාශයට පත් වුණා. මේ අතර අපි දැක්කා, මේ රට ඉස්සරහට ගෙන යන්න පුළුවන් මහාචාර්යවරු, නීතිඥවරු, වෛද්‍යවරු, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ, සිවිල් සේවකයින්, ගොවි හා කම්කරු ජනතාව වැනි හැම ස්තරයකම ජනතාව මේ විනාශයට ගොදුරු වූ බව. ඒ සා විශාල ප්‍රමාණයක් මිය ගියා. මේ රටට අවශ්‍ය බුද්ධිමතුන් විශාල සංඛ්‍යාවක් -අපේ රට ඉස්සරහට ගෙන යන්න බුද්ධිමය ශ්‍රමය පාවිච්චි කරන්න පුළුවන් විශාල සංඛ්‍යාවක්- මිය ගියා.

ඊට අමතරව, රටක් සංවර්ධනය කරන කොට ප්‍රාග්ධනය අවශ්‍යයි කියලා අපි දන්නවා. ප්‍රාග්ධනය ගැන කථා කරන කොට මානව ප්‍රාග්ධනය වාගේම, ස්ථාවර වත්කම්, ස්ථාවර ප්‍රාග්ධනයත් අපේ රටේ තිබෙනවා.

විශේෂයෙන් ගොඩනැඟිලි, යන්ත්‍රෝපකරණ වාගේ දේවල් මේ රටේ ස්ථාවර ප්‍රාග්ධන වත්කම්. මේ රටේ ජනතාවගෙන් අය කර ගත් බදු මුදල් තමයි ගොඩනැඟිලි ඇතුළු මේ ස්ථාවර වත්කම් ගොඩ නඟා ගැනීමට රජය වැය කර තිබෙන්නේ. මේ තුළ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය කාර්ය භාරයන් රාශියක් පරම්පරා ගණනාවක් තුළ සිද්ධ වනවා.

ඒ අවධියේ විනාශ වුණු ගොඩනැඟිලි අතර විශේෂයෙන්ම වී ඇතුළු ගොවි ජනතාවගේ අනෙකුත් නිෂ්පාදන ගබඩා කරන්න තිබෙන ගොවිජන සේවා මධ්‍යස්ථාන, ඒ වාගේම වී අළෙවි මණ්ඩලයට අදාළ ගොඩනැඟිලි තිබුණා. මහාමාර්ග විනාශ වුණා. දුම්රිය, බස් ඩිපෝ, තේ කර්මාන්තශාලා, ගොවිජන සේවා මධ්‍යස්ථාන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ප්‍රාදේශීය සභා ඇතුළු ගොඩනැඟිලි රාශියක් විනාශයට පත් වුණා. 1987, 1988, 1989, 1990 වාගේ කාලවලදීයි ඒ වාගේ විනාශයක් අපට උරුම කළේ. ඒ විනාශයෙන් මිදෙන්නට තවම අපට බැරි වෙලා තිබෙනවා. නමුත් අපි දකිනවා, රජය බොහෝ වෙහෙස මහන්සි වෙලා උත්සාහ අරගෙන සමහර ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය කරලා යථාවත් කර තිබෙන බව. හැබැයි ඒවාට වැය කර තිබෙන්නේත් මේ රටේ සංවර්ධනය සඳහා වෙන් විය යුතු මුදල්. මේ රටේ ජනතාවගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් වෙන් විය යුතු මුදල් තමයි ඒ විනාශ වුණු ගොඩනැඟිලි, කර්මාන්තශාලා, යන්ත්‍රෝපකරණ, දුම්රිය, බස් රථ, ට්‍රාන්ස් ෆෝමර් වැනි ඒ සියල්ල යථාවත් කිරීම සඳහා වැය කර තිබෙන්නේ. නමුත්, මා දන්නා විධියට මොනරාගල දිස්ත්‍රික්කයේ සමහර තැන්වල තවමත් ඒ ගොඩනැඟිලි තිබෙනවා. බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැඟිල්ල විනාශ කළා. ඒ වෙනුවට අලුත් ගොඩනැඟිල්ලක් තමයි බිබිල නගරයේ හැදුවේ. නමුත්, කලින් තිබුණු ගොඩනැඟිල්ල විනාශ වෙලා දැන් එතැන භූමිය විතරයි තිබෙන්නේ. නමුත්, එතැන තිබෙන නිල නිවාසය පාවිච්චියට ගන්නවා. ඒ වාගේ ගොඩනැඟිලි විශාල ප්‍රමාණයක් ලංකාව පුරා අපට දකින්න ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සිවිල් අරගලය විතරක් නොවෙයි, වසර 30ක් පුරා මේ රටේ ජන ජීවිතය අඩාළ කරපු, මහ ජනතාවගේ ජීවිත අවිනිශ්චිතභාවයට පත් කරපු, ඒ වාගේම මේ රටේ ජනතාවට කඳුළ, දුක, වේදනාව පොදු උරුමයක් බවට පත් කරපු, රටේ හැම දිස්ත්‍රික්කයකම ඝාතනය විමධ්‍යගත කරපු මහා ත්‍රස්තවාදී යුද්ධයක් තිබුණා. භීෂණය සහ තිරශ්චීන මිනී මැරුම් අතරේ රටේ සම්පත්, ආගමික සිද්ධස්ථාන විනාශ කරපු, අපේ ගරුතර මහා සංඝරත්නය, ඒ වාගේම ජනාධිපතිවරු, ආරක්ෂක හමුදාවේ නිලධාරින්, සිවිල් ජනතාව, පාසල් දරුවන් මේ කියූ නොකියූ සියලු දෙනාටම බිය ගෙන දුන්, අවිනිශ්චිතභාවයක් ඇති කරපු, ජීවිතය ගැන බලාපොරොත්තුවක් ඇති නොවන තරමට පීඩනයක් ඇති කරපු ත්‍රස්තවාදයක් තිබුණා. ඒ අවධියේ උතුරු නැඟෙනහිර පාසල් ගොඩනැඟිලි, උතුරු නැඟෙනහිර රජයේ ගොඩනැඟිලි, කර්මාන්තශාලා, පොලිස් ස්ථාන, ඒ සියලු ස්ථාන විනාශයට පත් වුණා. පාසල් දරුවන්ට පාසල් යන්නට බැරි වුණා. රෝහල් විනාශ වුණා. මේ වාගේ විශාල විනාශයන් රාශියක් සිද්ධ වුණා.

ඒවා ගොඩ නඟන්න වෙන් වුණෙත් මේ රට සංවර්ධනය කරන්න තිබුණු මුදල්. අපේ ජනතාවගේ ඉතිරි කිරීම් සහ රාජ්‍ය ඉතිරි කිරීම් එකතුවේ තිබුණු දේශීය ප්‍රාග්ධනය, ඒ වාගේම විදේශීය ප්‍රාග්ධනය, මේ සියලු ප්‍රාග්ධනය, නැත්නම් මේ සියලු මුදල් ප්‍රතිපාදන හා සම්පත් තමයි ඒවාට වෙන් කළේ. අපි දැක්කා, අතිගරු ජනාධිපතිතුමා ත්‍රස්තවාදයට යුදමය විසඳුමක් දීලා මේ රටේ ජනතාව මුදා ගෙන සාමය ස්ථාපිත කළා.

සාමය ස්ථාපිත කළා විතරක් නොවෙයි, උතුරු නැඟෙනහිර ජනතාවට සදාකාලික සාමයක්, කල් පවත්නා තිරසාර සාමයක් ඇති කරන්නටත්, ඔවුන්ගේ ජන ජීවිතය ගොඩ නඟන්නටත්, ඒ අයගේ කෘෂි කර්මාන්තය, කර්මාන්ත, මාර්ග, අධ්‍යාපනය ඇතුළු සියලු යටිතල පහසුකම් දියුණු කරන්නටත් උතුරු වසන්තය හා නැඟෙනහිර නවෝදය මඟින් කටයුතු කළා. අද වන විට අවතැන් කඳවුරු සියල්ලම වාගේ ඉවත් වෙලා තිබෙනවා. හැම දරුවෙක්ම පාසල් යනවා. සමහර අය පදිංචිව සිටි ප්‍රදේශවලම නැවත පදිංචි කර ගෙන යනවා. විශාල පිරිසක් පදිංචි කරවලා තිබෙනවා.

විශාල මුදල් ප්‍රමාණයක් ලබා දීලා වර්තමානයේ ඒ ජනතාවට ආත්ම අභිමානයෙන් යුතුව ජීවත් වන්නට පුළුවන් පරිසරයක්

[ගරු විජිත බේරුගොඩ මහතා]

නිර්මාණය කර තිබෙනවා. ඉතින්, අපට වර්තමානය පිළිබඳව සතුටු වෙන්න පුළුවන්. වර්තමානයේ අපේ රටේ ජනතාවගේ දුක වේදනාව පිස දාලා, සතුට සැනසුම, බලාපොරොත්තුව ඔවුන්ගේ හදවත් තුළ ඇති කර තිබෙනවා. ඒ නිසා මේ රටේ ජනතාව අතිගරු ජනාධිපතිතුමාට, ආරක්ෂක හමුදාව ඇතුළු මේ රටේ සියලු දෙනාට කෘතඥතාව පළ කරනවා, එවැනි සාමයක් ස්ථාපිත කරලා ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම පිළිබඳව.

එහෙම වුණත්, තවමත් යථා තත්ත්වයට පත් කර නැති සමහර ගොඩනැඟිලි තිබෙනවා, සමහර යන්ත්‍රෝපකරණ තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේ රජය වෙනුවෙන් සිටින ගරු ගොවිජන සේවා හා වනජීවි නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා, ඒ ගැන තවත් සොයා බලා පුනරුත්ථාපනය කළ යුතු ගොඩනැඟිලි තිබෙනවා නම්, ප්‍රතිසංස්කරණය කළ යුතු වත්කම් තිබෙනවා නම් ඒවා නැවත ගොඩනඟන්න කියලා.

මේ රටේ වර්තමාන පරපුරට ඉදිරියේදී ඒ වාගේ අභාග්‍යසම්පන්න තත්ත්වයකට පත් වන්නට ඉඩ නොදී, පාසල් දරු දැරියන්ගේ ඉඳලා මේ රටේ ජනතාවගේත්, මේ රට ඉස්සරහට ගෙනියන්න පුළුවන් සියලුම ජනතාවගේත් ආකල්ප සංවර්ධනයක්, පරිවර්තනයක් ඇති කරලා මේ රටට ආදරය කරන පිරිසක්, මේ බිමට ආදරය කරන පිරිසක් බිහි කරන්න ඕනෑ. මේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්න පුළුවන් ආකල්ප ඇති කරන්න අපට අවශ්‍ය වෙනවා. ඉතින් අපි විශ්වාස කරනවා, අතිගරු ජනාධිපතිතුමා සියලු උපාය, උපක්‍රම පාවිච්චි කරලා ඒ කටයුතු කරන බව. මේ රජයේ මූලික අරමුණ වෙලා තිබෙන්නේ මේ රට සංවර්ධිත රටක් බවට පත් කිරීමයි. මැදි ආදායම් රටක් බවට පත් වන මේ රටේ ජනතාවගේ භෞතික ජීවන තත්ත්වය, ඒ වාගේම සමාජ තත්ත්වය ඉහළ නංවලා, අධ්‍යාපනය ඉහළ මට්ටමට ගෙනැල්ලා, දැනුමේ කේන්ද්‍රස්ථානයක් හැටියට මේ රට ඉස්සරහට ගෙනිහිල්ලා, මේ රට ආර්ථික, සමාජයීය, සංස්කෘතික යන සෑම අංශයකින්ම සංවර්ධනය කරන්න මේ රජය කටයුතු කරනවා. "පෙරදිග ලෝකයේ මුතු ඇටය" කියලා එක කාලයක් ශ්‍රී ලංකාව විරුදාවලිය ලැබුවා. අපේ වර්තමාන ජනාධිපතිතුමා ඇතුළු මේ රජය එයට නැවත ජීවය දෙන්න කටයුතු කරනවා.

ඒ නිසා අප ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ සඳහා විශේෂ අවධානය යොමු කර, එවැනි ගොඩනැඟිලි තිබේ නම් ඒවා සොයා බලා, ඒවා නැවත ප්‍රතිසංස්කරණය කර මේ රටේ ජනතාව වෙනුවෙන්, මේ රටේ සංවර්ධනය වෙනුවෙන් පාවිච්චි කරන්න කටයුතු කරන ලෙස. එසේ ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

එම යෝජනාව ස්ථිර කිරීම, ගරු එස්. සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව මා ස්ථිර කරන අතර, වචන ස්වල්පයක් මේ ගරු සභාවට යොමු කරන්නට කැමැතියි.

අපේ ඉතිහාසය දෙස බැලුවාම එතුමාගේ යෝජනාව පරිදි අපේ පරිසර විනාශය හා දේපළ විනාශය අවස්ථා හතරකදී සිද්ධ වුණා. 1971 වර්ෂයේදී, 1988-1989 කාලයේ, ඊළඟට සුනාමි ව්‍යසනය සිදු වූ අවස්ථාවේ හා ජනවාර්ගික අර්බුදය එනම් ප්‍රභාකරන්ගේ බලය ලබා ගැනීමේ කුරිරු උත්සාහය පැවැති කාලයේ. මේ අවස්ථා තුළ තමයි අපේ දේපළ විනාශ වුණේ. මේ සිද්ධීන් හතර දිහා බැලුවාම අපේ රටේ ආර්ථිකය සෑහෙන ප්‍රමාණයකට කඩා හැලීමක් සිදු වුණා. මට මතකයි අප කුඩා කාලයේදී දිවංගත බණ්ඩාරනායක මැතිතුමා අනුස්මරණය වෙනුවෙන් චීනයෙන් ලබා දුන් ආධාරයක් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව. ඒ වාගේ ම ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේදී ලංකාවේ අස්සක් මුල්ලක් නැර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ගණනේ ගොවි ජන සේවා මධ්‍යස්ථාන පිහිටුවා තිබුණා.

ගොවි ජන සේවා මධ්‍යස්ථාන කියන්නේ ගොවීන්ට එදිනෙදා තමන්ගේ කාර්ය භාරය කරගැනීමට ගොවීන් සඳහා ම හැදූව කාර්යාල. ප්‍රජාතන්ත්‍රවාදී ලෙස නොව බලහත්කාරයෙන් රජයක් ලබා ගැනීම සඳහා කළ උත්සාහය තුළ මේ වාගේ දේපළ විනාශ කර ඒ තුළින් බලය ලබා ගන්නට උත්සාහ කළා. ආර්ථික ආධාර අපට ලැබුණත්, අපේ රටේ ආර්ථිකය කඩා හැලෙන තත්ත්වයට පත් වුණා. සුනාමිය ස්වාභාවික විපතක්. ඒකත් අපට ගැටලුවක් වුණා. 1988 -1989 කාලයේ ඒ විධියටම බලය ලබා ගැනීම සඳහා කළ උත්සාහය තුළත් අපේ දේපළ විනාශයට ලක් වුණා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ගොවි ජන සේවා මධ්‍යස්ථාන, පොහොර ගබඩා වාගේ සමහර ස්ථාන අපේ අතිගරු ජනාධිපතිතුමා බලයට ආවාට පස්සේ දැන් හදමින් පවතිනවා. අප ඒ ගැන සන්තෝෂ වෙනවා.

විශේෂයෙන් නියෝජ්‍ය ඇමතිතුමාට මා මේ කාරණය මතක් කරන්නට ඕනෑ. මිහින්තලේ ගොවිජන සේවා මධ්‍යස්ථානය සිවිල් ආරක්ෂක කමිටුවට භාර ගත්තා වෙනුවට අද අලුත් ගොඩනැඟිල්ලක් ඉදි වෙමින් පවතිනවා. ඒ ගැන එතුමාට ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම රාජාංගන ප්‍රදේශයේ ධාන්‍ය ගබඩාවක් තිබුණා. ඒක විනාශයට පත් වුණා. තවම ඒ ගැන කිසිම පියවරක් අර ගෙන නැහැ. ඒ සඳහාත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

මෙම කාලෝචිත යෝජනාව අපේ ගරු මැති ඇමතිතුමන්ලාගේ අවධානයට යොමු කර නැවත එම ගොඩනැඟිලි ඒ ජනතාවට ලබා දී ඒ ජනතාව ඒවායින් ලබා ගත් සේවාව ලබා දීමට ඔබතුමන්ලාගේ අවධානය යොමු වේවායි පතමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගොවිජන සේවා හා වනජීවී නියෝජ්‍ය අමාත්‍ය ගරු එස්.එම්. චන්ද්‍රසේන නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் பிரதி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Deputy Minister of Agrarian Services and Wildlife)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණා පිළිබඳව අප කථා කරනකොට, මේ වන විට අපේ රටේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 558ක් පමණ තිබෙනවා. මේ ගොවිජන සේවා මධ්‍යස්ථාන ආරම්භ කළේ

1970 සිට 1977 කාලයේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පාලනය යටතේ තිබුණු සමගි පෙරමුණ ආණ්ඩුවේ සිටි කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමාගේ අදහසක් අනුවයි. අපේ රටේ පළාත් නවයම ආවරණය වන විධියට -දිස්ත්‍රික් 25 ම ආවරණය වන විධියට- යම් කිසි කෘෂිකාර්මික භූමියක් තුළ තමයි -භූගෝලීය හා කෘෂිකාර්මික රටාවන් අනුව ඒ ප්‍රදේශවලට ගැළපෙන පරිදි භූමියක් තෝරා ගෙන තමයි- මේ ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉදි කර තිබෙන්නේ.

මේ ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉදි කිරීම ඉතාම විශිෂ්ට කාර්යයක් හැටියට අපි දකිනවා. අපි විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වන්නට ඕනෑ, සිහිපත් කරන්නට ඕනෑ හිටපු අමාත්‍ය හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා කළ කාර්ය භාරය පිළිබඳව. එතුමා එදා ඒ කටයුත්ත නොකළා නම් අද අපට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්මයට සම්බන්ධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මඟින් විධිමත් විධියට කෘෂිකර්මය හසුරුවන්නට, පාලනය කරන්නට අපහසු වෙනවා. ගොවිජන සේවා මධ්‍යස්ථානය කියන්නේ ඒ ප්‍රදේශයේ ගොවි ජනතාවගේ මූලස්ථානය. ඉස්සර එය "එළදා වර්ධන කමිටුව" කියලත් හැඳින්වූවා. ගොවි සංවිධාන කිහිපයක් එකතු වෙලා තෝරා ගත් සභාපතිවරයෙක් යටතේ තමයි එය පාලනය වුණේ. අද ගොවිජන සංවර්ධන කමිටු හැටියට ස්වේච්ඡා සංවිධාන කිහිපයක් එකතු වෙලා, රජයේ ගොවිජන සංවර්ධන නිලධාරිවරයෙකුගේ පාලනය යටතේ විශාල නිලධාරින් සංඛ්‍යාවක් එතැන කටයුතු කරනවා. විශේෂයෙන්ම ගොවිජන සේවා නිලධාරිවරයා, කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන නිලධාරිවරයා, කෘෂිකර්ම උපදේශකවරයා, පොල් සංවර්ධන නිලධාරිවරයා, සුළු අපනයන බෝග සංවර්ධන නිලධාරිවරයා, ඒ ප්‍රදේශවලට අවේණික වගාවන් සඳහා පත් කරලා සිටින සියලුම නිලධාරිවරුන්ගෙන් සමන්විත එකම වහලක් හැටියට තමයි මේ ගොවිජන සේවා මධ්‍යස්ථාන පවතින්නේ. අද වන විට පොහොර සහනාධාරය ලබා දෙන මූලස්ථානය හැටියටත් මේ ගොවිජන සේවා මධ්‍යස්ථානය කටයුතු කරනවා.

මේ විධියට ගොවීන්ට ඉතාම සමීප මූලස්ථානයන් තමයි එදා ජනතා විමුක්ති පෙරමුණ 1988-89 භීෂණ සමයේ විනාශ කරලා දැම්මේ. මේ තොරතුරු අපේ දෙපාර්තමේන්තුවෙන් තමයි ලබා දීලා තිබෙන්නේ. -ලේකම්තුමාත්, කොමසාරිස් ජෙනරාල්තුමාත් නිලධාරි කුටියේ ඉන්නවා.- ගොවිජන සේවා මධ්‍යස්ථාන 151ක් සම්පූර්ණයෙන් විනාශ කර දාලා තිබෙනවා. ගොවිජන සේවා මධ්‍යස්ථාන ගිනි තියලා, විනාශ කර දාලා තිබෙනවා. එදා ජනතා විමුක්ති පෙරමුණ මේ රටට විමුක්තිය උදා කරන්නට කටයුතු කරලා තිබෙන්නේ එහෙම තමයි.

ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා අපෙන් අහලා තිබෙන්නේ අවුරුදු 30ක තොරතුරුයි. ඒ අවුරුදු 30ට අදාළ සියලුම තොරතුරු මා සතුව තිබෙනවා. නමුත් කාලය ප්‍රමාණවත් නැහැ. අවශ්‍ය නම් ඒ තොරතුරු වෙන වෙනම ඉදිරිපත් කරන්නටත් පුළුවන්. නමුත් මම දළ වශයෙන් ඉදිරිපත් කරන්නම්. 1988-89 කාලයේදී ගොවිජන සේවා මධ්‍යස්ථාන 151ක් ජනතා විමුක්ති පෙරමුණේ කැරලිකාරයෝ සම්පූර්ණයෙන්ම විනාශ කරලා දැම්මා. ඒ වාගේම අර්ධ වශයෙනුත් විනාශ කරලා තිබෙනවා. ඒ වාගේම අපි බොහොම කනගාටුවෙන් කියනවා, ගොවිජන සේවා මධ්‍යස්ථාන ගිනි තිබ්බා කියලා කියන්නේ ගොවීන්ගෙන් පළිගැනීමක් කළා කියන එකයි. අපේ රටේ අහිංසක ගොවි ජනතාවගෙන් පළිගැනීමක් හැටියට තමයි කරලා තිබෙන්නේ.

මේ රටේ ගොවි ජනතාව කියන්නේ වැරැද්දක් කරන පිරිසක් නොවෙයි. අහිංසක රැකියාවක් කරන, වෘත්තියක් කරන කොටසක්. උදේ සිට රෑ වනතුරු අව්ව, වැස්ස, පින්න නොතකා මහන්සි වෙලා වැඩ කරලා, මේවා ගිනි තියපු අයටත් බත් සපයපු අය. ආහාර සපයන අයගේ මූලස්ථානය තමයි එදා ගිනි තිබ්බේ. ඒ පිළිබඳව විශේෂයෙන් අදටත් අපි කනගාටු වෙනවා. විශාල මුදලක් වියදම් කරලා අපි ඒවා නැවත ගොඩ නඟලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, උතුරු නැඟෙනහිර ප්‍රදේශවලත් මේ වාගේම තත්ත්වයක් ඇති වුණා. මේ රට බෙදන්න, වෙන් කරන්න, වෙනම ආණ්ඩු හදන්න, රාජ්‍යයන් ගොඩ නඟන්න කටයුතු කළ එල්ටීටීඊ සංවිධානය උතුරේ තිබුණ ගොවිජන සේවා මධ්‍යස්ථාන සම්පූර්ණයෙන්ම වාගේ විනාශ කරලා දාලා තිබුණා. ඒ වාගේම ඒ මූලස්ථාන ඒ අයගේ එල්ටීටීඊ කඳවුරු හැටියට පවත්වා ගෙන ගිහින් තිබුණා. උතුරු-නැඟෙනහිර කෘෂිකර්මය සම්පූර්ණයෙන් කඩාකප්පල් කිරීම සඳහා තමයි මේ ගොවිජන සේවා මධ්‍යස්ථාන විනාශ කිරීම සහ ඒවා අඩ පණ කිරීම කරලා තිබෙන්නේ. ඒ අනුව විනාශ වුණ ගොවිජන සේවා මධ්‍යස්ථාන විශාල ප්‍රමාණයක් මේ වන විට සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කරලා ගොවි ජනතාව වෙත නැවත පවරලා තිබෙනවා. වවුනියාව දිස්ත්‍රික්කයේ සෙට්ටිකුලම්, කෝවිල්කුලම්, පම්බෙයිමඩු, කනහරායන්කුලම්, නදුන්කර්නි, මඩුකන්ද, ඕමන්තේ, ඕමන්තේ - උතුර; ඒ සියල්ල නැවත අලුත්වැඩියා කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම යාපනය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 15ක් විනාශ වෙලා තිබුණා. මේ වන විට භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගෙන, විදේශ ණය ලබා ගෙන, ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා මේ සඳහා නොයෙක් ආකාරයෙන් ප්‍රතිපාදන ලබා දීලා ඒ මධ්‍යස්ථාන 15ම අද අලුත්වැඩියා කර තිබෙනවා. ඒ මධ්‍යස්ථාන 15ටම මම පසු ගිය කාලයේ ගිහින් තිබෙනවා. ඒවා ඉතාම හොඳින් ක්‍රියාත්මක වෙනවා. අපේ කෘෂිකර්ම ඇමතිතුමාත් උතුරේ සංචාරයේ යන විට එතුමාගේ කෘෂිකර්ම කටයුතුවලටත් මේ මධ්‍යස්ථානයේ නිලධාරින් තමයි යොදා ගන්නේ. අපි එකතු වෙලා තමයි ඒ කටයුතු සියල්ලම කරන්නේ.

අපේ ගරු මුතුකුමාරණ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවැත්වූ දැයට කිරුළ වැඩසටහනේදී අනුරාධපුරයේ අලුතින් ගොවිජන මධ්‍යස්ථානයක් ඉදි කරන්න අතිගරු ජනාධිපතිතුමා කටයුතු කළා. අනුරාධපුරය කියන්නේ වී වගාව සහ බඩ ඉරිඟු වැනි අතිරේක භෝග නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කයක්. ඒ වාගේම අප නියෝජනය කරන දිස්ත්‍රික්කය. මේ දිස්ත්‍රික්කයේ මිහින්තලේ ගොවිජන සේවා මධ්‍යස්ථානය නැඟෙනහිර යුද්ධයත් එක්ක සිවිල් ආරක්ෂක නිලධාරින්ට පාවිච්චි කරන්න සිද්ධ වුණා. අපි ලක්ෂ 70ක් පමණ වියදම් කර ඉතාම හොඳ තත්ත්වයෙන් අද ඒ මධ්‍යස්ථානය ඉදි කරනවා. ඒ වාගේම සාලියපුර ප්‍රදේශයට අලුත් මධ්‍යස්ථානයක් පිහිටෙව්වා. මධ්‍යස්ථාන 557යි තිබුණේ. දැන් මධ්‍යස්ථාන 558ක් දක්වා අපිට ගොවිජන සේවා මධ්‍යස්ථාන ප්‍රමාණය වැඩි කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ අවුරුද්දෙත් ගොවිජන සේවා මධ්‍යස්ථාන හතරකට පමණ මුදල් වැය කර තිබෙනවා. සුනාමිය නිසා විනාශ වූ කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට දක්වා තිබුණු ගොවිජන සේවා මධ්‍යස්ථාන සියල්ලම වාගේ දැනට හදලා තිබෙනවා. මහින්ද යාපා අබේවර්ධන ඇමතිතුමාත් මේවා භාරව සිටියදී එතුමාගේ කාලයේදීත් මේවා හැදුවා. මේ විධියට ගොවිජන සේවා මධ්‍යස්ථාන සියල්ලම අංග සම්පූර්ණ මධ්‍යස්ථාන හැටියට දැනට ඒ අලුත්වැඩියා කිරීම්, අලුතෙන් ඉදි කිරීම් කර ගෙන යනවා. ගොවිජන සේවා මධ්‍යස්ථාන 45ක් පමණ අලුත්වැඩියා කරන්න තිබෙනවා.

[ගරු එස්. සී. මුතුකුමාරණ මහතා]

ගොවිජන සේවා මධ්‍යස්ථානවලට පමණක් නොවෙයි, අපේ දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාලවලටත් හානි කරලා තිබුණා. 1988, 1989 භීෂණය වෙලාවේ, ඒ වාගේම එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ භීෂණය වෙලාවේ විනාශ කරපු දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාල සියල්ල අලුත්වැඩියා කරන්නත්, ගරා වැටුණු ඒවා අලුතෙන් හදන්නත් මුදල් වෙන් කර දීම ගැන මම විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. කෘෂිකර්මය වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයට, ගොවිජන සේවා අමාත්‍යාංශයට, මේ රටේ කෘෂිකර්මයට අදාළ සියලුම ආයතනවලට විශාල මුදලක් වෙන් කර දෙනවා. ඒ නිසා තමයි අපට නිර්භීතව භය නැතුව අද කථා කරන්න වැඩ කරන්න ශක්තිය ලැබිලා තියෙන්නේ. ගොවිජන සේවා මධ්‍යස්ථානවල වටිනාකම ඒ වාගේම ගොවීන්ට එයින් වන සේවය පිළිබඳව හොඳ දැනීමක් තිබෙන නායකයෙක් ඉන්න නිසා අපිට මේ කටයුතු කිරීම ඉතාම පහසු වෙලා තිබෙනවා.

මූලාසනයේ ඉන්න මන්ත්‍රීතුමියගේ දිස්ත්‍රික්කය අම්පාර දිස්ත්‍රික්කයයි. දැයට කිරුළ දිස්ත්‍රික්ක හතරක අපි පවත්වා තිබෙනවා. පොළොන්නරුව, ත්‍රිකුණාමලය, අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවල පවත්වා තිබෙනවා. ඒ දිස්ත්‍රික්කවල ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියා කරන්න අපි කටයුතු කරනවා. මඩකලපුව දිස්ත්‍රික්කයේ කඩා දමා තිබෙන ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකක් අලුතෙන් ඉදි කරන්නත් කටයුතු කර ගෙන යනවා. ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ හොඳ යෝජනාවක්. අපේ ගරු මුතුකුමාරණ මන්ත්‍රීතුමා එය ස්ථිර කළා. දෙදෙනාම ගොවි ජනතාව නියෝජනය කරන ප්‍රදේශවල මහජන නියෝජිතයෝ හැටියට මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම නිසා මට මේ තොරතුරු සපයන්න පුළුවන් වුණා.

විශේෂයෙන්ම අපේ ආණ්ඩුව මෙම ගොවිජන සේවා මධ්‍යස්ථානවලට මුල් තැනක් දෙනවා. ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් අපට බීජ ටික ලබා දෙනවා.

පසු ගිය කාලයේ නියඟය නිසා විශාල ප්‍රමාණයක් වගා හානි වුණා. වී බුසල් 385,000ක් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලබා දෙන කොට ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ තිබෙන ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා තමයි ඒවා බෙදා හැරියේ. ඒක අපිට හරියාකාරව කරන්නට පුළුවන් වුණේ ඒ මූලස්ථාන තිබුණු නිසායි. ඒ නිසාම තමයි කැරලිකාරයෝ මේවාට ගහන්නේ. මේවා ආර්ථික මර්මස්ථාන කියලා හඳුනා ගෙන තමයි ඒවාට ගිනි තියන්නේ. ඒක ලොකු අපරාධයක්. ආණ්ඩුවත් එක්ක ප්‍රශ්න තිබෙනවා නම්, කැරලි කෝලාහල කරන්න ඕනෑ නම්, අරගල කරන්න ඕනෑ නම් වෙනත් ආයතන තෝරා ගත්තාට කමක් නැහැ. මේ ගොවිජන සේවා මධ්‍යස්ථාන කියන්නේ අහිංසක මිනිස්සුන්ගේ ආයතන. අපේ රට කෘෂි ආර්ථිකයක් තිබෙන රටක්. මේ රටේ සියලු දෙනාටම ආහාර සපයන, ඒ කියන්නේ කැරලිකරුවන්ටත් ආහාර සපයන මධ්‍යස්ථාන මේවා. ඒ නිසා මේ ගොවිජන සේවා මධ්‍යස්ථාන විනාශ කිරීම විශාල අපරාධයක්. ඒක අපරාධයක් කියලා මම හඳුන්වන්නේ මේවා විනාශ කිරීම ඉතාම නින්දිත කාරණයක් නිසායි. අනෙක් පැත්තෙන් ඒ කැරලිකරුවන්, ඒ වාගේම භීෂණය ඇති කරන්න කටයුතු කළ ඒ ම්ලේච්ඡ ත්‍රස්තවාදීන් විනාශ කළ දේවල් අලුත්වැඩියා කරන්න; ඒ සඳහා ප්‍රතිඋත්තර ලබා දෙන්න ආණ්ඩුව හැටියට අපි කටයුතු කරනවා.

අතිගරු ජනාධිපතිතුමාත් ඒ සඳහා අවශ්‍ය මූලා පහසුකම් සහ උපදෙස් ලබා දී තිබෙනවා. ඉදිරියේදී තවත් ගොවිජන සේවා මධ්‍යස්ථාන හදන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි වගා කරන ඉඩම් ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. පුරන් කුඹුරු අස්වද්දනවා. ගල්නෑව ප්‍රදේශයේ අපි අලුතින් ගොවිජන සේවා මධ්‍යස්ථානයක් හදන්න මුදල් වෙන් කර තිබෙනවා. ඒ වාගේම තවත් විශාල වශයෙන් කුඹුරු තිබෙන කොට්ඨාස හඳුනා ගෙන ගොවි ජනතාවගේ අවශ්‍යතාව අනුව ඒ අයට වැඩි සේවයක් ලබා දෙන්න තවත් ගොවිජන සේවා මධ්‍යස්ථාන ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

කෘෂිකර්ම පර්යේෂණ නිලධාරින් 9,500ක් විතර ඉන්නවා. කෘෂිකර්ම, වැවිලි කර්මාන්ත, සුළු අපනයන භෝග ප්‍රවර්ධන, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන වැනි අමාත්‍යාංශ සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වැනි අංශවල නිලධාරින් සම්බන්ධ වන ස්ථානය හැටියට ඒ ස්ථාන සංවර්ධනය කිරීම, ඒවා දියුණු කිරීම ඉතා ප්‍රතිඵලදායක දෙයක්. ගොවීන්ට අවශ්‍ය බීජ ටික පවා ඒ තැන්වලින් බෙදන්න කටයුතු ලැහැස්ති කර තිබෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවාව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සේවාව, සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවේ සේවාව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනවල සේවාව කියන මේ සියලුම සේවාවන් කරන්න යොදා ගෙන තිබෙන තැන මෙතැන නිසා අපි ඒ ස්ථාන තව තවත් වැඩි දියුණු කරන්න කටයුතු කරනවා. සුනාමියෙන් ගහ ගෙන ගිය ඒවාට අපට දොස් කියන්න බැහැ. ඒක ස්වාභාවික විපතක්. ස්වාභාවික විපත්වලින් විනාශ වුණු ඒ ස්ථාන අපි ඉතාම කඩිනමින් අලුත්වැඩියා කළා. තව සුළු ප්‍රමාණයක් තමයි අලුත්වැඩියා කරන්න සහ ඉදි කරන්න තිබෙන්නේ. අපි රජයක් හැටියට ඒ ටිකත් කරන්න කටයුතු කරනවා.

කෘෂිකර්මයට ලැදි, කෘෂිකර්මය තුළින් රට දියුණු කරන රජයක් හැටියට ඒ සියල්ලම කරන්න අපි කටයුතු කරනවාය කියන එක ප්‍රකාශ කරනවා.

මම හිතන විධියට මගේ කාල වේලාව අවසන් වෙලා තිබෙනවා. මේ යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමාටත්, එය ස්ථිර කළ ගරු මන්ත්‍රීතුමාටත් මම නැවතත් ස්තුතිවන්ත වෙමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 6.30 වුයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2012 නොවැම්බර් 15 වන දින සභා සම්මුතිය අනුව, 2012 දෙසැම්බර් 04 වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது, பி.ப 6.30 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2012 நவம்பர் 15 ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க, 2012 டிசம்பர் 04, செவ்வாய்க்கிழமை மு.ப.9.30 மணிவரை ஒத்திவைக்கப் பட்டது*

*It being 6.30 p.m.,* THE PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 9.30 a.m. on Tuesday, 04th December, 2012 pursuant to the Resolution of Parliament of 15th November, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.